ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
ආරක්ෂක අමාත්‍යාංශය
ශ්‍රී ලංකා රජය

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම

2023-2030

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආරක්ෂක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රජය

2023 නොවැම්බර්

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030

©ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.

සියලුම හිමිකම් අවුරා ඇත

ප්‍රථම ප්‍රකාශනය:: 2023
ප්‍රකාශනය : ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
අංක 120/1, විද්‍යා මාවත
කොළඹ 7.
ශ්‍රී ලංකාව
www.dmc.gov.lk

ජා.ග්‍ර.අං.ක්‍ර. අංකය : **XXX-XXX-XXX-XX-X**

අරමුදල් සම්පාදනය : .....

සැකැස්ම :.....

මුද්‍රණය :.....

යාවත්කාලීන කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම — 2023-2030 අමාත්‍ය මණ්ඩලය විසින් 2023 ..... මස ..... දින අනුමත කරන ලදී.

(අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක XX/XXXX/XXX/XXX

උධෘතය:

මෙම වාර්තාව උපුටා දැක්වීමේදී පහත උධෘතය භාවිත කරනු ලැබිය යුතුය:-
ජ.ආ.ම. (2023) ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම, 2023 – 2030. කොළඹ, ශ්‍රී ලංකාව:
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය. **XX*i*+157 pp.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

ගෝලීය උණුසුම ඉහළ යාම සහ දේශගුණ විපර්යාස හමුවේ ස්වභාවික ආපදාවල වර්ධනයක් ලොව පුරා මේ වන විට දක්නට ලැබේ. රටක් වශයෙන් ශ්‍රී ලංකාව ද ස්වභාවික මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදාවල බලපෑමට ලක්ව තිබීම නිසා අනාගතයේදී මුහුණ දිය හැකි එවන් වූ ව්‍යසන පාලනය කිරීමට සහ කළමනාකරණය කිරීමට ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් එක්ව ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් 2023 වසරේ සිට 2030 වසර දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වැඩිදියුණු කළ සහ යාවත්කාලීන කළ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් **(NDMP)** සැකසීම සතුටට කරුණකි.

රටේ ආපදා කළමනාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපායමාර්ගික රාමුවක් සහිතව ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් නිර්මාණය කිරීමෙහිලා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඉටු කර ඇති කාර්යභාරය අගය කළ යුතුය. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් බහුවිධ පාර්ශ්වකරුවන්ගේ දායකත්වය ලබා ගැනීමේ අවශ්‍යතාව සහ සීමාවන්ට යටත් නොවී ක්‍රියා කිරීම මෙම සැලැස්ම මඟින් අවධාරණය කර තිබේ. තමන්ට පැවරී ඇති වගකීම් නිශ්චිත කාල සීමාවක් තුළදී ඉටු කිරීම මඟින් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම රජයේ මෙන්ම පුද්ගලික අංශය ඇතුළු රාජ්‍ය නොවන ආයතනවලින් සමන්විත සියලු පාර්ශ්වකරුවන්ගේ වගකීමකි. එවන් වූ ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය වන්නේ ආපදාවල බලපෑම් රටේ ආර්ථික සහ සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ප්‍රයත්නවලට සැලකිය යුතු බාධාවක් විය හැකි බැවිනි.

ආපදා කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩ සහාය හා ආයෝජන හිමි වීමේ අවශ්‍යතාව ද මම පෙන්වා දෙනු කැමැත්තෙමි. ආපදා සඳහා පෙර සූදානම, අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යථා තත්ත්වයට පත් වීම යන අංශ සඳහා සම්පත් වෙන් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඊට අමතරව, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා අඛණ්ඩ සහය හිමිවීම වැදගත් වන්නේ ආපදා කළමනාකරණයේදී වඩාත් ඵලදායී ප්‍රවේශයක් පැවතීම මඟින් ආපදා අවදානම් සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි වන බැවිනි.

2023/30 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** ක්‍රියාවට නැංවීම මඟින් වත්මන් හා අනාගත පරපුරට ආරක්ෂාකාරී, ඉහළ ප්‍රතිරෝධයක් සහිත නිරසර ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කැප වන ලෙසට මා සියලු පාර්ශ්වවලට යළි අවධාරණය කරනු කැමැත්තෙමි.

රනිල් වික්‍රමසිංහ

ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

2023 ජූනි **13** වැනිදා

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය

මුලින් පැවති ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** 2013-2017 හි දක්වා ඇති සාර්ථකත්වයන් තවදුරටත් අවධාරණය කරන ප්‍රබල සහ ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල හැකි ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් **(NDMP)** 2023-2030 සකස් කිරීමේ කාර්යභාරය තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගන්නා ලද ප්‍රයත්නයන් තහවුරු කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

ඉන්දියන් සාගරයේ සර්ම කලාපීය දිවයිනක් වන ශ්‍රී ලංකාව, කාළගුණික විපර්යාස නිසා ඇතිවන ආපදා සහ උපද්‍රව වලින් වඩාත්ම අවදානමට ලක්විය හැකි රටවල් අතරට ශ්‍රේණිගත කර ඇත. එබැවින් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත බලාත්මක කිරීමත් සමඟ, ස්වභාවික හා මිනිසා විසින් සිදු කරන ලද ආපදා හේතුවෙන් ඇතිවන අභියෝගාත්මක තත්ත්වයන්ට ඵලදායී ලෙස මුහුණ දීමේ දුෂ්කර වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලදී.

වර්තමානය තුළ අත්විඳිනු ලබන පෙර නොවූ විරූ ආකාරයේ වාතාවරණය මධ්‍යයේ තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ රටේ බලාපොරොත්තු සහගත අරමුණට සහාය වීම සඳහා **NDMP** 2023-2030 වඩාත් ප්‍රායෝගික සහ අනාගත දැක්මක් සහිත වේ. මෙය ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ඉතිහාසයේ නවත් සන්ධිස්ථානයකි. ආපදා කළමනාකරණයේ සෑම අදියරකටම යුක්තිය ඉටු කර ඇති මෙම සංශෝධිත සැලැස්ම, ඉදිරි වසර හත තුළ "සුරක්ෂිත ශ්‍රී ලංකාවක්" ගොඩනැගීමේ දී හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික මාර්ගෝපදේශයක් වනු ඇත.

ඉදිරියට ගමන් කිරීමේදී, ජාතියක් ලෙස සියල්ලන් ඇතුලත් වූ ප්‍රවේශයක් අනුගමනය කරමින් ආපදා අවදානම් අවම කිරීම ප්‍රධාන ප්‍රවාහගත කිරීම සඳහා අප අපගේ ජාතික මෙන්ම උපාය මාර්ගික ගෝලීය රාමු සමඟ පෙළ ගැසිය යුතු වෙයි. එපමණක් නොව, අපගේ තිරසර සංවර්ධන අභිලාෂයන් පාරිසරික තිරසාරත්වය ඉහළ නංවමින්, ආපදාවලට ඔරොත්තු දෙන සහ කාලගුණික විපර්යාස බලපෑම්වලට අනුගත වන ඒවා විය යුතුය. මෙය මත පදනම් වෙමින්, **NDMP** 2023-2030 ආපදා කළමනාකරණය පිළිබඳව රට තුල වර්තමානයේ සැලකිල්ලක් දක්වනු ලබන කාරණා මෙන්ම අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්වල දී ආපදා අවදානම් අවම කිරීම ප්‍රධාන ප්‍රවාහගත කිරීම සඳහා නව මානයක් සහිත ප්‍රවේශයක් අනුගමනය කර ඇත.

ආපදා කළමනාකරණයට අදාළ සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සුසංයෝගයක් ඇති කිරීම අත්‍යවශ්‍ය වන අතර ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා යෝජිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සැලැස්ම අනුසාරයෙන් ඔවුන් කටයුතු කරනු ලැබේ. අප රටේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අත්විඳින ව්‍යසනවල බලපෑම අවම කිරීම සඳහා, සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අත්විඳින ආපදා අවදානම් අවම කිරීමේ අභියෝගවලට මුහුණ දීම තුළ මෙම නව සැලැස්ම වඩාත් ප්‍රායෝගික සහ ඵලදායී එකක් බවට සනාථ වනු ඇතැයි අපි දැඩිව බලාපොරොත්තු වෙමු.

ජාතික සැලැස්ම 2023-2030 පිළියෙළ කිරීමේදී සපයන ලද නොමසුරු සහයෝගය සහ වටිනා දායකත්වය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා, මාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්, රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ජාත්‍යන්තර සහ දේශීය සියලුම රාජ්‍ය නොවන ආයතනවල ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සහ අනෙකුත් වෘත්තිකයන් වෙත මගේ කෘතඥතාව පුද කිරීමට මම කැමැත්තෙමි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු නිලධාරීන්ගේ උත්සාහය වෙනුවෙන් මගේ සුබ පැතුම් පිරිනමන අතර මෙම දැවැන්ත කර්තව්‍ය සම්පූර්ණ කිරීමට සම්බන්ධ වූ සැමට මම ප්‍රශංසා කරමි.

ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්

ආරක්ෂක රාජ්‍ය ඇමති

ලේකම්තුමාගේ පණිවුඩය

ගෝලීය දේශගුණයේ සිසු වෙනස මිනිස් ජීවිතයට, දේපළවලට සහ යටිතල පහසුකම්වලට දැඩි තර්ජනයක් වන බොහෝ ව්‍යසනයන්ට හේතු වී තිබේ. ආපදා කළමනාකරණය සඳහා පරිසර පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයක් පිළිගෙන ඇති ශ්‍රී ලංකාවට ආපදා අවදානම් අවම කිරීමේ දිගු ඉතිහාසයක් ඇති අතර ආපදා කළමනාකරණ චක්‍රයේ සෑම අදියරකදීම ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරන ආසියානු කලාපයේ ප්‍රමුඛතම රටක් ලෙස හැඳින්විය හැකිය.

විය හැකි ආපදා වල බලපෑම් අවම කිරීම සඳහා පෙර සැලැස්මේ වැඩි දියුණු කළ අනුවාදයක් වන ජාතික ආපදා කළමනාකරණ සැලසුම (**NDMP**) 2023-2030, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන, ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, වෘත්තිකයන් සහ ප්‍රජා පාදක කණ්ඩායම් සමඟ සහයෝගයෙන් සහයෝගී සහ පුළුල් ප්‍රවේශයක් අනුගමනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. ජාතික ආපදා කළමනාකරණ සැලසුම 2023-2030 හි ප්‍රධාන සංරචක, ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුවේ ප්‍රමුඛතා හතර, වත්මන් සාර්ව මට්ටමේ ව්‍යසනයන් අවම කිරීම සහ ඒවාට එරෙහිව වැඩි ප්‍රත්‍යාස්ථතාවක් ඇති කිරීම, මෙන්ම දූපත් රාජ්‍යයක් ලෙස අත්විඳිය හැකි ව්‍යසනයන් ආමන්ත්‍රණය කිරීමද මත පදනම් වී තිබේ.

මානව ක්‍රියාකාරකම් දේශගුණික විපර්යාසවල ප්‍රධාන ධාවකයා වී ඇති අතර අද වෙන කවරදාටත් වඩා මිනිස්සු එහි ප්‍රතිවිපාක විවිධ ආකාරවලින් අත්විඳිමින් සිටිති. අපගේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා රටේ ආර්ථික සහ සංවර්ධන අංශ තිරසාර සහ දේශගුණික ප්‍රත්‍යාස්ථ භාවිතයන් අනුගමනය කිරීම සම්බන්ධයෙන් පුළුල් හා දිගුකාලීන වෙනසක් පිළිබඳ දැක්මක් සහතික කිරීම සඳහා පුළුල් සහ දිගුකාළීන දෘෂ්ටියේ වෙනසක් ජාතික ආපදා කළමනාකරණ සැළසුම 2023-2030 ඇති කරයි.ඒ අනුව, ආපදාවලට ඔරොත්තු දෙන ජාතියක් බවට පත්වීම සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව, ශ්‍රී ලංකාවේ විවිධ පාර්ශ්වකරුවන් විසින් සිදු කළ යුතු ප්‍රමුඛතා සහ මූලපිරීම් සැලැස්ම මඟින් හඳුනාගෙන තිබේ.

රටක් වශයෙන්, ස්වභාවික හා මිනිසා විසින් සිදු කරන ලද විපත්වල අනපේක්ෂිත ප්‍රතිවිපාකවලට හුරුවීමේ දී ගෝලීය රාමු සහ ගිවිසුම් මඟින් නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා කළ යුතු කාර්යයන් බොහෝය. අනුවර්තනය වීම සහ ඔරොත්තු දීමේ හැකියාව සෑම තැනකම අවශ්‍ය වන නමුත් අඩුම සම්පත් වලින් වඩාත් අවදානමට ලක්විය හැකි අයට සහාය වීම සඳහා මෙම සැලැස්මේ දක්වා ඇති ක්‍රියාවන්ට ප්‍රමුඛත්වය දීම අත්‍යවශ්‍ය වේ.

ඉහළම මට්ටමේ දේශපාලන අනුග්‍රහය සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, පරිත්‍යාගශීලීන් සහ ප්‍රජාවන් ඇතුළු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) 2023-2030 හි ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උත්සුක වන බව මගේ විශ්වාසයයි.

මෙම අතිශය වැදගත් ජාතික ලේඛනය සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැපයීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිවරයාට සහ රාජ්‍ය අමාත්‍යවරයාටත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ටත් ඔවුන්ගේ උනන්දුව සහ කැපවීම වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කරමි.

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)

WWV RWP RSP USP ndc psc MPhil

ලේකම්

ආරක්ෂක අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවුඩය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස 2023 වසරේ සිට 2030 වසර දක්වා වූ ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ඔබ වෙත ඉදිරිපත් කරන්නේ සතුටෙනි. මෙම සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය අතිශය වෙහෙසකර කටයුත්තක් වූයේ දැනට පවත්නා සැලැස්ම වැඩිදියුණු කිරීමත් සමකාලීන මානයන් ඊට එක් කිරීමත් යන ද්වි ආංශික ක්‍රියාවලිය අනුගමනය කිරීමට සිදු වූ බැවිනි. ඒ සඳහා අධික කාලයක් ගත වූ අතර ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පාර්ශ්වකරුවන්ගේ සහාය ඊට හිමි විය.

ජාතියක් වශයෙන් අප විවිධ ස්වභාවික ආපදාවන්ට මුහුණ දී ඇති අතර එම සිදුවීම්වලින් ප්‍රජාවන්ට එල්ල වූ බලපෑම සුළුපටු නොවේ. ඉන් ජීවිත හානි, දේපළ හානි මෙන්ම අපගේ දෛනික ජීවිතයේ කටයුතු අඩාල වීම් ද සිදු විය. කෙසේ වෙතත්, රටක් ලෙස අපගේ ප්‍රතිරෝධී බව මෙන්ම යළි ගොඩ නැගී යථා තත්ත්වයට පත් වීමට ඇති අදිටන ද පෙන්නුම් කර තිබේ. මෙම වාර්තාව එම ජීවගුණයට ඇති සාක්ෂියකි.

2005 අංක **13** දරණ ආපදා කළමනාකරණ පනතට අනුකූලව සම්පාදනය කර ඇති ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට **(NDMP) 2023-2030** සෙන්ඩායි රාමුව, පැරිස් එකඟතාව සහ තිරසර සංවර්ධන ඉලක්ක යන අන්තර්ජාතික ගිවිසුම්වල ප්‍රධාන ප්‍රතිපත්ති පදනම් වී ඇත. ප්‍රතිරෝධී බව ශක්තිමත් කිරීම සඳහා අලුතින් ඇතිවිය හැකි ආපදා වළක්වාලීම මෙන්ම දැනට පවත්නා ආපදා අවදානම් අවම කිරීම ද සිදු කළ යුතු බවට සෙන්ඩායි රාමුව ප්‍රකාශ කර තිබේ. ඒ අනුව ආපදා අවදානම අවම කිරීම සඳහා ක්‍රියාවට නැංවිය හැකි ගෝලීය ප්‍රමුඛතා හතරක් දක්වා ඇති අතර මනා සම්බන්ධීකරණයක් සහිත බහු ආංශික ප්‍රවේශයක් ද ඊට අවශ්‍ය බව පෙන්වා දී තිබේ. තව ද, මෙම වාර්තාව සම්පාදනය කිරීමේදී දේශගුණික විපර්යාසවල ප්‍රතිවිපාක සහ මෑත කාලීනව ලොව පුරා ආපදා වාර්තා වූ වාර ගණන හා ඒවායේ ප්‍රබලත්වය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර තිබේ.

ආපදාවක් කළමනාකරණය කිරීමේ විවිධ අදියරවලදී එක් එක් රජයේ ආයතනයට සහ අදාල පාර්ශ්වකරුවන්ට පැවරෙන නිශ්චිත වගකීම් සහ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම්වත් කිරීමක් රටක ආපදා කළමනාකරණ සැලැස්ම මඟින් සිදු කරනු ලබයි. **2023-2030** කාල සීමාව සඳහා සකසා ඇති ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ **(NDMP)** ඇති විශේෂත්වය වන්නේ සෙන්ඩායි රාමුව හා සමපාත වෙමින් අනාගත චින්තනයකින් හා බහුවිධ ප්‍රවේශයකින් යුතුව ක්‍රියාකාරී සැලසුම් සකසා තිබීමයි. මෙම සැලැස්ම අන්තර්ග්‍රාහී වන ආකාරයෙන් සැකසීමට අවධානය යොමු කර ඇති අතර ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ග්‍රාහ්‍යතාව, දරුවන්, ආබාධ සහිත පුද්ගලයන් සහ අවදානම්සහගත ප්‍රජා කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා පිළිබඳව ද විශේෂ සැලකිල්ල යොමු කෙරිණ.

මෙම ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමට නම් සියලු පාර්ශ්වවල සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය බවට අප හඳුනාගෙන තිබේ. මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ලබා ගන්නා අත්දැකීම් මත පදනම්ව අනාගතයේදී සිදු විය යුතු වෙනස්කම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අපට හැකිවනු ඇත. සුරක්ෂිත හා ප්‍රතිරෝධී බවින් යුත් ආපදා අවදානම්වලට අවම වශයෙන් නිරාවරණය වූ සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා අප සෑම එකමුතුව ක්‍රියා කළ යුතු අතර ආපදාවක් සිදු වූ විට ඊට සාර්ථකව මුහුණ දීම සඳහා අප සූදානම්ව සිටිය යුතුය.

මෙම ජාතික ලේඛනය සැකසීම සඳහා දායක වූ සෑමට ස්තූතිය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කරගන්නා අතර ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 **(NDMP)** නිර්මාණය කර ප්‍රකාශයට පත් කිරීමේ දුෂ්කර කටයුත්තට ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන සහ **ADRiMP** ආයතනය ලබා දුන් සහාය අගය කරනු කැමැත්තෙමි.

මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ

RWP RSP MSc ndu psc

අධ්‍යක්ෂ ජෙනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ප්‍රස්තාවනාව

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 (**NDMP** 2023-2030) දේශගුණික විපර්යාස මගින් එල්ල වන අභියෝගවලට අනුගත වෙමින් ආපදා අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට හැකි ප්‍රතිරෝධී දේශයක් ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවේ හවුල් වගකීම සහ කැපවීම මූර්තිමත් කරයි. මෙම සැලැස්ම රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් අතර පුළුල් සහයෝගීතාවයේ ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාවේ නූතන ආපදා කළමනාකරණයේ ආරම්භය 2003 වසරේදී සිදු වූ විනාශකාරී ගංවතුර හා නායයෑම්වලින් පසුව සනිටුහන් විය. 2004 වසරේදී සිදු වූ පෙර අත්නොදුටු ඉන්දියානු සාගර සුනාමියෙන් පසු පුළුල් ප්‍රවේශයක අවශ්‍යතාව කැපී පෙනෙන ලෙස පැහැදිලි විය. ශ්‍රී ලංකාව ආපදා අවදානම් කළමනාකරණය අතින් මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, ක්‍රියාකාරීත්වය සඳහා වන හියෝගෝ රාමුව (**HFA**) සහ මෑතක සිට ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව (**SFDRR**) වැනි අන්තර්ජාතික මාර්ගෝපදේශ උපයෝගී කර ගනිමින් එම කටයුතු මෙහෙයවනු ලබයි.

ආපදා කළමනාකරණයට සම්බන්ධ ආයතන සහ ප්‍රජාවන්ට අභියෝග රාශියක් ඉදිරිපත් කරමින් දේශගුණික විපර්යාසවල බලපෑම් මගින් ශ්‍රී ලංකාවේ උපද්‍රව සහ අවදානම් පැතිකඩ තවදුරටත් උග්‍ර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත බලාත්මක කිරීම මගින් ආපදා අවම කිරීම, ඒ සඳහා වන සූදානම, ප්‍රතිචාර දැක්වීම, සහන සම්බන්ධීකරණය, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය ඇතුළු ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රධාන අදියර ඇතුළත් මාර්ගෝපදේශ ලේඛනය ලෙස මෙම සැලැස්ම සකස් කිරීම අවශ්‍ය විය. සංශෝධිත සැලැස්ම මගින් සියලුම පාර්ශ්වකරුවන් අතර සහජීවනය ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කළ ආයතනික විධිවිධාන සහ අනාගත ආපදා තත්ත්වයන්ට ඵලදායී ලෙස මුහුණදීම සඳහා ආපදා අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030, ආපදාවන්ට ප්‍රතිරෝධය දැක්වීමේ හැකියාව වර්ධනයකරමින් ශ්‍රී ලංකාව ඉදිරියට යන ගමනේ තීරණාත්මක සන්ධිස්ථානයක් නියෝජනය කරයි. අලුතින් එල්ල වන අභියෝග, තාක්ෂණික දියුණුව සහ වෙනස් වීම්වලට ලක්වන ගෝලීය රාමු සමඟ අනුගත වන පරිදි නීතිපතා යාවත්කාලීන කිරීම් සහ ගැලපීම් සඳහා ඉඩ සලසන ගතික සහ අනුවර්තනය කළ හැකි සැලැස්මක් ලෙස මෙය සැලසුම් කර තිබේ. ආරක්ෂිත සහ ප්‍රතිරෝධී දේශයක් ගොඩනැගීම සඳහා එක්ව කටයුතු කිරීමේදී රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන හවුල්කරුවන්ගේ සිට සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් දක්වා සියලුම පාර්ශවකරුවන්ගේ සාමූහික වගකීම සැලැස්ම මඟින් අවධාරණය කර ඇත.

ආපදා අවදානම් අවම කිරීමේ සෙන්ඩායි රාමුව විසින් රටේ ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රයත්නයන් සඳහා ශක්තිමත් පදනමක් සපයා ඇති අතර, අවදානම් දැනුවත් ප්‍රවේශයන්, බහු ආංශික සහයෝගීතාවය සහ ඒ සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයේ වැදගත්කම අවධාරණය කරයි. මෙම රාමුව මත පදනම්ව ජාතික අපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ඒකාබද්ධ විසඳුම්වල අවශ්‍යතාවය අවධාරණය කරමින් දේශගුණික විපර්යාස සහ ආපදා අවදානම අවම කිරීම සඳහා පරිසර පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයන් ඇතුළත් කළ හැකිවන පරිදි විෂය පථය පුළුල් කර තිබේ.

ජාතික සැලැස්ම සංවර්ධනය සඳහා පුළුල් ප්‍රයත්න රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ දැඩි අභ්‍යන්තර සාකච්ඡා පැවැත්වීම ද ඊට ඇතුලත් වේ. ඉන් අනතුරුව, රාජ්‍ය අමාත්‍යාංශ, තාක්ෂණික ආයතන, පෞද්ගලික අංශයේ සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (**INGOs**), රාජ්‍ය නොවන සංවිධාන (**NGOs**), එක්සත් ජාතීන්ගේ සංවිධාන, විද්වතුන්, සිවිල් සමාජ සංවිධාන (**CSOs**) සහ ස්වේච්ඡා සේවකයන් ඇතුළු විවිධ පරාසවල පාර්ශවකරුවන් සහ වසම් ප්‍රවීණයන් එක්රැස් කරමින් උපදේශන වැඩමුළුවක් ද පැවැත්වුණි. කෙටුම්පත් ලේඛනය සඳහා ප්‍රතිපෝෂණ එක්කිරීමට සහ වලංගුභාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් ප්‍රධාන පාර්ශවකරුවන් අතර එය බෙදා හරින ලදී. ලැබුණු යෝජනා සහ අදහස් ඇතුළත් කරමින්, අවසාන අනුවාදය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (**DMC**) අතුරු කළමනාකරණ කමිටුවේ (**IMC**) සාමාජිකයින් විසින් ඉතා සූක්ෂම ලෙස පිරිපහදු කර අනුමත කරන ලදී.

ජාතික සැලැස්ම 2023-2030 ඵලදායී සහ සාර්ථක වන්නේ එහි ක්‍රියාකාරී සැලැස්ම නිශ්චිතව ක්‍රියාත්මක කිරීමෙන් පමණි. එබැවින්, ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්ති ලෙසින් අපදා අවම කිරීමේ පියවර ප්‍රධාන ප්‍රවාහයට එක්කිරීම සඳහා එය අතිශයින් වැදගත් වේ. තවද, මෙම සැලැස්ම සෙන්ඩායි රාමුව සමඟ සමීපව අනුගත වෙමින්

ආපදා අවදානම් අවම කිරීමේ උපායමාර්ග අදාළ ආයතනික සැලසුම්වලට ඒකාබද්ධ කිරීම සඳහා අත්‍යවශ්‍ය මග පෙන්වීමක් සපයයි.

අපදාවන් ප්‍රජාවේ ඇතැම් කොටස්වලට අසමාන ලෙස බලපානු ලබන අතර ඔවුන්ගේ අවදානම් තත්ත්වයන්, සමාජ-ආර්ථික, භෞතික තත්ත්වයන්, ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ වෙනත් සාධක ඊට හේතුවේ. සංශෝධිත සැලැස්ම තුළින් ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ සෑම අදියරකදීම මෙම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ විශේෂ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම මඟින් එය ප්‍රගතිශීලී ජාතික ලේඛනයක් බවට පත්කරනු ඇත.

විධායක සාරාංශයට අමතරව පරිපූර්ණ පරිච්ඡේද හයකින් මෙම ජාතික සැලැස්ම සමන්විත වන අතර, අදාල පාර්ශවකරුවන්ගේ භූමිකාවන් සහ වගකීම් 2015 වසරෙන් පසු ඇතිකරගන්නා ලද ප්‍රධාන ජාත්‍යන්තර ගිවිසුම් සහ තිරසර සංවර්ධන ඉලක්කවලට අනුගත වන පරිදි එහි පැහැදිලිව දක්වා තිබේ. තවද, ආපදා අවදානම් කළමනාකරණයේ වැදගත්කම සහ ආපදා කළමනාකරණ මූලධර්මවල විශ්වීය ප්‍රතිව්‍යුහගත කිරීම හඳුනා ගනිමින්, යාවත්කාලීන සැලැස්ම ප්‍රජා-පාදක ආපදා අවදානම් කළමනාකරණ ප්‍රවේශයට ඉහළ වැදගත්කමක් ලබා දී ඇත.

වත්මන් සැලැස්මට අවශ්‍ය සංශෝධන සිදු කරමින් ජාතික සැලැස්ම 2023-2030 සකස් කිරීම සඳහා දැඩි සැලකිල්ලක් සහ ප්‍රයත්නයක් ආයෝජනය කර තිබේ. මෙම අනුවාදය පෙර සැලැස්මේ වැඩිදියුණු කළ ආකාරයක් නියෝජනය කරන අතර මෙවැනි ආකාරයේ ලේඛනයක ගතික ස්වභාවය ද ඉන් හඳුනාගෙන තිබේ. එපමණක් නොව, එය ක්‍රියාත්මක කිරීම තුලින් ලබා ගන්නා ලද අත්දැකීම් මත පදනම්ව, අනාගතයේ දී සිදු කළ යුතු වෙනස්කම් සඳහා ද ඉන් අවකාශ සලසා ඇත.

හඳුනාගත් ක්‍රියාමාර්ග සහ සැලසුම් කළ ආයෝජන සිදු කිරීම සඳහා අවශ්‍ය මහ පෙන්වීමට ජාතික සැලැස්ම 2023-2030 පරිපූර්ණ මාර්ග සිතියමක් ලෙස ක්‍රියා කරන අතර, එය අවසානයේ වඩාත් සුරක්ෂිත සහ ප්‍රතිරෝධීභාවයෙන් යුත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම උදෙසා උරදෙනු ඇත.

ආපදා අවදානම් සැලකිය යුතු මට්ටමකින් අවම, මනා සූදානමකින් යුත් ප්‍රජාවන් සවිබල ගැන්වුණු, ප්‍රතිරෝධී බවින් යුක්ත ස්වභාවික හා කෘත්‍රිම පරිසර තත්ත්වයන් සහජීවනයෙන් යුතුව වැජඹෙන අනාගතයක් උදා කර දීමේ අභියෝගය සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීම වගකිව යුතු පාර්ශ්වකරුවන් ලෙස අප සැමගේ වගකීමයි.

තුතිපුද

විවිධ පුද්ගලයන්ගේ සහ සංවිධානවල අගනා දායකත්වය මෙන්ම සහයෝගය තුළින් ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 නිර්මාණය කිරීමට හැකි විය. මෙම සැලැස්ම විවිධ පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්න, කැපවීම සහ විශේෂඥතාව ප්‍රදර්ශනය කරමින්, ආපදා කළමනාකරණය සඳහා ජාතියේ කැපවීමෙහි කැපී පෙනෙන ජයග්‍රහණයක් නියෝජනය කරයි.

වත්මන් ජාතික සැලැස්ම ආපසු විමසා බැලීමේ සහ සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය මෙන්ම පවතින අන්තර්ගතය වැඩිදියුණු කිරීම සහ නව මානයන් හඳුන්වාදීම යන දෙඅංශය පිළිබඳ අවධානය යොමු කරමින් පුළුල් ප්‍රවේශයක් ආරම්භ කරන ලදී. යාවත්කාලීන තොරතුරු එක්රැස් කිරීම සඳහා පුළුල් උත්සාහයක් ගන්නා ලද අතර, සැලැස්මෙහි ඵලදායීතාවය සහ අදාළත්වය සහතික කිරීම සඳහා විශේෂඥ සාකච්ඡා මාලාවක් අනුගමනය කරන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලයේ, ආරක්ෂක අමාත්‍යාංශයේ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආපදා කළමනාකරණය සඳහා දක්වන අසීමිත කැපවීම පිළිබඳව අපගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමු. ඔවුන්ගේ දූරදර්ශී නායකත්වය සහ කැපවීම ජාතික සැලැස්ම 2023-2030 හැඩගැස්වීමේදී සහ එය ජාතික ප්‍රමුඛතා සහ සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැස්වීමේදී වැදගත් වේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ප්‍රතිශෝධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීමේදී තීරණාත්මක සහය සහ මගපෙන්වීම ලබා දුන් විද්වතුන් සහ වෘත්තිකයන් ඇතුළු ආපදා කළමනාකරණ සහෝදරත්වය නියෝජනය කරන විශේෂඥ කණ්ඩායම් විශේෂ ඇගයීමට ලක් වේ. ඔවුන්ගේ විශේෂඥතාව, මනා භාවිතයන් බෙදාහදා ගැනීම සහ තාක්ෂණික සහාය මෙම වැදගත් කාර්යය සඳහා පදනම සකස් කළේය.

ප්‍රධාන තාක්ෂණික ආයතන, රාජ්‍ය අමාත්‍යාංශ, පෞද්ගලික අංශයේ සංවිධාන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ ස්වේච්ඡා කණ්ඩායම්වල නිලධාරීන්ට ද අපගේ කෘතඥතාව පළ කරමු. උපදේශන ක්‍රියාවලියට ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය සැලැස්ම හැඩගැස්වීමටත්, එහි අදාළත්වය සහතික කිරීමටත්, බිම් මට්ටමේ දී එය අදාළ කිරීමටත් උපකාරී වී ඇත. සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිරෝධී ප්‍රජාවන් සංවර්ධනය කිරීම සඳහා මෙම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ.

ජාතික සැලැස්ම 2023-2030 ප්‍රවර්ධනය සඳහා ලබා දුන් අමිල දායකත්වය උදෙසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රශංසාව හිමි විය යුතුය. සැලැස්ම සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙහෙස නොබලා දරණ උත්සාහය සහ විවිධ ඉදිරි දර්ශන ඇතුළත් කිරීමට සහ විවිධ පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමට ඇති කැපවීම ජාතියේ අවශ්‍යතා සහ අභිලාෂයන් පිළිබිඹු කරන විස්තීර්ණ ඇතුළත් ලේඛනයකට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන තාක්ෂණික ආයතන, අමාත්‍යාංශ සහ රජයේ දෙපාර්තමේන්තු වෙත ද අපගේ කෘතඥතාව පුදකර සිටිමු. ඔවුන්ගේ වටිනා යෝජනා, අදහස් සහ දායකත්වය සමාලෝචන ක්‍රියාවලියේදී ප්‍රයෝජනවත් වූ අතර ජාතික සැලැස්ම 2023-2030 හි අවසන් කෙටුම්පතට ඒවා නිසි ලෙස ඇතුළත් කරන ලදී.

ආපදා අවදානම් කළමනාකරණ වෘත්තිකයන්ගේ සංගමය (**ADRIMP**) සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සංවිධානවල නියෝජිතයින්ගේ උත්සාහයන් ද විශේෂ ඇගයීමට ලක්විය යුතුය. ඔවුන්ගේ දායකත්වයන් ජාතික සැලැස්ම 2023-2030 හි අන්තර්ගතය පොහොසත් කර ඇත, එය වටිනා සහ ප්‍රගතිශීලී ලියවිල්ලක් බවට පත් කර ඇත.

තවද, මෙම ලේඛනය සකස් කිරීම සඳහා සම්බන්ධ වූ සංස්කාරකවරුන්, පරිවර්තකයන් (සිංහල සහ දෙමළ භාෂා), ග්‍රැෆික් අන්තර්ගත සංවර්ධකයින්, නිර්මාණකරුවන් සහ මුද්‍රණකරුවන්ට අපි ස්තූතිවන්ත වෙමු. ඔවුන්ගේ කඩිසර කාර්යය ජාතික සැලැස්මෙහි ගුණාත්මකභාවය සහ මනා ඉදිරිපත් කිරීම සහතික කර ඇති අතර, එය පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ප්‍රවේශය සහතික කර ඇත..

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 සැකසීමට සහය දුන් සහ ඔවුන්ගේ ප්‍රවීණත්වය ලබා දුන් ජාත්‍යන්තර හවුල්කරුවන්ට සහ සංවිධානවලට අපගේ කෘතඥතාව පුදකරමු.. ඔවුන්ගේ සහයෝගීතාව සහ හවුල්කාරිත්වය ආපදාවල බලපෑම්වලට මුහුණ දීමට සහ ඒවා අවම කිරීමට ඇති අපගේ සාමූහික හැකියාව ශක්තිමත් කර ඇත. සැලැස්මේ

ගුණාත්මකභාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (**UNDP**) සහ ලෝක ආහාර වැඩසටහන (**WFP**) විවිධ අවස්ථාවලදී සපයන ලද මූල්‍යාධාර අපි විශේෂයෙන් අගය කරමු.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 දියත් කිරීමේ පුළුල් ව්‍යාපාරයට සහාය වීම සඳහා තිරය පිටුපස සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වූ සැමට අපි අපගේ කෘත ඥතාව කරමු. ඔබගේ සහයෝගය සහ දායකත්වය ඉතා අගය කොට සලකන අතර වඩාත් ප්‍රත්‍යාස්ථාවයෙන් යුත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා අපි සැම කැපවෙමු.

අන්තර්ගතය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය iv

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය v

ලේකම්තුමාගේ පණිවුඩය vi

අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවුඩය vii

ප්‍රස්තාවනාව viii

තුතිපුද x

අන්තර්ගතය xii

වගු මාලාව xvi

රූප පෙළ xvii

විධායක සාරාංශය 1

පසුබිම 1

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 හි ප්‍රධාන කුළුණු 2

සැලැස්මේ ව්‍යුහය 3

1 හැඳින්වීම 4

1.1 රටෙහි සන්දර්භය 4

1.2 **සමාජ-ආර්ථික සන්දර්භය** 5

1.3 **හානි හා අලාභ** 5

1.4 දේශගුණික විපර්යාස අභියෝග 6

1.5 **ආපදා හා පාරිසරික පද්ධති අතර සම්බන්ධය** 7

1.6 **සංකීර්ණතාව හඳුනා ගැනීම** 7

1.7 **ආපදා කළමනාකරණ රාමුව** 8

1.8 **යාවත්කාලීන කරන ලද ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් සඳහා තාර්කික පදනම** 9

1.9 **ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම** (NDMP) 2023- 2030 10

1.9.1 බහු-කොටස්කාර ප්‍රවේශය 12

1.9.2 බහු උපද්‍රව ප්‍රවේශය 12

1.9.3 මාර්ගෝපදේශක මූලධර්ම 12

1.9.4 විෂය පථය 14

1.9.5 අරමුණු 14

1.9.6 ක්‍රමවේද ප්‍රවේශය 15

1.9.7 මෙහෙයුම් රාමුව 16

1.9.8 ස්වෙච්ඡා සේවය 18

1.9.9 ජාතික හා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමග සම්බන්ධීකරණය 18

1.10 **සමාජ අන්තර්ග්‍රාහීත්වය** 19

1.10.1ආපදා කළමනාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ආබාධිතභාවය සහ සමාජ අන්තර්ග්‍රාහීත්වය 19

1.10.2ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අඩු කිරීම (CC-DRR) 20

1.10.3ආබාධ සහිත පුද්ගලයන් (**PWDs)** 20

1.10.4වැඩිහිටි ප්‍රජාව 20

1.10.5විගමණික ශ්‍රමිකයන් 21

1.11 **ආපදා අවදානම් අඩු කිරීම ආශ්‍රිත ගෝලීය හා දේශීය රාමු** 22

1.11.1තිරසර සංවර්ධන ඉලක්ක **(SDGs)** 22
1.11.2ආපදා අවදානම් අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව **(SFDRR)** 23
1.11.2.1 ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව 24
1.12 ජාතික පාරිසරික ප්‍රතිපත්තිය සහ ජාතික අනුවර්තන සැලැස්ම 25
1.13 **කාල රාමු** 26
1.14 **අනාගත ප්‍රතිශෝධන හා යාවත්කාලීන කිරීම්** 27
2 අවදානම් හරස්කඩ 28
2.1 බහුවිධ හානිකර තත්ත්වයන් හා අවදානම් 28
2.2 **බහුලව සිදුවන ආපදාවල බලපෑම් මට්ටම** 29
2.2.1 ගංවතුර 29
2.2.2 නියඟ 30
2.2.3 නායයෑම් 33
2.2.4 සුළි සුළං/ වණ්ඩ මාරුත 34
2.2.5 සුනාමි 35
2.2.6 මුහුදු මට්ටම ඉහළ නැගීම 37
2.2.7 කුණාටු රළපහර 37
2.2.8 වෙරළ ඛාදනය 38
2.2.9 අකුණු 39
2.2.10ගිනි 39
2.2.11භූමිකම්පා 39
2.2.12ගොඩනැගිලි කඩා වැටීම් 40
2.2.13වෙරළබඩ හා සමුද්‍ර කලාපය දූෂණය 40
2.2.14අභ්‍යන්තර ජල මූලාශ්‍ර දූෂණය 41
2.2.15වායු දූෂණය 42
2.2.16කාර්මික 44
2.2.17න්‍යෂ්ටික හා විකිරණ හදිසි අනතුරු 44
2.2.18කොවිඩ් 19 වසංගතය 44
2.2.19ඉස්මතු වෙමින් පවතින සෞඛ්‍ය උපද්‍රව 45
2.2.19.1 වාහකයින් විසින් සම්ප්‍රේෂණය කරනු ලබන රෝග 45
2.2.19.2 බෝ නොවන රෝග 46
2.2.20මාර්ග අනතුරු 46
2.2.21දුම්රිය මාර්ග ආශ්‍රිත අනතුරු 47
2.2.22සතුන්ගෙන් එල්ල වන ප්‍රහාර 47
2.2.23සතුන්ගෙන් හෝ ශාක මඟින් බෝ වන රෝග 49
2.2.24දියේ ගිලීම් 49
2.3 **අවදානම් අවබෝධය** 51
2.4 **දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් පිළිබඳව අවබෝධ කර ගැනීම** 51
2.5 **උපද්‍රවය, අවදානම්-පාත්‍රතාව, ධාරිතාව හා අවදානම් තක්සේරුව** 53
2.6 **උපද්‍රව තක්සේරුව හා උපද්‍රව සිතියම්කරණය** 53
2.7 **ප්‍රජා මට්ටමේ උපද්‍රව සිතියම්කරණය** 54
2.8 **අවදානම්-පාත්‍රතාව සහ අවදානම පිළිබඳ තක්සේරු** 54
2.9 **ධාරිතා තක්සේරු** 55
2.10 **අවදානම් තක්සේරුව සඳහා දත්ත** 55
2.11 **අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම්කරණය** 55
3 ආපදා අවදානම් කළමනාකරණය කිරීම සඳහා පද්ධති ප්‍රවේශය 58
3.1 ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයෝජනය කිරීම 58

3.2 **සංවර්ධන ක්ෂේත්‍රය තුළට අපදා අවදානම් අවම කිරීමේආයෝජන මුඛ්‍ය ධාරාගත කිරීම** 60
3.3 **නාගරික සංවර්ධනය තුළ ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍යධාරාගත කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම** 61
3.4 **ජීවනෝපාය පිළිබඳ අවධාරණය කිරීම** 61
3.5 **අවදානම් වෙනත් පාර්ශ්වයක් වෙත පැවරීම සඳහා නවෝත්පාදන මූල්‍යකරණය** 61
3.6 **සොබාදහම මත පදනම් වූ විසඳුම්** 62
3.6.1 සොබා දහම මත පදනම් වූ විසඳුම් සඳහා සහාය සැලසීමට රාජ්‍ය පාලන තත්ත්වයන් වැඩිදියුණු කිරීම .. 63
3.7 ආපදා අවදානම් කටයුතු පාලනය කිරීම සම්බන්ධයෙන් ආයතනික ශක්තිමත් කිරීම 63
3.8 ආරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහා මාර්ග සිතියම 64
3.9 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (2013-2017) සහ ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන (2014-2018) 65
3.10 ජාතික මට්ටමින් ආපදා කළමනාකරණය සිදු කිරීම 66
3.10.1ආපදා කළමනාකරණ අමාත්‍යාංශය 66
3.10.2ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 67
3.10.3තාක්ෂණික උපදේශක කමිටුව 68
3.10.4හදිසි ප්‍රතිචාර කමිටුව 68
3.11 **උප ජාතික මට්ටමේ ආපදා කළමනාකරණය** 68
3.11.1දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණය 68
3.11.2ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණය 69
3.11.3ආපදා කළමනාකරණය තුළ පළාත් පාලන ආයතන 69
3.11.4ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ආපදා කළමනාකරණය 70
3.12 **උපද්‍රවඅධීක්ෂණය සහ අනාවැකි පලකිරීම (පුරෝකථන)** 71
3.12.1සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි **(SOPs)** 71
3.12.2පූර්ව අනතුරු ඇඟවීම් 72
3.13 **ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානමින් පසුවීම** 73
3.14 පෞද්ගලික අංශයේ ආපදා සඳහා සූදානම් වීමේ කටයුතු සැලසුම්කරණය 73
3.15 හදිසි අවස්ථාවලදී සිදු කරන මෙහෙයුම් 74
3.15.1ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම **(NEOP)** 74
3.15.2හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ **(EOC)** කාර්යයන් 75
3.15.3දිස්ත්‍රික් මට්ටමේ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන 76
3.16 **හදිසි අවස්ථා ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම** 76
3.16.1ආපදාවල වින්දිතයන් හඳුනාගැනීම 76
3.16.2මාධ්‍ය ආයතනවල භූමිකාව 76
3.16.3ජංගම දුරකථන සේවා සම්පාදකයන්ගේ කාර්යභාරය 77
3.17 සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම් 77
3.18 සහන සහ ප්‍රතිසාධනය 78
3.18.1සහන මධ්‍යස්ථාන කලමනාකරණය 78
3.19 **පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය** 78
4 ආපදා අවදානම් කළමනාකරණය සඳහා ශක්‍යතා වර්ධනය 80
4.1 **තොරතුරු හුවමාරුව ශක්තිමත් කිරීම** 81
4.1.1 දත්ත සම්පාදකයන් සමඟ වන හවුල්කාරිත්වයන් 81
4.1.2 ජාත්‍යන්තර ආයතන සමඟ හවුල්කාරිත්වයන් 81
4.2 ආපදා කළමනාකරණ පුහුණු 82
4.2.1 පුහුණුකරුවන් පුහුණු කිරීම 82
4.2.2 පුහුණු පහසුකම් 82
4.3 **දැනුවත්භාවය සහ අධ්‍යාපනය** 83

4.3.1 පාසල් අධ්‍යාපනය 83
4.3.2 විශ්වවිද්‍යාල අධ්‍යාපනය 83
4.3.3 තෘතියික අධ්‍යාපනය 83
4.4 ප්‍රජාව පාදක කරගත් ආපදා අවදානම් කළමනාකරණය 84
4.5 පර්යේෂණ සහ සංවර්ධනය 84
5 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030 **වැඩසටහන** 86
5.1 මෙහෙයුම් ක්‍රමෝපායයන් 87
ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030 90
6 ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය 149
6.1 බහු-අදියර ක්‍රමලේඛන ප්‍රවේශය 150
6.2 සම්පත් බලමුලු ගැන්වීම 151
6.3 අධීක්ෂණය සහ ඇගයීම සම්බන්ධීකරණය 151
7 යොමු 152
8 වාග් මාලාව 154
9 ඇමුණුම් 157
9.1 ඇමුණුම 1: අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ආපදා අවදානම් අවම කිරීම හා සම්බන්ධ ඉලක්ක 157
9.2 **ඇමුණුම 2:: බහුඋපද්‍රව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සහ ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ කොළඹ ප්‍රකාශනය** 2020 159
9.3 **ඇමුණුම** 1: 2005 **අංක** 13 **දරණ ආපදා කළමනාකරණ පනත** 162
9.4 **ඇමුණුම** 2: **උපද්‍රව සිතියම්ගත කිරීම / උපද්‍රව තොරතුරු සඳහා වගකිව යුතු ආයතන** 163
9.5 ඇමුණුම 3: අවශ්‍ය වන උපද්‍රව සිතියම් පරිමාණ 165
9.6 ඇමුණුම 4: විවිධ ජාතික සහ පළාත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන / නියෝජිතායතනවල ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ මාර්ගෝපදේශය 166
9.7 ඇමුණුම 5: ප්‍රාග්ධන වෙළඳපොළ (ආයතනික) සඳහා IFC ආයතනයේ පාරිසරික සහ සමාජීය (E&S) කාර්යසාධක දර්ශක 170
9.8 ඇමුණුම 6: විවිධ ආකාරයේ තාක්ෂණික උපද්‍රව / අනතුරු සඳහා වගකිව යුතු අමාත්‍යාංශ / නියෝජිතායතන 175
9.9 ඇමුණුම 9: සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ සහ හදිසි ඉවත් කිරීමේ ක්‍රියාවලිය : "අවසන් සැනපුම - අවසන් මිනිසා" 176
9.10 පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය 177

වගු මාලාව

වගුව 1. මාර්ග අනතුරු පිළිබඳ විශ්ලේෂණය (2018 - 2022) 47

වගුව 2. දුම්රිය අනතුරු පිළිබඳ විශ්ලේෂණය - මිනිසුන් සහ සතුන් (2018 – 2022) 47

වගුව 3. - අනාගත ආපදා ප්‍රවණතා හා බලපෑම් 52

වගුව 4. ආපදා අවදානම් අවම කිරීමේ සෙන්ඩායි රාමුවේ ප්‍රමුඛතාවන්ට එරෙහි මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය 65

වගුව 5. ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනෙහි සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතාවයන් සංසන්දනය කිරීම 66

වගුව 6. ශක්‍යතා වර්ධනය සඳහා ආපදා අවම කිරීම සඳහා වූ සෙන්ඩායි ප්‍රවේශය 80

රූප පෙළ

1 රූපය. දේශගුණික විපර්යාසවල බලපෑම් **6**

2 රූපය. ආපදා අවදානම හා ගාමකයෝ **7**

3 රූපය. ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ ව්‍යූහය **9**

4 රූපය. යාවත්කාලීන කරන ලද ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් සඳහා තාර්කික පදනම **10**

5 රූපය. ජාතික සැලැස්ම **2023-2030** හි කුළුණු හතරක් සහ අදාළ මෙහෙයුම් උපාය මාර්ග **15**

6 රූපය. ආපදා කළමනාකරණය සඳහා වූ මෙහෙයුම් රාමුව **17**

7 රූපය. තිරසර සංවර්ධන ඉලක්ක **(SDGs)** **22**

8 රූපය. තිරසර සංවර්ධන ඉලක්ක සහ සෙන්ඩායි රාමුවෙහි සුසංයෝගය සහ ශක්තිමත් කිරීම **23**

9 රූපය. සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතා **24**

10 රූපය. ශ්‍රී ලංකාව විසින් සම්මත කරන ලද ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි ජාතික රාමුවෙහි ඉලක්ක හත **25**

11 රූපය. ප්‍රමුඛතා ක්‍රියාවන් සම්පූර්ණ කිරීම සඳහා අපේක්ෂිත කාල රාමු - ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** **27**

12 රූපය. දිස්ත්‍රික්ක අනුව ගංවතුරින් පීඩාවට පත් මුළු ජනගහනය **2010-2022** **29**

13 රූපය. ශ්‍රී ලංකාවේ ගංවතුර අවකාශීය ව්‍යාප්තිය **30**

14 රූපය. නියං උපද්‍රව ස්වරූපය **31**

15 රූපය. නියඟය හේතුවෙන් වසර **2010** සිට **2021** දක්වා විපතට පත් පුද්ගලයින් සංඛ්‍යාව **32**

16 රූපය. නියඟයේ බලපෑම - වසර **2010** සිට **2022** වසර දක්වා දිස්ත්‍රික්ක අනුව **32**

17 රූපය. නායයාම් කලාප සිතියම් **33**

18 රූපය. වසර **1811** සිට **2021** වසර දක්වා සුළි සුළං හා ගමන් පථ **34**

19 රූපය. දිස්ත්‍රික්ක අනුව වණ්ඩ මාරුත හා සුළි සුළං මගින් පීඩාවට පත් සංඛ්‍යා **(2010-2022** වණ්ඩ මාරුත හා සුළි සුළං හේතුවෙන් පීඩාවට පත් සංඛ්‍යා**)** **35**

20 රූපය. සුනාමී උපද්‍රව පැතිකඩ **36**

21 රූපය. පුරෝකථනය කර ඇති මුහුදු මට්ටම ඉහළ නැගීම - **2100** **37**

22 රූපය. අනුකෘතික උච්ඡතම රළපහර උස ප්‍රමාණයන් රළපහරේ උස (මීටර්) **38**

23 රූපය. අකුණු සැර වැදීමෙන් සිදුවන මරණ සහ තුවාල **39**

24 රූපය. කැලණි නදියෙහි නයිට්‍රේට් නයිට්‍රජන් ප්‍රමාණය (හංවැල්ල පාලමෙහි සාමාන්‍ය නයිට්‍රේට් බැර) සාමාන්‍ය වාර්ෂික බැර - ටොන් **65.61** **42**

25 රූපය. කැලණි නදියෙහි කොලිෆෝම් ප්‍රමිති ඉක්මවා යාම **42**

26 රූපය. ගතික වායු තත්ත්ව සිතියම **43**

27 රූපය. ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව දර්ශකය **43**

28 රූපය. ශ්‍රී ලංකාවේ කෝවිඩ් සංඛ්‍යා දත්ත **(2020-2022)** **45**

29 රූපය. මිනිස්-අලි ගැටුම සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස **48**

30 රූපය. දියේ ගිලීම් හේතුවෙන් වූ මරණ **(2012** සිට **2022** දක්වා) **50**

31 රූපය. ශ්‍රී ලංකාවේ දියේ ගිලීම් වැඩි වශයෙන් සිදු වන ස්ථාන **50**

32 රූපය. සිරස් හා තිරස් ආපදා කළමනාකරණය **56**

33 රූපය. ආපදා සූදානම්කරණය පිළිබඳ සැලසුම් රාමුව **56**

34 රූපය. සොබාදහම මත පදනම්වූ විසඳුම් සඳහා පරිසරය සංරක්ෂණය සඳහා වන අන්තර්ජාතික එකමුතුවේ ගෝලීය ප්‍රමිතීන් **62**

35 රූපය. ආපදා අවදානම් කළමනාකරණයේ ආයතනික රාමුව **66**

36 රූපය. ආපදා කළමනාකරණ කමිටු උප ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම **69**

37 රූපය. පූර්ව අනතුරු ඇඟවීමේ පණිවිඩ අවසාන අදියර / මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමේ ක්‍රමය **72**

38 රූපය. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් ආකෘතිය **75**

39 රූපය. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** ක්‍රියාත්මක කිරීමේ සඵලතාවය සොයා බැලීම සඳහා ඒකාබද්ධ ඩිජිටල් උපකරණ පුවරු පද්ධතිය **(IDDS)** **150**

කෙටි යෙදුම්

AASL	ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම
ADB	ආසියානු සංවර්ධන බැංකුව
AEA	පරමාණුක බලශක්ති අධිකාරිය
AI	කෘත්‍රිම බුද්ධිය
AIDS	නතු කරගත් ප්‍රතිශක්ති ඌණතා සින්ඩ්‍රෝමය
AMCDRR	ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ආසියානු අමාත්‍යවරුන්ගේ සමුළුව
AQI	වායු තත්ත්ව දර්ශකය
ASD	ගොවිජනසේවා දෙපාර්තමේන්තුව
BCP	ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම
CAT DDO	ව්‍යසන විලම්බන විකල්පය
CB	පුරවැසි කණ්ඩායම
CBDRM	ප්‍රජාව පාදක කරගත් ආපදා අවදානම් කළමනාකරණය
CBOs	ප්‍රජාව පාදක කරගත් සංවිධාන
CBRNE	රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ඉහළ බලපෑමක් සහිත පුපුරණ ද්‍රව්‍ය
CC & CRM	වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණය
CCA	රට පිළිබඳ පොදු තක්සේරුව
CCAP	දේශගුණික විපර්යාස අනුවර්තන ප්‍රතිපත්තිය
CCC	ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
CC-DRR	ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණය
CCS	දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය
CDLG	පළාත්පාලන ආයතනවල ශක්‍යතා වර්ධනය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CECB	මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය
CEJ	පරිසර යුක්ති කේන්ද්‍රය
CFR	සිද්ධි මරණ අනුපාතය
CGIAR	ජාත්‍යන්තර කෘෂිකාර්මික මධ්‍යස්ථානවල එකමුතුව
CIMIC	සිවිල් හමුදා සහයෝගීතාව
CKDu	නොදැනුවත් හේතු විද්‍යාවේ නිදන්ගත වකුගඩු රෝග
CMA	සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
COP	විවිධ පාර්ශ්වවල සමුළුව
COVID-19	කොරෝනා වෛරස රෝගය
CPC	ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
CPP	දේශගුණික සෞභාග්‍ය සැලැස්ම
CresMPA	දේශගුණික ප්‍රතිරෝධී බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය
CRIP	දේශගුණික ප්‍රතිරෝධීභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
CRIWMP	දේශගුණික ප්‍රතිරෝධී ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය
CSBL	ශ්‍රී ලංකා මහ බැංකුව
CSIAP	දේශගුණ සුහුරු සමෝධායන කෘෂිකාර්මික ව්‍යාපෘතිය
CSOs	සිවිල් සමාජ සංවිධාන
CSR	ආයතනික සමාජ වගකීම
DAD	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
DaLA	හානි හා අලාභ තක්සේරුව
DB	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

DCC	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව
DCS	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
DDMCUs	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක
DivS	ප්‍රාදේශීය ලේකම්
DM	ආපදා කළමනාකරණය
DM Act 2005	**2005** අංක **13** දරණ ආපදා කළමනාකරණ පනත
DMC	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
DMPs	ආපදා කළමනාකරණ සැලසුම්
DoA	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
DoArc	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
DoGI	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
DoM	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
DoSS	සමාජ සේවා දෙපාර්තමේන්තුව
DPL	සංවර්ධන ප්‍රතිපත්ති ණය
DRM	ආපදා අවදනම් කළමනාකරණය
DRR	ආපදා අවදානම් අවමකරණය
DS	දිස්ත්‍රික් ලේකම්
DVI	ආපදා වින්දිතයන් හඳුනාගැනීම
DWC	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
E&S	පාරිසරික හා සමාජයීය
EbA	පරිසර පද්ධතිය මත පදනම් වූ අනුවර්තනය
Eco-DRR	පරිසර පද්ධතිය මත පදනම් වූ ආපදා අවදානම් අවමකරණය
EEZ	විශේෂිත ආර්ථික කලාපය
EIA	පාරිසරික බලපෑම් තක්සේරුකරණය
EMP	හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම
EOC	හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය
EPL	පාරිසරික ආරක්ෂණ බලපත්‍රය
ERC	හදිසි ප්‍රතිචාර කමිටුව
FD	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
GBCSL	ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය
GCF	හරිත දේශගුණික අරමුදල
GEDSI	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ආබාධිත ප්‍රජාව සහ සමාජ අන්තර්ග්‍රාහීත්වය
GFDRR	ආපදා අවදානම් අවමකරණය සඳහා වූ ගෝලීය පහසුම්
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GIZ	අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වන ජර්මානු ඒජන්සිය
GN	ග්‍රාම නිලධාරි
GoSL	ශ්‍රී ලංකා රජය
GSMB	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
HARTI	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු, පුහුණු හා පර්යේෂණ ආයතනය
HE	අතිගරු
HEC	මිනිස් අලි ගැටුම
HEVR	උපද්‍රව, නිරාවරණය, අනතුරුදායී සහ අවදානම
HF	ඉහළ සංඛ්‍යාත
HFA	ක්‍රියාකාරීත්වය සඳහා වූ හියුගෝ රාමුව
ICS	සිද්ධි විධාන පද්ධතිය
ICTA	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
ICTAD	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය
ID	වාරිමාර්ග දෙපාර්තමේන්තුව

IDDS	සමෝධානික ඩිජිටල් උපකරණ පුවරු පද්ධතිය
IDPs	අභ්‍යන්තරව අවතැන්වූවන්
IEEs	මූලික පරිසර විමර්ශන
IGP	පොලිස්පති
IHR	අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසි
IMO	ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය
INGO	අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන
INSARG	ජාත්‍යන්තර සෙවුම් සහ මුදාගැනීමේ කණ්ඩායම
IOT	විවිධ දෑ ඇතුලත් අන්තර්ජාලය
IPCC	දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර මණ්ඩලය
IT	තොරතුරු තාක්ෂණය
IUCN	පරිසර සංරක්ෂණය සඳහා අන්තර්ජාතික එකමුතුව
JICA	ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය
LAs	පළාත් පාලන ආයතන
LD	කම්කරු දෙපාර්තමේන්තුව
LDD	නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
LGBTQI+	සමරිසි, සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික සහ අන්තර් ලිංගික
LNGOs	දේශීය රාජ්‍ය නොවන සංවිධාන
LSA	ජීවිතාරක්ෂක සංගමය
M/DM&HR	ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය
MACA	සිවිල් බලධාරීන්ට හමුදා ආධාර
MAoSL	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
MDGs	සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථ
MEPA	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
MFARD	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
MHEW	බහු උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීම
MHPPS	මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය උපකාරක සේවා
MoA	කෘෂිකර්ම අමාත්‍යාංශය
MoD	ආරක්ෂක අමාත්‍යාංශය
MoDM	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
MoE	පරිසර අමාත්‍යාංශය
MoEd	අධ්‍යාපන අමාත්‍යාංශය
MoF	මුදල් අමාත්‍යාංශය
MoFA	විදේශ කටයුතු අමාත්‍යාංශය
MOH	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
MoH	සෞඛ්‍ය අමාත්‍යාංශය
MoInd	කර්මාන්ත අමාත්‍යාංශය
MoJ	අධිකරණ අමාත්‍යාංශය
MoLands	ඉඩම් අමාත්‍යාංශය
MoMM	ජනමාධ්‍ය අමාත්‍යාංශය
MoPHP&L	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යාශය
MoPRD	ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
MoSDVT	නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
MoTHW	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
MPA	බහුඅදියර ක්‍රමලේඛන ප්‍රවේශය
MRCC	සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
MRI	වෛද්‍ය පර්යේෂණ ආයතනය

MSMEs	ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය
MWCASE	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය
NACWC	රසායනික අවි පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය
NAITA	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
NAP	ජාතික අනුවර්තන සැලැස්ම
NAPA	ජාතික අනුවර්තන ක්‍රියාකාරී සැලැස්ම
NBRO	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
NbS	පරිසරය පදනම් කරගත් විසඳුම්
NCCAS	ජාතික දේශගුණික විපර්යාස අනුවර්තන උපායමාර්ගය
NCDM	ආපදා කළමනාකරණය සඳහා වන ජාතික කවුන්සිලය
NCDs	බෝ නොවන රෝග
NCPA	ජාතික ළමාරක්ෂණ අධිකාරිය
NCT	තාක්ෂණය සඳහා වන ජාතික සහතික පත්‍රය
NDCs	ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්
NDMCC	ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව
NDMO	ජාතික ආපදා කළමනාකරණ සංවිධානය
NDMP	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම
NDRSC	ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
NDT	තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
NEL	ආර්ථිකමය නොවන පාඩු
NEOP	ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම
NEP	ජාතික පාරිසරික ප්‍රතිපත්තිය
NERD	ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
NGJA	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
NHDA	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
NIE	ජාතික අධ්‍යාපන ආයතනය
NITF	ජාතික රක්ෂණ භාර අරමුදල
NOC PCO	කොවිඩ් 19 වළක්වාලීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය
NOSCOP	ජාතික තෙල් කාන්දුවීමේ හදිසි සැලැස්ම
NPD	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
NPPD	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
NSDI	ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම්
NSE	වැඩිහිටි මහලේකම් කාර්යාලය
NSF	ජාතික විද්‍යා පදනම
NSPWD	ආබාධිත තැනැත්තන් සඳහා වන මහලේකම් කාර්යාලය
NTWC	ජාතික සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය
NWSDB	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
NYSC	ජාතික තරුණසේවා සභාව
OCDS	ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියාගේ කාර්යාලය
PDNA	පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුකරණය
PEER	හදිසි ප්‍රතිචාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන
PES	පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම්
PHIs	මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු
PPP	රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය
PRA	සහභාගීත්ව ආපදා තක්සේරුකරණය
PRISM	තත්‍ය කාලීන තොරතුරු සහ තත්ත්ව අධීක්ෂණය සඳහා වන අවකාශය
PWDs	ආබාධ සහිත තැනැත්තන්
R2R	කඳුවැටියේ සිට ගල්පරය දක්වා

RTAs	රථවාහන අනතුරු
SAR	සෙවීමේ හා ගලවා ගැනීමේ මෙහෙයුම්
SARS	උග්‍ර ශ්වසන රෝග සින්ඩ්‍රෝමය
SBTs	විද්‍යාව පදනම් කරගත් ඉලක්ක
SD	මිනින්දෝරු දෙපාර්තමේන්තුව
SD&CC	රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව
SDGs	තිරසර සංවර්ධන ඉලක්ක
SFDRR	ආපදා අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුව
SGBV	ලිංගික සහ ස්ත්‍රීපුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය
SLCDMP	ශ්‍රී ලංකා විස්තීර්ණ ආපදා කළමනාකරණ වැඩසටහන
SLCG	ශ්‍රී ලංකා වෙරළාරක්ෂකයින්
SLDM	ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය
SLDRN	ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය
SLIDA	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලනය
SLLDC	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
SLPA	ශ්‍රී ලංකා වරාය අධිකාරිය
SLSA	ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය
SLTDA	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
SMoHA	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
SMS	කෙටි පණිවුඩ සේවය
SOPs	සම්මත මෙහෙයුම් පටිපාටි
SOs	ස්ථාවර නියෝග
STF	විශේෂ කාර්ය බලකාය
TAC	තාක්ෂණික උපදේශක කමිටුව
TORs	යොමු කොන්දේසි
TOTs	පුහුණුකරුවන් පුහුණු කිරීම
TRC	විදුලි සංදේශ නියාමන කොමිසම
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UN	එක්සත් ජාතීන්ගේ සංවිධානය
UNDAF	එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර රාමුව
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
UNICEF	එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
UNOCHA	මානුෂීය කටයුතු සම්බන්ධීකරණය කිරී සඳහා වන එක්සත් ජාතීන්ගේ නිලධාරියා
USDA	නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
VHF	ඉතා ඉහළ සංඛ්‍යාතය
WASH	ජලය, සනීපාරක්ෂාව සහ පවිත්‍රතාව ප්‍රවර්ධනය කිරීම
WFP	ලෝක ආහාර වැඩසටහන
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය
WNPS	වනජීවීන් හා පරිසරය සුරක්ෂිත කිරීමේ සංගමය

විධායක සාරාංශය

පසුබිම

ශ්‍රී ලංකාවේ නූතන ආපදා කළමනාකරණය 2003 වසරේදී සිදු වූ ගංවතුර හා නායයෑම් වලින් ආරම්භ වූ අතර 2004 වසරේ ඉන්දියානු සාගර සුනාමියෙන් පසු සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. පශ්චාත් සුනාමි වැඩසටහන්වලට "සුරක්ෂිත ශ්‍රී ලංකාව සඳහා වූ මාර්ග සිතියම" ඇතුළත් වූ අතර ඊට අදාලව ජාතික සහ උප ජාතික පද්ධති පිහිටුවීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති උත්පාදනය ඇතුළත් විය. 2007 වසරේදී **DisInventar** ආපදා සිද්ධි දත්ත ගබඩාව දියත් කිරීමත් සමඟ ප්‍රතිපත්ති සමෝධානයන සහ වැඩසටහන්කරණය සඳහා වසර ගණනාවක් භාවිත කළ හැකි වාර්තා වූ ආපදා පිළිබඳ ජාතික මට්ටමේ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට හැකි විය. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ විස්තර කර ඇති පරිදි, එතැන් සිට, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සංවිධාන දැක්වූ සහාය මෙන්ම රාජ්‍ය අයවැයෙන් සිදු කළ වෙන් කිරීම් හමුවේ රටේ ආපදා අවදානම් කළමනාකරණ හැකියාව වැඩිදියුණු වීමට හේතු වී ඇත.

මූලික මට්ටමේ කටයුතු සඳහා වන හියෝගෝ රාමුවට **(HFA)** අනුව, ශ්‍රී ලංකාව ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුව **(SFDRR)** සහ යෝජිත වාර්තාකරණ ව්‍යුහයන් පහසුවෙන් අනුගමනය කර තිබේ. සෞඛ්‍ය, අධ්‍යාපනය, දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය සුරැකීම, ඉඩම් පරිහරණය, වෙරළබඩ සහ සාගර කලාප, පළාත් පාලන, හා කර්මාන්ත යනාදී ක්ෂේත්‍රවලට අදාලව ඉදිරිපත් කර ඇති ජාතික රාමු කිහිපයකින් ආපදා අවදානම් අවම කිරීමේ සෙන්ඩායි රාමුව තවදුරටත් ශක්තිමත් වී තිබේ. විශේෂයෙන්ම ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් **(NDCs)** සහ ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති මගින් අවදානම් අවම කිරීම සඳහා දේශගුණික විපර්යාස අනුවර්තනය ඊට ඇතුළත් කිරීමේ වටිනාකම දක්වා ඇත.

මීට අමතරව, 2022 වසරේ නොවැම්බර මාසයේ ඊජිප්තුවේ ෂාම් එල්-ෂෙයික් හි පැවති පාර්ශවයන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේදී **(COP** 27) සහ 2022 වසරේ දෙසැම්බර් මාසයේදී කැනඩාවේ මොන්ට්‍රියල් හි පැවති එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්ව සමුළුවේදී **(COP** 15) ආපදා විභවයන් අවම කිරීමට මෙන්ම අවදානම් මුලිනුපුටා දැමීම සඳහා පාරිසරික පද්ධති සංරක්ෂණයට සහ පාරිසරික පද්ධති සේවා ආයෝජනය කිරීමේ සහ හානි හා අලාභ අවම කිරීමට මෙන්ම සංරක්ෂණය සඳහා සම්පත් සැපයීමට නව්‍ය මූල්‍ය යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරුණි.

ශ්‍රී ලංකා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 20023-2030 **(NDMP** 2023-2030) ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව පදනමක් ලෙස ගෙන දේශගුණික විපර්යාස සහ පරිසර පද්ධතිය මත පදනම් වූ ආපදා අවදානම ඇතුළු ආපදා අවදානම අවම කිරීමට පරිසර පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයන් ඇතුළත් කිරීමට විෂයපථය පුළුල් කළේය. ඒ පාරිසරික පද්ධති පදනම් කරගත් ආපදා අවදානම් අවම කිරීම සහ පරිසර පද්ධති මත පදනම් වූ අනුවර්තනයන් ද සමඟිනි. ශ්‍රී ලංකාවේ ශුෂ්ක සහ අතරමැදි කලාපවල පැරණි වැව් එල්ලංගා පද්ධතිවල ඇති පරිසර පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයන් ද උපයෝගී කර ගනිමින් හරිත යටිතල පහසුකම් සමඟ ආපදා අවදානම අවම කිරීම සඳහා සොබාදහම පදනම් වූ විසඳුම් **(NbS)** භාවිතය ප්‍රවර්ධනය කර ඇත. ස්වාභාවික විපත් අවම කර ගැනීම සඳහා වෙරළබඩ ප්‍රදේශවල කඩොලාන ආරක්ෂා කිරීම සහ මධ්‍යම කඳුකරයේ හරිත අවකාශයන් ආරක්ෂා කිරීම සඳහා ද එම ප්‍රවේශය සලකා බලා ඇත. සම්ප්‍රදායික ආපදාවලින් ඔබ්බට යමින් ගංගා සහ සාගරවල සිදු වන රසායනික දූෂණය, දියේ ගිලීම්, මිනිස් සත්ව ගැටුම්, බෝ වන රෝග සහ වසංගත වැනි නව සහ ඉස්මතු වෙමින් පවතින ව්‍යසන ජාතික සැලැස්ම 2023-2030 ට ඇතුළත් කර ඇත.

2023-2030 කාලසීමාව සඳහා අන්තර් ආපදා කළමනාකරණ කමිටුව විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2022 දෙසැම්බර් මාසයේදී අනුමත කරන ලද අතර, අවශ්‍ය නම් එම කාල සීමාව තුළදී යම් අමතර කරුණක් ඇතුලත් කිරීම සඳහා සංශෝධන සිදු කළ හැකිය.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 හි ප්‍රධාන කුළුණු

ජාතික ආපදා කළමනාකරණ සැලැස්මෙහි මෙම වැඩිදියුණු කළ අනුවාදය ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුව යටතේ ක්‍රියාවට නැංවීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රමුඛතා හතර (4) මත ගොඩනගා ඇති ප්‍රධාන තේමා ක්ෂේත්‍ර හෝ කුළුණු හතරක් මත පදනම් වේ. මෙම කුළුණු 2023-2030 ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අරමුණු හතර ලෙස සලකනු ලබන අතර ඒ අනුව හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පුළුල් මෙහෙයුම් උපාය මාර්ග හඳුනාගෙන ඇත.

- **ප්‍රමුඛතා 1:** ආපදා අවදානම අවබෝධ කර ගැනීම: ආපදා අවදානම් පිළිබඳ වන පූර්ණ අවබෝධය එලදායී ලෙස සම්පත් සැලසුම් කිරීම සහ වෙන් කිරීම සඳහා තීරණාත්මක බව පිළිගැනේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 විවිධ උපද්‍රව සහ අවදානම් සමඟ සම්බන්ධ අවදානම් තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා නවතම විද්‍යාත්මක දැනුම, තාක්ෂණික දියුණුව සහ දත්ත පදනම් කරගත් ප්‍රවේශයන් ඒකාබද්ධ කරයි. මෙම අවබෝධය මැදිහත්වීම්වලට ප්‍රමුඛත්වය දීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති වැඩිදියුණු කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා ඉලක්කගත පියවරයන් ක්‍රියාත්මක කිරීම සක්‍රීය කරයි.
    - **කුළුණු 1:** අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම් සහ පද්ධති
    - **මෙහෙයුම් උපායමාර්ගය 1:** සියලු ආකාරයේ උපද්‍රව, ආපදා සහ අවදානම් ආවරණය වන පරිදි අවදානම් පිළිබඳ දැනුවත්, තාක්ෂණිකව දියුණු සහ සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශයන් හරහා ආපදා අවදානම් කළමනාකරණ පද්ධති, හැකියාවන් සහ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම.
- **ප්‍රමුඛතා 2: ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම:** මනා පාලනයක් සහිත වීම ආපදා අවදානම අවම කිරීමේ පදනමයි ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 බහු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය, දැනුවත් තීරණ ගැනීම සහ ඒකාබද්ධ සැලසුම්කරණය සඳහා පහසුකම් සැලසීම සඳහා ශක්තිමත් ආයතනික රාමු, නීතිමය නියෝග සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණවල අවශ්‍යතාව අවධාරණය කරයි. ආපදා අවදානම් අවම කිරීම ජාතික සහ ආංශික ප්‍රතිපත්තිවලට ප්‍රධාන ප්‍රවාහගත කිරීම, ආන්තික කණ්ඩායම්වල සහභාගීත්වය සහතික කිරීම සහ වගවීම මෙන්ම විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම ඉන් අවධාරණය කෙරේ.
    - **කුළුණු 2:** අවදානම් පාලනය සහ අන්තර් සහභාගීත්වය වැඩිදියුණු කිරීම
      මෙහෙයුම් උපායමාර්ගය 2: ප්‍රමාණවත් නෛතික විධිවිධාන, ආපදා අවදානම් අවම කිරීමේ ඒකාබද්ධ සංවර්ධනය සහ පාර්ශ්වකරුවන්ගේ අර්ථවත් සහභාගීත්වය තුළින් ආපදා අවදානම් පාලනය සෑම තරාතිරමකම වැඩිදියුණු කිරීම.
- **ප්‍රමුඛතා 3: ප්‍රත්‍යාස්ථභාවය සඳහා ආපදා අවදානම අවම කිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම**: ආපදා අවදානම අවම කිරීම සඳහා ආයෝජනය කිරීම සාමූහික ප්‍රත්‍යාස්ථභාවය වෙනුවෙන් සිදු කරන ආයෝජනයකි. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ප්‍රජාවන්, යටිතල පහසුකම් සහ පරිසර පද්ධතිවල ප්‍රත්‍යාස්ථභාවය වර්ධනය කරන ක්‍රියාකාරී පියවරවල වැදගත්කම ඉස්මතු කරයි. අවදානම් අවම කර ගැනීමට සහ අනුවර්තන ධාරිතාව වැඩිදියුණු කිරීමට පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය සහ තිරසාර ඉඩම් පරිහරණය වැනි ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම් එමඟින් දිරිමත් කෙරේ. තවද, ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රයත්න සඳහා තිරසාර අරමුදල් සැපයීම සහතික කිරීමට නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණ සහ අවදානම් සමර්පණය කිරීමේ ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව ද ඉන් පෙන්වා දෙයි.
    - **කුළුණු 3:** හවුල් සබඳතා සහ මූල්‍ය කටයුතු සඳහා පරිසරය සැකසීම
      මෙහෙයුම් උපායමාර්ගය 3: අවදානම් මූල්‍යකරණය, අවදානම් රක්ෂණය සහ කම්පනයට ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂණ වැඩසටහන සඳහා ව්‍යවස්ථාදායක සහ නියාමන රාමු මෙන්ම ක්‍රියාමාර්ග තුළින් පහසුකම් සැලසීම හරහා ප්‍රත්‍යාස්ථභාවය වෙනුවෙන් රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන වර්ධනය කිරීම.
- **ප්‍රමුඛතා 4: යථා තත්ත්වයට පත් කිරීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය ක්‍රියාවලියේදී එලදායී අන්දමින් ප්‍රතිචාර දැක්වීමට සහ "යළි ගොඩ නැගීම" සඳහා ආපදා සූදානම වැඩිදියුණු කිරීම:** සූදානම එලදායී ආපදා කළමනාකරණයේ මූලිකාංගයකි. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීම, ප්‍රජා මූලික සූදානම වැඩිදියුණු කිරීම සහ ප්‍රතිචාර දැක්වීමේ මෙන්ම ප්‍රතිසාධන යාන්ත්‍රණවල ධාරිතාව වර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. එය පරිපූර්ණ

අවදානම් සන්නිවේදනය, පුහුණුව සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්වල වැදගත්කම මෙන්ම සංවර්ධන සැලසුම් ක්‍රියාවලි තුළට ආපදා අවදානම් අවම කිරීම ඒකාබද්ධ කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි..

- **කුළුණු 4:** ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සහ තිරසාර ප්‍රකෘතිමත්භාවය
- **මෙහෙයුම් උපායමාර්ගය 4:** කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීම්, ප්‍රජාවේ ප්‍රත්‍යාස්ථ හැකියාව ගොඩනැගීම සහ ජාතික හා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම තුළින් ආපදා සහ දේශගුණික විපර්යාසවලින් බලපෑමට ලක් වූ සියලුම අංශවල සහ ප්‍රජාවන්ගේ ප්‍රතිචාර දැක්වීමේ සහ තිරසාර ප්‍රකෘතිමත්භාවයක් අත්කර ගැනීම සඳහා වන ඵලදායී සූදානම සහතික කිරීම.

සැලැස්මේ ව්‍යුහය

සාරාංශයක් ලෙස, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ලේඛනය ආපදා අවදානම අවම කිරීම සඳහා පුළුල් සහ උපායමාර්ගික ප්‍රවේශයක් පෙන්වා දෙයි. රටේ අවදානම් අවම කිරීම සඳහා මෙන්ම ප්‍රත්‍යාස්ථ හැකියාව ගොඩනැගීම ඉලක්ක කරගත් ඵලදායී සැලසුම් කිරීම්, ක්‍රියාත්මක කිරීම් සහ අධීක්ෂණය කිරීම සඳහා පැහැදිලි මාර්ග සිතියමක් එය ගෙනහැර දක්වයි.

1 වන පරිච්ඡේදය, "හැඳින්වීම", ආපදා සහ දේශගුණික විපර්යාසවල බලපෑම්වන් එල්ල වන වත්මන් අභියෝග ඉස්මතු කරමින් සන්දර්භාත්මක දළ විශ්ලේෂණයක් සපයයි. එම අභියෝගවලට මුහුණ දීම සඳහා වන බහු-ආංශික සහ බහු-පාර්ශ්වික ප්‍රවේශයක අවශ්‍යතාව, ආපදා අවදානම අවම කිරීම සමඟ පරිසර පද්ධති කළමනාකරණය ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව ඉන් අවධාරණය කෙරේ.

2 වන පරිච්ඡේදය, "අවදානම් පැතිකඩ", ආපදා පිළිබඳ ඉතිහාසමය සහ අවකාශීය රටා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. දැනටමත් දැනුම්වන් උපද්‍රව පමණක් නොව, සම්පාදිත නීති විෂය පථයෙන් ඔබ්බට විහිදෙන නව ආකාරයේ ව්‍යසන ද එමඟින් හඳුන්වා දෙයි. අවදානම් පිළිබඳ මෙම සවිස්තරාත්මක අවබෝධය පුළුල් පරාසයක විහිදෙන සිදුවිය හැකි ආපදා සම්බන්ධයෙන් වන සූදානම වැඩිදියුණු කරයි.

3 වන පරිච්ඡේදය, "ආපදා අවදානම් කළමනාකරණ ප්‍රවේශය", ආපදා අවදානම් අවම කිරීම සඳහා නිශ්චිත ප්‍රවේශයන් ගෙනහැර දක්වයි. එය ස්වභාවධර්මය මත පදනම් වූ විසඳුම් සහ නාගරික ප්‍රවේශයන්වල වැදගත්කම අවධාරණය කරමින් අවදානම් අවම කිරීම සඳහා වන නව්‍ය උපායමාර්ග ගෙනහැර දක්වයි. තවද, මෙම පරිච්ඡේදය අතීතයෙන් පාඩම් උකහා ගන්නා අතර, උගත් පාඩම් වැඩිදියුණු කළ ආපදා කළමනාකරණ පිළිවෙත් සඳහා යොදා ගන්නා බවට සහතික කරයි..

4 වන පරිච්ඡේදය, "ආපදා අවදානම් කළමනාකරණය සඳහා ධාරිතා ගොඩනැගීම", ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023 - 2030** සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. ව්‍යසනවලට ප්‍රතිචාර දැක්වීමේ සාමූහික හැකියාව ශක්තිමත් කිරීම සඳහා සහයෝගිතා පරිසරයක් පෝෂණය කරමින් පාර්ශවකරුවන් අතර හවුල්කාරිත්වයන් සහ හවුල් වගකීම් ගොඩනැගීම අත්‍යවශ්‍ය බව ඉන් අවධාරණය කෙරේ.

5 වන පරිච්ඡේදය, "ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** වැඩසටහන," පාර්ශවකාර නියෝජිතායතන සමඟ සාකච්ඡා කර වැඩිදියුණු කරන ලද ප්‍රමුඛතා ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයයි. මෙම මූල පිරීම් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ නේමාත්මක ක්ෂේත්‍ර හතර **(4)** සමඟ සමපාත වන අතර අවදානම් අවම කිරීම සහ ප්‍රත්‍යාස්ථභාවය වර්ධනය කිරීමට ඉලක්කගත පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි.

6 වන පරිච්ඡේදය, "ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය", ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය වගකීම්, කාල නියමයන් සහ තොරතුරු ගෙනහැර දක්වයි. අධීක්ෂණය සහ ඇගයීම සඳහා ශක්තිමත් රාමුවක් ස්ථාපිත කිරීමෙන්, ප්‍රගතිය අඛණ්ඩව තක්සේරු කළ හැකි අතර, ආපදා අවදානම් අවම කිරීමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ද එමඟින් ඉඩ සැලසේ..

මනා සංවිධාන සහ උපායමාර්ගික අවධානය තුළින්, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ආපදා අවදානම් අවම කිරීමට සහ ප්‍රත්‍යාස්ථභාවය වර්ධනය කිරීම සඳහා රටට පැහැදිලි මඟ පෙන්වීමක් සපයයි. නිර්දේශිත ප්‍රවේශයන් අනුගමනය කිරීමෙන් සහ ප්‍රමුඛතා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන්, අභියෝගවලට මුහුණ දීමට, ප්‍රජාවන් ආරක්ෂා කිරීමට සහ සැමට සුරක්ෂිත මෙන්ම ප්‍රත්‍යාස්ථභාවයෙන්යුත් අනාගතයක් නිර්මාණය කිරීමට ක්‍රියාශීලී පියවර ගත හැකිය.

1 හැඳින්වීම

1.1 රටෙහි සන්දර්භය

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරය තුළ උතුරු අක්ෂාංශ 6- 10 සහ නැගෙනහිර දේශාංශ අංශක 80-82 අතර පිහිටි වර්ග කිලෝමීටර් 65,610 ක භූමියක පැතිරී ඇති ආසන්න වශයෙන් මිලියන 22 ක ජනගහනයක් සහිත සර්මකලාපික දිවයනිකි. කඳුළු බිඳුවක හැඩය ගත් මෙම දේශය තුළ විශ්මිත ලෙස විවිධාකාර භූමි විෂමතා ලක්ෂණ සහිත වන අතර, උස මට්ටම් අනුව වෙන් කර හඳුනා ගත හැකි මධ්‍යම කඳුකරය, තැනිතලා හා වෙරළබඩ තීරය යන සුවිශේෂී කලාප තුනෙන් යුක්තය.

ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය පළාත් නවයකින් (9) සමන්විත වන අතර ඒවා දිස්ත්‍රික්ක 25 කට බෙදා ඇත. දිස්ත්‍රික්කවල පාලන ව්‍යුහය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331 කින් සමන්විත වේ. ඒ යටතේ ග්‍රාම නිලධාරීන් 14,022 ක් අවශ්‍ය පරිපාලන කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීම සඳහා පරිපාලනයේ පහළම මට්ටමේ ක්‍රියා කරයි..

රටක් වශයෙන් ගත්කල ගංවතුර, නායයෑම්, සුළි කුණාටු සහ නියඟය වැනි නිරන්තර ආපදාවල බලපෑමට ශ්‍රී ලංකාව ලක් වේ. දේශගුණය හා සම්බන්ධ මෙම ආන්තික සිදුවීම් මිනිසුන්ගේ සහ සතුන්ගේ ජීවිත හා ආරක්ෂාවට බලපායි. ආපදා මඟින් දේපළවලට හා යටිතල පහසුකම්වලට හානි එල්ල වීම හේතුවෙන් ජනතාවගේ ජීවනෝපාය අඩාල වන අතර එමඟින් රටේ සමස්ත ආර්ථික හා සංවර්ධන කටයුතුවලට බලපෑම් එල්ල වේ.

> **ලක් රජය ග්‍රේලිය උණුසුම් වීම සෙන්ටිග්‍රේඩ අංශක 1.5 ට සීමා කිරීමේ පැරිස් පරමාර්ථවලට උරදීමට පූර්ණ වශයෙන් ඇපකැප වී සිටී. දේශගුණයේ බලපෑමට ලක් වන රටක් ලෙස මෙය වැදගත් ආරක්ෂක කාරණයකි. මෙම ඉලක්කය සපුරා නොගත හොත් ශ්‍රී ලංකාවට සිය වෙරළබඩ තීරයෙන්, පරිසර පද්ධතිවලින් හා කෘෂිකර්මයෙන් වැඩි කොටසක් අහිමි වී යා හැකිය.**
>
> **(ශ්‍රී ලංකාවේ දේශගුණික සෞභාග්‍ය සැලැස්ම - 2022 නොවැම්බර්)**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 87 % පමණ මද හෝ තීව්‍ර ආපදාවට ලක් වන ප්‍රදේශවල වාසය කරති.[1]. ජනගහන ගතිකයන්, ජලය හා ඉඩම් වැනි ස්වභාවික සම්පත් සඳහා ඉහළ යමින් ඇති ඉල්ලුම, සීඝ්‍ර හා අසංවිධිත නාගරීකරණය, ආපදා අවදානම හා නිරාවරණය අන්තර්ග්‍රහණය නොවූ සංවර්ධන සැලසුම්කරණය යන සාධක ආපදා වැඩි වීමේ ප්‍රවණතාවට ප්‍රධාන වශයෙන් දායක වන ඒවායින් සමහරකි. එපමණක් නොව, ඉන්දියන් සාගරයේ සර්ම කලාපීය දූපතක් වන ශ්‍රී ලංකාව එහි කාබන් විමෝචනය අවම වුවද දේශගුණික විපර්යාස නිසා ඇතිවන උවදුරුවලට වඩාත් ගොදුරු විය හැකි රටක් ලෙසට හඳුනාගෙන ඇත.[2]

මෝසම් සුළං මඟින් මෙහෙයවෙන දේශගුණය මිලි මීටර් 1,860 ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයක් ලබා දෙන අතර, එය මධ්‍යම කඳුකරයේ (මුහුදු මට්ටමේ සිට මීටර 2,000 ට වඩා උස ප්‍රදේශයේ) බෑවුම්වල මිලි මීටර් 5,500 සහ වයඹ හා ගිනිකොණ වියළි ප්‍රදේශවල මිලි මීටර් 950 අතර පරාසයක පවතී. සාමාන්‍ය වාර්ෂික වායුගෝලීය උෂ්ණත්වය තැනිතලාවෙහි සෙල්සියස් අංශක 24 හා 31 අතර සහ මධ්‍යම කඳුකරයේ 18^0 හා 27^0 අතර පවතී.

---

[1] ලෝක බැංකුව **2018,** *දකුණු ආසියාවේ තීව්‍ර ප්‍රදේශ : ජීවන මට්ටම් මත උෂ්ණත්වයේ හා වර්ෂාපතනයේ බලපෑම්.* දකුණු ආසියාවේ සංවර්ධන කාරණා

[2] පරිසර අමාත්‍යාංශය **(2021).** දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය කොළඹ:, පැරිස් ගිවිසුම යටතේ යාවත්කාලීන කරන ලද ජාතික වශයෙන් තීරණය කළ දායකත්වය

2016 වර්ෂය තුළ වර්ෂ 18 කින් වාර්තා වූ වැඩිම වර්ෂාපතනය මගින් දිස්ත්‍රික්ක 25 24 ක් තුළම උත්තේජනය කරන ලද ජලගැලීම් හා නාය යාම් දේශගුණික විපර්යාසවල බලපෑමක් නිසා ඇති වූවක් විය හැකිය. තවද, මධ්‍යම කඳුකරයෙන් පටන් ගෙන ඉන්දියන් සාගරය දක්වා ගලන කඳුවැටියේ සිට මුහුදු පරය දක්වා ඇති කරන සම්බන්ධකය ශ්‍රී ලංකාවේ ගංගා 103 ජල කාලගුණික ආපදාවන් සම්බන්ධයෙන් මුඛ්‍ය කාර්යභාරයක් ඉටු කරන අතර එමගින් මඩාත් ප්‍රත්‍යාස්ථ (ඉක්මණින් හා පහසුවෙන් යථා තත්ත්වට පත් වීමේ සමත්) හා තිරසාර ජාතියක් සහතික කරනු පිණිස රට පුරාම පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීම හා සංවර්ධනය අතර සමබරතාවක් ඇති කර ගැනීමේ වැදගත්කම මැනවින් පෙන්වා දෙයි.

ශ්‍රී ලංකාව කෝවිඩ්-19 වසංගතයට පසුව ඉහළට පැමිණෙමින් සිටි අතර පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකින් ගොඩ ඒමට ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. එමෙන්ම එය දේශගුණික විපර්යාස මගින් අධිකවම පීඩාවට පත් රටවලින් එකක් ලෙසද සැලකේ.[3] ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු ලෙස දායක වන සංචාරක, ධීවර, වැවිලි හා කෘෂිකර්ම වැනි ක්ෂේත්‍ර දේශගුණික සංවේදී ඒවා වන අතර, මෝසම් සුළං හා වර්ෂාපතනයේ රටාවන්හි, විශාලත්වයේ, දීර්ඝත්වයේ, කාලයේ හා තීව්‍රතාවේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන බාධක මගින් බලපෑමට ලක් වේ.

1.2 සමාජ-ආර්ථික සන්දර්භය

ශ්‍රී ලංකාව වර්ගීකරණය කර ඇත්තේ ශ්‍රම බලකායෙන් 30%කට පමන රැකියා සපයන සේවා අංශය (2019 වර්ෂයේදී 58%ක්)[4] මත ප්‍රධාන වශයෙන් යැපෙන පහළ මැදි ආදායම් රටක් ලෙසය. ශ්‍රී ලංකාව සැලකිය යුතු ලෙස පොසිල ඉන්ධන මත හා කෘෂිකර්මය හා කර්මාන්ත අංශය සඳහා ආනයනික යෙදවුම් මත යැපෙන අතර එමගින් ගෝලීය කම්පනයන්ට ඇති අවදානම්-පාත්‍ර බව මෙන්ම ගෝලීය ආර්ථික ප්‍රවණතාවන්ට ඇති සංවේදීතාව කැපී පෙනේ. බොහොමයක් කුඩා පරිමාණ අය වන මිලියන දෙකකට අධික පිරිසක් කෘෂිකර්මයෙහි නියැළෙන අතර, දේශගුණයේ විචලනයන් ප්‍රධානතම අවධානයකි. කෝවිඩ්-19 වසංගතයේ ඵලයන් කෙරෙන් යලි ප්‍රකෘතිමත් වීමට ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජය වෙර දරමින් සිටියදී, දේශීය මුදල් ඒකකය ස්ථායි කරනු පිණිස අවශ්‍ය විදේශ මුදල් සංචිත නිහ වීම හේතුවෙන් මෑතකදී ශ්‍රී ලංකාවේ රුපියල අවප්‍රමාණ වීම මගින් තත්ත්වය තවත් උග්‍ර කරනු ලැබීය. රජය හරිත වගා පැකිකඩෙහි උපරිම ඵල නෙලන අතරේ උචිත ප්‍රතිපත්ති, මූල්‍ය දිරිගැන්වීම් හා තාක්ෂණික සහාය සමගින් පවත්නා ආර්ථික අවපාතයේ ඵල සමනය කිරීමට හැකි වන සේ නිෂ්පාදන හා සේවා අංශ තුළ ආයෝජනය දියුණු කිරීම රජයේ ප්‍රධාන උපායමාර්ගයයි.

1.3 හානි හා අලාභ

ජලගැලීම්, නාය යාම්, සුළි සුළං, වෙරළ බාදනය ආදී ස්වභාවික ආපදා සහ නියං, මුහුදු මට්ටම ඉහළ යාම, උෂ්ණත්වය ඉහළ යාම, සමුදුරු අම්ලකරණය, කර්මාන්තමය, කෘෂිකාර්මික හා නාගරික දූෂණය වැනි සෙමෙන් සිදුවන සිදුවීම් මගින් ජල තත්ත්වය පරිහානි, ලවණතාව, ඉඩම් හා වන භායනය, ජෛව විවිධත්වය අහිමි වීම හා කාන්තාරකරණය, ජීවිත හා දේපළ අහිමි වීම් සහ සෘජු හා වක්‍ර බලපෑම් සහිත හානි වෙත මග පාදා ඇත. කෘෂිකර්මාන්තය, ධීවර කටයුතු, බලශක්තිය, ප්‍රවාහනය, නාගරික සංවර්ධනය, කර්මාන්ත හා වාණිජ කටයුතු යනාදිය නිතර ඇති වන උපද්‍රව හේතුවෙන් සැලකිය යුතු හානි හා අහිමි වීම් අත් විඳින ප්‍රධාන ක්ෂේත්‍ර ලෙස හඳුනා ගෙන තිබේ.

[3] ගෝලීය දේශගුණික අවදානම් දර්ශකය **2021** - ජගත් | සහන වෙබ් අඩවිය **World | ReliefWeb**


[4] ශ්‍රී ලංකා මහ බැංකුව **2020** වාර්ෂික වාර්තාව

ලෝක බැංකුවට අනුව, ශ්‍රී ලංකාව වාර්ෂිකව නිවාස, යටිතල පහසුකම් හා කෘෂිකර්ම අංශයන්ගෙන් මෙන්ම හානි වූ දේපළ ප්‍රතිසංස්කරණය හා සහන සඳහා රුපියල් බිලියන 50 ක (ඩොලර් මිලියන 300 ක) අලාභයක් අත්විඳී. ඇති වූ සමස්ත ඇස්තමේන්තුගත අලාභයන් අතරින් රුපියල් බිලියන 32 ක් (ඩොලර් මිලියන 200 ක්) ජල ගැලීම් මගින් යැයි දැක්වේ. සුළි සුලං හා කුණාටු මගින් රුපියල් බිලියන 11 ක හානියක් අත් කෙරෙන අතර, නියං හා නාය යෑම් නිසා පිළිවෙළින් රුපියල් බිලියන 5.2 ක් (ඩොලර් මිලියන 32 ක්) හා රුපියල් බිලියන 1.8 ක් (ඩොලර් මිලියන 11 ක්) අහිමි වේ. එය දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) හා රජයේ සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් 0.4% ක් හා 2.1% ක් නිරූපනය කරයි.මෙම අලාභයන් රජයට සැලකිය යුතු මූල්‍ය බරක් ඇති කරයි. තවද, ඇස්තමේන්තුගත හානි හා අලාභ මගින් හානියට පත් වූ වත්කම් තාවකාලිකව නොමැති වීම නිසා වූ ආර්ථික අලාභ, නිෂ්පාදන අලාභ, ව්‍යාපාරික අලාභ, ආදායම් අලාභ ආදිය දැක්වේ. කෙසේ වුවද, මැනීම හෝ ප්‍රමාණනය කිරීම අභියෝගයක් වන, දේශගුණික විපර්යාස ඇතුළු ආපදා හේතුවෙන් ඇති වන සෙමෙන් සිදු වන බලපෑම්වල සෘණාත්මක බලපෑම් හේතුවෙන් ඇති වන ඉතා වැදගත් වන ආර්ථික-නොවන අලාභ (NEL) කොටසක්ද ඇත. සුලභ ආර්ථික-නොවන අලාභ (NEL) කොටසට මිනිස් ජීවිත, අර්ථාන්විත ස්ථාන, සංස්කෘතික කෞතුක භාණ්ඩ, ජෛව විවිධත්වය, පොදු ස්ථාන, නිෂ්පාදන භූමි, පුරුෂාර්ථ පද්ධති, අනන්‍යතාව ආදිය ඇතුළත් වේ.

පොදු යටිතල පහසුකම්වලට සිදු වන හානි මගින් නියතවම ව්‍යාපාරික මෙහෙයුම් හා සැපයුම් දාම බිඳ වැටෙන අතර එමගින් සමස්ත ආර්ථික අලාභයන්ට තවත් එකතු වේ. ආපදාවන්හිදී ඇති වන වත්කම් හා යටිතල පහසුකම්වල විශාල කොටසක් පෞද්ගලික අංශය අත්විඳී. ප්‍රවාහනය, බලශක්තිය, ඉදිකිරීම්, ජලය, සන්නිවේදනය, අධ්‍යාපනය හා සෞඛ්‍යය ඇතුළු තීරණාත්මක දේශගුණික-ප්‍රත්‍යාස්ථ යටිතල පහසුකම් අංශවල රාජ්‍ය ආයෝජනය ප්‍රත්‍යාස්ථ සමාජ හා ව්‍යාපාර ගොඩනගනු පිණිස අතිශය වැදගත් වේ. ආපදා බලපෑම්වල ප්‍රති-ආදේශ කිරීමේ පිරිවැය හා ආවස්ථික පිරිවැය සලකා බලන කල, හානි හා අලාභ අවම කර ගැනීම උදෙසාත්, එක්සත් ජාතීන්ගේ (UN) තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සාක්ෂාත් කර ගැනීම උදෙසාත් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයට අවදානම්-සංවේදී සංවර්ධනය වැදගත්ය.

1.4 දේශගුණික විපර්යාස අභියෝග

දේශගුණික විපර්යාසයේ විභව්‍ය බලපෑම්වලට (1 රූපය): කඳුකර වාසභූමිවල ජල ක්‍රමිකකරණය පහත වැටීම; ශුෂ්ක හා අර්ධ ශුෂ්ක කලාපයන්හි ජලය හිඟකම හා ජල තත්ත්වය අයපත් වීම; බොහෝ පාරිසරික පද්ධති මත අහිතකර ඵල ඇති වීම; ජල විදුලිය මත විශ්වාසය තැබීම අඩු වීම; අඩු කෘෂිකාර්මික ඵලදායිත්වය; ධීවර භූමි මත අහිතකර ඵල; ආහාර සුරක්ෂිතතාවට තර්ජන; මුහුදු මට්ටම ඉහළ යාම හා වෙරළබඩ පහත් බිම් යට වීම; වෙරළබඩ ඉඩම්වලට ලවණතාව පිවිසීම හේතුවෙන් ඒවා කෘෂිකාර්මික වශයෙන් ඵලදායි නොවන තත්ත්වයට පත් වීම සහ මැලේරියා හා ඩෙංගු වැනි වාහකයින් විසින් ගෙන යනු ලබන රෝග සිදුවීම් ඉහළ යාම ඇතුළත්ය.



1 රූපය. දේශගුණික විපර්යාසවල බලපෑම්


ඒ අනුව, දේශගුණික විපර්යාස මගින් කෘෂිකර්මය, ධීවර හා සංචාරක කටයුතු, යටිතල පහසුකම් හා වෙරළබඩ සංවර්ධනය ඇතුළු මෙරට තීරණාත්මක ක්ෂේත්‍ර කිහිපයක් බලපෑමට ලක් විය හැකිය. දේශගුණික ඵල අවම කිරීම හා දේශගුණික අනුවර්තනය සඳහා අවධානය යොමු කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම ආපදා අවදානම් අඩු කිරීම හා දේශගුණික අනුවර්තනය සඳහා උරදෙනු වස් දැඩි ලෙස දේශගුණික මූල්‍ය සම්පාදනය වෙත යොමු වීමත් අතිශයින් වැදගත් වේ.

1.5 ආපදා හා පාරිසරික පද්ධති අතර සම්බන්ධය

දේශගුණයේ, භූවිෂමතාවෙහි හා වෙනත් අංගයන්හි මෙම විවිධත්වය ශ්‍රී ලංකාවට රට අභ්‍යන්තරයේ, වෙරළබඩ හා සමුද්‍රයේ අගනා පාරිසරික පද්ධති හා ආශ්‍රිත සේවා එකතුවක ආශීර්වාදය ලබා දී තිබේ. මෙම පාරිසරික පද්ධති ශ්‍රී ලංකාවේ කර්මාන්ත, කෘෂිකාර්මික, සංචාරක, ධීවර හා නාගරික සේවාවන්හි තිරසාරභාවය සඳහා මෙන්ම, ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස ජනප්‍රිය කරවීම සඳහා වැදගත් වේ. අඛණ්ඩ ලෙස සංවේදී පාරිසරික පද්ධති විනාශ කිරීම හා පාරිසරික පද්ධති සේවාවන් පරිහානියට පත් වීම යන සාධක ආපදා සිදුවීම්වල විශාලත්වයට දායක වේ. මධ්‍යම කඳුකරයේ ඉඩම් හායනය සහ වන හානිය මගින් වලාකුළු ග්‍රහණය අවම වීම, වැව්වල හා ජලාශයන්හි බාදනය හා රොන්මඩ වැඩි වීම සහ ජල පද්ධතීන්ට බලපෑම් එල්ල වීම සිදු වීමෙන් නියං, ගංවතුර හා නාය යෑම් වෙත මග පෑදෙන අතර කෘෂිකර්මය, වාරිමාර්ග, නාගරික සේවා හා ජලවිදුලි උත්පාදනය සඳහා ඇති ජලයට බලපෑම් ඇති වනු ඇත. වෙරළබඩ හා සමුද්‍රය ආශ්‍රිත පාරිසරික පද්ධති හායනය මගින් වෙරළබඩ උපද්‍රව වඩාත් අයහපත් අතට පත් කොට ධීවර, සංචාරක හා වෙනත් වෙරළබඩ ජීවනෝපායන්හි ඵලදායිත්වය අවම කරනු ඇත.

1.6 සංකීර්ණතාව හඳුනා ගැනීම

ආපදා අවදානම් පිළිබඳව ඇති උපද්‍රවකාරිත්වයන්, අවදානම් පාත්‍රතාව හා නිරාවරණය අතිරේක ගාමකයන් විසින් වැඩිදුරටත් අධික කොට සංකීර්ණ කරනු ලබයි. දුර්වල ලෙස සැලසුම් කරන ලද සංවර්ධනය, දරිද්‍රතාව ආශ්‍රිත පාරිසරික හායනය සහ දේශගුණික විපර්යාසය[5] (2 රූපය) යන මේවා ආපදා අවදානම් කළමනාකරණ සූදානම්තාව, සැලසුම්කරණය හා නිරීක්ෂණය තුළ මුඛ්‍ය වැදගත්කමකින් යුතු සංරචකයන්ය.



2 රූපය. ආපදා අවදානම හා ගාමකයෝ

[5] ලෝක බැංකුව - සංවර්ධනය තුළට දේශගුණික හා ආපදා අවදානම් අන්තර්ග්‍රහණය කිරීම - **https://documents1.worldbank.org/curated/en/653931468340471918/pdf/826480WP0v20Bu0130Box37986200OUO090.pdf**

මෙම සාමාජීය, ආර්ථික හා පාරිසරික ගාමකයන් වනාහි විවිධ ක්ෂේත්‍රවල දායකත්වයන්හි සමුච්චිත බලපෑම වන අතර, ඒවා සම්බන්ධයෙන් අවදානම් අවම කිරීම සඳහා අනාගත ප්‍රයත්න, බහුවිධ ක්ෂේත්‍ර හා කොටස්කරුවන් පිළිබඳව එක විට කටයුතු කිරීම, ක්ෂේත්‍ර සිසාරා ආපදා අවදානම් කළමනාකරණය සහ බහුවිධ කොටස්කාර ආයතනයන්හි ධාරිතාව ගොඩනැගීම අවශ්‍ය වේ.

ආපදා කළමනාකරණ සැලසුම්කරණයේ, ක්‍රියාත්මක කිරීමේ, මූල්‍යකරණයේ හා නිරීක්ෂණයේ සාර්ථකත්වය සඳහා දේශීය හා ජාත්‍යන්තර දැනුම, තාක්ෂණය, විශිෂ්ටතම පිළිවෙත්, නෛතික හා සම්මුති ආශ්‍රිත සම්පාදනයන්, නව හා මතු වෙමින් එන වාතාවරණයන්ට බහු ආංශික හා බහු කොටස්කාර සංයෝජනයන් සමගින් අනුවර්තනය වීමේ හැකියාව සහ මෙම සාධකයන්ට සංශක්ත හා සම්මුහුර්ත ආකාරයකට ක්‍රියාත්මක වීම සඳහා කාර්ය පරිසරය ඇති කිරීම අවශ්‍ය වේ.

ආපදා කළමනාකරණය තුළ සඵලදායී ලෙස නියැලීම සඳහා වූ මෙම හැකි කරවන පරිසරයට ආපදා කළමනාකරණය සම්බන්ධ මෙරට තන්ත්‍රණ පද්ධතිවල මෙන්ම ගෝලීය රාමුවල සහ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි වෘත්තීයවේදීන් අත් කර ගෙන ඇති දැනුම හා අත්දැකීම්වලද පිටුබලය ලැබේ. අවදානම් සම්බන්ධයෙන් දැනුවත්, දේශගුණයට හා පාරිසරික පද්ධතියට සංවේදී හා අන්තර්ග්‍රාහී හැකියාව ඇති කරවන පරිසරය ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම — 2023-2030 තුළ දක්වා ඇත.


1.7 ආපදා කළමනාකරණ රාමුව

මෙරට සර්ව-ග්‍රාහක ආපදා කළමනාකරණ රාමුව සකස් කරන ලද්දේ 2004 විනාශකාරී ඉන්දියන් සාගර සුනාමි බෙදවාවනයට පසුව පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නිර්දේශ මත පදනම්ව වන අතර, එය 2005 මැයි මස අංක 13 දරන ආපදා කළමනාකරණ පනත[6] සකස් කිරීමට මග පෑදීය.
මෙහි මින් මතු පනත යනුවෙන් හඳුන්වනු ලබන ආපදා කළමනාකරණ පනත ජාතික හා උප-ජාතික මට්ටමේදී ආපදා ආශ්‍රිත කාරණා සම්බන්ධීකරණය කරනු නෛතික පදනම, උපායමාර්ගික දිශානතිය හා ආයතනික ව්‍යූහය සැපයීය.

මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනාධිපතිතුමා ප්‍රධානත්වය දරන හා අග්‍රාමාත්‍යතුමා උප සභාපති තනතුරු හොබවන ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ මාර්ගෝපදේශකත්වය ඇතිවය.

විරුද්ධ පක්ෂයේ නායකයා මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් පස්දෙනෙක්, පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරු සහ ආපදා කළමනාකරණ පනතේ සඳහන් විෂයන් විසි එක (21) හාර අමාත්‍යවරු ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ (**NCDM**) අනෙකුත් සාමාජිකයෝ වෙති (3 රූපය). ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ උපායමාර්ග ප්‍රධාන වශයෙන් පාලනය වන්නේ 2010 දෙසැම්බර් 28 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද, 2013 ප්‍රතිශෝධිත ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය මගිනි.

[6] ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත | **VII** වෙළුම (**srilankalaw.lk**)



3 රූපය. ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ ව්‍යූහය

1.8 යාවත්කාලීන කරන ලද ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් සඳහා තාර්කික පදනම

ආපදාවලින් ඇති වන හානි හා අලාභ අඛණ්ඩව ආර්ථිකය හා ජනතාව මත සැලකිය යුතු ඍණාත්මක බලපෑම් ඇති කරයි. යථා තත්ත්වයට පත් කිරීමේ වියදම ඉහළ යාම නිසා, ජාතික හා ප්‍රාදේශීය යන මට්ටම් දෙකෙහිම සහ සමාජ-ආර්ථික ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අඩු කිරීම **(DRR)** මුඛ්‍යධාරාගත කිරීමේ අවශ්‍යතාව ඇතිව තිබේ. 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත තුළ විස්තර කර ඇති උපද්‍රවයන්ට අමතරව, සැලසුම් කිරීමේදී මතු වෙමින් ඇති වසංගත, රසායන ආශ්‍රිත සෙමෙන් ක්‍රියාත්මක වන ආපදා, දේශගුණික විපර්යාස මගින් සාම්ප්‍රදායික ආපදා රටාවන්හි උත්තේජනය කරනු ලබන වෙනස්කම් ආදියද සැලකිල්ලට ගැනීමට සිදු වේ. අතීත ආපදා කළමනාකරණ සැලැසුම්වල හා ගෝලීය සංවර්ධනයන්හි කළමනාකරණ හා ක්‍රියාත්මක කිරීමේ සඵලදායීතාව පිළිබඳව මෑත කාලීන සමාලෝචනයදී, පෙර පැවති 2013-2017 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** සමාලෝචනය හා යාවත්කාලීන කිරීම සඳහා පහත සඳහන් ඒවා වැදගත් බව පෙන්වා දී තිබේ:-

ප්‍රත්‍යාස්ථ සංවර්ධනය සඳහා ආපදා අවදානම පෙළගැස්වීමේ සහ ප්‍රධාන ධාරාවේ හිඩැස්: වසර ගණනාවක් පුරා, රට ආපදා, දේශගුණික විපර්යාස, ජල කළමනාකරණය යනාදියට අදාළ අංශ ප්‍රතිපත්ති, භාවිතයන් සහ ප්‍රමිතීන් සකස් කර ඇත. කෙසේ වෙතත්, සම්බන්ධීකරණය නොකළ, අකාර්යක්ෂම සහ තොරතුරු නොමැතිකම මත පදනම් වූ ඒකාබද්ධ කළමනාකරණ ලුහුබැඳීමේ පද්ධති ප්‍රශස්ත සංවර්ධන ප්‍රතිඵලවලට වඩා අඩු ප්‍රවාහයකට දායක වී ඇති අතර ප්‍රධාන ධාරාව දුර්වල වෙමින් පවතී. සංවර්ධනයේ දී ආපදා අවදානම සහ දේශගුණික විපර්යාස අනුවර්තනය වීම.

ආපදා අවදානම් අඩු කිරීම ප්‍රධාන ප්‍රවාහගත කිරීම සඳහා 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතේ පූර්ණ විභවය භාවිත කිරීම : ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව (NCDM) සහ රට තුළ ඇති පළාත්, දිස්ත්‍රික් සහ පළාත් පාලන යාන්ත්‍රණයන්හි පූර්ණ විභවයන් අවදානම් අවම කිරීමේ ප්‍රවේශයන් අනුගමනය කිරීම සඳහා බලමුලු ගැන්විය යුතුය. ශක්තිමත් පදනමක් සහිත අවදානම් පිළිබඳ දැනුවත් සංවර්ධන සැලසුම් කිරීම, ඒ සඳහා නව තාක්ෂණයන් භාවිතය සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් (EIAs), මූලික පාරිසරික පරීක්ෂණ (IEEs), උපායමාර්ගික පාරිසරික ඇගයීම් (SEAs) වැනි සංවර්ධන මෙවලම් ඇතුළත් කර ඇත.

රජයේ ආධාරදායකයින් හා වෙනත් ගෝලීය හා කලාපීය අනුග්‍රාහකයන් අතර සම්බන්ධීකරණය: තිරසාර සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇති

විවිධ රාජ්‍ය හා පුද්ගලික අංශයේ සංවිධාන මෙන්ම හරිත දේශගුණ අරමුදල (GCF), ගෝලීය පරිසර අරමුදල (GEF) වැනි සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGOs) හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන (LNGOs) මෙන්ම වෙනත් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ව්‍යාපෘති රාශියක් පවතී ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණික සුහුරු ප්‍රවේශයන් සංස්ථාගත කිරීමත් සමඟ මෙම ව්‍යාපෘති වඩාත් ප්‍රත්‍යාස්ථ සහ තිරසාර වනු ඇත. සම්බන්ධීකරණ කළමනාකරණ පසුවිපරම් සහ සන්නිවේදනයන් මඟින් ආපදා අවදානම් අවම කිරීමේ සහ දේශගුණ සංවේදී ප්‍රවේශයන් ඇතුළු නව්‍යමය, උසස් තාක්ෂණික, තිරසාර මූල්‍යකරණ සහ හවුල්කාරිත්වයෙන් යුත් අවස්ථා වැඩිදියුණු කරනු ඇත.

4 රූපය. යාවත්කාලීන කරන ලද ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් සඳහා තාර්කික පදනම

මෙම සන්දර්භය තුළ, දේශගුණිකව සුහුරු තිරසාර සංවර්ධනය ආමන්ත්‍රණය කරන ආපදා අවදානම් කළමනාකරණය ආහාර, බලශක්තිය හා වෙනත් නිෂ්පාදන හා සේවා ආශ්‍රිත ආදායම් උත්පාදනයන් අංශයෙන් අනාරක්ෂිතතා වෙත සබැඳියන් සහිත තීරණාත්මක ජාතික ප්‍රමුඛතාවන් ලෙස මතු වී ඇත. තිරසාර සංවර්ධනය කරා මග පාදමින්, සඵලදායී ලෙස ආපදා හානි හා අලාභයන් අවම කිරීමටත්, ආයෝජනයන්හි ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීමටත්, ජනතාවගේ ජීවිත ගුණාත්මකතාව වැඩිදියුණු කිරීමටත් කෙටි, මැදි හා දීර්ඝ කාලීන අරමුණු හා ක්‍රියාමාර්ග සහිත ක්‍රමානුකූල හා ස්ථාවර ආපදා හා දේශගුණික අවදානම් කළමනාකරණ උපායමාර්ගවලට හැකියාව තිබේ.

1.9 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (NDMP) 2023- 2030

ඒ අනුව, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) 2023 - 2030 කරනු ලබන්නේ සංවර්ධන සැලසුම්කරණය හා ආයෝජන තීරණ තුළට ආපදා අවදානම් අන්තර්ගත කිරීම මගින් ජීවිත, ජීවනෝපායන් හා දේපළ ආරක්ෂා කරනු පිණිස සියලු ක්ෂේත්‍ර තුළ අවදානම අඩු කිරීමේ සාකල්‍ය ප්‍රවේශයක් වශයෙනි. එමෙන්ම 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ආපදා අවදානම් අඩු කිරීම හා දේශගුණික විපර්යාසවල ඵල පහත හෙළීම හා අනුවර්තනය මුඛ්‍යධාරාගත කිරීම උදෙසා සියලු සංවර්ධන ක්ෂේත්‍රයන්හි මුදල් හා උචිත තාක්ෂණය සපයා ගැනීම, ධාරිතා සංවර්ධනය, ගැඹුරු පර්යේෂණ සිදු කිරීම හා පුහුණු මානව සම්පත් බඳවා ගැනීම සඳහා වූ මාර්ග කෙරෙහි අවධානය යොමු කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මෙම 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) සකස් කළේ තිරසාර සංවර්ධනය, ආපදා අවදානම් අඩු කිරීම හා දේශගුණික විපර්යාසවල ඵල අඩු කිරීම හා අනුවර්තනය පිළිබඳ ජාතික ප්‍රමුඛතාවන් හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති රාමු සමග දිශාගත වන පරිදිය. ජාතික සංවර්ධන දැක්ම 2015-2030, ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව (**SFDRR**), එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන පරමාර්ථ, පැරිස් ගිවිසුම හා 2020 න් පසු ගෝලීය ජෛව විවිධත්ව න්‍යාය පත්‍රය මෙන්ම 2022 දේශගුණික සෞභාග්‍යතා සැලැස්ම (**CPP**) වැනි උන්නතිකාමී ආර්ථික වර්ධන සැලසුම් යටතේ වූ ඇපකැප වීම් සමග දිශානුගත වන පරිදි මෙරට ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ 2030 වර්ෂයේ උපායමාර්ගික දිශානතිය නියම කිරීම ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ (**NDMP**) ඉලක්කයයි.

තවද, වේගවත් ආර්ථික ප්‍රකෘතිමත් වීම සහ ශුද්ධ ඍණ කාබන් විමෝචනය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේදී (**COP 27**) ශ්‍රී ලංකාව "දේශගුණික සෞභාග්‍ය සැලැස්ම (**CPP**)" දියත් කරන ලද අතර නියම කරන ලද එහිදී ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ අදාළ ක්‍රියා සහ උපායමාර්ග ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** මඟින් පැහැදිලි කෙරේ. ශ්‍රී ලංකාවේ දේශගුණික සෞභාග්‍ය සැලැස්ම මගින් ජලය, වන වගාව, ප්‍රවාහනය සහ සංචාරක ක්ෂේත්‍ර සඳහා වන සමාන අභිලාෂකාමී ඉලක්ක ඇතුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ඉහළ නැංවීමේ දැඩි අපේක්ෂාව ද ප්‍රකාශයට පත් කර තිබේ. දේශගුණික සෞභාග්‍ය සැලැස්ම ශ්‍රී ලංකාවට ආර්ථිකය පුනර්ජීවනය අත් කර ගැනීමට, රැකියා අවස්ථා ඉහළ නැංවීමට සහ සමස්ත ආර්ථික වර්ධනය සඳහා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට මෙන්ම දේශගුණයට අනුවර්තනය වීමටත් වේගවත් පසු විපරමක් සිදු කිරීමටත් මහ හෙළි කරයි.

දැක්ම

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ (NDMP)දැක්ම වන්නේ "සැලකිය යුතු ආපදා අලාභ හා හානි අඩු කරමින් ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීම සහතික වීම" ය.

පරමාර්ථය

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ (NDMP) පරමාර්ථය වන්නේ "නව අවදානම් වැළැක්වීම, පවත්නා අවදානම් අඩු කිරීම හා ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීමයි.

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) 2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සහ 2023-2030 ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යන දෙකෙහි විධිවිධාන මත පදනම්ව 2013 වර්ෂය තුළ සංවර්ධනය කර තිබේ. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) අවදානම් අඩු කිරීම හා ආයෝජන කෙරෙහි විශාල අවධාරණයක් සහිත ප්‍රත්‍යාස්ථ ජාතියක් ගොඩනැගීම උදෙසා වූ උපායමාර්ගික දිශානතිය ලබා ගනුයේ බහු-ආංශික ප්‍රවේශයක් හරහාය. එය ආපදා න්‍යාසයෙහි සියලුම අදියරයන් ආවරණය කරමින්, වත්මන් හා අනාගතවාදී ආපදා සන්දර්භ සලකා බලන අතරේ, අතීතයේදී ඉගෙන ගත් පාඩම්, රට තුළ හා කලාපය තුළ ආපදා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් මත ගොඩනගයි.

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) දේශගුණික හා ජෛව විවිධත්වය ආශ්‍රිත මූල්‍යකරණයෙහි වාසිය ලබා ගන්නා අතර, අවදානම් අඩු කිරීමෙහිදී දේශගුණික වශයෙන් සුහුරු පාරිසරික පද්ධති පාදක ප්‍රවේශයන් ගණනාවක් අන්තර්ගත කර ගෙන ඇත. එමෙන්ම එය පාරිසරික පද්ධති-පාදක ආපදා අවදානම් අඩු කිරීම (**Eco-DRR**) [7], පාරිසරික පද්ධති-පාදක දේශගුණික අනුවර්තනය (**EbA**)[8]

[7] **UN Environment – Disasters, Environment and Risk Reduction – Eco-DRR Master's Module, Instructor's Manual | UNEP - UN Environment Programme.** එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන - ආපදා, පරිසර හා අවදානම් අඩු කිරීම (**Eco-DRR**) උපදේශක අත්පොත / එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන වැඩසටහන - එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන

[8] **FAO - Ecosystem-based Adaptation | Integrating Agriculture in National Adaptation Plans (NAPs) | Food and Agriculture Organization of the United Nations fao.org** ආහාර හා කෘෂිකර්ම සංවිධානය (**FAO**) / ජාතික අනුවර්තන සැලසුම් තුළට කෘෂිකර්මය සමෝධානය කිරීම (**NAPs**) / එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (**FAO**)

සොබාදහම-පාදක විසඳුම් (**NbS**)[9] තුළ සඳහන් විශිෂ්ටතම ගෝලීය කළමනාකරණ පිළිවෙත්වලට අමතරව, වාරි දියබස්නා පද්ධති හා ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම වැනි ඓතිහාසික ආපදා කළමනාකරණ පද්ධතිවල වාසිය ප්‍රයෝජනයට ගනී. . එමෙන්ම 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) ජාතික හා උප-ජාතික මට්ටම්වලින් සර්ව-සාධාරණ, සැම-ඇතුළත්, ස්ත්‍රී-පුරුෂ ප්‍රතිචාරී, ළමා කේන්ද්‍රික හා සහභාගී ආපදා අවදානම් පහළ දැමීම් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම මුඛ්‍යධාරාගත කිරීම සඳහා පහසුකම් සලස්වයි. එම නිසා, 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ප්‍රත්‍යාස්ථතාව ගොඩනැගීම පිණිස වූ අවදානම්-සංවේදී හා තිරසාර සංවර්ධනය සැලසුම් කිරීමට හැකියාව ඇති කරයි.

මෙම සැලැස්මෙන් ආපදා කළමනාකරණය යන විෂයට සම්බන්ධ ජාතික හා අනු-ජාතික (පළාත්, දිස්ත්‍රික්, කොට්ඨාස, පළාත් පාලන ආයතන, ග්‍රාම නිලධාරී කොට්ඨාස) මට්ටම්වල රාජ්‍ය නියෝජිතායතන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන (**CSOs**), විද්වතුන්, පර්යේෂකයින් හා වෘත්තීයවේදී සංවිධාන සඳහා මගපෙන්වීම අපේක්ෂා කෙරේ.

1.9.1 බහු-කොටස්කාර ප්‍රවේශය

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) තුළ උපයෝගී කර ගනු ලබන බහු-කොටස්කාර ප්‍රවේශය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා සහ දෙවරක් සිදු කිරීම වළක්වා ගනිමින් සීමිත සම්පත් සඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා ඉඩ සලසනු ඇත. ආපදා අවදානම් කළමනාකරණ රාමුව යටතේ ඇති නිරීක්ෂණය කරන ඇතැම් ලද දුර්වලතාවන් හවුලේ තොරතුරු හැසිරවීම, සහයෝගිතාව, සම්බන්ධීකරණය හා ධාරිතා ගොඩනැංවීම සමග ඒකාබද්ධ කිරීමෙන් ආමන්ත්‍රණය කළ හැකිය. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) ප්‍රත්‍යාස්ථතාව සාක්ෂාත් කර ගැනීම හා සම්පත් භාවිතය උපරිම කර ගැනීම උදෙසා කොටස්කාර සංවිධාන සමග, විශේෂයෙන්ම ප්‍රදේශයේ සිවිල් සමාජ සංවිධාන, විද්වත් ප්‍රජාව, පෞද්ගලික අංශය, ජාත්‍යන්තර හා ප්‍රාදේශීය ස්වේච්ඡා සේවකයින්, සන්නද්ධ හමුදා ආදිය සමග, නිර්මාණශීලී හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරයි.

1.9.2 බහු උපද්‍රව ප්‍රවේශය

නිරාවරණයෙහි අවකාශීය රටාවන් සමගින් විවිධ උපද්‍රවයන්හි සුලභතාව, තීව්‍රතාව හා බලපෑම වෙනස් වේ. ඒ අනුව, දීර්ඝ-කාලීන ප්‍රත්‍යාස්ථතාව සාක්ෂාත් කර ගැනීම හා බහුවිධ උපද්‍රව හේතුවෙන් පැන නගින අභියෝගයන්ට මුහුණ දීම සඳහා, දේශගුණික වශයෙන් සුහුරු හා සම්පත්-කාර්යක්ෂම පිලිවෙත් සමගින් අවදානම් කළමනාකරණය කරනු පිණිස **විද්‍යාත්මක බහුවිධ-උපද්‍රව ප්‍රවේශය** යොදා ගැනීම අවශ්‍ය වේ. එමෙන්ම බහු-උපද්‍රව ප්‍රවේශය පාරිසරික පද්ධති-පාදක ප්‍රවේශය හා මූල්‍යකරණයද ඇතුළුව නව්‍ය මූල්‍යකරණ පද්ධති සඳහා ද පහසුකම් සලස්වනු ඇත.

1.9.3 මාර්ගෝපදේශක මූලධර්ම

ජාතික සැලැස්ම 2023-2030 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ තවත් සුසමාදර්ශීය වෙනසක් පෙන්නුම් කරයි, එය සහන කේන්ද්‍රීය ආකල්පයක සිට වැළැක්වීම, අවම කිරීම සහ සූදානම් වීමේ යාන්ත්‍රණයන්හි වඩාත් ක්‍රියාශීලී ප්‍රවේශයක් දක්වා ගමන් කරයි. ස්වාභාවික විපත් වළක්වා ගත නොහැකි වුවද, ඵලදායී සූදානම් කිරීමේ ක්‍රියාමාර්ග, ප්‍රමාණවත් අවම කිරීම් සහ ආපදාවලට සාර්ථකව මුහුණ දීමේ ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවට විශාල ව්‍යසනයන් ඇති කළ හැකි පොදු උපද්‍රව වළක්වා ගැනීමට උපකාරී වන බව සැලකිල්ලට ගත යුතුය. ජාතික සැලැස්ම 2023-2030 ඩීආර්ආර් සඳහා බහු පාර්ශ්වික ප්‍රවේශයක් යෝජනා කරන අතර පහත මාර්ගෝපදේශන මූලධර්ම මත පදනම්ව සංවර්ධනය කර ඇත.

---

[9] **IUCN Global Standards for Nature based Solutions -** සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමයේ සොබාදම්-පාදක විසඳුම් සඳහා ගෝලීය ප්‍රමිති - **https://www.iucn.org/resources/publication/iucn-global-standard-nature-based-solutions-first-edition**

- සැම-ඇතුළත්, අවදානම්-සංවේදී සංවර්ධන සැලසුම්කරණය, සූදානම්භාවය හා ප්‍රතිචාරය උදෙසා වූ සප්‍රමාණවත් ප්‍රතිපත්ති හා නීති පරිසරයක්ද සමගින් ජාතික මට්ටමේ ඇපකැප වීම් ග්‍රහණය කර ගැනීම සහ "කිසිවකු මග දමා" නොයමින් ප්‍රත්‍යාස්ථතාව ගොඩනැගීම
- සමෝධානිත අවදානම් අවම කිරීමේ ආයෝජන, ක්‍රියාත්මක කිරීම හා ඒකාබද්ධ නිරීක්ෂණය සඳහා ආංශික නියෝජිතායතන සම්බන්ධීකරණය කිරීමට, නියමානුකූල කිරීමට හා සවිබලගැන්වීම පිණිස ප්‍රතිපත්ති හා නෛතික ශක්‍ය-දායක පරිසරය ඇති කිරීම.
- උපද්‍රවවල ගාමකයින් අවබෝධ කොට ගෙන විවිධ මට්ටම්වලින් ක්‍රියාමාර්ග ගනු පිණිස සමාජය සිසාරා වඩා යහපත් කරන ලද අවදානම් පිළිබඳ දැනුම සමගින්, මුල සිට අගට ඇති හා ජනතා-කේන්ද්‍රික, බහුවිධ-උපද්‍රව සඳහා වූ කල් ඇතිව අනතුරු ඇඟවීමේ පද්ධති
- භෞතික, මානව, පාරිසරික, සාමාජීය අවදානම්-පාත්‍රතාවයන් අවම කරනු පිණිස ආයතනික ධාරිතා හා අවදානම් පිළිබඳ දැනුවත් තීරණ ගැනීමේ ක්‍රියාවලි වර්ධනය කිරීම
- ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ ප්‍රතිපාදන ජාතික භෞතික සැලසුම්කරණයේදී, කලාප අනුව සැලසුම්කරණයේදී හා ඉඩම් පරිහරණ සැලසුම්කරණයේදී මුඛ්‍ය-ධාරාගත කෙරෙන බවටත්, ඒවා ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති හා ආයෝජන සඳහා මගපෙන්වනු පිණිස භාවිත කෙරෙන බවටත් සහතික වීම
- වඩා යහපත් ආපදා අවදානම් අවම කිරීමේ මැදිහත්වීම් උදෙසා සියපු පුද්ගලයින් හට සමාන ඉඩප්‍රස්ථා ඇති කිරීම සහ ජාතික මට්ටමේ සිට ප්‍රජා මට්ටම දක්වා දත්ත ලබා දීම හා සැලසුම්කරණය ඇතුළු සියලු ආපදා කළමනාකරණය ක්‍රියාමාර්ග සිසාරා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මුඛ්‍ය-ධාරාගත කිරීම.
- ජාතික හා උප-ජාතික මට්ටම්වලදී සියලු ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අඩු කිරීම හා දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම පිළිබඳව සැලසුම් නිර්මාණයේදී, ක්‍රියාත්මක කිරීමේදී හා තීරණ ගැනීමේදී දායක වීමට ළමුන්ට හා තරුණ-තරුණියන්ට වැඩි ඉඩප්‍රස්ථා ලැබෙන බවට සහතික වීම.
- කාන්තාවන්ගේ, කොන් කරන ලද ප්‍රජාවන්ගේ, අවතැන් වූවන්ගේ හා ඉහළ අවදානමේ සිටින කණ්ඩායම්වල සහභාගිත්වය හා නායකත්වය සැම-ඇතුළත් ආපදා අවදානම් අඩු කිරීම උදෙසා ලබා ගැනීම මගින්, ඔවුන්ගේ අත්‍යවශ්‍ය දැනුම, කුසලතා, සම්පත හා අත්දැකීම් භාවිතයට ගැනීම
- ගෘහ ආහාර සුරක්ෂිතතාව හා වෛද්‍ය හා වෙනත් සේවාවන් වෙත ප්‍රවිෂ්ටය සහතික කරමින්, මෙරට සාමාජීය ආරක්ෂණ යාන්ත්‍රණ හා සමෝධානිත, සම්බන්ධීකරණය වූ ආපදා, සූදානම්තා, ප්‍රතිචාර හා සහන මෙහෙයුම් පරිපාලනය කිරීම
- වඩා යහපත් ලෙස යලි ගොඩනැගීමේ ක්‍රියාවලින් තුළදී නව ස්ථානයක පදිංචි කිරීම, ජීවනෝපාය හා යටිතල පහසුකම් ආධාර ඇතුළු සඵලදායී ආපදා ප්‍රකෘතිකරණ යාන්ත්‍රණ සඳහා හැකියාව ඇති කරන පරිසරයක් ගොඩනැගීම
- ආපදා අවදානම් කළමනාකරණ මූලකෘත්‍යයන්හිදී ප්‍රශස්ථතම සම්පත් පරිහරණය පිළිබඳව ඒකාබද්ධ සැලසුම්කරණය හා හවුල් වගකීම් උදෙසා වූ අන්තර්-නියෝජිතායතන සබඳතා පෝෂණය කිරීම
- පෞද්ගලික අංශයද ඇතුළුව ජාතික හා ජාත්‍යන්තර කොටස්කාර සහයෝගිතාව හා හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස සම්බන්ධීකරණය වූ හා සැම-ඇතුළත් කර ගන්නා ප්‍රවේශයන් යොදා ගැනීම
- ගෝලීය හා ජාතික රාමු ඔස්සේ වන නව්‍ය තොරතුරු තාක්ෂණ ව්‍යවහාරිකයන් සමගින් උගත් පාඩම් නිරීක්ෂණය කිරීම, පුළුල් කිරීම හා වාර්තා කිරීම උදෙසා උර දෙනු පිණිස ආපදා කළමනාකරණය තුළ සහභාගී කළමනාකරණ සඵලදායීතා විපරම් කිරීමේ පද්ධති සහතික කිරීම.

1.9.4 විෂය පථය

විවිධ රාජ්‍ය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල වගකීම් සහ භූමිකාවන් මත පදනම්ව, ධාරිතා වර්ධනය ඇතුළු ආපදා කළමනාකරණයේ විවිධ අවධීන් සහ අංගයන් ඇතුළත් 2005 ආපදා කළමනාකරණ පනතේ පිළිබිඹු වන පරිදි ජාතික සැලැස්මෙහි ප්‍රධාන ක්ෂේත්‍ර අඩංගු වේ. ආපදා වැළැක්වීම සහ අවම කිරීම, සූදානම, ප්‍රතිචාරය සහ ප්‍රතිසාධනය ඇතුළත් බහු-විනය සහභාගීත්ව ප්‍රවේශයක් (එනම් බහු-ආංශික, අන්තර් අමාත්‍යාංශ, අන්තර් නියෝජිතායතන සහ බහු පාර්ශ්වකරුවන්) සමඟ නියමිත කාල රාමු සහ අයවැය සමඟ නිශ්චිත ක්‍රියාමාර්ග හඳුනා ගැනීමේදී උපායමාර්ගික ප්‍රවේශයක් එය අනුගමනය කරයි. එය පුළුල් **DRM** රාමුවක් ස්ථාපිත කිරීම සහ ජාතික සහ ප්‍රාදේශීය පරිපාලන මට්ටමින් හඳුනාගත් වැඩසටහන්, ක්‍රියාකාරකම්, ව්‍යාපෘති යනාදිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සමස්ත ආපදා කළමනාකරණ චක්‍රය ආවරණය කරමින් 2023-2030 කාලපරිච්ඡේදය ඇතුළත බහු-විෂය-ක්ෂේත්‍රීය (එනම්, බහු-ආංශික, අන්තර් අමාත්‍යාංශයික හා අන්තර් නියෝජිතායතන බහු-කොටස්කාර සහභාගිත්වය ඇති) ප්‍රවේශයක් සහිතව මෙරට ආපදා අවදානම් කළමනාකරණය සහ ආශ්‍රිත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් ස්ථාපිත කරනු පිණිස වූ ක්‍රියාකාරිත්වය සඳහා වන උපායමාර්ගික ප්‍රවේශය, කළමනාකරණ විධිවිධාන, සබඳතා, යාන්ත්‍රණ හා කාල රාමු ආවරණය කරයි, මෙම සැලැස්ම සියලු මට්ටම්වලදී සියලුම අවස්ථාවන්හිදී සාකල්‍ය ආපදා අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් සංකල්පනය කරයි.

1. **පූර්ව ආපදා ක්‍රියාමාර්ග:**
   - ආපදා අවදානම් කළමනාකරණය සියලුම මානවල ආපදා අවදානම පිළිබඳව වූ අවබෝධය මත පාදක කළ යුතුය.
   - ක්‍රියාමාර්ග ගැනීම දිරිගන්වනු පිණිස හා ආපදා අවදානම ආමන්ත්‍රණය කරනු පිණිස වූ කාර්යභාරයන්, වගකීම් හා මගපෙන්වීම නිර්වචනය කිරීම මගින් ජාතික හා ප්‍රාදේශීය නීති රාමු, රෙගුලාසි හා රාජ්‍ය ප්‍රතිපත්ති අතර සුසංයෝගය ඇති කළ යුතුය.
   - ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ප්‍රත්‍යාස්ථතාව වර්ධනය කරනු පිණිස වූ ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක-නොවන ක්‍රියාමාර්ග හරහා ආපදා අවදානම වැළැක්වීම හා අඩු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන යෙදවිය යුතුය.
   - වඩාත් සඵලදායී ප්‍රතිචාරය සඳහා ආපදා සූදානම්තාව ශක්තිමත් කළ යුතු අතර සඵලදායී ලෙස යථා තත්වයට ගෙන ඒම සඳහා ධාරිතාවන් ස්ථානගතව ඇති බවට සහතික විය යුතුය.
2. **ආපදා කාලයේදී**: හදිසි අවස්ථා ප්‍රතිචාර ක්‍රියාමාර්ග (එනම් ආපදා බලපෑම අතරතුර හා අනතුරුවම කාලය තුළ ගත යුතු ක්‍රියාමාර්ග)
3. **ආපදාවෙන් පසු කාලය (කෙටි, මධ්‍යම හා දීර්ඝ කාලීන):** සහන හා යථා තත්වයට පත් කිරීම; අලාභ හා හානි තක්සේරුව; පුනරුත්ථාපනය; වෙනත් තැන්වල පදිංචි කිරීම හා ප්‍රතිසංස්කරණය; වඩා හොඳින් ආපසු ගොඩනැංවීමේ ප්‍රවේශය හරහා ප්‍රජා ප්‍රත්‍යාස්ථතාව සංවර්ධනය කරනු පිණිස දීර්ඝ-කාලීන සහාය ලබා දීම.

1.9.5 අරමුණු

ජාතික ආපදා කළමනාකරණ සැලැස්මෙහි **(NDMP)** සමස්ත අරමුණ වන්නේ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව අවදානම පිළිබඳ වඩාත් තියුණු දැනුමක් සහිතව, සහභාගී ප්‍රවේශයන් අනුගමනය කරමින්, සියලු සංවර්ධන හා සංරක්ෂණ ක්ෂේත්‍රයන්හි සියලුම අදියරයන්හිදී ආපදා අවදානම සමෝධානය කිරීම මගින් සාකල්‍ය ආපදා අවදානම් කළමනාකරණයක් ස්ථාපිත කිරීමයි.

රූප සටහන 5 හි විස්තර කර ඇති පරිදි පහත කුළුණු හතර (4) හරහා මෙම පරමාර්ථය ඉටු වනු ඇත..

1. **අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම් සහ පද්ධති**
2. **අවදානම් පාලනය සහ අන්තර්ග්‍රාහී සහභාගීත්වය වැඩිදියුණු කිරීම**
3. **හවුල්කාරිත්වයන් සහ මූල්‍ය කටයුතු සඳහා පරිසරය සැකසීම**
4. **ඵලදායී ප්‍රතිචාර සහ නිරසාර ප්‍රකෘතිමත්භාවය**

1. **අවදානම පිළිබඳ දැනුවත් සැලසුම සහ පද්ධති**	සියලු ආකාරයේ උපද්‍රව, ආපදා, අවදානම් සහ අවදානම් ආවරණය වන පරිදි අවදානම් දැනුවත්, තාක්ෂණිකව දියුණු සහ සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශයන් හරහා ආපදා අවදානම් කළමනාකරණ පද්ධති, හැකියාවන් සහ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම.
2. **අවදානම පාලනය සහ අන්තර්ග්‍රාහී සහභාගිත්වය වැඩිදියුණු කිරීම**	ප්‍රමාණවත් නෛතික විධිවිධාන, ආපදා අවදානම් අවම කිරීමේ ඒකාබද්ධ සංවර්ධනය සහ පාර්ශ්වකරුවන්ගේ අර්ථවත් සහභාගිත්වය තුළින් ආපදා අවදානම් පාලනය සෑම තරාතිරමකම වැඩිදියුණු කිරීම.
3. **හවුල්කාරිත්වයන් සහ මූල්‍ය කටයුතු සඳහා පරිසරය සක්‍රිය කිරීම**	අවදානම් මූල්‍යකරණය, අවදානම් රක්ෂණය සහ කම්පනයට ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා ව්‍යවස්ථාදායක සහ නියාමන රාමු සහ උපකරණ සඳහා පහසුකම් සැලසීම හරහා ඔරොත්තු දීමේ හැකියාව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන වැඩි දියුණු කිරීම.
4. ඵලදායී ප්‍රතිචාර සහ තිරසාර ප්‍රකෘතිමත්භාවය	ආපදා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් බලපෑමට ලක් වූ සියලුම අංශවල සහ ප්‍රජාවන්ගේ ප්‍රතිචාර සඳහා ඵලදායී සූදානමක් සහ තිරසාර ප්‍රකෘතිමත් වීම සහතික කිරීම, කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීම් හරහා, ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ ජාතික හා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් පෝෂණය කිරීම.

5 රූපය. ජාතික සැලැස්ම **2023-2030** හි කුළුණු හතරක් සහ අදාළ මෙහෙයුම් උපාය මාර්ග

1.9.6 ක්‍රමවේද ප්‍රවේශය

ජාතික සැලැස්ම 2023-2030 සංවර්ධනය කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය දේශීය හා ජාතික ආපදා අවදානම් කළමනාකරණ ප්‍රමුඛතා හඳුනාගැනීමේ ප්‍රධාන අරමුණ සමඟින් සහභාගිත්ව සහ ඇතුළත් විය. ක්‍රමවේදයට පහත සඳහන් දෑ ඇතුළත් විය.

1. ගෝලීය සහ දේශීය මූලපිරීම් සහ වර්තමාන ආපදා අවදානම් අවම කිරීමේ පිළිවෙත් එකතු කිරීම සඳහා ලේඛන සමාලෝචනය
2. ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ ප්‍රවීණයන් සමඟ පවත්වන උපදේශන මාලාවක් හරහා සොයාගැනීම් වලංගු කර ගැනීම
3. ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික මට්ටමේ තාක්ෂණික ආයතන සමඟ සම්මුඛ සාකච්ඡා සහ රැස්වීම් පැවැත්වීම
4. දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ කමිටු සාමාජිකයින් සමඟ පාර්ශවකරුවන්ගේ උපදේශන පැවැත්වීම
5. පළාත් පාලන ආයතන සහ ආපදාවලින් විපතට පත් ප්‍රජාවන් සමඟ සාකච්ඡා කිරීම
6. ආපදාවල බරපතලකම පිළිබඳ සොයාගැනීම් සහ අත්දැකීම් තවදුරටත් පිරිපහදු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ උපදේශන රැස්වීම් පැවැත්වීම
7. වඩාත් අවදානමට ලක්විය හැකි සහ ආපදා අවදානම් සහිත දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් උපදේශන සහ ක්‍රියාකාරී පසු සමාලෝචන අභ්‍යාස මත පදනම්ව තොරතුරු රැස් කිරීම
8. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවට (NDMCC) [10] අනුකූලව අන්තර් නියෝජිතායතන ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ උපදේශන රැස්වීම් පැවැත්වීම
9. පළාත් පාලන ආයතන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික නියෝජිතායතන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාව පාදක කරගත් සංවිධාන, ශාස්ත්‍රීය සහ

[10] ආපදා අවදානම අවම කිරීම සඳහා රටේ ජාතික වේදිකාව


පර්යේෂණ කණ්ඩායම්, පෞද්ගලික අංශය සහ ප්‍රජා නියෝජිතයන් ඇතුළු රාජ්‍ය ආයතන සමඟ ජාතික සැලැස්මේ කෙටුම්පත පිළිබඳ උපදේශන වැඩමුළුව සහ සමාලෝචන සාකච්ඡා පැවැත්වීම

10. බහු ආංශික ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ අවසන් කෙටුම්පත් අන්තර්ගතය වලංගු කිරීම
11. හඳුනාගත් උපාය මාර්ග, ක්‍රියාකාරී සැලසුම් සහ අන්තර්ගතයන් මැනවින් සකසා ගැනීම සඳහා බහු නියෝජිතායතන ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් සංස්කරණය කිරීම සහ පිරිපහදු කිරීම

1.9.7 මෙහෙයුම් රාමුව

ජාතික සැලැස්ම 2023-2030 (රූපය 6) සඳහා යෝජිත මෙහෙයුම් රාමුව නිර්මාණය කරන ලද්දේ අවශ්‍ය නෛතික හා .ආයතනික සංවිධිවිධාන සඳහා පහසුකම් සැලැස්වීමටත්, මුඛ්‍ය කාරකයින් සඳහා නිරවුල්ව නිර්වචනය කරන ලද කාර්යභාරයන් හා වගකීම් සහිතව 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** තුළ යෝජිත ක්‍රියාමාර්ග ක්‍රියාවේ යෙදවීමටත්ය.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** කෝවිඩ්-19 වසංගතයෙන් පසු අත්දැකීම, සෞඛ්‍යාදායක පාරිසරික පද්ධති හා දේශගුණික ප්‍රත්‍යාස්ථතාව ආදිය ප්‍රවර්ධනය කරන අඩු යෙදවුම් හෝ දේශගුණික සුහුරු හරිත සංවර්ධනය වැනි ගෝලීය අවදානම් තන්ත්‍රණ සංවර්ධනයන්හි උපරිම පල ලබා ගනු ඇත. ‘‘කිසිවකු මග දමා නොයෑම’’ ප්‍රවේශයට අනුගතව, එය ජාත්‍යන්තර, ජාතික හා උප-ජාතික මට්ටමෙන් රජයේ නියෝජිතායතන, පෞද්ගලික අංශය, ජාත්‍යන්තර නියෝජිතායතන, සිවිල් සමාජ සංවිධාන හා වෙනත් ප්‍රජාවන්ගේ යෙදවුම්, සම්පත් හා සහයෝගය ප්‍රයෝජනයට ගනු ඇත. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** ප්‍රතිපත්ති, උපායමාර්ග හා ක්‍රියාමාර්ග ඇතුළත් වඩා යහපත් ආපදා තන්ත්‍රණය සඳහා හැකියාව ඇති කරන පරිසරයක් නිර්මාණය කිරීමට හෝ වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරයි.



6 රූපය. ආපදා කළමනාකරණය සඳහා වූ මෙහෙයුම් රාමුව

1.9.8 ස්වේච්ඡා සේවය

ස්වේච්ඡකත්වය වනාහි ශ්‍රී ලංකාවට අළුත් සංකල්පයකි. වත්මන් ආපදා කළමනාකරණ සන්දර්භය තුළ ස්වේච්ඡා සේවය දේශීය හා ජාත්‍යන්තර සංවිධාන විසින් විධිමත් ප්‍රවේශයන් සහිතව ක්‍රියාවේ යොදනු ලබන හා ප්‍රවර්ධනය කරනු ලබන අතර ප්‍රජාවේ සාමාජිකයෝ සිය ප්‍රජාවට ඇති වූ හදිසි ආපදාවන්හිදී එකිනෙකාට උපකාර කරනු පිණිස ප්‍රථම ප්‍රතිචාරකයින් ලෙස කටයුතු කරති. පෞද්ගලික අංශය සිය කාර්ය මණ්ඩලය සහ සේවාලාභීන් නිරත කරවමින් සංස්ථායික සාමාජීය වගකීම හා තිරසාරතා වැඩසටහන් හරහා ස්වේච්ඡකත්වය ක්‍රියාවේ යොදවයි. ප්‍රජා මට්ටමේදී ආපදා අවදානම් අඩු කිරීම සඳහා ස්වේච්ඡා සේවය හඳුන්වා දෙනු ලබන්නේ "පුරවැසි විද්‍යා" ප්‍රවේශයන් හරහාය.

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** ප්‍රජාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය තුළ ස්වේච්ඡා සේවය ප්‍රයෝජනයට ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමටත්, අවශ්‍ය පරිදි නිරීක්ෂණය, කල් ඇතිව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීම, සහභාගී සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම තුළ පුරවැසි විද්‍යාව භාවිතය පුළුල් කිරීමටත් අපේක්ෂා කරයි.

ප්‍රජාවේ ධාරිතාව වැඩිදියුණු කිරීමට සමගාමීව දත්ත රැස් කිරීමට උපකාර වන ක්‍රමවේදයක් ලෙස පුරවැසි විද්‍යාව පොදු ස්වේච්ඡා සේවකයන්ට භාවිතා කළ හැකි අතර එමඟින් පරිසරය, අවදානම් සහ සෞඛ්‍ය උපද්‍රව පිළිබඳ අවබෝධය ලබා ගැනීම ඇතුළු ඉගෙනුම් හා පර්යේෂණ සඳහා ප්‍රජාවන්ගේ සෘජු මැදිහත්වීම ද වැඩිදියුණු කළ හැකි වේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙහෙයවනු ලබන "පරිසර පුරෝගාමීන්" වැනි පාසල් වැඩසටහන් පුරවැසි විද්‍යා ව්‍යාපෘති සඳහා සිසුන්ගේ සහභාගිත්වය දිරිමත් කරයි.

තවද, දැනුම හා නිපුණතා හුවමාරු මඟින් ශ්‍රී ලාංකික වැඩසටහන්වලට හා ව්‍යාපෘතිවලට වටිනාකම් එකතු කළ හැකි වන්නේ නම්, 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **(NDMP)** ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර ස්වේච්ඡා වැඩසටහන් ප්‍රවර්ධනය කරයි. ශ්‍රී ලංකාවේ රතු කුරුස සංවිධානය, සර්වෝදය, ශාන්ත ජෝන් ගිලන් රථ සේවය, එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයෝ ආදී ආයතනයන්හි ස්වේච්ඡා සේවා ප්‍රයත්නයන් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සැලකිය යුතු ලෙස පෝෂණය කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ "පරිසර පුරෝගාමියෝ" සහ "බාලදක්ෂ" වැඩසටහන් වැනි දැනට ක්‍රියාත්මක පරිසර වැඩසටහන් ආපදා අවදානම් අඩු කිරීම ආශ්‍රිත ස්වේච්ඡා සේවය පෝෂණය කරනු පිණිස ඒකාබද්ධ කිරීමේ ඉඩප්‍රස්ථාද පවතී. ජාත්‍යන්තර වැඩසටහනක් වන "සෞඛ්‍ය උද්‍යාන - නීරෝගී ජනතාව"[11] ප්‍රධාන වශයෙන් බහුවිධ ස්වේච්ඡා විකල්ප තේරීම්ද සහිත, ප්‍රධාන වශයෙන් රක්ෂණ කර්මාන්තය විසින් අරමුදල් සපයනු ලබන ආබාධිත හා වයෝවෘද්ධ ජනතාව ආදීන්ගේ ප්‍රත්‍යාස්ථතාව දියුණු කිරීමට උපකාරී වන වැඩසටහනකි.

1.9.9 ජාතික හා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සමග සම්බන්ධීකරණය

මෙරට වෙනුවෙන් වූ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන රාමුව හරහා එක්සත් ජාතීන්ගේ පද්ධතිය විසින් මෙහෙයවනු ලබන ජාත්‍යන්තර මානුෂීය හා සංවර්ධන හවුල්කාර නියෝජිතායතන ජාතික හා උප-ජාතික මට්ටමේ ආපදා අවදානම් කළමනාකරණ ප්‍රවේශයන්ට උපකාර කිරීමෙහිලා ක්‍රියාකාරී හා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. රජය හා ආපදා කළමනාකරණය විෂය භාර අමාත්‍යාංශය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග එක්ව අවශ්‍ය පරිදි ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණය සිදු කරනු ඇත. වර්තමානයේ, හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සහ ආපදා මෙන්ම හදිසි අවස්ථා සඳහා සූදානම් වීමේ දී හා ආපදා සහන සහය ලබා දීමේදී මානුෂීය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් සහායක සහ ස්වේච්ඡා සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

---

[11] **Park Victoria. Healthy Parks Healthy People - https://www.parks.vic.gov.au/healthy-parks-healthy-people**
වික්ටෝරියා උයන. සෞඛ්‍යදායී උද්‍යාන සමග නීරෝගී ජනතාව

ජාත්‍යන්තර යෙදවුම් මෙරට ආපදා කළමනාකරණයේ වත්මන් මට්ටම සුවිශේෂී ලෙස හැඩගස්වා ඇති අතර එය අඛණ්ඩව සිදු කරනු ඇත. 2005 – 2008, දක්වා වූ සුනාමි-පශ්චිම ආපදා ප්‍රතිචාරය හා පද්ධතිය ස්ථාපිත කිරීම කාලයේදී ජාත්‍යන්තර සහයෝගය වැඩියෙන්ම නාගිගත වූයේ ධාරිතා සංවර්ධනය හා නෛතික හා ආයතනික රාමු වැඩිදියුණු කිරීම මත ය. වත්මන් සන්දර්භය තුළ, ජාත්‍යන්තර සහක්‍රියාකාරිත්වයන් හා උපකාර මගින් නව හා මතු වෙමින් ඇති සංකල්ප හා කළමනාකරණ ප්‍රවේශ උදෙසා නව්‍යකරණය හා මුදල් එක් කිරීමට හැකියාව තිබේ. හදුනා ගත් මුඛ්‍ය ක්ෂේත්‍රයන්ට තිරසාර මූල්‍ය සම්පාදනය, දේශගුණික වශයෙන් සුහුරු හා පාරිසරික පද්ධති පාදක ආපදා අවදානම් අඩු කිරීම සහ දත්ත, ඉන්ටනෙට් ඔෆ් තිංස් (IOT) හා කෘත්‍රිම බුද්ධිය (AI) භාවිත කිරීම දක්වා ව්‍යාප්ත වන තොරතුරු තාක්ෂණවේද ප්‍රගමණයන් යොදා ගැනීම ඇතුළත් වන අතර ඒවාට සීමා නොවේ.

සුනාමි-පශ්චිම කාලපරිච්ඡේදය තුළ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයෙහි (EOC) කල් ඇතිව අනතුරු ඇඟවීමේ පද්ධති ශක්තිමත් කිරීමෙහිලා පෞද්ගලික අංශ නියෝජිතායතන මුඛ්‍ය කාර්යභාරයක් ඉටු කළ අතර, කෝවිඩ්-19 වසංගත ප්‍රතිචාරයේ මෙහෙයුම් යාන්ත්‍රණය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිචාර ප්‍රයත්නයන්ට උර දෙනු පිණිස පෞද්ගලික අංශය විසින් බහුවිධ කාර්යභාර ඉටු කරන ලදී. පෞද්ගලික අංශය වැඩි වැඩියෙන් ව්‍යාපාර අවිච්ඡින්නතා තහවුරු කරනු පිණිස වූ අවදානම අඩු කිරීමේ ප්‍රයත්නයන්හි හා ඒ ආශ්‍රිත වැඩසටහන්වල වාසිදායක බවද සැලකිල්ලට ගනී. මේ වන විට ලංකා වාණිජ මණ්ඩලයේ (CCC) "විශිෂ්ටතම සංස්ථායික පුරවැසි සම්මානය" මගින් ආපදාවන්ට හා පරිසර උපද්‍රවයන්ට ඇති සූදානම් බව පිළිගැනීමට ලක් කරයි. සංස්ථායික අංශයේ ජාත්‍යන්තර හවුල්කරුවන් සඳහා ඇති අවස්ථාව රක්ෂණය, තොරතුරු කළමනාකරණය, සෞඛ්‍යය, බලශක්තිය, කාර්ය සම්පාදනය ආදියෙහි ඉතා ඉහළ පවතින අතර, 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (NDMP) දේශගුණික මූල්‍යකරණයේ හා හරිත නව්‍යකරණයේ ප්‍රතිලාභ කර්මාන්තමය හා නාගරික දූෂණ කළමනාකරණය, කාබන් ප්‍රතිලාභ හා පාරිසරික පද්ධති වැඩි දියුණු කිරීම් සමග සම්බන්ධ යලි වන වගාව හා පුනරුත්ථාපනය හරහා වූ අවදානම් අවම කිරීමේ ප්‍රයත්නයන්ට මාරු කිරීම ආදියද ඇතුළත් ආපදා කළමනාකරණය තුළ පෞද්ගලික අංශයේ සම්බන්ධ වීමෙහි සුවිශේෂී ව්‍යාප්ත වීමක් ප්‍රවර්ධනය කරයි.

1.10 සමාජ අන්තර්ග්‍රාහීත්වය

ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රයත්නයන් මගින් සමාජීය උත්සුකතාවන්හි සංකීර්ණ සහ විවිධ ස්වභාවයන් සැලකිල්ලට ගෙන සියලු ආන්තික සහ අවදානමට ලක්විය හැකි පුද්ගල කණ්ඩායම්වල අවශ්‍යතා නිසි ලෙස විශ්ලේෂණය කිරීමට අපේක්ෂා කෙරේ. ආපදා අවදානම් කළමනාකරණයේ (DRM) සමාජ ඇතුළත් කිරීමේ ක්‍රමෝපායන් මගින් සමාජයේ විවිධ පුද්ගල කණ්ඩායම් මුහුණ දෙන අභියෝග හදුනාගෙන සුදුසු දේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

1.10.1 ආපදා කළමනාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ආබාධිතභාවය සහ සමාජ අන්තර්ග්‍රාහීත්වය

උපද්‍රවයන් හා සම්බන්ධ දුර්වලතා හේතුවෙන් සමාජයේ පවතින අසමානතාවන් වඩාත් අයහපත් අතට හැරෙන අතර එය විශේෂයෙන්ම කාන්තාවන්, ළමයින්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින් අතර දක්නට ලැබේ. "සමාජ වශයෙන් වෙනස් වූ බලපෑම්" ලෙස හදුනාගෙන, ගැඹුරු ලෙස මුල් බැසගත් අසමාන අදහස්, සංස්කෘතික සම්මතයන්, පහසුකම් සඳහා වන අසමාන ප්‍රවේශ සහ පැනවූ භෞතික විද්‍යාත්මක ප්‍රවේශයන් හේතුවෙන් මෙන්ම දේශගුණික විපර්යාස හේතුවෙන් විවිධ පුද්ගලයින් සහ කණ්ඩායම් විවිධ බලපෑම් අත්විඳිය හැකිය. මෙම සංසිද්ධිය ශ්‍රී ලංකාව තුළ ද විද්‍යමාන වන අතර, කාන්තාවන් සහ පිරිමින් ආපදාවල සහ දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් වෙනස් ලෙස අත්විඳිති. ජනගහන කණ්ඩායම් තුළ, සමාජ හා ආර්ථික තත්ත්වය, වයස සහ ශාරීරික හැකියාවන් අනුව නිර්ණය වන අවදානම, අනුවර්තනය සහ මුහුණ දීමේ හැකියාවන්හි වෙනස්කම් දක්නට ලැබේ. තවද, ආබාධ සහිත පුද්ගලයන්, නව යෞවනයන්, සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික සහ අන්තර් ලිංගික (LGBTQI+) සහ දරිද්‍රතාවයෙන් පෙළෙන කාන්තාවන් ඇතුළත් සෑම අවදානම් සහ ආන්තික කන්ඩායමක්ම සෘණාත්මකව පීඩා විඳිමින් වඩාත් අසරණභාවයට පත් වේ. එබැවින්, ආපදා අවදානම් අවම

කිරීමේ ප්‍රතිපත්ති නියෝජනය කිරීම ඇතුළුව ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ප්‍රවේශයන් අනුවර්තනය කිරීම අවශ්‍ය වේ.

1.10.2 ළමා කේන්ද්‍රීය ආපදා අවදානම අඩු කිරීම (CC-DRR)

සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 30% ක් නියෝජනය කරන්නේ ළමුන් සහ නව යෞවනයන්ය. දරුවන් කෙරෙහි ආපදා ඇති කරන බලපෑම්වලට මරණ, තුවාල, පවුල්වලින් වෙන්වීම මෙන්ම සෞඛ්‍ය, පෝෂණය, ජලය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ ආරක්ෂාව වැනි තීරණාත්මක සේවාවන් සඳහා ප්‍රවේශය නොමැතිකම ද ඇතුළත් වේ. දරුවන්ගේ කායික, ආර්ථික සහ සමාජීය දුර්වලතා හේතුවෙන්, වැඩිහිටියන්ට සාපේක්ෂව, දරුවන් ස්වභාවිකව හෝ මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා සිදු වන විපත් සහ දේශගුණික විපර්යාස නිසා ඇතිවන ආන්තික කාලගුණික සිදුවීම් වලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත. එපමණක් නොව, පොදු ආපදා තත්ත්වයන් හෝ උපද්‍රවයන්ගෙන් ඔබ්බට ගොස් විශාල පරාසයක් ආවරණය කරමින්, දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ අවශ්‍යතාවන් සහ අවදානම්වලට නිරාවරණය වීම් සොයා බැලිය යුතුය. තවද, විපතට පත් දරුවන් නොසලකා හැරීමෙන් වැළකී සිටිය යුතු අතර ඔවුන් ඕනෑම ආකාරයක අපචාර, ජාවාරම්, අපචාර සහ ලිංගික සූරාකෑම්වලින් නිදහස් කිරීමටත් ආරක්ෂිත පරිසරයක් තුළ ඔවුන්ගේ ජීවිතය පවත්වාගෙන යාමට සහාය ලබා දීමටත් ක්‍රියා කළ යුතුය. දරිද්‍රතාව වැනි අනෙකුත් අවදානම් සහිත භූගෝලීය ප්‍රදේශවල දරුවන්, නිදන්ගත පෝෂණ ඌනතාවය, ආහාර අනාරක්ෂිතභාවය, පාසල් හැර යාම සහ ළමා ශ්‍රමය ඉහළ යාම වැනි අවදානම්සහගත තත්ත්වයන්ට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ ගොස් තිබේ. අනාගත දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදු වන පරම්පරාවට ළමා හා තරුණ ප්‍රජාව ඇතුළත් වන බැවින් ප්‍රත්‍යාස්ථභාවය ගොඩනැගීමේ සහ දේශගුණික විපර්යාස පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ ද දායකත්වය අනාගත නායකයින් ලෙස ලබා ගැනීම වැදගත් වන අතර එය මෙම ගෝලීය අර්බුදයට මුහුණ දීම සඳහා ඔවුන් වඩාත් ශක්තිමත් කරනු ඇත.

1.10.3 ආබාධ සහිත පුද්ගලයන් (PWDs)

ආබාධ සහිත පුද්ගලයන් **(PWDs)** යනු ආපදාවලින් අසමාන අන්දමින් පීඩාවට පත්වන ප්‍රධාන අවදානමට ලක්විය හැකි කාණ්ඩවලින් එකක් වන අතර විවිධ වර්ගයේ ආබාධ හේතුවෙන් ප්‍රකෘතිමත් වීමට සහ යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාව ද එනිසා අසමාන වේ. බොහෝ ආබාධිත පුද්ගලයන් සමාජයෙන් හුදකලා වී ඇති අතර, ඔවුන්ගේ විවිධ ආබාධ හේතුවෙන් බොහෝ විට පසුබෑමට ලක් වේ. පූර්ව අනතුරු ඇඟවීම් සහ ඉවත් වීමට සිදු කෙරෙන දැනුම්දීම් සඳහා ප්‍රවේශය නොමැතිකම, සුදුසු හදිසි ප්‍රවාහන පහසුකම්, අවශ්‍ය වෛද්‍ය උපකරණ හිඟවීම, සන්නිවේදන දුෂ්කරතා යනාදිය ආපදාවලින් පීඩාවට පත් වූ විට ආබාධ සහිත තැනැත්තන් මුහුණ දෙන අභියෝග වේ. 2012 වසරේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තාවේ දක්වා ඇති තොරතුරුවලට අනුව[12], ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයින්ගේ සංඛ්‍යාව සමස්ත ජනගහනයෙන් 8.7% ක් (වයස අවුරුදු 5 ට වැඩි) වන අතර, එය 43% ක් පුරුෂයින්ගෙන් සහ 57% ක් කාන්තාවන්ගෙන් සමන්විත වේ. ආපදා අවදානම අවම කිරීමේ ප්‍රයත්න සඳහා ආබාධ සහිත පුද්ගලයින් ඇතුළත් නොකිරීම සුවිශේෂී ප්‍රතිවිපාකවලට තුඩු දෙන්නක් විය හැකි වන බැවින් ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සලකා බැලීම අත්‍යවශ්‍ය වන අතර ජාතික සහ දේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපායමාර්ග සැකසීමේදී හා ක්‍රියාවට නැංවීමේදී විවිධ ආබාධ සහිත පුද්ගලයින්ගේ නියෝජිතයින් ද එම ක්‍රියාවලියට දායක කර ගැනීම අතිශයින් වැදගත් වේ. විපත්වලදී ආබාධ සහිත තැනැත්තන් අත් නොහරින බවට සහතික කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර ඔවුන්ට උපකාර කිරීම සඳහා ප්‍රදේශයේ ප්‍රජාවගේ සහාය ඇතිව ආධාරක පද්ධතියක් සකස් කිරීම අවශ්‍ය වේ.

1.10.4 වැඩිහිටි ප්‍රජාව

ගෝලීය වශයෙන් වයස්ගත ජනගහනය වැඩි වීමේ ප්‍රවණතාවක පවතින අතර විවිධ ආකාරයේ ආපදා සහ හදිසි අවස්ථා හමුවේ වැඩිහිටි හෝ වයෝවෘද්ධ පුද්ගලයින්ගේ අවදානම් තත්ත්වයන් තීව්‍ර කරයි. බොහෝ අවස්ථාවලදී, වැඩිහිටි ජනගහනයට පුළුල් අත්දැකීම්, කුසලතා සහ දැනුම ඇති අතර, ඒවා දේශීය පාරිසරික උපද්‍රව සන්දර්භය තුළ ගැඹුරින් මුල් බැස ගෙන ඇත. එසේ වුවද, ආන්තික දේශගුණික විපර්යාස හා ආපදා ඉහළ යාමේ ප්‍රවණතාව මෙන්ම ආපදා අවදානම්

[12] ආබාධිත තත්ත්වයන්: අයි.එන්.

අවම කිරීමේ ප්‍රතිචාරවලට අනුවර්තනය වීම කෙරෙහි වයෝවෘද්ධ හෝ වයස්ගත ජනගහනය අඩු අවධානයක් යොමු කිරීම හමුවේ ඔවුන් විවිධ උපද්‍රව සහ ආපදාවලට ගොදුරු වීමේ අවදානම වැඩි කරයි. එපමණක් නොව, ස්ත්‍රී පුරුෂ භාවය මත කාන්තාවන් වඩාත් අවදානමට ලක්වන අතර ඔවුන්ගේ අවශ්‍යතා නොසලකා හැරීම හමුවේ ඔවුන් විශාල පීඩාවකට ලක් වෙයි. බොහෝ වයස්ගත පුද්ගලයින් දුර්වල හා විවිධ ආබාධවලින් පෙළෙන අතර සංචලනයේ දුෂ්කරතා අත්විඳිමින් සිටින නිසා ඒ සඳහා ඔවුන්ට තවත් වැඩිහිටියෙකුගේ සහාය අවශ්‍ය වේ. ඒ අනුව, බොහෝ දෙනෙකුට විපතකදී හෝ හදිසි අවස්ථාකදී පලා යාමට හෝ ඉවත්ව යාමට මෙන්ම තමන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අපහසු වනු ඇත. සංඛ්‍යාලේඛනවලට අනුව වයස්ගත (එනම් වයස අවුරුදු 60 හෝ ඊට වැඩි) ජනගහනය 2012 වසරේදී මුළු ජනගහනයෙන් 12.5% ක් වූ අතර, එය දකුණු ආසියාවේ ඉහළම වැඩිහිටි ප්‍රජාවක් හෝ වයෝවෘද්ධ පුද්ගලයන් සිටින රට බවට ශ්‍රී ලංකාව පත් වීමට හේතු විය. තවත් වසර පහළොවකින් ප්‍රජාවෙන් 25%ක් හෝ පුද්ගලයන් හතර දෙනෙකුගෙන් එක් අයෙකුට වඩා[13] වයස අවුරුදු 60 ඉක්මවනු ඇතැයි පුරෝකථන පළ වන බැවින් එය සැබවින්ම බරපතල අභියෝගයකි. මෙම ජන විකාශන සංක්‍රාන්තිය බරපතල සමාජ, සෞඛ්‍ය, ආර්ථික සහ යටිතල පහසුකම් අභියෝග නිර්මාණය කරනු ඇති අතර, එමඟින් වැඩිහිටි ජනගහනයේ ආපදා සූදානමේ සීමාවන් ද පිළිබිඹු වේ. එබැවින්, විවිධ ආපදාවන් සඳහා සූදානම් වීමේ යාන්ත්‍රණයන් සැලසුම් කිරීමේදී සහ අනුගමනය කිරීමේදී වැඩිහිටි ජනගහනයේ කායික හා මානසික දුර්වලතා, ආබාධිත සංචලනය, දුර්වල සංවේදීත්වය සහ දුර්වල සෞඛ්‍ය තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වන්නේ එමඟින් ඔවුන්ගේ අනුවර්තනය වීම වළක්වාලීමට හැකි බැවිනි.

1.10.5 විගමණික ශ්‍රමිකයන්

විගමණික ශ්‍රමිකයින් ඔවුන් අයත් වන රටවලට සහ ඔවුන්ගේ සේවය ලබා දෙන රටවල සමාජ-ආර්ථික සංවර්ධනයට ද අගනා දායකත්වයක් සපයයි. මෙම ශ්‍රමිකයින් කුටුම්භ සහ රජයන් සඳහා මූල්‍ය හා විදේශ විනිමය සපයන වැදගත් මූලාශ්‍රයකි. එබැවින් සෑම අවස්ථාවකදීම ඔවුන්ගේ පහසුකම්, අයිතිවාසිකම් සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට රජය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දායකත්වය ශ්‍රී ලංකාවට ආදායම් උත්පාදනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයකි. 2016 වසරේ සිට 2019 වසර දක්වා වූ කාලය තුළ, වාර්ෂිකව සාමාන්‍යයෙන් නව ලියාපදිංචි කිරීම් සහ අලුත් කරන ලද කොන්ත්‍රාත් [14] පිළිවෙලින් 217 ක් හා 272 ක් වූ අතර 2020 වසරේදී එම අගයේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. කොවිඩ්-19 ගෝලීය වසංගතය හේතුවෙන් එය සිදු වූ බවට අනුමාන කළ හැකිය. කෙසේ වෙතත්, 2021 වර්ෂයේදී සංක්‍රමණවල වර්ධනයක් දක්නට ලැබුණු අතර ලියාපදිංචි විදේශ දූත මණ්ඩල සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය [15] හරහා සංක්‍රමණය වූ මුළු සංඛ්‍යාව 122,264ක් විය. ඊට පිරිමි ශ්‍රමිකයන් 66.34% ක් සහ කාන්තා ශ්‍රමිකයන් 33.66% ක් අයත් විය. එක් එක් සත්කාරක රට (හෝ ගමනාන්තය වූ රට) මුහුණ දෙන අර්බුදකාරී තත්ත්වයන්ගේ ස්වභාවය වෙනස් වන බැවින් එම රටවල් අත්විඳින ස්වභාවික ආපදා සහ වෙනත් ව්‍යසන "රටට විශේෂිත" වනු ඇති අතර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන ගෝලීය ආපදාවන් සහ හදිසි අවස්ථාවලට ද නිරාවරණය වීමට සිදු වනු ඇත. අර්බුදකාරී අවස්ථාවන්හිදී, විවිධ හේතූන් මත සංක්‍රමණික ශ්‍රමිකයින් ඔවුන් සේවය කරන රටවලදී දැඩි අවදානමකට ලක් වේ. ආපදාවකදී කාන්තාවන්, ගර්භනී කාන්තාවන්, ළමයින්, ආබාධිත පුද්ගලයින් සහ වැඩිහිටියන් වැනි කණ්ඩායම් වැඩි වශයෙන් අවදානමට ලක් වන අතර විපතට පත් පුද්ගලයින් සිය රට වෙත ආපසු ගෙන්වා ගැනීමට අවශ්‍ය වූ විට එලෙස ඉවත් කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වනු ඇත.

එබැවින්, හදිසි ප්‍රතිචාර දැක්වීමේ, ප්‍රතිසාධනය සහ ප්‍රතිසමෝධායනය කිරීමේ සැලැස්මක් **(ERRRP)**[16] ආකාරයෙන්, සිදුවිය හැකි සියලු අර්බුදකාරී අවස්ථා, හිඩැස් සහ අවදානම් තත්ත්වයන් ආවරණය කරන පරිපූර්ණ නිල හදිසි ප්‍රතිචාර සැලැස්මක් සකස් කිරීම වැදගත් වේ. එමඟින් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ අවදානම ද අවම කිරීමට හැකි වනු ඇත.

---

[13] **ibid**

[14] ආරක්ෂිත ශ්‍රමික සංක්‍රමණ ව්‍යාපෘතියේ රාමුව – ශ්‍රී ලංකාව- අදියර **IV –** ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යාපෘතිය, හදිසි ඉවත් කිරීම/ප්‍රතිචාර සැලැස්මක් සකස් කිරීම: ආරම්භක වාර්තාව, නොවැම්බර් **2022**

[15] **ibid**

[16] **ibid**

1.11 ආපදා අවදානම් අඩු කිරීම ආශ්‍රිත ගෝලීය හා දේශීය රාමු

2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් තිරසාර සංවර්ධනය සඳහා සුසංගත 2030 න්‍යාය පත්‍රයක් ඇති කර ගැනීම පිළිබඳව එකඟත්වයට පැමිණියහ. තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ මූල්ගල "කිසිදු කෙනකු මග දමා නොයනු" යන පාඨය වන අතර එය සමස්ත ආපදා අවදානම් අඩු කිරීම් **(DRR)** ප්‍රතිපත්ති, උපායමාර්ග, සැලසුම් හා ක්‍රියාමාර්ගවල මූඛ්‍ය මාර්ගෝපදේශක මූලධර්මයකි.

2019 තිරසාර සංවර්ධන පනත විසින් පාලනය කරනු ලබන ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන සභාව අවදානම් අවම කිරීම ආශ්‍රිත තිරසාර සංවර්ධන අරමුණුද ඇතුළු තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරනු පිණිස ක්ෂේත්‍රයේ නියෝජිතායතන අතර සංශක්තීන් සඳහා පහසුකම් සලස්වයි. ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව **(SFDRR)** 2015-2030, දේශගුණික විපර්යාසය පිළිබඳව පැරිස් එකඟතාව, නව නාගරික න්‍යාය පත්‍රය, සංවර්ධනය සඳහා මුදල් සම්පාදනය කිරීම පිළිබඳ ඇඩිස් ඇබාබා න්‍යාය පත්‍රය සහ මානව දයාව සඳහා වූ න්‍යාය පත්‍රය යන සියල්ල එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක **(SDGs)** සමග සුසංගතව පවතී.

1.11.1 තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)

තිරසාර සංවර්ධන ඉලක්ක **(SDGs)** ගෝලීය අරමුණු 17 කින් සහ ඉලක්ක 169 කින් සමන්විත වේ (රූපය 7). එය දරිද්‍රතාවය තුරන් කිරීමට සහ පෘථිවිය ආරක්ෂා කිරීමට මෙන්ම සියලු මිනිසුන්ට සාමයෙන් හා සමෘද්ධියෙන් ජීවත් වීමට හැකි පරිසරයක් සහතික කිරීමට ආයාචනා කරන විශ්වීය කැඳවීමක් කෙරෙහි අවධානය යොමු කරයි. සහශ්‍ර සංවර්ධන ඉලක්ක **(MDGs)** සාක්ෂාත් කර ගැනීම මත පදනම්ව ඉලක්ක 17 නිර්මාණය කර තිබුණ ද, නවෝත්පාදනය, දේශගුණික විපර්යාස, තිරසර පරිභෝජනය, ආර්ථික අසමානතාව සහ සාමය හා යුක්තිය වැනි නව ක්ෂේත්‍ර ප්‍රමුඛතා ලෙස හඳුනාගෙන තිබේ. අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාවන් හා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී ඒවා එකිනෙක සම්බන්ධ වේ.




7 රූපය. තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)

අතීත ගෝලීය ආපදා සහ විනාශයන් ප්‍රවලිත සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇති නිසාත් එවැනි බලපෑමට ලක් වූ රටවල ආර්ථික ප්‍රගතියට අදාල සිදුවීම් බලපා ඇති නිසාත් තිරසර සංවර්ධනයේදී ආපදා අවදානම් අවම කිරීම කෙරෙහි ද විශේෂ අවධානය යොමු කළ යුතුය. ක්ෂණිකව හෝ ක්‍රමිකව සිදු වන ආපදා හෝ එවැනි සිදුවීම්වල "කම්පන" කෙටි කාලීන මෙන්ම දිගු කාලීන සමාජ ආර්ථික හානියක් සිදු කරනු ඇත. තවද, ස්වභාවිකව හා මිනිසුන් නිසා සිදු වන උපද්‍රව සහ ආපදාවන් දේශගුණික විපර්යාස හේතුවෙන් සිදු වන බලපෑම් තීව්‍ර කිරීමට හේතු වනු ඇත. මෑතකාලීනව ලොව පුරා කාලගුණය ආශ්‍රිත බරපතල තත්ත්වයන් නිර්මාණය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන බැවින් අවදානමට ලක්විය හැකි සහ ආපදා අවදානම් සහිත ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයින්ගේ අවදානම් මට්ටම ද ඉහළ ගොස් තිබේ..

මෙම ගිවිසුම් සිය විෂය පථය තුළ ආපදා අවදානම් අඩු කිරීමෙහි සංරචකයන් හා ප්‍රත්‍යාස්ථතාව සැලකිල්ලට ගනී. 2030 න්‍යාය පත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු 17න් 10ක්ම ආපදා අවදානම් අඩු කිරීම කෙරෙහි සම්බන්ධක ඇති ඒවාය ඇමුණුම

1). අරමුණුවලින් 3ක ප්‍රගතියේ දර්ශක සෙන්ඩායි රාමුවෙහි ඉලක්ක සමග සමපාත වේ. සෑම ගිවිසුමක්ම එකිනෙකට වෙනස් දෘෂ්ටිකෝණයන් වෙතින් ආපදා අවදානම හා ප්‍රත්‍යාස්ථතාව පිළිබඳව කටයුතු කරන නමුදු, ආපදා අවදානම් අඩු කිරීම වනාහි තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා අනිවාර්ය දෙයක් වන ප්‍රත්‍යාස්ථතාව ගොඩනැගීමේ පූර්ව-අවශ්‍යතාවන් ගෙන් එකක්ය යන පොදු අවබෝධය පවතී.



8 රූපය. **තිරසර සංවර්ධන ඉලක්ක සහ සෙන්ඩායි රාමුවෙහි සුසංයෝගය සහ ශක්තිමත් කිරීම**

1.11.2 ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව (SFDRR)

2015 වර්ෂයේ ජපානයේ ටෝකියෝ නුවර පැවති එක්සත් ජාතීන්ගේ 3 වන ලෝක සමුළුව විසින් ආපදා අවදානම් කළමනාකරණය සඳහා ගෝලීය මූලික සැලැස්මක් ලෙස ක්‍රියා කරන ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව සම්මත කර ගනු ලැබීය. මෙම රාමුව කුඩා හා මහා පරිමාණ, සුලභ හා දුර්ලභ, හදිසි හා සෙමෙන් වර්ධනය වන ස්වාභාවික හා මිනිසා නිර්මාණය කරන උවදුරු මෙන්ම පාරිසරික, තාක්ෂණික හා ජීවවිද්‍යාත්මක උවදුරු හා අන්තරායන් මගින් ඇති වන අවදානම් තක්සේරු කිරීමට අදාළ වේ. මෙම බන්ධනීය නොවන ගිවිසුම "සැලකිය යුතු ලෙස ආපදා අවදානම, ජීවිත, ජීවනෝපායන් හා නිරෝගිකම අහිමි වීම් සහ පුද්ගලයින්ගේ, ව්‍යාපාරවල, ප්‍රජාවන්ගේ හා රටවල ආර්ථික, භෞතික, සාමාජීය, සංස්කෘතික හා පාරිසරික වත්කම් අහිමි වීම් පහත හෙළීම උදෙසා සංවර්ධනයේ සියලු මට්ටම්වලදී හා සියලු ක්ෂේත්‍ර සිසාරා බහුවිධ උවදුරු ආපදා අවදානම කළමනාකරණය මෙහෙයවීමට" අරමුණු කරයි.

සෙන්ඩායි රාමුවට අනුව (ඇමුණුම 2), ආපදා අවදානම අවම කිරීමට නම්, ආපදා අවදානම නිරීක්ෂණය, තක්සේරුව හා අවබෝධ කර ගැනීම මත අවධානය නාභිගත කරමින් පවත්නා අභියෝග ආමන්ත්‍රණය කිරීමේ හා අනාගත අභියෝගයන්ට සූදානම් වීමේ අවශ්‍ය වේ.

සෙන්ඩායි රාමුව යටතේ ක්‍රියාකාරීත්ව උදෙසා වූ ප්‍රමුඛතා 4 වන්නේ (රූපය 9):

ප්‍රමුඛතා අංක 1: ආපදා අවදානම අවබෝධ කර ගැනීම

ප්‍රමුඛතා අංක 2: ආපදා අවදානම කළමනාකරණය කරනු පිණිස ආපදා අවදානම් තන්ත්‍රණය ශක්තිමත් කිරීම

ප්‍රමුඛතා අංක 3: ප්‍රත්‍යාස්ථතාව සඳහා ආපදා අවදානම් අඩු කිරීමෙහි ආයෝජනය කිරීම

ප්‍රමුඛතා අංක 4: සඵලදායී ප්‍රතිචාරය සඳහා ආපදා සූදානම්තාව වර්ධනය කිරීම සහ යථාතත්වයට පත් වීමේදී, පුනරුත්ථාපනයේදී හා ප්‍රතිසංස්කරණයේදී "වඩා හොඳින් ආපසු ගොඩනැගීම"

"සමෝධානිත හා සැලසුම් ඇතුළත් ආර්ථික, ව්‍යුහාත්මක, නෛතික, සාමාජීය, සෞඛ්‍ය, සංස්කෘතික, අධ්‍යාපනික, පාරිසරික, තාක්ෂණික, දේශපාලනික හා ආයතනික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හරහා නව ආපදා අවදානම් වැළැක්වීම හා පවතින ආපදා අවදානම් අඩු කිරීම පිණිස රාජ්‍යයන්ට ඇති ප්‍රාථමික කාර්යභාරය හා ආණ්ඩුවල, පළාත් පාලන ආයතනවල, පෞද්ගලික අංශයේ, සිවිල් සමාජ සංවිධානවල හා වෙනත් අයගේ භවුල් වගකීම ආපදා අවදානම් අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව මගින් හඳුනා ගැනේ. අවදානම් අඩු කිරීමේ ක්‍රියාමාර්ග මගින් ආපදා කෙරෙහි උපද්‍රව නිරාවරණය හා අවදානම් පාත්‍රතාව වැළැක්වීම හා අඩු කිරීම, ප්‍රතිචාරය හා යථා තත්ත්වයට පත් වීම සඳහා සූදානම්තාව වැඩි කිරීම, සහ එමඟින් ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීම සිදු කෙරේ."



9 රූපය. **සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතා**

1.11.2.1 ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව

ශ්‍රී ලංකාව ආපදා කළමනාකරණය වැඩිදියුණු කරනු පිණිස ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුවෙහි ඉලක්ක හතක් (7) උපයෝගී කර ගෙන ඇති අතර, සන්සන්දනය සඳහා වන පාදක කාලපරිච්ඡේදය ලෙස 2005-2015 සැලකිල්ලට ගෙන ඇත. ආපදා අවදානම අවම කිරීම සඳහා වන ජාතික ඉලක්ක හත (7) රූප සටහන 10 හි පැහැදිලි කර ඇත.

ඒ අනුව ආපදා හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව 152ක් ලෙසද, පීඩාවට පත් තැනැත්තන් සංඛ්‍යාව 186,162ක් ලෙසද හඳුනා ගෙන ඇති අතර සලකනු ලබන පාදක වර්ෂය 2015යි. ඒ අනුව ඉලක්ක වන්නේ 2030 වර්ෂය වන විට මෙම පාදක වර්ෂයට සාපේක්ෂව මරණ සංඛ්‍යාව 50%කින්, එනම් 76කින්, සහ විඳිතයින් සංඛ්‍යාව 50%කින් හෙවත්

93,081කින් අඩු කිරීමයි. එම ඉලක්ක සාක්ෂාත් කර ගනු පිණිස සෑම පාර්ශ්වයකගේම සහයෝගය අත්‍යවශ්‍ය වන අතර, මෙම වැඩසටහන නිසි හා සඵලදායී ආකාරයකට ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇත.

ඉලක්කය 1	•2005 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ මරණ සංඛ්‍යාවට සාපේක්ෂව 2030 වර්ෂය වන විට වාර්ෂික මරණ අනුපාතිකය 50%කින් අඩු කිරීම
ඉලක්කය 2	•2005 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ විත්දිතයින් සංඛ්‍යාවට සාපේක්ෂව 2030 වර්ෂය වන විට පීඩාවට පත්වූවන්ගේ සංඛ්‍යාව 50%කින් අඩු කිරීම
ඉලක්කය 3	•2005 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ දළ දේශීය නිෂ්පාදිතය (GDP) කෙරෙහි ඇති වූ වාර්ෂික ඍජු අලාභයට සාපේක්ෂව 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතය (GDP) කෙරෙහි වාර්ෂික අලාභය 50%කින් අඩු කිරීම
ඉලක්කය 4	•ආපදා හේතුවෙන් අධ්‍යාපන සේවාවන්ට එල්ල වූ බාධකයන් 50%කින් අඩු කිරීම
ඉලක්කය 5	•2025 වර්ෂය වන විට 80%කට වැඩි පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් ආපදා අවදානම් අඩු කිරීමේ වැඩසටහන් අනුගමනය කිරීම
ඉලක්කය 6	•2005 සිට 2015 දක්වා කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2030 වර්ෂය වන විට ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීමේ ප්‍රයත්නයන් 50%කින් වැඩි කිරීම
ඉලක්කය 7	•2030 වර්ෂය වන විට අවදානමේ සිටින මුළු ජනගහනයම බහුවිධ උපද්‍රව කළ් ඇතිව අනතුරු ඇඟවීමේ පද්ධති මගින් ආවරණය කිරීමයි.

10 රූපය. ශ්‍රී ලංකාව විසින් සම්මත කරන ලද ආපදා අවදානම අඩු කිරීම සඳහා වූ සෙන්ඩායි ජාතික රාමුවෙහි ඉලක්ක හත

1.12 ජාතික පාරිසරික ප්‍රතිපත්තිය සහ ජාතික අනුවර්තන සැලැස්ම

දේශගුණික විපර්යාස හා ආපදා කළමනාකරණය යන දෙකම එකිනෙකට බද්ධ විෂයන් වේ. එම නිසා, 'දේශගුණික විපර්යාස අනුවර්තනය', 'දේශගුණ බලපෑම් අවම කිරීම' හා 'ආපදා අවදානම් කළමනාකරණය' අතර සංශක්තීන් ගවේෂණය කිරීම සඳහා ඉඩප්‍රස්ථා පවතී. ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස ක්‍රියාමාර්ග ඍජුවම ආමන්ත්‍රණය කරන මුඛ්‍ය ප්‍රතිපත්ති වන්නේ ජාතික පාරිසරික ප්‍රතිපත්තිය හා දේශගුණික විපර්යාස ප්‍රතිපත්තියයි. බලපෑම් සිද්ධිරූපන සංවර්ධනය කිරීම හරහා ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසවල ඵලය සමාලෝචනය කිරීම කෙරෙහිද වැඩි අවධාරණයක් ලබා දෙමින්, *"ජනතාව මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කරන අනුවර්තනීය උපායමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් දේශගුණික විපර්යාසවල අවදානම් කළමනාකරණය කරනු ලැබේ"*[17], යනුවෙන් ශ්‍රී ලංකා රජයේ ජාතික පාරිසරික ප්‍රතිපත්තියේ **(NEP)** 2.2.10 වගන්තිය ප්‍රකාශ කරයි. මේවා මුහුදු මට්ටම ඉහළ යාම, වැසි හා නියං සුලභතාව වෙනස් වීමද ඇතුළු ප්‍රයෝජනයට ඇති ජල සම්පත් වෙනස් වීම මගින් කෘෂි නිෂ්පාදන හා ආර්ථිකය මත බලපෑම් සඳහා ප්‍රතිචාර උපායමාර්ග මත බලපානු ඇත..

එයට ආනුෂංගිකව, අභියෝග ආමන්ත්‍රණය කරනු පිණිස සියලු කොටස්කරුවන්ට හැකියාව ඇති කිරීම සඳහා මග පෙන්වීම හා විධාන ලබා දීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තු විසින් 2012 වර්ෂයේදී දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය සම්මත කරන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික අනුවර්තන සැලැස්ම **(NAP)** (2016–2025) දේශගුණික විපර්යාසවල ප්‍රතිවිපාක කෙරෙහි ශ්‍රී ලංකා රජයේ ප්‍රතිචාර සඳහා වූ රාමුව ලෙස සේවය සලසයි. එය මිනිස් ජීවිතය, පාරිසරික පද්ධති, ජාතික වත්කම් හා ආර්ථිකය මත දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කරනු පිණිස කෘෂිකර්මාන්තය, පශු සම්පත් හා ධීවර කර්මාන්තය, ජලය, සෞඛ්‍යය,

[17] ශ්‍රී ලංකා රජයේ ජාතික පරිසර ප්‍රතිපත්තිය

මානව ජනාවාස, බලශක්තිය හා සංචරණය වැනි මුඛ්‍ය අවදානම්-පාත්‍රතා සහිත අංශ වෙත දේශගුණික අනුවර්තනය මුඛ්‍යධාරාගත කිරීමේ අවශ්‍යතාව හඳුනා ගෙන ඇත.[18]

ජාතික අනුවර්තන සැලැස්මේ ප්‍රධාන පරමාර්ථ වන්නේ:-

1. දේශගුණික විපර්යාසවල බලපෑම් සඵලදායී ලෙස සමනය කර ගැනීමට තනි පුද්ගලයින්ට, ජන ප්‍රජාවන්ට හා සමාජයට ඇති අනුවර්තනීය ධාරිතාව ඉහළ නැංවීම
2. ප්‍රජාවන්හි හා පාරිසරික පද්ධතිවල ප්‍රත්‍යාස්ථතාව වර්ධනය කිරීම මගින් දේශගුණික අවදානම්වල අන්තරායට පාත්‍ර විය හැකි බව අඩු කිරීම
3. වෙනස්කම් හේතුවෙන් පැන නගින කවර හෝ ඉඩප්‍රස්ථාවන් සමාජයේ හා ජනතාවගේ උපරිම යහපත සඳහා ග්‍රහණය කර ගැනීම

1.13 කාල රාමු

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 තුළින් ප්‍රධාන ප්‍රමුඛතා, කාල රාමු සහ ජාතික හා පළාත් පාලන ආයතන බහු පාර්ශ්ව ප්‍රවේශයක් අනුගමනය කරමින් සම්බන්ධීකරණ හා විමධ්‍යගත ආකාරයකින් ක්‍රියාත්මක කළ යුතු වැදගත් තේමා ක්ෂේත්‍ර දක්වා ඇත. ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍ය ධාරාගත කිරීම ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ මූලික අංගයක් වන අතර ඒ අනුව ප්‍රමුඛතා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු බලධාරීන් සහ හවුල්කරුවන් සුදුසු පරිදි සෑම මට්ටමකම බහු පාර්ශ්වකරුවන්ගේ සහය හා හවුල්කාරිත්වය දිරිමත් කරන පරිපූර්ණ ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බවට අවධාරණය කර තිබේ. පුළුල් අර්ථයකින් ගත් කල ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ පැහැදිලි කර ඇති ප්‍රවේශය ආපදා කළමනාකරණයට සම්බන්ධ වන සහ රට තුළ ආපදා අවදානම් අවම කිරීම සඳහා ක්‍රියා කරන සෑම කෙනෙකුටම අදාළ වන අතර ඊට රජය, පුද්ගලික අංශය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, මානුෂීය ආධාර සපයන සංවිධාන ද ඇතුලත් වේ. ජාතික හා ප්‍රාදේශීය මට්ටම්න් ආපදා කළමනාකරණයේ අංශවලට අදාළ වෙනත් විවිධ සැලසුම්, 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව සකස් කළ යුතු අතර ප්‍රධාන අරමුණු, ප්‍රමුඛතා, උපාය මාර්ග, ක්‍රියාමාර්ග සහ කාල රාමුවලට අනුකූල විය යුතුය. තවද, 2005 ආපදා කළමනාකරණ පනතේ නියම කර ඇති පරිදි, ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අදාළ රජයේ අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු සහ ආයතන සතු වේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 සිට උපාය මාර්ගික අවධානයක් ඉලක්ක කර ගනිමින්, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව ඇතුළු ජාත්‍යන්තර සම්මුතීන්වල කාල නියමයන් අනුගමනය කරයි. 2030 වසර අවසානය යනු ප්‍රධාන පශ්චාත් 2015 ජාත්‍යන්තර ගිවිසුම් තුනේ එනම් ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව, තිරසාර සංවර්ධන ඉලක්ක සහ පැරිස් ගිවිසුමේ (**COP** 21) කාල රාමුවයි. ස්ථාවරභාවය ඇති කිරීම සඳහා, අදාළ පාර්ශවකරුවන් සහ ක්‍රියාකාරීන් විසින් ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ යෝජිත සියලු ක්‍රියාමාර්ග සපුරාලීම සඳහා අපේක්ෂිත වර්ෂය ලෙස ද 2030 වසර සම්මත කරගෙන ඇත.

බහු පාර්ශ්වකරුවන් විසින් ආසන්න කාල රාමු සමඟින් 2023 වසරේ සිට 2030 වසර දක්වා වසර හතක් සඳහා මෙහෙයුම් උපායමාර්ග සහ ප්‍රමුඛතා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික අරමුණු සඳහා ප්‍රධාන අවධානය යොමු වන කරුණක් වනු ඇත. (රූපය 11). තවද, සැලැස්මේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කෙටි (**T**1), මධ්‍යම (**T**2) සහ දිගු කාලීන (**T**3) වශයෙන් සම්පූර්ණ කළ යුතු අතර සෙසු ක්‍රියාමාර්ග වසර හතක කාල සීමාව තුළ අඛණ්ඩ පදනමක් සහිතව පවත්වා ගත යුතුය.

[18] මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, දේශගුණික විපර්යාසවල බලපෑම් සඳහා වූ ජාතික අනුවර්තන සැලැස්ම **2016-2025**

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 හි අපේක්ෂිත කාල රාමු			
අඛණ්ඩ	T1/T2/T3		
කෙටි කාලීන (T1)	T1 (2024)		
මධ්‍ය කාලීන (T2)	T1/T2	T2 (2026)	
දිගු කාලීන (T3)	T1/T2/T3	T2/T3	T3 (2030)

11 රූපය. ප්‍රමුඛතා ක්‍රියාවන් සම්පූර්ණ කිරීම සඳහා අපේක්ෂිත කාල රාමු - ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030

කෙටි, මධ්‍යම සහ දිගු කාලීන ලෙස සඳහන් කර ඇත්තේ නිශ්චිත පියවර සපුරාලීම සඳහා වන කාල රාමු වන අතර ප්‍රමුඛතාව අනුව ඒවා කිසිදු අනුපිළිවෙලක් සනිටුහන් නොකරයි. අපේක්ෂිත ඇතැම් ක්‍රියා දිගු කාලීන අදියරේ සිට කෙටි කාලීන අදියර දක්වා වෙනස් විය හැකි අතර අමතර කාලයක් ගත නොකොට සැලසුම් කළ ක්‍රියාවන් සපුරාලීම සහතික කිරීමට සියලු ප්‍රයත්න දැරීම සිදු කළ යුතුය. ප්‍රකාශිත ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීමේදී වෙනසක් පවතින අතර එලදායී ලෙස ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් වගකිවයුතු අමාත්‍යාංශය, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු ආදිය නියමිත කාල රාමුවලට අනුව නිශ්චිත ආපදා කළමනාකරණ සැලසුම් හෝ ආයතනික ක්‍රියාකාරී සැලසුම් තුළ මෙම ක්‍රියාමාර්ග හඳුනාගෙන වර්ගීකරණය සිදු කළ යුතුය.

1.14 අනාගත ප්‍රතිශෝධන හා යාවත්කාලීන කිරීම්

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම "ප්‍රගතිශීලී ලේඛනයක්" ලෙස සැලකිය හැකි අතර, එය කලින් කලට සමලෝචනයට ලක් කෙරේ. රටේ පවතින වාතාවරණය හමුවේ අවශ්‍ය පරිදි (එනම් ක්‍රියාත්මක කිරීමේ සිට අවුරුදු 5 කින් හෝ විශාල ආපදාවන්ට හෝ වෙනත් යම් වාතාවරණයකට පසුව කෙරෙන සමාලෝචනයකින් නිශ්චය කෙරෙන පරිදි) බහුවිධ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තහවුරු කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව සැලැස්ම යාවත්කාලීන කරනු ඇත. එය ආපදා කළමනාකරණය පිළිබඳ වෙනස් වන දැනුම සහ ගෝලීය හොඳම භාවිතයන් මෙන්ම යාවත්කාලීන සහ පිළිගත් ඕනෑම ජාතික ප්‍රතිපත්ති, රෙගුලාසි සහ භාවිතයන් මත පදනම්ව වැඩිදියුණු කෙරේ. 2023 - 2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මත පදනම්ව, සියලුම ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර, ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ ප්‍රගතිය වඩාත් හොඳින් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වාර්ෂික ජාතික වැඩ සැලසුම් සකස් කිරීමට නියමිතය.

2 අවදානම් හරස්කඩ

2.1 බහුවිධ හානිකර තත්ත්වයන් හා අවදානම්

ස්වාභාවික උපද්‍රව හෝ මිනිසුන් විසින් සිදු කරන ලද ක්‍රියාකාරකමක ප්‍රතිඵලයක් ලෙසින් හෝ ඒ දෙකෙහිම සංකලනයක ප්‍රතිඵලයක් ලෙසින් ආපදාවක් සිදු විය හැකිය.

සීඝ්‍ර නාගරීකරණය සහ කාර්මීකරණය ආශ්‍රිත සංවර්ධන ක්‍රියාකාරකම් ඉහළ යාම නිසා මිනිසා විසින් ඇති කරන ආපදාවල තර්ජනය සහ සම්භාවිතාව ද වැඩි වී ඇති අතර එමඟින් සිදුවිය හැකි ජීවිත හානි, තුවාල හා දේපළ විනාශය ද ඉහළ ගොස් තිබේ.

DesInventar හෙවත් ශ්‍රී ලංකාවේ ආපදා තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්වභාවික උපද්‍රව මඟින් සිදු වන ආපදා ප්‍රධාන වශයෙන් කාණ්ඩ පහකට වර්ගීකරණයට ලක් කරයි. ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවේ ඉලක්ක සපුරාගැනීම අධීක්ෂණය කිරීමේ පහසුව පිණිස භූ භෞතික, ජල විද්‍යාත්මක, කාලගුණ විද්‍යාත්මක, දේශගුණ විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක ලෙස වර්ගීකරණයට ලක් කර ඇත. ස්වභාවික ආපදා නිසා ඇති වන විපත් මානව ක්‍රියාකාරකම්වලට අදාල තත්ත්වයන් මඟින් වැඩි බලපෑමකට ලක් වන අතර ඒවා ආන්තික කාලගුණික සිදුවීම්වල තීව්‍රතාවය සහ වාර ගණන වැඩි කිරීමට ද හේතු වී තිබේ. එපමණක් නොව අධික වර්ෂාව නිසා ඇතිවන ගංවතුර, නාය යෑම්, සුළි සුළං මෙන්ම නියඟය ආදි සියල්ල ස්වභාවික වන අතර මානව ක්‍රියාකාරකම් සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ඒවායේ බලපෑම් වඩාත් දරුණු වී ඇත. සීඝ්‍ර නාගරීකරණය සහ කාර්මීකරණය ආශ්‍රිත සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි වීම නිසා මිනිසුන් නිසා සිදු වන ආපදාවලින් එල්ල වන තර්ජනය සහ සම්භාවිතාව ඉහළ යාමට ද හේතු වී ඇති අතර එමඟින් දේපළවලට, සතුන්ට හා වෘක්ෂලතාවලට සිදුවිය හැකි හානි, තුවාල හා විනාශයේ ප්‍රමාණය ඉහළ ගොස් තිබේ. තවද, රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික සහ ඉහළ බලපෑමක් සහිත පුපුරණ ද්‍රව්‍ය (**CBRNE**) ආශ්‍රිත අනතුරු හේතුවෙන් එල්ල වන තර්ජන මෙන්ම හදිසි අවස්ථාවලට හෝ ආපදාවලට ද මිනිසුන් ගොදුරු වේ.

2005 වසරේ ආපදා කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික සහ මිනිසා විසින් සාදන ලද උපද්‍රව **21**ක් (ඇමුණුම **3**) ලැයිස්තුගත කර ඇත. ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන උපද්‍රව අතර ජලය හා කාලගුණ විද්‍යාත්මක සම්භවයක් සහිත ගංවතුර, නියඟ, නායයෑම්, සුළි සුළං / අධික සුළං, කුණාටු සහ වෙරළ ඛාදනය මෙන්ම සුනාමි, මුහුදු මට්ටම ඉහළ යාම, අකුණු, ගිනි, භූමිකම්පා, කාර්මික උපද්‍රව, ගොඩනැගිලි කඩා වැටීම්, තෙල් කාන්දුවීම් සහ සෞඛ්‍ය උවදුරු දැක්විය හැකිය.

මිනිසා විසින් ඇති කරන ලද ආපදාවලට සත්ව ප්‍රහාර, තෙල් කාන්දුවීම් සහ සන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී වැරදි කළමනාකරණය මෙන්ම වන විනාශය වැනි පාරිසරික විනාශකාරී ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ජල දූෂණය (එනම් ක්ෂුද්‍ර ප්ලාස්ටික්, රසායනික ද්‍රව්‍ය, පළිබෝධනාශක යනාදිය මිශ්‍ර වීමෙන්) හේතුවෙන් නිදන්ගත වකුගඩු රෝග වැනි විවිධ සෞඛ්‍ය උවදුරු ඉහළ යමින් පවතින අතර මෝසම් වැසි ලැබෙන කාලසීමාවලදී උග්‍ර වන ඩෙංගු වැනි නිරන්තරයෙන් වාර්තා වන වසංගත ද පවතී.

අවදානම් තොරතුරු අදාල පාර්ශවකරුවන් අතර මුඛ්‍යධාරාගත කළ යුතු වන්නේ එමඟින් අවදානම් අවම කිරීම පිළිබඳ දැනුම්වත් තීරණවලට එළැඹීමට සහ සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීමට මෙන්ම ඵලදායී මැදිහත්වීම්වලට මග පාදන බැවිනි. අවදානම් තොරතුරු කාර්යක්ෂමව හුවමාරු කර ගැනීම සඳහා මෙවලම් සහ යාන්ත්‍රණ පැවතීම, අවදානම් තක්සේරු කිරීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙන්ම දෘශ්‍යකරණය සහ ඵලදායී සන්නිවේදනය කිරීමට ඇති හැකියාව මුහුණ දෙන අවදානම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට මඟ විවර කරන අතර අවදානම් අවම කිරීමේ ප්‍රවේශයන් සඳහා මෙන්ම විවිධ වැඩසටහන්වල ඒවා වඩා හොඳින් භාවිත කිරීම සඳහා ද අවස්ථාව සලසයි.

ජනගහනය ඉහළ යාම, සැලසුම් නොකළ වේගවත් නාගරීකරණය, අවදානමට ලක්විය හැකි සහ ඉහළ අවදානම් කලාපවල අනවසර සංවර්ධනය, පාරිසරික හායනය දේශගුණික විපර්යාස හා සබැඳිව ශ්‍රී ලංකාව විවිධ ආකාරයේ ආපදාවලට ගොදුරු වීමේ අවදානම උග්‍ර කර ඇති බව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත.

මිනිසා විසින් ඇති කරන ලද විවිධ අපද්‍රව්‍ය සහ අනතුරු හේතුවෙන් මෑත කාලීනව ප්‍රජාවන් සහ සතුන් ඉහළ අවදානම්වලට නිරාවරණය වී තිබේ. ගැටුම්, කැරලි, වසංගත මෙන්ම රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණ සහ න්‍යෂ්ටික තර්ජන සහ ජීව විද්‍යාත්මක උපද්‍රව හා ඒ ආශ්‍රිත සිදුවීම් හේතුවෙන් උද්ගත වන අවදානම්වලට මුහුණ දීම සඳහා වැඩිදියුණු කළ සහ ප්‍රමාණවත් සූදානමක් සහ සැලසුම් ක්‍රියාමාර්ග අවශ්‍ය වී තිබේ.


මතු කියැවෙන තොරතුරු මගින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන **DesInventar** දත්ත සමුදාය සහ විවිධ පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන හා ප්‍රකාශනවලින් ලබාගත් විස්තර පදනම් කරගත් උපද්‍රව කිහිපයක වත්මන් තත්ත්වය පැහැදිලි කර ඇත. 2010 වසරේ සිට 2022 වසර දක්වා (එනම් 2022 වසරේ සැප්තැම්බර් මාසය දක්වා) පවත්නා තොරතුරු ශ්‍රී ලංකාවට බලපාන පොදු ආකාරයේ උපද්‍රව සහ ආපදා පිළිබඳ අවදානම් දැක්ම අවබෝධ කර ගැනීමට භාවිතා කර ඇත.

2.2 බහුලව සිදුවන ආපදාවල බලපෑම් මට්ටම

2.2.1 ගංවතුර


ගංවතුර හෙවත් ජලගැලීම් වනාහි ශ්‍රී ලංකාවේ වඩාත් සුලභ, පුළුල්ව පැතිරුණු හා විනාශකාරී ස්වභාවික උපද්‍රවය වෙයි. ගංවතුරවල ඍණාත්මක බලපෑම් ජීවිත අහිමිවීම්වලට සීමා නොවේ. මෙම බලපෑම් යටිතල පහසුකම්, පරිසරය සහ පීඩාවට පත් ප්‍රදේශයද ඉක්මවා කෘෂිකර්මය ආශ්‍රිත ජීවනෝපායන් වැනි ආර්ථික අංශවලටද ව්‍යාප්ත වේ. ගංවතුර බෙහෙවින්ම නාගරික පසුබිම්වල ප්‍රාදේශිකව සීමා වූ මෝසම් ආශ්‍රිත ක්ෂණික ජලගැලීම් වේ. ගංවතුර හේතුවෙන් වාර්ෂික අලාභය ඇමෙරිකන් ඩොලර් මිලියන 240ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ. ගංවතුර ප්‍රභේදයන්ට ගංගා ආශ්‍රිත ජලගැලීම්, අධික වැසි නිසා ඇති වන ජලගැලීම්, ප්‍රාදේශීයව සීමා වූ ජලගැලීම් හා ජලාශ ආශ්‍රිත (ජලාශ පළුදු වීම හේතුවෙන් ඇති වන) ජලගැලීම් ඇතුළත්ය.

2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පුද්ගලයින් 7,053,064 ක් පීඩාවට පත්ව ඇති අතර, මරණ 401 ක් සිදු විය. **DesInventar** දත්ත සමුදායට අනුව, වර්ෂ 2014, 2015, 2018 හා 2021 අයහපත්ම වර්ෂ වූ අතර, දිස්ත්‍රික්ක 25න් 23ක්ම ගංවතුරින් පීඩාවට පත්ව තිබුණි. වඩාත් පීඩාවට පත් දිස්ත්‍රික්ක වූයේ මඩකලපුව, ගම්පහ, කොළඹ, අම්පාර, පුත්තලම, ගාල්ල, යාපනය හා මාතර යන දිස්ත්‍රික්කයි (රූපසටහන 12).



12 රූපය. දිස්ත්‍රික්ක අනුව ගංවතුරින් පීඩාවට පත් මුළු ජනගහනය **2010-2022**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ගංවතුර කළමනාකරණය කිරීමේ ප්‍රමුඛ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (**SLLDC**)[19] කොළඹ මහනගර කලාපය තුළ ජලගැලීම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. ප්‍රාදේශීයව ඇති වන ජලගැලීම් පාලනය කිරීම ඒ ඒ පළාත් පාලන ආයතනයේ වගකීම වෙයි. ජල සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය විස්තරාත්මක ගංවතුර (රූපය 13) හා නියං අවදානම් තක්සේරු සිදු කොට, ගංගා ද්‍රෝණි 10 ක් (කැලණි, නිල්වලා, ගිං, මහවැලි, අත්තනගලු ඔය, මහ ඔය, දැදුරු ඔය, කලා ඔය, මල්වතු ඔය හා ගල් ඔය) සඳහා දේශගුණික ප්‍රත්‍යාස්ථතාව දියුණු කිරීමේ ව්‍යාපෘතිය (**CRIP**) යටතේ ගංගා නිම්න ආයෝජන සැලසුම් සංවර්ධනය කර තිබේ. ඊට වාරිමාර්ග අමාත්‍යාංශය හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය එක්ව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (**UNDP**) සහ හරිත දේශගුණික අරමුදලේ (**GCF**) තාක්ෂණික හා මූල්‍ය අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (**CRIWMP**) මඟින් ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (**DoM**) විසින් ද සහාය ලබා දෙයි.



13 රූපය. ශ්‍රී ලංකාවේ ගංවතුර අවකාශීය ව්‍යාප්තිය

2.2.2 නියඟ


නියඟය වනාහි මන්දගාමීව ක්‍රියාත්මක වන, පුළුල්ව පැතිරුණු සමාජ-ආර්ථික බලපෑම් සහිත, යලි යලිත් ඇති වන සංසිද්ධියකි. නියං බලපෑම් ශ්‍රී ලංකාවේ නියං ඇති වීමේ ප්‍රවණතාව ඇති වියළි කලාපය තුළ පමණක් නොව, අතරමැදි තෙත් කලාපයන්හිද නියං බලපෑම් වාර්තා වේ. නියඟයේ සුලභතාව හා බරපතල බව දේශගුණික විපර්යාස, වන සංහාරය, ඉඩම් භායනය ආදිය නිසා මෙන්ම එල් නිනෝ වැනි ගෝලීය සංසිද්ධි නිසාද වැඩි වී තිබේ නියඟයේ සුලභතාව හා බරපතල බව

[19] ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (**SLLDC**)

දේශගුණික විපර්යාස, වන සංහාරය, ඉඩම් හායනය ආදිය නිසා මෙන්ම එල් නිනෝ වැනි ගෝලීය සංසිද්ධි නිසාද වැඩි වී තිබේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව[20] විසින් සංවර්ධනය කරන ලද නියං උපද්‍රව ස්වරූප සටහන අතරමැදි හා වියළි කලාප ප්‍රදේශයන්හි ඉහළ මට්ටමේ සිට ඉතා ඉහළ මට්ටම දක්වා වූ නියං විභවයක් දැක්වීය (රූපසටහන 14) ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය (NDRSC) විසින් ඉදිරිපත් කෙරෙන දත්ත මගින් අනාවරණය වන්නේ 2016 වර්ෂයේදී භෝග පාළුව සඳහා වන්දි ලබා දීම සඳහා රුපියල් බිලියන 5.2 ක් වැය කරන ලද බවත්, 2017 වර්ෂයේ පානීය ජලය හා වියළි ආහාර සලාක සඳහා සැපයීමට රුපියල් බිලියන 5.1 ක් වැය වූ බව සහ 2018 වර්ෂයේ නියං සහන වශයෙන් රුපියල් බිලියන 8.1 ක් වැය කරනු ලැබූ බවත්ය.

ජනගහනය වැඩි වීම, විද්‍යාත්මක නොවන ඉඩම් පරිහරණ සැලසුම්කරණය, ඉඩම් පරිහානිය, අධික කෘෂිකාර්මික කටයුතු, අයහපත් ජල කළමනාකරණය සහ අප්‍රමාණවත් දැනුවත්භාවය හා සූදානම්භාවය හේතුවෙන් නියඟයට ඇති අන්තරාය-පාත්‍රතාව වැඩි වී තිබේ. නියං අවදානම් කළමනාකරණයේ ඇති සංකීර්ණ ස්වභාවය නිසා ඒ සඳහා බහු-නියෝජිතායතනික ප්‍රවේශයක් අවශ්‍ය වන අතර විස්තීර්ණ නියං අවදානම් කළමනාකරණය සඳහා මනා ලෙස සම්බන්ධීකරණය කරන ලද ප්‍රවේශයක් අවශ්‍ය කෙරේ.




14 රූපය. නියං උපද්‍රව ස්වරූපය

[20] ශ්‍රී ලංකාවේ උපද්‍රව පැතිකඩ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, 2012


DesInventar දත්ත සමුදායට අනුව, **2010** හා **2022** අතර සමස්ත වශයෙන් **9,621,862** ක් දෙනා පීඩාවට පත් වූ අතර ඉන් අයහපත්ම වර්ෂ ලෙස වාර්තා වූයේ **2014-2017** කාලපරිච්ඡේදයයි (**7** රූපසටහන). නියඟය හේතුවෙන් වූ සාමාන්‍ය වාර්ෂික අලාභය ඇමෙරිකන් ඩොලර් මිලියන **40**ක්[21] ලෙස ගණනය් බලා ඇත. කෙසේ වුවද මෙය කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ඔබ්බට ආංශික නියං බලපෑම් දත්ත සීමා වීම හේතුවෙන් වූ අවතක්සේරුවක් වීමටද පිළිවන.

වඩාත්ම බරපතල ලෙස නියඟයෙන් බැට කෑ දිස්ත්‍රික්ක ලෙස කුරුණෑගල, පුත්තලම, මඩකලපුව, යාපනය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක හැඳින්විය හැකි අතර ඒවා අතරමැදි හා වියළි කලාපවල පිහිටි දිස්ත්‍රික්කයි (රූපය 16).

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (**UNDP**) හා ජාතික සොබාදම් සංරක්ෂණ සංගමය (**IUCN**) විසින් අරමුදල් සම්පාදනය කරන ලද හරිත දේශගුණික අරමුදලේ ප්‍රතිපාදිත ව්‍යාපෘති දෙකක් සහ ලෝක බැංකුව අරමුදල් සපයන දේශගුණික විපර්යාස ප්‍රත්‍යාස්ථතාව දියුණු කිරීමේ ව්‍යාපෘතිය (**CRIMP**) හා දේශගුණික සුහුරු සමෝධානිත කෘෂිකර්ම ව්‍යාපෘතිය (**CSIAP**) ඇතුළු තවත් ආධාරදායක අරමුදල් සම්පාදිත ව්‍යාපෘති නියං බලපෑම් අවම කරනු පිණිස ක්‍රියාත්මකව පවතී. ගංවතුර ප්‍රශ්නයේදී මෙන්ම, නියං හානි අවම කරනු පිණිස වූ සොබාදහම පාදක ප්‍රවේශයන් සමග කටයුතු කිරීමේ විෂය ක්ෂේත්‍රය ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කැපී පෙනේ.



15 රූපය. නියඟය හේතුවෙන් වසර 2010 සිට 2021 දක්වා විපතට පත් පුද්ගලයින් සංඛ්‍යාව




16 රූපය. නියඟයේ බලපෑම - වසර 2010 සිට 2022 වසර දක්වා දිස්ත්‍රික්ක අනුව

[21] මූල්‍ය ආපදා අවදානම් තක්සේරුව, ලෝක බැංකුව, **2016**

2.2.3 නායයාම්

ගුරුත්වයේ බලපෑම හේතුවෙන් බෑවුම පහළට පාංශු මෙන්ම පාෂාණ ද්‍රව්‍ය ප්‍රවාහනය වීම ආශ්‍රිත පුළුල් පැතිකඩයන් ගණනාවක් නාය යෑම්වලට සම්බන්ධ වේ. කෘෂිකර්මය, මාර්ග ඉදිකිරීම, නිවාස හා නාගරික යටිතල පහසුකම් ආදිය හා සම්බන්ධ ඉඩම් පරිහරණය හා භූ නිර්මාණ වෙනස්කම් මගින් උත්තේජිත මානව කාරක ඉහළ යාම නිසා පෙර සියවස් ගණනාවක් මුළුල්ලේ ආරක්ෂිතව පැවති කඳු බෑවුම්වලද නාය යෑමේ හැකියාව ඉහළ ගොස් තිබේ.

නාය යෑම් සාමාන්‍යයෙන් මෝසම් හා අන්තර්-මෝසම් කාලය තුළ අධික වැසි හෝ සුළි සුළං පූර්ව වැසි සමග සම්බන්ධ වේ. දේශගුණික විපර්යාස මෙරට තෙත් කලාපය තුළ වර්ෂාපතන තීව්‍රතාව වැඩි කරමින් එහි නාය යාමේ විභවය වඩා අයහපත් කර තිබේ. පරිපාලන දිස්ත්‍රික්ක 13ක[22] වර්ග කිලෝමීටර් 20,000කට ආසන්න (රටේ වර්ගඵලයෙන් 30%ක පමණ) ප්‍රදේශයක් නාය යාම්වලට නැඹුරු ලෙස සැලකේ. (රූපසටහන 17)[23].



17 රූපය. නායයාම් කලාප සිතියම්

[22]බදුල්ල, කොළඹ, ගම්පහ, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොනරාගල, නුවරඑළිය, රත්නපුර

[23] ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) වාර්තාව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය **(NBRO)** නාය යාම් උපද්‍රව සම්බන්ධයෙන් ප්‍රමුඛ නියෝජිතායතනයයි. නාය යාමට නැඹුරු දිස්ත්‍රික්ක 13 සඳහා 1:50,000 පරිමාණයේ නාය යාම් කලාපකරණ සිතියම් තිබේ. අතීත නාය යාම් මත පදනම්ව හඳුනා ගත් දරුණු ලෙස බලපෑමට ලක් වන ප්‍රදේශ සඳහා 1:10,000 පරිමාණයේ සිතියම් සංවර්ධනය කර ඇති අතර, ඉහළ අවදානම සහිත නාගරික ප්‍රදේශ සඳහා 1:5000 පරිමාණයේ සිතියම් ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය **(NBRO)** විසින් අවදානම් අවම කරනු පිණිස අනාගත සැලසුම්කරණය සඳහා දිස්ත්‍රික්ක 9 ක් තුළ ඉහළ නාය යාම් අවදානම සහිත ප්‍රදේශයන්හි පිහිටි නිවාස 14,860 ක් හඳුනා ගෙන තිබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ **(DMC) DesInventar** දත්ත අනුව, 2010 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ නාය යාම් මගින් 188,595 ක් ජනතාව පීඩාවට පත්ව ඇති අතර, 232 දෙනෙක් මියගොස් නිවාස 4,964 ක් හානියට පත්ව හෝ විනාශ වී තිබුණි.

2.2.4 සුළි සුළං/ චණ්ඩ මාරුත


ඉන්දියන් සාගරයේ දිවයිනක් වන ශ්‍රී ලංකාව සුළි සුළං හෙවත් වා සුළි වෙරළ හරහා හෝ අසලින් යන විට තද සුළංවලින් හා ජලගැලීම් ඇති කරන තද වර්ෂාපතනයෙන් පීඩාවට පත් වෙයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අනුව, වර්ෂ 1881 සිට 2020 දක්වා වූ 140-අවුරුදු කාලපරිච්ඡේදය තුළ වාසුළි කුණාටු 11ක් හා සුළි සුළං 6ක් පමණක් මෙම දිවයින හරහා ගමන් කර ඇති අතර, ඒවා නොවැම්බර් හා දෙසැම්බර් මාස ඇතුළත ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළෙන් දිවයිනට ඇතුළු වී තිබේ (රූපය 18).



18 රූපය. වසර 1811 සිට 2021 වසර දක්වා සුළි සුළං හා ගමන් පථ

ඓතිහාසික දත්ත අනුව, ශ්‍රී ලංකාවේ භූමි ස්කන්ධය තුළ සුළි සුළං ගොඩබිමට සේන්දු වීමේ නිශ්චිත සංඛ්‍යාතයක් හඳුනා ගෙන නොමැත. එමෙන්ම නියත යලි පැමිණීමේ කාලාන්තරයක් ඇති බවටද සප්‍රමාණවත් සාක්ෂ්‍ය තිබී නැත. 2010 හා 2022 වර්ෂ අතර ඩෙස්ඉන්වෙන්ටා දත්ත මගින් දැක්වෙන්නේ පීඩාවට පත් වැඩිම ජන සංඛ්‍යා මඩකලපුව, යාපනය, කළුතර හා ගාල්ල දිස්ත්‍රික්කවලින් හමු වූ බවයි (රූපය 19).

ශ්‍රී ලංකාව ආශ්‍රිත සුළි සුළං තොරතුරු මගින් පෙන්වා දෙන්නේ ප්‍රාදේශීයව සිදු වන වණ්ඩ මාරුත අවස්ථා සුළි සුළං කුණාටුවලට හා ඒ ආශ්‍රිත කුණාටු සුළංවලට වඩා සුලභ වන අතර ඒවා සෑම වර්ෂයකම නිවාස දහස් ගණනකට හානි සිදු කරන බවයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට (DoM) හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට (DMC) අනුව, පසුගිය අවුරුදු 35ක කාලපරිච්ඡේදය තුළ තද හා ප්‍රාදේශීයව ඇති වූ සුළං හේතුවෙන් නිවාස 55,000කට අධික සංඛ්‍යාවකට හානි සිදු විය.



19 රූපය. දිස්ත්‍රික්ක අනුව වණ්ඩ මාරුත හා සුළි සුළං මගින් පීඩාවට පත් සංඛ්‍යා (2010-2022 වණ්ඩ මාරුත හා සුළි සුළං හේතුවෙන් පීඩාවට පත් සංඛ්‍යා)


කල් ඇතිව අනතුරු ඇඟවීම් නිකුත් කොට ජනයා ආරක්ෂාකාරී ස්ථානවලට යැවීම ප්‍රමාණවත් කාලයක් ලැබෙන සේ, බෙංගාල බොක්කේ සුළි සුළං වර්ධනය වීම කලින්ම නිරීක්ෂණය කිරීමේ ධාරිතාව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අත්කර ගෙන තිබේ. එමෙන්ම, ප්‍රතිචාර නියෝජිතායතනවලට සුළි සුළංවල ගමන් පථය හඳුනා ගෙන ප්‍රතිචාරය සඳහා සූදානම් විය හැකි වන සේ සර්ම-කලාපික සුළි සුළං ස්වරූපයද සම්පූර්ණ කොට සපයා දී තිබේ.

2.2.5 සුනාමි

2004 දෙසැම්බර් 26 වන දින ඉන්දුනීසියාවේ උතුරු සුමාත්‍රා වෙරළෙන් ඔබ්බෙහි රිච්ටර් මාපාංක 9.0 ක භූවලනයක් මගින් ඇති කෙරුණු ඉන්දීය සාගර සුනාමියෙන් බරපතල ලෙසම පීඩාවට පත් රටවලින් ශ්‍රී ලංකාවද එකක් විය. සුනාමිය ශ්‍රී ලංකාවට අඩු සංඛ්‍යාත, ඉහළ බලපෑම් සහිත සිදුවීමක් විය. ඉන් පෙර අත් නොවිඳි මෙම සිදුවීමෙන් 35,000කට අධික පිරිසක් මිය ගොස් දස ලක්ෂයකට ආසන්න පිරිසක් අවතැන් වූහ. එමගින් නිවාස 99,000 කට හානි සිදු වී, ඇස්තමේන්තුගත150,000 ක් දෙනා හට ජීවනෝපායන් අහිමි විය. යටිතල පහසුකම් හා ප්‍රාග්ධන වත්කම්වලට සිදු වූ හානිය ඇමෙරිකානු ඩොලර් බිලියනයක් පමණ වෙතැයි ඇස්තමේන්තු කරන ලද අතර, එය එකල දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 4.5% ක් විය. බරපතලම බලපෑම ඇති වූ ආර්ථික ක්ෂේත්‍රයන් වූයේ සංචාරක හා ධීවර ක්ෂේත්‍රයන්ය.

මෙරට මුළු වෙරළබඩ කලාපයම ආවරණය වන පරිදි සුනාමි උපද්‍රව පැනිකඩ 1: 10,000 හා 1: 50,000 පරිමාණවලින් විස්තීර්ණ ලෙස සම්පූර්ණ කරනු ලැබ තිබේ. සුනාමි සිතියම (රූපය 20) මගින් අවකාශීය ව්‍යාප්තිය හා තලයෙහි උස වැනි විස්තර සැපයෙන බැවින්, එය මෙරට වෙරළබඩ කලාපයන්හි තීරණ ගැනීමේ ක්‍රියාවලියට බෙහෙවින් දායක වෙයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (DoM) සුනාමි පිළිබඳව කල් ඇතිව අනතුරු ඇඟවීමේ නියෝජිතායතනය ලෙස (ජාතික සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය ලෙස හඳුනාගෙන ඇත - NTWC) නම් කරනු ලැබූ අතර ආපදා කළමනාකරණ

මධ්‍යස්ථානය (**DMC**) අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීම සඳහා වගකීම දරයි. (ජාතික ආපදා කළමනාකරණ සංවිධානය - **NDMO** ලෙස පිළිගෙන ඇත).




20 රූපය. සුනාමී උපද්‍රව පැතිකඩ

2.2.6 මුහුදු මට්ටම ඉහළ නැගීම

ජාතික උපද්‍රව පැතිකඩ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස මඩුල්ලේ **(IPCC)** සිද්ධි නිරූපණ මත පදනම්ව මුහුදු මට්ටම ඉහළ යාම නිසා ඇති වන ගංවතුර පිළිබඳ අවුරුදු 25, 50, 75 සහ 100 සඳහා වූ 1:250,000 පරිමාණයේ සිතියම් ඉදිරිපත් කර ඇත. (රූපසටහන 21)

මුහුදු මට්ටම ඉහළ නැගීම නිසා වෙරළබඩ ප්‍රදේශයේ මිරිදිය ජලාශයන්ට හා භූගත ජලයට ලවණ ජලය එක් වීම ඉහළ ගොස් තිබේ. මෙය ගෘහස්ථ ජල සැපයුම, කෘෂිකර්මාන්තය හා පරිසරය මත සැලකිය යුතු ඵලයක් ඇති කරයි. කෘෂිකර්මාන්තය සඳහා නියාමනයකින් තොරව භූගත ජලය පරිහරණය කිරීම සහ භූගත ජලය විශාල ප්‍රමාණවලින් පරිභෝජනය කරන සංචාරක හා වෙනත් පහසුකම් සහ නගර ආදිය ස්ථානගත කිරීම මගින් මුහුදු ජලය මිශ්‍ර වීමේ විභවය වඩාත් නරක අතට හැරවීමට ඉඩ ඇත.




21 රූපය. පුරෝකථනය කර ඇති මුහුදු මට්ටම ඉහළ නැගීම - 2100

2.2.7 කුණාටු රළපහර

සුළි සුළංවලදී විනාශයන්හි වැඩි කොටසක් සිදු වන්නේ කුණාටු රළපහර නිසා වන අතර ශ්‍රී ලංකාවේ නැගෙනහිර, උතුරු හා වයඹ වෙරළබඩ කුණාටු රළපහරවලින් වඩාත් හානියට පත් වන ප්‍රදේශ වේ.

මෙරට ජාතික උපද්‍රව පැතිකඩ තුළ, 1: 50,000 පරිමාණයේ මූලික සිතියම් අනුගමනය කරමින් අතීත දත්ත හා සංඛ්‍යාත්මක නිරූපනය මත පදනම්ව පිළියෙළ කරන ලද කුණාටු රළපහර පැතිකඩ ඇතුළත් වේ. ගංවතුර සිතියම් තුළ ගැඹුර පරාසයන් සහිත අවකාශීය ව්‍යාප්තිය ප්‍රකාශ කරනු ලබයි. අවුරුදු 10, 30, 90 හා 300 කාලපරිච්ඡේදයන්ට අනුරූපී වන පැයට කිලෝමීටර් 110, 160, 215 හා 275 වශයෙන් විවලනය වන සුළං වේගයන් යටතේ ආදර්ශ අධ්‍යයන සිදු කර ඇත. මෙම අධ්‍යයනයන්හිදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මෙම දැනුම සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමෙහිලා විශ්වවිද්‍යාල හා වෙරළාරක්ෂක බලධාරීන් සමග ඒකාබද්ධව කටයුතු කරයි. පැයට කිලෝමීටර් 270 ක උපරිම ධාරිත සුළං වේගයක් සහිත සුළි සුළං සංසිද්ධියක් මගින් ඇති කෙරෙන අනුකෘතික උච්ඡතම රළපහර උස ප්‍රමාණයන් රූපසටහන 22 තුළ දක්වා ඇත.




22 රූපය. අනුකෘතික උච්ඡතම රළුපහර උස ප්‍රමාණයන් රළුපහරේ උස (මීටර්)

2.2.8 වෙරළ බාදනය

වෙරළ බාදනය වනාහි මානව-ජනක ක්‍රියාකාරකම් හේතුවෙන් වඩා අයහපත් කෙරෙන ස්වභාවික උපද්‍රවයකි. එය ප්‍රධාන කොටම ඉදිකිරීම් කර්මාන්තය සඳහා ගංගා වැලි අධික ලෙස ලබා ගැනීම හේතුවෙන් සහ වෙරළ මත හෝ අසබඩ ප්‍රදේශයන්හි නුසුදුසු කෘත්‍රිම ව්‍යුහයන් හේතුවෙන් වෙරළබඩ ප්‍රදේශයන්හි අවසාදිතවල ස්වභාවික සමතුලිතතාව නැති වීම නිසා සිදු වේ. ස්වභාවික පරිසරයේ සංරචකයක් වශයෙන් වෙරළබඩ ප්‍රජාවන්ගේ ජීවනෝපායන්ට හා පොදුවේ ජාතික ආර්ථිකයට විපුල පල ගෙන දිය හැකි, අවසාදිත ක්‍රියාවලිය සහ පාරිසරික පද්ධති වටිණාකම් පුනර්ජීවනය කිරීම දුෂ්කරය. වෙරළ බාදනය 1960 ගණන්වල සිට සටහන් කරනු ලැබ ඇති අතර, පාරිසරික තිරසරභාවය, ප්‍රජා ජීවනෝපාය හා ජාතික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් එහි බලපෑම් හීන කරනු පිණිස ප්‍රතිකර්ම යොදනු ලැබේ. වෙරළ බාදන උපද්‍රවය තක්සේරු කිරීමේදී, විභව්‍ය බාදන තීව්‍රතා ආකෘතිගත කොට, සිතියම්කරණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ ජාතික උපද්‍රව පැතිකඩ තුළ ඇතුළත් කරනු ලැබ තිබේ. වෙරළබඩ කලාප කළමනාකරණ පිළිවෙත් සෘජුව හා වක්‍රව ධීවර බිම්, කොරල් සෞඛ්‍යය හා වෙරළබඩ සංචාරක කර්මාන්තයේ දීර්ඝ-කාලීන තිරසාරභාවය මත බලපෑම් ඇති කරයි. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (**CC&CRM**) කඩොලාන ඇතුළු ප්‍රත්‍යාස්ථ වෙරළබඩ පාරිසරික පද්ධතිවලින් පල ලබන ආංශික නියෝජිතායතනයන්හි සහයෝගය ඇතිව වෙරළබඩ අවදානම් තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වගකීම දරයි.

2.2.9 අකුණු

රත්නපුර, ගාල්ල, කෑගල්ල, අනුරාධපුරහා කුරුණෑගල ආදී. දිස්ත්‍රික්කයන්හි සාපේක්ෂ වශයෙන් වඩා වැඩි අකුණු හානි සිද්ධි වාර්තා වී ඇති බව **DesInventar** දත්ත සමුදායෙහි තොරතුරු පෙන්වා දෙයි (රූපසටහන - 23). කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරන ලද අකුණු උපද්‍රව පැතිකඩ මගින් අකුණු සුලභව සිදු වන කලාප පිළිබඳ විස්තර ලබා දෙනු ලබන අතර, එමගින් ජනතාවගේ ආරක්ෂාව සඳහා වැසි කාලපරිච්ඡේදය තුළ අනතුරු ඇඟවීම් නිකුත් කළ හැකි වේ. මුළු රටම සඳහා 1:250,000 පරිමාණයේ අකුණු උපද්‍රව සිතියම් සම්පූර්ණ කරනු ලැබ ඇත. කාලගුණ විද්‍යා ස්ථාන 20 ක් වෙතින් ලබා ගන්නා ලද අතීත තොරතුරු හා දත්ත පදනම් කර ගෙන මාසික අකුණු සිතියම් මෙන්ම වාර්ෂික අකුණු උපද්‍රව සිතියම්ද පිළියෙළ කරනු ලැබ ඇත.[24] මෙම තොරතුරු ජීවිත අහිමි වීම් හා දේපළ හානි අවම කරනු පිණිස ඉලක්කගත දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම සඳහා උපයෝගී කර ගත හැකිය.



23 රූපය. අකුණු සැර වැදීමෙන් සිදුවන මරණ සහ තුවාල

2.2.10 ගිනි

ලැව් ගිනි හා නාගරික ගිනි සිදුවීම්ද ශ්‍රී ලංකාවට බලපාන උපද්‍රව ලෙස හඳුනා ගෙන තිබේ. ලැව්ගිනි ප්‍රධාන වශයෙන්ම මිනිස් මැදිහත්වීම් මගින් ඇති කරනු ලබන අතර ඒවා බදුල්ල, මොණරාගල, මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. වියළි ඍතුවලදී, නොසැලකිල්ල නිසා මෙන්ම හිතාමතා පවා මිනිස්සු වනයේ/ පඳුරු පෙදෙස්වල ගිනි ඇති කරති. ගිනි සේවාවන් සඳහා ගෙවීමේ යාන්ත්‍රණයන් සමගින් මහනගර හා නගර සභා සිසාරා සම්පත් ඒකරාශී කිරීමේ පද්ධතිද ඇතළත්ව ගිනි සූදානම්තාව හා ප්‍රතිචාරය දියුණු කිරීමේ ඉඩප්‍රස්ථා පවතී.

2.2.11 භූමිකම්පා

ශ්‍රී ලංකාව භූමිකම්පාවලට ලක් නොවන රටක් ලෙස හඳුනා ගෙන ඇති නමුදු, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය (**GSMB**) සතු ඓතිහාසික වාර්තාවලින් දැක්වෙන්නේ කොළඹ කොටුව ප්‍රදේශය රික්ට මාපාංක 6.5 ක භූමිකම්පාවකට මුහුණ පෑ අතර, නිවාස 200 ක් විනාශ වී, ජීවිත 2,000 ක් අහිමි වූ බවයි. 1800 වර්ෂයේදී කොළඹ නගර සීමාව ඇතුළත අපිකේන්ද්‍රය තුළ භූමිකම්පා කීපයක් සිදු වූ බව ඓතිහාසික ලිපිලේඛන තුළ සටහන් වී තිබේ. තවද, 2005 වර්ෂයේ සිට, දිස්ත්‍රික්ක ගණනාවක කුඩා භූවලන වාර්තා විය. මෙම ඇතැම් කම්පනවල ප්‍රබලත්වය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දේශීය විශ්ව විද්‍යාලවල සහාය ඇතිව ගැඹුරින් අධ්‍යයනය කර ඇත. ඒ අනුව, ආපදා කළමනාකරණ

[24] ශ්‍රී ලංකා උපද්‍රව පැතිකඩ

මධ්‍යස්ථානය **(DMC)** විසින් විශ්වවිද්‍යාලවල සහාය ඇතිව, නාගරික ප්‍රදේශවල භූමිකම්පාවලට ඔරොත්තු දෙන ගොඩනැගිලි නිර්මාණය කිරීමේ මාර්ගෝපදේශ පිළියෙළ කර තිබෙන අතර ඒවා අධීක්ෂණයට හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල රජයේ නිලධාරීන් වෙත යොමු කර තිබේ.

ශ්‍රී ලංකාව තුළ භූමිකම්පා ඇති වූ බවට වාර්තා නැතත්, පසුගිය කාලයේ රටේ නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවලින් විවිධ මට්ටමේ භූවලන කිහිපයක් වාර්තා විය. අපකේන්ද්‍රීය පොකුරු වටා වන පෘථිවි පෘෂ්ඨයේ ගතික හැසිරීම් ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීමේ වැදගත්කම මෙම සිදුවීම් මගින් ඉස්මතු කරයි. 2012 වර්ෂයේදී අම්පාර - වඩිනාගල කම්පන මාලාව නිරීක්ෂණය කරන ලද අතර, එහි බලපෑමට ලක් වූ ප්‍රදේශවල පදිංචිකරුවන්ට අමුතු සහ අපහසුතාවට පත් කරන අත්දැකීමක් විය. 2020 වසරේදී දිගන-වික්ටෝරියා ප්‍රදේශය ආශ්‍රිතව ද කම්පන මාලාවක් වාර්තා විය. පසුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ජර්මානු **GFZ** ආයතනික සහයෝගීතාව ඇතිව මාස නවයක කාලයක් සඳහා තාවකාලික භූ කම්පන ජාලයක් ස්ථාපිත කරන ලද අතර ලබාගත් දත්ත දැනට පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරයි. 2012 වසරේදී (සේනානායක සමුද්‍රය, අම්පාර) සහ 2020 වසරේදී (වික්ටෝරියා-රන්දෙණිගල) වාර්තා වූ කම්පන මාලාවන් දෙකම ජාතික ජලාශවලට යාබදව සිදු වූ අතර ජල මට්ටමේ උච්චාවචන අදාල භූ කම්පනවලට සබැඳියාවක් තිබේද යන්න පිළිබඳව විශේෂඥයිනගේ විශේෂ අවධානය යොමු විය.

2023 වසරේ පෙබරවාරි මාසයේදී බුත්තල - වැල්ලවාය ආශ්‍රිතව සිදු වූ කම්පන මාලාව භූ කම්පන වාර්තා ගොනු කරන මධ්‍යස්ථාන හතරම **(4)** හරහා නිරීක්ෂණය කර මූලික පරීක්ෂණ සිදු කරන ලදී. තවද, තෝරාගත් ප්‍රදේශ තුළ අතිරේක භූ කම්පන සමීක්ෂණ සැලසුම් කරන ලදී. භූ කම්පන ආපදා අවම කිරීමේ විෂය පථය තුළ ජාතික පරිමාණයෙන් ක්ෂුද්‍ර භූ කම්පන පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. භූ කම්පන කලාපකරණය සිතියම්ගත කිරීම සහ ප්‍රමිති/පරාමිතීන් සැකසීම මෙන්ම ලබාගත් දැනුම භූමිකම්පාවලට ඔරොත්තු දෙන ගොඩනැගිලි සහිත පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට නියමිතයි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර සහ දකුණු ප්‍රදේශවල ව්‍යුහාත්මක ගතිකතාවයන් අධ්‍යයනය කිරීම සඳහා භූ විද්‍යාත්මක හා භූ භෞතික අධ්‍යයනයන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදු කරන අතර, කම්පන අවදානම් ප්‍රදේශ කෙරෙහි දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධාන කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

කෙසේ වෙතත්, දැනට පවතින තාක්ෂණය භූමිකම්පා හෝ භූමිකම්පා පිළිබඳ පූර්ව අනාවැකි සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින්, විය හැකි හානි අවම කර ගැනීම සඳහා අවදානම් අඩු කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානම් වීම අතිශයින් වැදගත් වේ.

2.2.12 ගොඩනැගිලි කඩා වැටීම්

මෑතදී ගොඩනැගිලි කඩාවැටීමේ සිද්ධි නිරීක්ෂණය වීම ක්‍රමයෙන් වැඩි වෙමින් තිබේ. එබඳු සිදුවීම් ප්‍රධාන කොටම ගොඩනැගිලි රෙගුලාසි හා මාර්ගෝපදේශ නොපිළිපැදීම හේතුවෙන් ඇති වේ. ශ්‍රී ලංකාවේ විශේෂිත ගොඩනැගිලි ප්‍රඥප්තියක් නොමැති වුවද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය **(NBRO)** හා තවත් ආයතන වඩාත් සුරක්ෂිත හා වඩාත් ප්‍රත්‍යාස්ථ ඉදිකිරීම් සඳහා ප්‍රමාණවත් රෙගුලාසි හා මාර්ගෝපදේශ නිකුත් කර තිබේ. නිර්මිත පරිසරයෙහි ප්‍රත්‍යාස්ථතාව සහතික කරනු පිණිස දෘඪතර අනුකූලතා නිරීක්ෂණ යාන්ත්‍රණයක්ද සහිතව විස්තීර්ණ ගොඩනැගිලි ප්‍රඥප්තියක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් සඳහා රජය ආරම්භ කර තිබේ.

2.2.13 වෙරළබඩ හා සමුද්‍ර කලාපය දූෂණය

ලෝක තෙල් ප්‍රවාහනයෙන් 25%ක් ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික කලාපය **(EEZ)** හරහා යන බැවින් ශ්‍රී ලංකාව අවට මුහුදු තෙල් විසිරීම් හා වෙනත් සමුද්‍රීය උපද්‍රවයන්ට ගොදුරු වන සුළුය [25] **(EEZ).** තවද ආනයනය කරනු ලබන තෙල් සැපයුම් තෙල් පිරිපහදු වෙත ප්‍රවාහනය කරන මුහුදු යට නල මාර්ග, සමුද්‍රීය ප්‍රවාහන යටිතල පහසුකම් ව්‍යාප්ත වීම, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ මෙහෙයුම් සහ විශේෂිත ආර්ථික කලාපය **(EEZ)** ඇතුළත තෙල් ගවේෂණය යන මේවා ආශ්‍රිත අවදානම් ද ඇත.

[25] සෑම වසරකදීම මෙම කලාපය හරහා තෙල් ටොන් **500** කට වඩා ප්‍රවාහනය කෙරේ - ජාතික තෙල් කාන්දු හදිසි සැලැස්ම - සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

ශ්‍රී ලංකාව පසුගිය දශක දෙක තුළ තෙල් විසිරීම් 5කට හා නැවක ගින්නක් හට ගැනීමේ සිද්ධියකට මුහුණ පා තිබේ. 2021 වර්ෂය තුළ සිදු වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ බේදවාචකය ශ්‍රී ලංකාවේ සංවේදී වෙරළබඩ පරිසරය, ධීවර ප්‍රජාව හා ආර්ථිකය මත ඇති වූ දරුණුතම හානියයි. සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරිය (**MEPA**) 'ජාතික තෙල් විසිරීම් සම්භව්‍යතා සැලැස්ම' (**NOSCOP**) ක්‍රියාත්මක කරමින්, කුඩා හා මධ්‍ය පරිමාණ විසිරීම් සිද්ධි කළමනාකරණය කිරීම සාර්ථක ලෙස සම්බන්ධීකරණය කර ඇති අතර ආසන්නතම සිදුවීම වූයේ 2020 සැප්තැම්බර් මාසයේදී තෙල් නැවක් ශ්‍රී ලංකාවේ වෙරළබඩ මුහුදු තීරයේදී ගිනි ගැනීමයි.

ප්ලාස්ටික්, රසායන හා වෙනත් භාණ්ඩ රැගෙන යමින් තිබූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ ව්‍යසනය ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩ තීරයට විශාල හානියක් සිදු කර ඇත. එක්ස්ප්‍රස් පර්ල් නෞකා සිද්ධියෙන් පසුව ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිසර උපදේශක දූතමණ්ඩලය[26] **i)** (වත්මන් 'ජාතික තෙල් විසිරීම් සම්භව්‍යතා සැලැස්ම' (**NOSCOP**) මත ගොඩනංවමින්) සමුද්‍රීය ආපදා සැලැස්මක් සංවර්ධනය කිරීම, **ii)** එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආයතනික පදනම ශක්තිමත් කිරීම සහ **iii)** නාවුක උපද්‍රව හා ප්‍රතිචාරය පිළිබඳව ධාරිතා ගොඩනැගීමේ හා පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම කළ යුතු යැයි ශ්‍රී ලංකාවට නිර්දේශ කර ඇත. සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියට හා ශ්‍රී ලංකා නාවුක හමුදාව වෙත සෝදිසිය පවත්වා ගෙන යාමේ වගකීම ඇති අතර ඕනෑම නැවක් මෙරට මුහුදු ප්‍රදේශයට ඇතුළු වීමට පෙර හඳුනා ගත හැකි පහසුකම් අවශ්‍යය. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ (**NARA**) පහසුකම් හා තාක්ෂණික ධාරිතාවද පාරිසරික පද්ධතිය ආශ්‍රිත වෙනත් පර්යේෂණ අතර තෙල් විසිරීම් උත්සර්ජනය, පාරිසරික පද්ධතිවලට හානිය, යථා තත්ත්වයට පත් වීමේ වේගය ආදිය පිළිබඳව පර්යේෂණ සිදු කරනු පිණිස ශක්තිමත් කළ යුතුව තිබේ.

2.2.14 අභ්‍යන්තර ජල මූලාශ්‍ර දූෂණය

ශ්‍රී ලාංකික ජනතාවගේ ඉවක් බවක් නැති භාවිතය නිසා ඔවුන් නිරාවරණය වීම වැඩි වෙමින් ඇති උපද්‍රවකාරී ද්‍රව්‍ය සමහරක් ඇත. ජලාශවල රසායන අවශේෂයන් විශාල ප්‍රමාණයන්ගෙන් වාර්තා වන බැවින් අත්‍යන්ත රසායනික පොහොර හා පළිබෝධ නාශක භාවිතය ප්‍රධානතම අවධානයක් වී ඇත[27] (රූපය - 24).

එයට අමතරව, ජල මූලාශ්‍රවල සැලකිය යුතු බැක්ටීරියා සංඛ්‍යාංක නිරීක්ෂණය වී ඇත [28] (රූපය - 25) එම අපවිත්‍ර ජලය පරිභෝජනය හා ස්නානයද, එතුළ විවේකී අවස්ථා ක්‍රියාකාරකම්වල නියැළීමද මගින් තර්ජනයක් ඇති වීමට ඉඩ ඇත.

ගංවතුර තත්ත්වයකදී බලපෑමට ලක් වූ ප්‍රදේශවල පිහිටි නිවෙස් ආශ්‍රිත ළිංවලට සහ ඒ අවට ඇති අනෙකුත් ජල මූලාශ්‍ර මේ ආකාරයෙන් පහසුවෙන් අපවිත්‍ර විය හැකිය.


විද්‍යුත් අපද්‍රව්‍ය ඉවක් බවක් නොමැතිව දැමීම හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් නිෂ්පාදනය කිරීම මගින් අනාගත තර්ජන සහ සැලකිය යුතු ආර්ථික හා සාමාජීය බලපෑම් එල්ල විය හැකිය. ක්ෂුද්‍ර ප්ලාස්ටික් හා ඇසුරුම් කිරීමේදී හා කෘෂිකර්මාන්තය තුළ භාවිත කෙරෙන විවිධ ප්ලාස්ටික් වර්ග පරිහානියට පත් වීමේදී ලෝහ හා බැක්ටීරියා අවශෝෂණය කර ගැනීමේ ප්‍රවණතාවක් ඇති අතර ඒවා කිරි, මාලු ආදිය හරහා දූෂක ද්‍රව්‍ය ආහාර දාමයන්ට ගෙන යා හැකිය.

---


26 ශ්‍රී ලංකාව තුළ එක්ස්ප්‍රස් පර්ල් නෞකා ව්‍යසනය - එක්සත් ජාතීන්ගේ පාරිසරික උපදේශක දූතමණ්ඩලයේ වාර්තාව (**2021** ජූලි)

27 සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය - **2016.** කැලණි ගඟ ආශ්‍රිත බහු පාර්ශ්වීය උපායමාර්ගය සහ ක්‍රියාකාරී සැලැස්ම

28 ibid



24 රූපය. කැලණි නදියෙහි නයිට්‍රේට් නයිට්‍රජන් ප්‍රමාණය (හංවැල්ල පාලමෙහි සාමාන්‍ය නයිට්‍රේට් බැර) සාමාන්‍ය වාර්ෂික බැර - ටොන් 65.61



25 රූපය. කැලණි නදියෙහි කොලිෆෝම් ප්‍රමිති ඉක්මවා යාම


2.2.15 වායු දූෂණය

ඉහළ ජනගහන වර්ධනය, මහා පරිමාණ ඉදිකිරීම් කටයුතු, රථවාහන සංඛ්‍යාව ඉහළ යාම සහ මාර්ග තදබදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ නාගරික ප්‍රදේශ (රූපය 26) සීඝ්‍රයෙන් සංවර්ධනය වීම හා ස්වභාවික පරිසරය මත බලපෑම් වැඩි වීම හමුවේ මෑත කාලයේ වායු දූෂණය නාගරික ප්‍රදේශවල ප්‍රධාන පාරිසරික උපද්‍රවවලින් එකක් බවට පත්ව ඇත. මෑත කාලීනව වායුවේ ගුණාත්මකභාවය සෞඛ්‍යයට ඉතා අහිතකර මට්ටම කරා ළඟාවීම හේතුවෙන් ශ්‍රී ලංකාව නිරන්තරයෙන් මීදුම හෝ මීදුම වැනි තත්ත්වයන්ට මුහුණ දෙමින් සිටී. ප්‍රධාන වශයෙන් ඉන්දියන් සාගරය හරහා දූෂිත වාතය රැගෙන යන සුළං හේතුවෙන් රටේ ඇතැම් ප්‍රදේශ වායු තත්ත්ව දර්ශකය **(AQI)** 200 ක අගය ඉක්මවා ඇත. ප්‍රවාහන කටයුතුවලදී සිදු වන විමෝචනය, අපද්‍රව්‍ය නිවැරදි ලෙස කළමනාකරණය නොකිරීම, හානිකර කෘෂිකාර්මික භාවිතයන්, විවිධ කර්මාන්ත ප්‍රභවයන් සහ බලශක්ති සැපයුම් හේතුවෙන් නිකුත් කෙරෙන දූවිලි හා දූෂක ද්‍රව්‍ය මෙම තත්ත්වයට බලපාන වෙනත් හේතු ලෙස හඳුනාගෙන ඇත.

2021 වසරේදී ප්‍රකාශිත ලෝක සෞඛ්‍ය සංවිධානයේ **(WHO)** මාර්ගෝපදේශ අගයන් පවා ඉක්මවා යන වායුගෝලයේ අඩංගු අංශුමය ද්‍රව්‍ය නැතහොත් **PM** අගය **2.5** ක මට්ටමට රටේ ජනගහනයෙන් **90%** කට වඩා වැඩි ප්‍රමාණයක් නිරාවරණය වන බැවින් ශ්‍රී ලංකාවේ වායු දූෂණය හේතුවෙන් සිදුවන මරණ අනුපාතය ඉහළ ගොස් තිබේ. සෞඛ්‍ය බලධාරීන්ට අනුව වායු දූෂණය මිනිස් සෞඛ්‍යයට සෘජුවම බලපාන අතර හිසරදය, චර්ම රෝග, හෘදවාහිනී සහ ශ්වසන

රෝග, නියුමෝනියාව, බ්‍රොන්කයිටිස්, කැස්ස හා ශ්වසන අපහසුතා යනාදිය ඉන් උද්ගත වන අතර ප්‍රතිකාර සඳහා රෝහල්වලට ඇතුළත් වන රෝගීන් සංඛ්‍යාව ද ඉහළ ගොස් තිබේ. මෙහි බලපෑම කොළඹ සහ මහනුවර වැනි දිස්ත්‍රික්කවලට සැලකිය යුතු ලෙස දැනී තිබීමට හේතු වන්නේ සාමාන්‍ය දෛනික අගය වන **PM2.5** ක සාන්ද්‍රණය ලෝක සෞඛ්‍ය සංවිධානය නියම කර ඇති මාර්ගෝපදේශ අගයන්ට වඩා වැඩි බැවිනි.

දැනට විමර්ශන මධ්‍යස්ථාන තුනක් වායු තත්ත්ව අධීක්ෂණ ජාලයක් පවත්වා ගෙන යන අතර දිස්ත්‍රික්ක පාදක කරගනිමින් ක්‍රියාත්මක තත්‍ය කාලීන නිරීක්ෂණ ඒකක තමන් රැස් කරගත් දත්ත මහජනතාවගේ දැනුවත්භාවය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරයි. වායු දූෂණය දේශගුණික විපර්යාස, බෝග නිෂ්පාදනය, ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති වෙනස්වීම් ආදිය සමඟ සමීපව සම්බන්ධ වී ඇති බව හඳුනාගෙන ඇති අතර එල්ල වන ඕනෑම බලපෑමක් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මෙන්ම එහි ජෛව විවිධත්වයට සැලකිය යුතු ලෙස බලපානු ඇත. සෞඛ්‍ය අවදානම් ද තීව්‍ර වී ඇති කාල සීමාවක ඊසාන දිග මෝසමත් සමඟ රට පුරා වායු දූෂක ද්‍රව්‍ය ගමන් කිරීම විශේෂ අවධානය යොමු කළ යුතු කරුණක් බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාව සඳහා පරිපූර්ණ වායු තත්ත්ව දර්ශකයක් ද සකස් කර තිබෙන අතර (රූපය 27) එමඟින් නිශ්චිත මට්ටම් වර්ගීකරණයක් ද සිදු කර තිබේ.[29] ශ්‍රී ලංකා වායු තත්ත්ව දර්ශකය 150-200 (සෞඛ්‍යයට අහිතකර) ; ශ්‍රී ලංකා වායු තත්ත්ව දර්ශකය 101-150 (සංවේදී කණ්ඩායම් සඳහා අහිතකර); ශ්‍රී ලංකා වායු තත්ත්ව දර්ශකය 51-100 (මධ්‍යස්ථ) සහ ශ්‍රී ලංකා වායු තත්ත්ව දර්ශකය 0-50 (හොඳයි).



26 රූපය. ගතික වායු තත්ත්ව සිතියම

SALQI 0-50	SALQI 51-100	SALQI 101-150	SALQI 150-200
හොඳයි	මධ්‍යස්ථ	සංවේදී කණ්ඩායම්වලට අහිතකර	අහිතකර

27 රූපය. ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව දර්ශකය

[29] ශ්‍රී ලංකා වායු තත්ත්ව දර්ශකය - ආචාර්ය විජේමුණි විසින් නිර්මිත

වායු දූෂණ ගැටළු කළමනාකරණය කිරීමේ ප්‍රයත්න ජාතික සහ ප්‍රාදේශීය උපායමාර්ග ලෙස සැලකිය යුතු අතර මහජන සෞඛ්‍යයට හිතකර පිරිසිදු වායු මට්ටම් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන බාධක ජය ගැනීම සඳහා හඳුනාගත් තත්ත්වයන් පිළිබඳව සොයා බැලිය යුතුය.

2.2.16 කාර්මික

රසායන ද්‍රව්‍ය කාන්දු වීම්, රසායනික හෝ පුපුරන ද්‍රව්‍ය ගබඩා තුළ සිදු වන පිපිරීම්, විකිරණශීලී හා න්‍යෂ්ටික අපද්‍රව්‍ය හැසිරවීමේදී සිදු වන හානි, කාර්මික අපද්‍රව්‍යවලින් ජල දේහ අපවිත්‍ර වීම සහ අපද්‍රව්‍ය ගොඩවල් කඩා වැටීම විභව්‍ය උපද්‍රවයන් අතරින් සමහරකි. ඇතැම් රසායනික කම්හල් හා ගබඩා නේවාසික ප්‍රදේශයන්හි පිහිටා ඇති අතර එමගින් ප්‍රජාවට ඇති අවදානම වැඩි කෙරේ. පොළව මතුපිට ජල දේහයන් තුළට විෂ අපද්‍රව්‍ය මුදා හරින කුඩා පරිමාණ කම්හල් පොදු විමෝචන පිරියම් පහසුකම් පිහිටුවිය යුතුය. ගිනි ගන්නා සුළු, උපද්‍රවකාරී හා විෂ ද්‍රව්‍ය නිපදවන හා ප්‍රවාහනය කරන කර්මාන්තවලටද අසල්වැසි ජනතාව, සෞඛ්‍ය බලධාරීන් හා පොලිසිය හා එක්ව අනුකරණ අභ්‍යාස සිදු කොට, කම්හල් භූමිය තුළ හා ඉන් පිටත සැලසුම් පිළියෙළ කිරීමේ අනිවාර්ය වගකීම ඇත. කර්මාන්ත ජනපද අසල පිහිටි රෝහල් තුළ විෂහරණය කිරීමේ පහසුකම්ද සහිත විෂ ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. කර්මාන්ත අමාත්‍යාංශය හා කම්කරු දෙපාර්තමේන්තුව යටතේ එන ආයතන හා සංවිධානද ඇතුළත්ව, කර්මාන්ත උපද්‍රව පිළිබඳ දීපව්‍යාප්ත විස්තීර්ණ අවදානම් තක්සේරුවක්, සූදානම්තාව හා ප්‍රතිචාරය සඳහා අවශ්‍ය සම්භව්‍යතා සැලසුම්කරණය හා ප්‍රජා දැනුවත්භාවය ඉතා වැදගත්ය. ඒ සමානවම, ව්‍යාපෘති සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් මෙහෙයවනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) හා පාරිසරික බලපෑම් තක්සේරු (EIA) ක්‍රියාවලීන්ද ශක්තිමත් කළ යුතුය.

2.2.17 න්‍යෂ්ටික හා විකිරණ හදිසි අනතුරු

විකිරණය නිසා සිදු වන කවර හෝ අනතුරුවල අවදානම් අඩු කරනු හා ප්‍රතිවිපාක හීන කරනු පිණිස හා බරපතල තුවාල හා මරණ සහ දීර්ඝ-කාලීන සෞඛ්‍ය ඵල නිවාරණය කරනු පිණිස පරමාණුක ශක්ති නියාමන සභාවේ සූදානම්තා සැලැස්ම ශක්තිමත් කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ මුහුදු දේශ සීමාව පුළුල් වන අතරේ සාගරයේ සබ්මැරින ඇතුළු යාත්‍රා වෙතින් එල්ල විය හැකි න්‍යෂ්ටික බලයේ විභව්‍ය තර්ජන නිරීක්ෂණය කිරීමේ හා අවම කිරීමේ වගකීම්ද අවදානම් සංවේදී සැලසුම්වලට අන්තර්ගත කරනු ලැබිය යුතුය. තවද, රෝහල්, විද්‍යාගාර හා පර්යේෂණ ආයතන වෙතින් විකිරණවේදී අපද්‍රව්‍ය බැහැර කිරීමේ අදාළ පද්ධති ශක්තිමත් කළ යුතුය.

2.2.18 කොවිඩ් 19 වසංගතය

කෝවිඩ්-19 වසංගතය පෙර නොවූ විරූ සමාජ-ආර්ථික බලපෑම් ඇති කළ අතර වසංගත සූදානම්භාවය සඳහා ඇති අවශ්‍යතාව පෙන්වා දී ඇත. එය සෞඛ්‍ය, සාමාජීය හා ආර්ථික අවදානම්වල නව මානයන් නිරාවරණය කර ඇති අතර, ආපදා අවදානම් කළමනාකරණයට අදාළ නව අංශ කීපයක් පෙන්වා දී ඇත. කෝවිඩ්-19 වසංගතයට පෙර.බෝවන රෝග දේශසීමා විනිවිද යාමේ අවදානම ආමන්ත්‍රණය කරනු පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) සහාය ඇතිව ශ්‍රී ලංකාව සඳහා රාමුවක් සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 මගින් දේශසීමා ඉක්මවා යන සෞඛ්‍ය උවදුරුවලට සූදානම් වීමේ සහ සුදුසු ප්‍රතිචාරයේ වැදගත්කම ද අවධාරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ නිරෝධායන හා රෝග නිවාරණ ආඥාපනත යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වසංගත රෝග ඒකකය සමගින් දීප-ව්‍යාප්ත ජාලයක් හරහා සංක්‍රාමික රෝග අවදානම කළමනාකරණය කරන ලදී.


කෝවිඩ්-19 වසංගතය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යාවත්කාලීන කරන ලද තොරතුරුවලින් දැක්වෙන්නේ[30] 2020 ජනවාරි හා 2022 ඔක්තෝබර් අතර තහවුරු කරන ලද රෝගීන් 671,465 ක් (රූපය - 28) වාර්තා වී තිබූ අතර 16,814 වූ[31] මුළු මරණ සංඛ්‍යාවක් වාර්තා වූ බවයි. කොවිඩ් -19 වසංගතයට එරෙහිව සටන් කිරීමේදී ශ්‍රී ලංකාව පරිපූර්ණ රාජ්‍ය හා සමාජීය ප්‍රවේශයක් අනුගමනය කළේය. ප්‍රමුඛ නියෝජිතායතනය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය එහි පුළුල් බිම් මට්ටමේ

---

[30] කොරෝනා වෛරසය (COVID-19) ශ්‍රී ලංකාව - විශ්ලේෂණ පුවරුව (health.gov.lk)

[31] ලෝක සෞඛ්‍ය සංවිධානය කොරෝනා වෛරසය (COVID-19) පුවරුව -
https://covid19.who.int/?adgroupsurvey={adgroupsurvey}&gclid=EAIaIQobChMIz5-N37uY_AIVQZhmAh1RdgBgEAAYASABEgKuWfD_BwE

මහජන සෞඛ්‍ය පහසුකම් ජාලය හරහා වසංගත වැළැක්වීමේ සහ පාලන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (**MOH**) සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (**PHI**) වැනි ප්‍රාථමික මට්ටමේ මහජන සෞඛ්‍ය සේවකයෝ වසංගතය පාලනය කිරීම සඳහා රටේ ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයේ ඉදිරියෙන්ම සිටියහ. මෙම ක්‍රමවේදය සඳහා විවිධ මට්ටම්වල ප්‍රාදේශීය රෝහල්, නිරෝධායන සහ හුදකලා මධ්‍යස්ථාන මෙන්ම රට පුරා පිහිටි රසායනාගාර මගින් ද සහාය ලබා දෙන ලදී. තවද, රට තුළට ප්‍රවේශය සලසන සියලුම ස්ථානවලදී රෝගීන් කල්තබා හඳුනා ගැනීම සහ පරීක්ෂා කිරීම ද ශක්තිමත් කරන ලදී.



28 රූපය. ශ්‍රී ලංකාවේ කෝවිඩ් සංඛ්‍යා දත්ත (2020-2022)

කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය (**NOC PCO**) ස්ථාපනය කිරීමත් සමඟ සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම, ආර්ථික හා සමාජීය සහය ලබා දීම, මහජනතාව දැනුවත් කිරීම, අවදානම් පිළිබඳ සන්නිවේදනය සහ නීතිය හා සාමය පවත්වා ගෙන යාම මෙන්ම මහජන ආරක්ෂාව සහතික කිරීම යනාදී කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම සඳහා බහු පාර්ශ්වීය වේදිකාවක් නිර්මාණය කෙරිණ. සෞඛ්‍ය ප්‍රතිචාර යාන්ත්‍රණයට පහසුකම් සැලසීම සඳහා ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය වෙතින් සුවිශේෂී සහයක් හිමි වූ අතර රෝගීන්ගේ සබැඳියන් සොයා ගැනීම, නිරෝධායනය සහ හුදෙකලා කිරීම යන කාර්යයන්ට පමණක් සීමා නොවී ඔවුන් සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් බැවින් දිවයින පුරා විශාල රෝගී පොකුරු නිර්මාණය වීම වැළැක්වීමට එය උපකාරී විය.

2.2.19 ඉස්මතු වෙමින් පවතින සෞඛ්‍ය උපද්‍රව

2.2.19.1 වාහකයින් විසින් සම්ප්‍රේෂණය කරනු ලබන රෝග

මැලේරියාව තුරන් කිරීමට ශ්‍රී ලංකාව සමත් වී ඇතත්, ඩෙංගු වැනි වෙනත් වාහක බෝවන රෝග තවමත් මහජන සෞඛ්‍යයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. මෝසම් කාල දෙකට සමගාමීව කාලානුරූපව පැතිර යන ඩෙංගු රෝගය මේ වන විට දිවයිනේ සියලුම භූගෝලීය කලාපවලට ව්‍යාප්ත වී ඇති අතර එය සෞඛ්‍ය බලධාරීන් අතර දැඩි කනස්සල්ලක් ඇති කර තිබේ. දේශගුණික විපර්යාසවල බලපෑම සහ පසුකාලීනව ඇති වූ ආන්තික කාලගුණික සිදුවීම් සමඟ රෝගය පිළිබඳ පුරෝකථනය කිරීම වඩාත් දුෂ්කර වී ඇත. පාසල්, ඉදිකිරීම් සිදු කරන ස්ථාන, ආගමික ස්ථාන සහ පොදු ස්ථාන ඩෙංගු රෝගය සම්බන්ධයෙන් ඉහළ අවදානමක් පවතින ස්ථාන ලෙස සලකනු ලබන අතර, කීට විද්‍යා වාර්තා මගින් ඉහළ වාහක

බෝවීම් අනාවරණය වී ඇත. තවද, ඩෙංගු මදුරු දෂ්ටනයට වඩාත්ම අවදානමට ලක්විය හැකි කොට්ඨාසය වයස අවුරුදු 20 ත් 49ත් අතර ආර්ථික වශයෙන් ඵලදායී වයස් කාණ්ඩය සහ පාසල් යන වයසේ දරුවන් බවට හඳුනාගෙන තිබේ. එහි වාහකයා වන ඊඩිස් මදුරුවන් ජලයට ඇති සම්බන්ධය සහ රට තුළ පවතින හිතකර නිවර්තන දේශගුණය රෝග වැළැක්වීමේ සහ පාලනය කිරීමේ ක්‍රියාකාරකම් තවදුරටත් සංකීර්ණ කර ඇත. 2022 වසරේ දෙසැම්බර් මස දෙවන සතිය වන විට ශ්‍රී ලංකාවෙන් ඩෙංගු රෝගීන් 71,980ක් වාර්තා වී ඇති අතර සිදු වූ මුද්ගල මරණ සංඛ්‍යාව 60කට ආසන්නය.

වාර්තා වන ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, රෝගය වැලැක්වීම සහ පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික ඩෙංගු මර්දන ඒකකයේ මූලිකත්වයෙන් සහ ඩෙංගු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ මෙහෙයවීමෙන් බහුපාර්ශ්වික ප්‍රවේශයක් අනුගමනය කර ඇත. පරිශ්‍ර/ස්ථාන පරීක්ෂා කිරීම, මූලාශ්‍ර අඩු කිරීම වැනි වැළැක්වීමේ ක්‍රමෝපායන් ඒහිදී ප්‍රමුඛ වන අතර, මහජන සහභාගීත්වය සහ ප්‍රජාව දැනුවත් කිරීම රෝග වැළැක්වීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම ක්‍රියාකාරකම් ඩෙංගු රෝගීන්ගේ තොරතුරු මත පදනම් වූ සායනික කළමනාකාරීත්වය මගින් පරිපූරණය කරනු ලබන අතර, ඉහළ රෝගී වාර්තා වීම් නිබියදීත්, අඩු මරණ අනුපාතයක් පැවතීම (CFR) මගින් එහි ප්‍රතිඵල මනාව පැහැදිලි වේ..

2.2.19.2 බෝ නොවන රෝග

බෝ නොවන රෝග ශ්‍රී ලංකාවේ අකල් මරණ සිදු වීමට බලපාන ප්‍රධාන හේතු දහය අතරේ පවතී. ශ්‍රී ලාංකිකයන් දිගු කලක් ජීවත් වුවද, වැඩිහිටි ජනගහනය බෝ නොවන රෝග ඇතුළු රෝග සහ ආබාධිත තත්ත්වයන්ගෙන් පීඩා විඳිති. ශ්‍රී ලංකාවේ උපතේදී ආයු අපේක්ෂාව අවුරුදු 74.9ක් වන අතර උපතේදී නිරෝගී ආයු අපේක්ෂාව අවුරුදු 67කි.[32]

හෘදය ආශ්‍රිත රෝග, පිළිකා, නිදන්ගත ශ්වසන රෝග සහ දියවැඩියාව ශ්‍රී ලංකාවේ බහුලවම වාර්තා වන බෝ නොවන රෝග අතර වේ. මත්පැන් හා දුම්කොළ භාවිතය, සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර සහ ශාරීරික ව්‍යායාම නොමැතිකම ඊට බලපාන අවදානම් සාධක අතරට ඇතුළත් වේ. දරිද්‍රතාව සහ වායු දූෂණයේ අහිතකර බලපෑම් ද ශ්‍රී ලාංකිකයන් අතර බෝ නොවන රෝග බහුලව පැතිරීමට මූලික සාධකයක් ලෙස සැලකේ. වයස්ගත ජනගහනයක් සමඟ, බෝ නොවන රෝග අනාගතයේදී රටේ සෞඛ්‍ය පද්ධතියට සහ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නිශ්චිත හේතු සාධක නොමැති වීමෙන් සංලක්ෂිත රෝගයක් වන නිදන්ගත වකුගඩු රෝගය (CKDu), ශ්‍රී ලංකාවේ පළාත් කිහිපයක, ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය පදනම් වූ ජනතාව අතර බහුලව දක්නට ලැබේ. කෘෂි රසායන ද්‍රව්‍ය අධික ලෙස භාවිත කිරීමෙන් භූගත ජලය අපවිත්‍ර වීම රෝගයට හේතු වී ඇති බවට උපකල්පන පවතී. එහෙත් නිශ්චිත හේතුව තවමත් හඳුනාගෙන නොමැත. මෙම රෝගයට ගොදුරු විය හැකි කෘෂිකර්මාන්තය පදනම් කරගත් ග්‍රාමීය ජනයාගේ යටිපෙළ සමාජ-ආර්ථික හේතූන් නිසා අනාගතයේදී එය ද ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා පද්ධතියට ප්‍රබල බලපෑමක් එල්ල කරනු ඇත.

2.2.20 මාර්ග අනතුරු

ශ්‍රී ලංකා පොලිසියේ රථවාහන පාලන සහ මාර්ග ආරක්ෂණ කොට්ඨාසය විසින් නිකුත් කරන ලද තොරතුරුවලට අනුව, 2018 සිට 2022 දක්වා කාලය තුළ මාර්ග අනතුරුවල ක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ. මෙම පස් අවුරුදු කාලය තුළ වාර්ෂිකව වාර්තා වූ මරණවල අගයන්ගේ සාමාන්‍යය 2,600 ක් විය. (වගුව 1) අනතුරු හේතුවෙන් සිදු වූ හානිවල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබෙන බව පහත සඳහන් දත්තවලින් සනාථ වෙයි. ශ්‍රී ලංකාව වැනි රටවල මාර්ග අනතුරු සහ ඉන් පසුව සිදුවන අනතුරු සඳහා වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් 3 ත් 5% ත් අතර ප්‍රමාණයක් වැය වන බවට ගණන් බලා ඇත.

[32] **2018** තිරසර සංවර්ධන ඉලක්කවලට අදාල සෞඛ්‍යමය පැතිකඩ: ශ්‍රී ලංකාව, ලෝක සෞඛ්‍ය සංවිධානය, අග්නිදිග ආසියාව

වගුව 1. මාර්ග අනතුරු පිළිබඳ විශ්ලේෂණය (2018 - 2022)

අනතුරේ ස්වභාවය	වසර				
	2018	2019	2020	2021	2022
මාරාන්තික	2,994	2,689	2,242	2,452	2,395
බරපතල	8,795	7,718	6,949	6,669	6,231
බරපතල නොවන	12,138	10,679	8,706	8,088	8,209
හානි පමණි	11,918	9,391	5,807	5,638	5,118
එකතුන	35,845	30,477	23,704	22,847	21,953
මරණ	3,150	2,852	2,363	2,557	2,515

මූලාශ්‍රය: ශ්‍රී ලංකා පොලිසියේ රථවාහන පාලන සහ මාර්ග ආරක්ෂණ කොට්ඨාසය (2022)

2.2.21 දුම්රිය මාර්ග ආශ්‍රිත අනතුරු

මෑතකාලීනව දුම්රිය අනතුරු හේතුවෙන් සිදුවන මරණ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) විසින් නිකුත් කරන ලද දත්තවලට අනුව 2021 වසර හා සසඳන විට 2022 වසරේදී දුම්රිය අනතුරු හේතුවෙන් සිදුවන මරණ සහ තුවාල සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. (වගුව 2). ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අනුව, 2022 වසරේ දුම්රිය ආශ්‍රිත අනතුරුවලින් පුද්ගලයන් 196 දෙනෙකු මිය ගොස් ඇති අතර, මෙම මරණ දුම්රිය හරස් මාර්ගවල ගැටීම්, දුම්රිය මාර්ගවලට අනවසරයෙන් ඇතුළුවීම සහ සියදිවි නසාගැනීම් හේතුවෙන් සිදු වූ අතර පුද්ගලයන් 400 කට වැඩි පිරිසකට සුළු හා දරුණු මට්ටමේ තුවාල සිදු වී ඇත[33].

තවද, 2022 වසරේ දී මියගිය ගවයින් 31 දෙනෙකු සහ අලි ඇතුන් 30 දෙනෙකු සමඟ දුම්රිය අනතුරු හේතුවෙන් සතුන් මිය යාම ද ඉහළ ගොස් තිබේ.

වගුව 2. දුම්රිය අනතුරු පිළිබඳ විශ්ලේෂණය - මිනිසුන් සහ සතුන් (2018 – 2022)

		Year				
		2018	2019	2020	2021	2022
සමස්ත පුද්ගල මරණ සංඛ්‍යාව		230	215	110	120	196
තුවාල ලැබූ සමස්ත පුද්ගලයන්ගේ සංඛ්‍යාව		474	371	238	200	403
සමස්ත සත්ව මරණ සංඛ්‍යාව	ගවයන්	34	43	27	22	31
	අලින්	10	9	5	7	13

මූලාශ්‍රය: ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (2022)

2.2.22 සතුන්ගෙන් එල්ල වන ප්‍රහාර

මිනිසුන්ගේ ජීවනෝපාය කටයුතු විනාශ කිරීම, මිනිස් ජීවිත අහිමි වීම සහ විවිධ සතුන් විසින් බෝග හා දේපළ විනාශ කිරීම හේතුවෙන් ඇති කරන බලපෑම සත්ව ප්‍රහාර ලෙස සැලකිය හැකිය. අලින්, දිවියන්, කිඹුලන්, වල් ඌරන්, රිලවුන්, වඳුරන්, මොණරුන් හා ලේනුන් වැනි සතුන් විශාල වශයෙන් මිනිසුන්ගේ ජීවනෝපායවලට හානි සිදු කර ඇත.

[33] 2022 වසරේදී 200ක් මියයති: දුම්රිය මාර්ග ආශ්‍රිතව සිදු වන බේදවාචක වැළැක්වීමට යකඩ යකාට නොහැකි වෙයි, https://www.sundaytimes.lk/230402/news/200-die-in-2022-railways-run-out-of-steam-to-stop-track-tragedies-516161.html, 2023 අප්‍රේල් මස 02 වැනිදා නාඩියා ෆලුසාක් විසිනි.


ශ්‍රී ලංකාවේ අලියා 1986 වසරේ සිට වඳ වී යාමේ තර්ජනයට ලක්ව සිටින සත්ත්ව විශේෂයක් ලෙස හඳුනාගෙන ලැයිස්තුගත කර ඇති අතර මෙරට අලි ඇතුන් ආසියානු අලියාගේ උප විශේෂයක් ද වේ. ප්‍රමුඛ සංස්කෘතික සංකේතයක් ද වන මෙම සත්ත්වයන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ භෞමික ආරක්ෂිත ප්‍රදේශ ද ස්ථාපනය කර තිබෙන අතර රටේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම ද එහි තවත් අරමුණකි.

මිනිස්-අලි ගැටුමේ **(HEC)** මූලික හේතුවලට ස්වභාවික කැලෑවල සම්බන්ධතාව නැති වීම**,** අලි මංකඩ මිනිසුන් අල්ලා ගැනීම හේතුවෙන් අලි වාසභූමි අහිමි වීම**,** සණ කැලෑවලට යාබද ඉඩම්වල පදිංචි වීම**,** වානිජ වගාව සහ අලි වාසභූමි පරිහානියට යාම ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අලි ඇතුන් නිතර මිනිස් ජනපද හා ගොවිබිම් හරහා යාම හෝ ඒවා තුළට ඇතුළු වීම කරති. එයට අමතරව**,** මිනිසුන්ගේ වදුරන් හා වෙනත් සත්ව විශේෂ සමග ගැටුම් ද ඉහළ යමින් ඇත.

වන විනාශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුවක් වන අතර දැනට වන ආවරණය 16% ක් දක්වා අඩු වී ඇත. 1920 ගණන්වල සිට ශ්‍රී ලංකාවේ වන ආවරණය 70% සිට මේ වන විට 20% කටත් වඩා අඩු මට්ටමකට අඩු වී ඇත.

අලින් ගම්වල ඇති ලුණු හා වී තොගවලට ඇල්මක් දක්වන බව ප්‍රකටය. මෙය තවදුරටත් අයහපත් වන්නේ අයහපත් අපද්‍රව්‍ය කළමනාකරණ පුරුදු නිසා ඉවත දමන ආහාරවල ඇති ලුණු රස විඳීමට ඉඩ සැලසීමෙන් ලුණු හා ආහාර සොයා නිවාස විනාශ කිරීමට අලින්ට අත වැනීමක් වන බැවිනි.

බොහෝ අලි දිවයිනේ වියළි කලාපයේ දක්නට ලැබේ. මිනිස්-අලි ගැටුම උතුරු මැද**,** නැගෙනහිර**,** ඌව**,** වයඹ**,** දකුණ**,** උතුර**,** මධ්‍යම හා සබරගමුව පළාත්වල අඩු වන පිළිවෙළින් පවතී. (රූපය 29). 2010-2019 කාලපරිච්ඡේදය තුළ මිනිස්-අලි ගැටුම් සිද්ධි 14,516 ක් වාර්තා විය. සමස්ත වශයෙන් මිනිස් මරණ 807 ක් හා තුවාල වීම් 579 ක් සහ දේපළ හානි සිද්ධි 10,532 ක් වාර්තා වී ඇති අතර අලින් 2,631 දෙනෙක් මිය ගියහ [34].



29 රූපය. මිනිස්-අලි ගැටුම සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

[34] ටී.ජී.එස්.එල්. ප්‍රකාශ්**,** ඒ.ඩබ්ලියු. විජේරත්න සහ පී. ප්‍රනාන්දු **(2020)** ශ්‍රී ලංකාවේ මිනිස්-අලි ගැටුම: රටා හා ප්‍රමාණය. ගජා **51: 16-2551: 16-25**

මිනිස්-අලි ගැටුම් අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාමාර්ග සැලැස්මක් පිළියෙළ කරනු පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් විස්තීර්ණ ප්‍රවේශයක් යෝජනා කරන ලදී[35]. මිනිස්-අලි ගැටුම (HEC) සම්බන්ධයෙන් සාකල්‍ය ප්‍රවේශයක් අවශ්‍ය වන බැවින් එය බහු-ක්ෂේත්‍රීය අංග පෙන්වා දී තිබේ.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඉඩම්, මහවැලි ඉඩම්, කැලෑ ඉඩම් හා වනජීවීන් ආශ්‍රිත ඉඩම් වැනි ඉඩම් සම්පත් පුනරුත්ථාපනය වැනි කළමනාකරණ කටයුතු භාර වී ඇති බැවින්, මිනිස්-අලි ගැටුම (HEC) තවදුරටත් වර්ධනය වීම වැළැක්වීම පිණිස හා යම් කල් ඇතිව අනතුරු ඇඟවීමේ ක්‍රමයක් හා භූගෝලීය තොරතුරු පද්ධතිය, ඉන්ටනෙට් ඔෆ් තිංස්, කෘත්‍රිම බුද්ධිය (AI) අධික මිලැති වැට/බාධක ආදී දියුණු තාක්ෂණික ක්‍රම වැනි වෙනත් ක්‍රම මගින් එය අවම කිරීම පිණිස දිස්ත්‍රික් පරිපාලනයෙහි හා පාරිසරික පද්ධති පිළිබඳ ක්‍රමසම්පාදනයෙහි ධාරිතා ගොඩනැංවීම සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය සහ පරිසර පද්ධති අංශ පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් ධාරිතා නැංවීම වැදගත් අවශ්‍යතාවකි.

2.2.23 සතුන්ගෙන් හෝ ශාක මඟින් බෝ වන රෝග

විශේෂයෙන්ම ඉහළ යන ජනගහන වර්ධනය, වාසස්ථාන විනාශය සහ නාගරීකරණය යන තත්ත්වයන් හමුවේ මිනිස් පරිභෝජනය සඳහා ශාක නිෂ්පාදනවල සුරක්ෂිත බවට සහතික කිරීම අභියෝගයක් වී තිබේ. උද්‍යාන හා පැලෑටි විද්‍යාත්මක අභ්‍යන්තර අපනයන සහ ආනයන සිදු කෙරෙන මෙම යුගයේ ආරක්ෂිත නිෂ්පාදන සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින අතර ආහාර සැපයුම් දාමයේ සහ පාරිභෝගික මට්ටමින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබේ.

රෝගවලින් සහ පළිබෝධකයන්ගෙන් වගා බිම්වලදී මෙන්ම ගබඩා කිරීමේදී බෝගවලට අබණ්ඩව තර්ජන එල්ල වන අතර එය ලොව පුරා වාර්ෂිකව අස්වැන්න අඩු වීමට ද හේතු වේ. ඒ හා සමානව, කෘත්‍රිම පළිබෝධනාශක සහ වල් නාශක අධික ලෙස භාවිතය සතුන්ගේ සහ මිනිසුන්ගේ සෞඛ්‍යයට අහිතකර ලෙස බලපෑම් එල්ල කිරීමට පමණක් නොව ස්වභාවික හා කෘෂි පරිසර පද්ධතිවල ආහාර ජාල අස්ථාවරභාවයට ද හේතු වේ.


ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සැලකිය යුතු තත්ත්වයක් නිර්මාණය කරමින් පළිබෝධකයන් පැතිරීම නිසා ශ්‍රී ලංකාව වගා හානි තත්ත්වයන්ට මුහුණ දී ඇත. පසුගිය වසර කිහිපය තුළදී, රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පළහැටියන්, පණුවන්, දළඹුවන්, මැස්සන්ගේ ආක්‍රමණයන්ට ගොදුරු වූ අතර ඉන් බෝග වගා කර ඇති විශාල ප්‍රදේශයකට හානි සිදු වූ බැවින් ගොවීන්ට සහ ගෙවතු වගාකරුවන්ට සැලකිය යුතු අලාභයක් සිදු විය. පොදුවේ ගත් කල, වී, පොල්, රබර්, කෙසෙල්, බඩ ඉරිඟු ආදී බෝගවලට ගැස්ට්‍රොපොඩ, කහ තිත් පළහැටියන්, පතන පණුවන් වැනි පළිබෝධකයන්ගේ බලපෑමට ලක්ව ඇත.

දේශගුණික විපර්යාස සහ කෘමීන් පැතිරීම අතර සම්බන්ධයක් පවතින බවට විද්‍යාත්මක සාක්ෂි මගින් හෙළි වී තිබෙන අතර, මෑත කාලීනව දකුණු ආසියාව පුරා දක්නට ලැබුණු පළිබෝධ බලපෑම්වලට හේතුව එමඟින් නිශ්චය කරගත හැකිය. දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීමට සහ පැවැත්ම සඳහා වෙනත් වාසස්ථාන වෙත සංක්‍රමණය වීමට ද මෙම කෘමීන්ට හැකියාව පවතී. පැරණි සහ නව පළිබෝධකයන්ගෙන් තර්ජන එල්ල වන විට, ශ්‍රී ලංකාව ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීමට යොමු වෙමින් සිටී.

2.2.24 දියේ ගිලීම්

දැනුවත් කිරීම, අධ්‍යාපනය හා අන්තරාය සංඥා ප්‍රදර්ශනය කිරීම මධ්‍යයේ වුවද, දියේ ගිලීම් නිසා සිදු වන මරණ හා තුවාල සංඛ්‍යාව ඉහළ යාම නව ප්‍රවණතාවක් වන අතර **DesInventar** දත්තවලට අනුව 2020 හා 2021 වර්ෂවල මරණ සංඛ්‍යාව 100ට ළඟා විය. 2022 වර්ෂයේ දත්ත තවමත් සම්පූර්ණ නැත. (රූපය - 30).


[35] මිනිස්-අලි ගැටුම අවම කරනු පිණිස වූ ජාතික ක්‍රියාමාර්ග සැලැස්ම. **2020**



30 රූපය. දියේ ගිලීම් හේතුවෙන් වූ මරණ (2012 සිට 2022 දක්වා)

හදිසි අනතුරු අතරින් දියේ ගිලීමෙන් සිදු වන මරණ සංඛ්‍යාව දෙවැනි වන්නේ මාර්ග අනතුරුවල මරණ සංඛ්‍යාවට පමණි. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂකය සංගමයට (ශ්‍රී ලංකා ලයිෆ් සේවිං) අනුව, සාමාන්‍යයෙන් එක් එක් වර්ෂය තුළ 750 දෙනෙක් පමණ දියේ ගිලෙති. (එය ජනගහනයේ ලක්ෂයකට මරණ 3.5ක ප්‍රමාණයකි.)[36]. ජීවිතාරක්ෂක සංගමයට අනුව 2001-2018 කාලපරිච්ඡේදය තුළ පිරිමි දියේ ගිලීම් සංඛ්‍යාව ස්ත්‍රී දියේ ගිලීම් සංඛ්‍යාව මෙන් 3.5 ගුණයකි. ජනගහන්යේ ලක්ෂයකින් කොටසක අනුපාතය ගත් විය එය පිරිමින් සම්බන්ධයෙන් 5.9 ක් හා කාන්තාවන් සඳහා 1.3 ක අගයකි. බැරෑරුම්ම කරුණ නම්, මෙරට වැඩිපුරම දියේ ගිලීමට ගොදුරු වන වයස් කාණ්ඩය අවුරුදු 1-14 කාණ්ඩයයි.

ජාතික වශයෙන් ගත් කල, 2016 වසරේ සිට 2018 වසර දක්වා වූ කාලය තුළ සිදු වූ සමස්ත මරණ සංඛ්‍යාවෙන් ඉහළම අගය වන 26% ක් විල් සහ අනෙකුත් ජල මාර්ග ආශ්‍රිතව වාර්තා විය (රූපය 31). ඇළ මාර්ග ආශ්‍රිතව දෙවැනි ඉහළම අගය (22%) වාර්තා වූ අතර සහ මුහුදු ආශ්‍රිතව තෙවැනි ඉහළම අගය (21%) වාර්තා විය.



31 රූපය. ශ්‍රී ලංකාවේ දියේ ගිලීම් වැඩි වශයෙන් සිදු වන ස්ථාන

මෙමගින් සියලුම පුරවැසියන් සඳහා පිහිනුම් කුසලතාවන්හි සමස්ත වර්ධනය සඳහා මෙන්ම අතීත සිදුවීම් ආශ්‍රයෙන් අනතුරු බහුල ප්‍රදේශයන් හඳුනා ගෙන, අසල ප්‍රජාවන්ගේ සෙවීමේ හා ගලවා ගැනීමේ ධාරිතාව දියුණු කිරීම සඳහා ඇති අවශ්‍යතාව විදහා දැක්වේ. 2021-2022 කාලපරිච්ඡේදය තුළ ඉහළම මරණ සංඛ්‍යාව වාර්තා වන්නේ පුත්තලම, ගාල්ල, කළුතර, හම්බන්තොට හා බදුල්ල තුළය.

[36] **SLLS –** ශ්‍රී ලංකා ජීවිතාරක්ෂකය සංගමය - **https://srilankalifesaving.lk/**

2.3 අවදානම් අවබෝධය

1990 හා 2018 අතර ආපදා සිදුවීම් දත්ත විශ්ලේෂණයෙන්[37] මරණ සංඛ්‍යාවන්හි හේතුකාරක අතර ඉහළින්ම නාය යාම් (35%), ඊළඟට සත්ව ප්‍රහාර (34%) හා ඉන් පසුව ගංවතුර (21%) ඇති බව දැක්වේ. සුළි සුළං හා ගිනි ගැනීම් මගින් සමස්ත මරණවලින් පිළිවෙළින් 5%ක් හා 3%ක් සිදු වේ. ජනතාවගෙන් වැඩිම කොටසක් නියඟයෙන් (56%) පීඩාවට පත් වන අතර, ඊළඟට වැඩි ජනතාවක් පීඩාවට පත් වන්නේ ගංවතුරෙනි (39.5%). එම කාලපරිච්ඡේදය තුළම, වැඩිම නිවාස සංඛ්‍යාවක් විනාශයට හෝ හානියට පත් වීම සුළි සුළං හා වණ්ඩ මාරුත නිසා සිදු වූ අතර, ඊළඟට ඉහළම හේතුකාරක වූයේ නාය යාම් හා ගංවතුරය. අවදානම් අවබෝධ කර ගැනීම මගින් අපට වර්තමානය තුළ නිරාවරණයව සිටින ප්‍රජාවගේ සහ වත්කම්වල ආපදා අවදානම අඩු කරන හා අනාගතයේ ආපදා අවදානම ඇති වීම මග හරවන තීරණ සඳහා භාවිත කළ හැකි තීරණාත්මක දැනුම ලැබේ.

මේ අතර, 2005 ආපදා කළමනාකරණ පනත සම්මත කළ තැන් පටන් සමස්ත උපද්‍රව පැතිකඩයන් වෙනස් කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙමින් මිනිසා විසින් උත්තේජනය කරන ලද සාධක මෙන්ම දේශගුණික විපර්යාස හේතුවෙන් නව උපද්‍රව මතු වී ඇත. කෘෂිකර්ම හා කර්මාන්ත අංශ විසින් පුළුල් ලෙස රසායන අවභාවිතය, සහු වාහන හා කර්මාන්ත විමෝචන හේතුවෙන් වායුගෝලය දූෂණය වේ. අන් දේ අතර සණ අපද්‍රව්‍ය, විද්‍යුත් අපද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය බැහැරණය අවකළමනාකරණයට මග පාදන අඩුපාඩුකම් පරිසර කළමනාකරණය තුළ පවතී. ඩෙංගු වැනි රෝග වාහකයින් මගින් බෝ කෙරෙන රෝග උපද්‍රවකාරී බවට හැරවෙන්නේ රටෙහි බොහෝ කොටස් තුළ වසංගත තත්ත්වයන් ඇති කරවමිනි.

එමෙන්ම අපේ වාසිය දෙසට ආපදා කළමනාකරණ ශිල්පක්‍රමද වෙනස් වී ඇත්තේ [38] ජන-සංයුතික ගමනයන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, වයස හා ආබාධිතත්ව ගැටළු, මානව හිමිකම් කාරණා, අවදානමේ අන්තර්-ඛණ්ඩික ස්වභාවය, සමාජ-ආර්ථික විවිධාංශයන් සහ සිසු ඩිජිටල්කරණ හා තාක්ෂණවේද ප්‍රගමනයන් මත අවධානය වර්ධනය වෙමිනි.

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) අවදානම් තක්සේරුව, දෘශ්‍යනය හා සන්නිවේදනය තුළ නව තාක්ෂණික ප්‍රගමණය යොදා ගනිමින් අවදානම් තොරතුරු කාර්යක්ෂම ලෙස බෙදාහදා ගැනීම සඳහා වූ මෙවලම් හා යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීමත්, අවදානම් තොරතුරු ලබා ගැනීමට සැලැස්වීමත්, සංවර්ධන හා අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා අවදානම් තොරතුරු භාවිත කිරීමත් සිදු කරනු ඇත. එම වැඩසටහන්වලට පහත ක්‍රියාමාර්ග ඇතුළත්ය:-

1. නව අවදානම් වැළැක්වීම සහ වළක්වා ගැනීම (අනාගත ආපදා අවදානම් කළමනාකරණය)
2. සමාජ හා ආර්ථික ප්‍රත්‍යාස්ථභාවය ශක්තිමත් කිරීම (අවශේෂ ආපදා අවදානම් කළමනාකරණය)
3. පවතින අවදානම අවම කිරීම (නිවැරදි ආපදා අවදානම් කළමනාකරණය)

ජාත්‍යන්තර සංවිධානයන්ට හා ශ්‍රී ලංකාවේ මුඛ්‍ය තාක්ෂණික නියෝජිතායතනයන්ට ආර්ථික, සාමාජීය හා පාරිසරික පද්ධතික ප්‍රත්‍යාස්ථතා ගොඩනැගීමේ ඉඩප්‍රස්ථා සඳහා සහ දැනුම, අත්දැකීම් හා පාඩම් බෙදාහදා ගැනීම සඳහා උර දෙනු පිණිස ආපදා හා දේශගුණය ආශ්‍රිත අවදානම් පිළිබඳව සන්සන්දනය කළ හැකි හා සංගත අවබෝධයක් සකස් කර ගැනීමට ඉවහල් වන උපායමාර්ග, විධාන, එකඟතා, සහයෝගිතා හා සන්දර්භකෘත ප්‍රවේශයන් හා මෙවලම් සංවර්ධනය කිරීමෙහිලා මුඛ්‍ය කාර්යභාරයක් ඉෂ්ට කළ හැකිය

2.4 දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් පිළිබඳව අවබෝධ කර ගැනීම

අත්‍යන්ත දේශගුණික දර්ශක පිළිබඳ අධ්‍යයනයෙන්[39] උපරිම එක් දින වර්ෂාපතනය, උපරිම 5-දින වර්ෂාපතනය සහ අත්‍යන්ත වැසි ඇද හැලුණු දිනයන්හි මුළු වර්ෂාපතනය වැනි වර්ෂාපතන දර්ශකයන්හි වැඩි වෙමින් ඇති ප්‍රවණතාවක් පෙන්නුම් කෙරුණි (**R95p –** අධික සහ **R99p –** ඉතා අධික).වර්ෂාපතන අත්‍යන්ත ප්‍රවණතාවන්ගේ වැඩිවීමකින් අත්‍යන්ත වර්ෂාපතන සිද්ධි සංඥා කෙරේ. රටේ ජල විද්‍යාව සහ පරිසර පද්ධති කෙරෙහි දේශගුණික බලපෑම (වර්ෂාපතනය සහ උෂ්ණත්වය) සහ හඳුනාගත් විභව අවම කිරීමේ පියවර පහත පරිදි වේ[40]:

---

[37] මූලාශ්‍රය: **DesInventar** දත්ත සමුදාය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**)

[38] **2030** වර්ෂය වන විට ආපදා-ප්‍රත්‍යාස්ථ යුරෝපීය හා මධ්‍යම ආසියානු කලාපයක් සඳහා වූ මාර්ග සිතියම. **www.undrr.org**

[39] අයි.එම්. ශිරෝමනි ප්‍රියන්තිකා, ඩී.ඩබ්ලියු.ටී. තනුජා දර්ශිකා, සී. රොෂාන් සහ එච්.එම්. හේරත්, **2018,** ශ්‍රී ලංකාව පිළිබඳ මෑතකාලීන අත්‍යන්ත දේශගුණික දර්ශක දේශගුණික විපර්යාස පිළිබඳ ඇමෙරිකානු ජර්නලය **2018, 7, 586-599**

[40] **ibid**

- නිරිත-දිග හා ඊසාන-දිග මෝසම් සුළංවලින් කඳුකර බිම්වල ග්‍රහණය කර ගන්නා ලද වර්ෂාපතනය වෙනස් වී තිබේ.
  [අවම කිරීම: වියන් ව්‍යුහය ශක්තිමත් කිරීම මගින් දේශගුණික බලපෑම අවම කර ගත හැකිය.]
- කඳුකර භූමි ප්‍රදේශය හා භූමි ස්වරූපය මගින් රැස් කර ගනු ලැබූ වැසි ජල ප්‍රමාණය
  [අවම කිරීම: වැසි ජල අස්වැද්දීම වඩා යහපත් කිරීම මෙන්ම භූගත ජල ප්‍රමාණය වැඩි කිරීම, පානය ඇතුළු සේවාවන් සඳහා ඇති ජලය සහ මතුපිට හා භූගත ජලය වශයෙන් කෘෂිකර්මය හා ව්‍යාපාර සඳහා ලබා දෙන ජල ප්‍රමාණය වැඩි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍යය.]
- උස හා සුළං තත්ත්වයන් අනුව පහළ බිම්වල සිට කඳුකරය දක්වා උෂ්ණත්ව අවනතිය
- දේශගුණික විපර්යාසය හේතුවෙන් උෂ්ණත්වය වෙනස් වීමේ රටා (වායුගෝලීය, අවම හා උපරිම දෛනික උෂ්ණත්වයන්)
- මුහුදු මට්ටම ඉහළ යාම සහ වෙරළබඩ ප්‍රදේශයන්හි පොළව මතුපිට හා භූගත ජලය මත බලපෑම
  [අවම කිරීම: භූගත ජලය ලබා ගැනීම කළමනාකරණය කිරීම සහ භූගත ජල මට්ටම් සුරක්ෂිත ලෙස මුහුදු මට්ටමින් ඉහළ බවට සහතික වීම]

ශ්‍රී ලංකාවේ වාර්ෂික මධ්‍යන්‍ය උෂ්ණත්වය මගින් පහළ භූමිවල ඒකාකාරී උෂ්ණත්වයන්ද, කඳුකරයෙහි සීමා ලෙස අඩු වෙමින් යන උෂ්ණත්වයන්ද පෙන්නුම් කෙරේ. පහළ භූමි ප්‍රදේශය තුළ උස මීටර් 100 සිට 150 වූ උසක් දක්වා වාර්ෂික මධ්‍යන්‍ය සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27 කි. කඳුකරයෙහි වැඩි වන උසත් සමගම උෂ්ණත්වය සීඝ්‍රයෙන් පහත වැටේ. නුවර එළියෙහි මුහුදු මට්ටමේ සිට මීටර් 1,800 ක පමණ උසකදී මධ්‍යන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 15 කි. කෙසේ වුවද, ජනවාරි-පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ මධ්‍යම කඳුකරයේ දිවා උෂ්ණත්ව විචලනය විශාල වන අතර එම නිසා, දින 3-7 ක පමණ කාලපරිච්ඡේදයකදී භූමියට ආසන්න උෂ්ණත්වය ජලය මීදෙන උෂ්ණත්වයට වඩා පහළට වැටෙන විට උදෑසන ආරම්භයේදී හෝ රාත්‍රියෙහි භූමියේ මිදුණු දිය දැක ගත හැකිය. වාර්ෂික ශීත රාත්‍රීන් ඇති වීමෙහි කැපී පෙනෙන අඩුවීමක් හා වාර්ෂිකව උණුසුම් රාත්‍රීන් ඇති වීමෙහි වැඩිවීමක් දක්නට ලැබුණි.

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතියේ ඒ.ආර්. 4 මොඩලය භාවිත කරමින් කළ දේශගුණික අනාවැකි මගින් මනුෂ්‍යයින්ට හා කිරි කර්මාන්තයද ඇතුළු කෘෂිකර්මයට හිතකාමී නොවන ප්‍රවණතා පෙන්නුම් කෙරුණි.

වගුව 3. - අනාගත ආපදා ප්‍රවණතා හා බලපෑම්

දර්ශකය	ප්‍රවණතාව
උපරිම උෂ්ණත්වයේ උපරිමය	ධන
අවම උෂ්ණත්වයේ උපරිමය	ධන
උපරිම උෂ්ණත්වයේ අවමය	ධන
අවම උෂ්ණත්වයේ අවමය	ධන
ශීත දින	සෘණ
උණුසුම් දින	ධන
ශීත රාත්‍රීන්	සෘණ
උණුසුම් රාත්‍රීන්	ධන
සරල දෛනික තීව්‍රතාව	ධන
මිලිමීටර් 20 ට වැඩි දින	ධන
වාර්ෂික මුළු වර්ෂාපතනය	ධන

අනාගතයේදී අවම මෙන්ම උපරිම උෂ්ණත්ව අගයන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර එය කිරි කර්මාන්තය සඳහා විශේෂයෙන් සංවේදී සාධකයකි. කෘෂිකර්මයට, විශේෂයෙන්ම අල භෝග වගාවන්ට ශීත රාත්‍රීන් අවශ්‍යය. අඩු වන ශීත රාත්‍රීන් සංඛ්‍යාව කෘෂිකාර්මික ඵලදායිත්වයට බලපෑම්ඇති කළ හැකි අතර දිගු උණුසුම් රාත්‍රීන් මගින් මනුෂ්‍යයින්ගේ සුවය හා සත්ව පාලනයේ සුභසාධනය සඳහා වූ ක්‍රියාමාර්ග කෙරෙහි අභියෝග එල්ල කරන අතර බලශක්ති වියදම් වැඩි කෙරේ. වර්ෂාපතන තීව්‍රතාවය වැඩි වීම පාංශු බාදනය සහ භූමි භායනය වැඩි කරන අතර එය කෘෂිකර්මාන්තයේ සහ අනෙකුත් සේවාවන්හි ඉඩම් සහ ජල කළමනාකරණ අංශ කෙරෙහි ද බලපෑම් එල්ල කරයි. තාප රැළි වැඩි වීම සහ වාතයේ ගුණාත්මකභාවය අයහපත් වීම මිනිසුන් විවිධ සෞඛ්‍ය අවදානම්වලට නිරාවරණය කරයි.

2.5 උපද්‍රවය, අවදානම්-පාත්‍රතාව, ධාරිතාව හා අවදානම් තක්සේරුව

වත්මන් සන්දර්භය තුළ ජීවිත හා දේපළ අහිමි වීමට මග පාදන, ශ්‍රී ලංකාවේ උපද්‍රව පැති-සටහන තුළ ඇතුළත් කර ඇති උපද්‍රව මාලාව වන ගංවතුර, නාය යෑම්, සුළි සුළං/ වණ්ඩ මාරුත, නියහ, අකුණු, ප්‍රචණ්ඩ වාසුළි, වෙරළ ජලගැලීම් හා සුනාමි ආදිය වැනි, සාම්ප්‍රදායික ජල-කාලගුණික හා භූ-භෞතික ආපදාවන් අභිභවා යන බහුවිධ උපද්‍රව තිබේ. මතුව එන නව ක්ෂේත්‍රයන් අතර පහත ඒවාද වේ:

1. වසංගත නැඹුරු ආසාදන රෝග, වාහකයින් ගෙන් බෝවන රෝග සහ පරිසර දූෂණය, ආරක්ෂාකාරී නොවන ආහාර අනුභවය හා විකිරණශීලිතා සිදුවීම් වෙතින් පැනනැගිය හැකි රෝග ඇතුළු සෞඛ්‍ය උපද්‍රව ජනතා සෞඛ්‍යය, ආර්ථිකය හා සමාජය මත සුවිශේෂී බලපෑමක් එල්ල කරයි.
2. සැලසුම් සහගත නොවන සංවර්ධනය හේතුවෙන් රට අභ්‍යන්තර ස්ථානවල කැලෑ පාළුව හා ඉඩම් භායනය, සහ මධ්‍යම කඳුකරයේ අඩු වළාකුළු ග්‍රහණය වෙත මගපාදන වියන් ආවරණය අඩු වීම.
3. නියහ, ගංවතුර හා නාය යාම් හරහා කෘෂිකර්මය, නාගරික සේවා, විදුලිබල උත්පාදනය ආදිය මත බලපෑම් ඇති කරමින් වැව් හා ජලාශ තුළ රොන්මඩ එකතු වීමටද මගපාදන ඉහළ බාදනය.
4. මත්ස්‍යයින්ගේ වාසභූමි හා ඉස්සන් වගාව අහිමි වීම වැනි සමාජ ආර්ථික ගැටළු අභිභවා යන කාරණයන් වන අධික බාදනය, සුළි සුළංවලට හා කුණාටු රළපහර ආදියට අඩු ප්‍රතිරෝධය වැනි බහුවිධ බලපෑම්ද සමගින් කඩොලාන හා වෘක්ෂලතා ඉවත් කිරීම වැනි ක්‍රියාකාරකම්වලින් වෙරළබඩ භූමි ප්‍රදේශ පරිහානියට පත්වීම.
5. සැලසුම් කර ඇති කර්මාන්ත ව්‍යාප්තිය හා තෙල් ගවේෂණය ආදියෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි කර්මාන්තමය තෙල් විසිරීම් හා විකිරණ ආශ්‍රිත සිදුවීම් ආදිය ඉහළ යාම.
6. කුකුළු ආහාර නිෂ්පාදනයට බලපෑමක් ඇති කරමින් බඩ ඉරිහු වගාවට හානි කළ 2019 වර්ෂයේ ඇති වූ සේනා දළඹු (රූන් පනු) උවදුර වැනි දේශගුණික විපර්යාස මගින් උත්තේජනය කරන ලද පළිබෝධක, වල් පැළෑටි හා රෝග ආදී භෝගවලට එල්ල වන තර්ජන හේතුවෙන් අස්වැන්නේ ගුණාත්මකතාව හා ප්‍රමාණය අවම වීම.
7. අලි, දිවි, වඳුරු ආදී සතුන්ගේ වාසභූමිවලට හා මංකඩවලට හානි වීම හේතුවෙන් එල්ල වන සත්ව ප්‍රහාර
8. මූලාශ්‍රයේ ධාරිතාව ඉක්මවා ජල පොම්පවලින් අධික ලෙස භූගත ජලය ලබා ගැනීම නිසා හෝ මුහුදු මට්ටම ඉහළ නැගීම නිසා මුහුදු ජලය මිශ්‍ර වීම හෝ ලවණ ගතිය ඇති වීම
9. ජාතික ආර්ථිකයට මධ්‍ය කාලීන හා දීර්ඝ-කාලීන අහිතකර ඵල ඇති කරන ලැව්ගිනි
10. භූමිකම්පා හා සබැඳි අවදානම්

2.6 උපද්‍රව තක්සේරුව හා උපද්‍රව සිතියම්කරණය

‘උපද්‍රව තක්සේරුව’ යනු ජීවිත අහිමි වීම් හා දේපළ හානි වීම් ඇති කළ හැකි සිදුවීම් හඳුනා ගෙන ඒවායෙහි විභව්‍ය තදබලකම, කාලය, ප්‍රමාණය හා බලපෑම් හඳුනා ගැනීමේ ක්‍රියාවලියයි. අවදානම්-පාත්‍ර බව හා අවදානම පිළිබඳ සිතියම් පිළියෙළ කිරීමෙහිලා ‘උපද්‍රව කලාප සිතියම්කරණය’ අත්‍යවශ්‍යය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) සමග ඒකාබද්ධව උපද්‍රව තොරතුරු හැසිරවීම සිතියම්කරණය හා කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා වගකිව යුතු ප්‍රමුඛ තාක්ෂණික නියෝජිතායතන (ඇමුණුම 4) සමගින් විවිධ භූමි ප්‍රදේශ සඳහා උචිත පරිමාණයන්ද (ඇමුණුම 5) හඳුනාගෙන ඇත.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව රේඛීය නියෝජිතායතන, ජාත්‍යන්තර සහක්‍රියාකාරිත්වයන් ආදිය වෙතින් ලැබෙන තොරතුරු භාවිත කරමින් සිතියම් ස්ථර සංවර්ධනය කරන බැවින් එය උපද්‍රව සිතියම්කරණය සඳහා සිතියම් සම්පත් ලබා ගන්නා මුඛ්‍ය නියෝජිතායතනයයි. ආපදා තොරතුරු සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) කොටස්කරුවන් සමග ඒකාබද්ධව ඩිජිටල් තොරතුරු වේදිකා දෙකක් සංවර්ධනය කර ඇත. අවදානම් තොරතුරු දත්ත සමුදාය (**www.Riskinfo.lk**) බහුවිධ ආපදා ආශ්‍රිත දත්ත ස්ථර ලබා දෙන අතර, ඩෙස්ඉන්වෙන්ටා දත්ත සමුදාය (**www.Desinventar.lk**) සිදුවීම්, අලාභ හා හානි ආවරණය කරයි. යම් භූගෝලීය ප්‍රදේශයක ආපදා අවදානම් අඩු කිරීම, සූදානම්තාව හා ප්‍රතිචාරය පිළිබඳව වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම, සැලසුම් සෑදීම හා ආයෝජනය කිරීම පිණිස බහුවිධ උපද්‍රව දක්වන සිතියම් සංවර්ධනය කිරීම යහපත් බව 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) දක්වයි.

2.7 ප්‍රජා මට්ටමේ උපද්‍රව සිතියම්කරණය

සාමාන්‍යයෙන් සහභාගී අවදානම් තක්සේරු (**PRA**) මෙවලම් හරහා උපද්‍රව හා හානියට පාත්‍ර විය හැකි බව පිළිබඳ සිතියම් සංවර්ධනය කරනු පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ඒවායේ සැලසුම්කරණ ඒකක ප්‍රජා මට්ටමහි කටයුතු කරන ප්‍රජා-පාදක සංවිධාන (**CBO**), ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (**INGO**), රාජ්‍ය නොවන සංවිධාන (**NGO**), කාන්තා ජාල, ළමා හා තරුණ සමාජ සමග සමීපව කටයුතු කරන අතරම, දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ කළමනාකරණ ඒකක (**DDCMUs**) සමග ඒකාබද්ධව ක්‍රියා කරයි. දේශගුණ හා පාරිසරික පද්ධති පිළිබඳ තොරතුරුවලට අමතරව, ප්‍රජා සිතියම් තුළ හැකි උපරිමයෙන් අවදානම් ප්‍රදේශ, ජනතාව ඉවත් කිරීමේ මාර්ග, ආරක්ෂාකාරී ප්‍රදේශ හා තාවකාලික වාසස්ථාන ආදිය ඇතුළත්ව තිබිය යුතුය. මෑත කාලය තුළ රාජ්‍ය නොවන සංවිධාන (**NGOs**) හා ප්‍රජාව අතර ඩිජිටල් සිතියම්කරණය සහ **Q-GIS** වැනි විවෘත මූලාශ්‍ර සිතියම්කරණ මෘදුකාංග භාවිතය ජනප්‍රිය වී තිබේ.

2.8 අවදානම්-පාත්‍රතාව සහ අවදානම පිළිබඳ තක්සේරු

අවදානම්-පාත්‍රතාව පිළිබඳ තක්සේරු සිදු කරනුයේ හානියට ඇති නැඹුරුතාව වැඩි කරන තත්ත්වයන් නිර්ණය කරනු පිණිස හා ප්‍රතිවිපාක කළමනාකරණය කර ගැනීමට ජනගහනයට ඇති ධාරිතාව තක්සේරු කරනු පිණිසය. අනාරක්ෂිතභාවයේ සමාජ පැතිකඩ ස්ත්‍රී පුරුෂභාවය, වයස, හැකියාවන්, සම්පත් වෙත ප්‍රවේශය එනම් ආදායම, දැනුම සහ තොරතුරු, නිෂ්පාදන වත්කම් වැනි වැදගත් නිර්ණායක කිහිපයකින් සමන්විත වේ. හානියට ගොදුරු වීමේ ප්‍රවණතාව වැඩි කරන තත්ත්වයන් තීරණය කිරීම සහ ප්‍රතිවිපාක කළමනාකරණය කිරීමට ජනගහනයේ ධාරිතාව තක්සේරු කිරීම සඳහා අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

සාකල්‍ය අවදානම් තක්සේරුවක් ඍජු හා වක්‍ර ප්‍රතිවිපාකද ඇතුළු අදාළ උපද්‍රව තත්ත්වය හා හානියට පාත්‍ර වීමේ හැකියා සැලකිල්ලට ගනී. අවදානම් තක්සේරුවලට ආපදාවන්හි විවිධ ස්වරූපයේ (ශාරීරික, භෞතික, සාමාජීය, ආර්ථික, පාරිසරික හා ආයතනික) ඍජු හා වක්‍ර බලපෑම් ඇතුළත් කෙරේ. එමෙන්ම ඒවා පාදක අවදානම් ගාමකයන් (දේශගුණික විපර්යාස, දිළිඳුකම, අසමානතාව, දුර්වල තන්ත්‍රණය සහ සැලසුමකින් තොර ඉඩම් පරිහරණය හා නාගරික සංවර්ධනය ආදීන්) පිළිබඳ තොරතුරුද ලබා දෙයි. ආපදා කළමනාකරණය තුළ ඇති අවදානම් තක්සේරුව ජාතික, උප-ජාතික, ප්‍රජා හෝ ව්‍යාපෘති පාදක විය හැකිය. අවදානම් කළමනාකරණය තුළ අවදානම් තක්සේරුව විෂය පථය අනුව වෙනස් වේ;

1. නිවාරණය හා හානි අවම කිරීම
2. ප්‍රතිචාරය හා යථාතත්වයට පත් කිරීම සඳහා සැලසුම් කිරීම
3. ජීවනෝපාය සංවර්ධනය හා දිළිඳුකම පහත හෙළීම සමගින් ප්‍රජා මට්ටමේ ආපදා අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම
4. ඉඩම් පරිහරණ කලාපකරණය, සංවර්ධන සැලසුම්කරණය, භෞතික සැලසුම්කරණය, ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය

2.9 ධාරිතා තක්සේරු

අවදානම් තක්සේරුවලදී, ඇති වෙතැයි සිතෙන අවදානම් රූපණයන් සම්බන්ධයෙන් දැනට පවතින හා විකල්ප සමනය කර ගැනීමේ ධාරිතාවන්හි සඵලදායිත්වය පිළිබඳ ඇගයීමක් සැලකිල්ලට ගනී. ධාරිතා තක්සේරුවකදී, අවදානමේ මට්ටම හෝ ආපදාවෙහි ඵල අඩු කිරීම සඳහා ඇති ප්‍රබලතා හා සම්පත් හඳුනා ගැනේ. ආපදා අවදානම්වල භානිය අවම කර ගැනීමට ඇති සම්පත් ඇගයීම සිදු කරනුයේ නිපුණතා, විශේෂඥතා, උපකරණ, යටිතල පහසුකම් ආදිය වැනි තිබෙන ප්‍රබලතා විශ්ලේෂණය කිරීම මගිනි. එමෙන්ම හදිසි තත්ත්වයකදී මෙම සම්පත් කොතරම් සීඝ්‍රයෙන් යොදාගත හැකිද යන්න සහ හඳුනා ගත් උපද්‍රවවල විවිධ තීව්‍රතා හා බරපතලකම් මට්ටම්හිදී මෙම සම්පත් කෙතෙක් කාලයක් පවතීද යන්න ඇගයීමද වැදගත් වේ.

2.10 අවදානම් තක්සේරුව සඳහා දත්ත

අවදානම් තක්සේරු සඳහා අවශ්‍ය දත්ත ජාතික ආපදා අවදානම් කළමනාකරණ නියෝජිතායතන, රජයේ රේඛීය නියෝජිතායතන, සංඛ්‍යාන කාර්යාල, විශේෂීකෘත (කාලගුණ විද්‍යා, ජලවිද්‍යා හෝ භූකම්පන විද්‍යා) නියෝජිතායතන, පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්, හා ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම් වෙතින් ලබා ගත හැකිය. කෙසේ වුවද, දත්ත පොකුරු නිතරම අසම්පූර්ණව, යල් පැන හෝ නැතිව ගොස් තිබිය හැකි බැවින්, ප්‍රමාණවත් හා උචිත දත්ත අත්කර ගැනීම අභියෝගයක් විය හැකිය. එයට අමතරව, සිය තොරතුරු හා දත්ත බෙදා ගැනීමට ඇතැම් ප්‍රධාන ප්‍රවාහයේ නියෝජිතායතනයන්හි ඇති පැකිලීමද දැඩි බාධකයක්ව පවතී.

ඓතිහාසික ආපදා තොරතුරු පද්ධතිය (ඩෙස්ඉන්වෙන්ටා) ක්‍රියාගන්වා ඇති අතර එය අඛණ්ඩව යාවත් කාලීන කෙරේ. උනන්දුවක් දක්වන කොටස්කාර නියෝජිතායතනයන්ට **www.desinventar.lk** වෙබ් ලිපිනය හරහා එය වෙත ප්‍රවිෂ්ට විය හැකිය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) අවදානම් තොරතුරු අවකාශීය දත්ත බෙදාහදා ගැනීම් වේදිකාව හඳුන්වා දෙමින් ආපදා අවදානම් කළමනාකරණය (**DRM**) සඳහා දත්ත ලබා දීම තවත් පුළුල් කරයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) අඛණ්ඩව උචිත පරිදි ජාතික මට්ටමේ හදිසි තොරතුරු දත්ත සමුදාය වන ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලයේ (**SLDRN**) කටයුතු සම්බන්ධීකරණය කරයි. එයට අමතරව, වෙනත් අදාළ නියෝජිතායතන සමග වූ දත්ත රැස්කිරීමේ ක්‍රියාකාරකම්ද අඛණ්ඩව යාවත්කාලීන කෙරෙනු ඇත.


2.11 අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම්කරණය

ආපදා කළමනාකරණය වනාහි ක්ෂෙත්‍ර සිසාරා යන විෂයක් වන අතර, එය සියලු ආයතනවල හා අංශවල අන්තර්ගත කොටසක් විය යුතුය. 2005 ආපදා කළමනාකරණ පනත අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සිය කාර්ය පැවරුමට අනුව අවදානම් අතින් දැනුවත් ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙළ කළ යුතුය. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) කොටස්කාර ආයතනයන් විසින් විවිධ මට්ටම්හි පිළියෙළ කර ඇති ආපදා කළමනාකරණ සැලසුම් සමග ඇති සම්බන්ධතාවයෙහි ඵල ලබා ගනිමින් ප්‍රත්‍යාස්ත සමාජයක් හා තිරසාර සංවර්ධනයක් සහතික කිරීමට අරමුණු කරයි. එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (**INGO**), රාජ්‍ය නොවන සංවිධාන (**NGOs**) හා මූලික මට්ටමේ සංවිධාන ඇතුළු සියලුම ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් සිරස් හා තිරස් සබැඳියන් (32 රූපසටහන) ප්‍රකට වන සේ 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**)[41] සමග අනුකූල වන පරිදි සිය මෙහෙයුම් සැලසුම් කළ යුතු ය.


ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) මාර්ගෝපදේශ ද සමගින් සියලු මට්ටම්වල ආපදා කළමනාකරණ සැලසුම් සඳහා ආකෘති ලබා දෙයි (ඇමුණුම 6). විවිධ ක්ෂේත්‍ර, පරිපාලන ආයතන හා නියෝජිතායතන ආදිය විසින් පිළියෙළ කරන ලද සියලුම සැලසුම්වලින් සූදානම්භාවය, ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (**NEOP**) සංවර්ධනය හා යාවත්කාලීන කිරීම, විවිධ මට්ටම්වලදී පිරික්සුම් කොට වාර්තා කරනු පිණිස වූ කළමනාකරණ සඵලදායිතා පිරික්සුම් මෙවලම් හඳුන්වා දීම සඳහා භාවිත කරනු ලැබිය හැකි සමස්ත සැලසුම්කරණ රාමුව (රූපසටහන 33) සාදයි. ආපදා කළමනාකරණ

[41] **2005** මැයි මසයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද අංක **13** දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ **10** වගන්තිය

මධ්‍යස්ථානය (DMC) ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ ආයතනවල සහයෝගය ඇතිව සංවර්ධනය කරන ලද සැලසුම්වල ක්‍රියාත්මක කිරීමේ හා කළමනාකරණය කිරීමේ සඵලදායීත්වය සම්බන්ධීකරණයත් නිරීක්ෂණයත් සිදු කරයි.



32 රූපය. සිරස් හා තිරස් ආපදා කළමනාකරණය



33 රූපය. ආපදා සූදානම්කරණය පිළිබඳ සැලසුම් රාමුව

ආපදා කළමනාකරණ සැලසුම් පාදක කොට ගෙන නියෝජිතායතන විසින් අදාළ ආපදා කළමනාකරණ චක්‍රය ආවරණය කරමින් 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ (**NDMP**) කොටසක් ලෙස අවදානම්-සංවේදී සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි (**SOPs**) පිළියෙළ කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කෙරෙනු ඇත. ආපදා කළමනාකරණ සැලසුම් සාමාන්‍යයෙන් සිංහල බසින් සහ/හෝ දෙමළ බසින් වනු ඇත. දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් සමගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (**DDMCUs**) උප-ජාතික මට්ටමේ සැලසුම් පිළියෙළ කිරීම සම්බන්ධීකරණය සඳහා වගකීම දරනු ඇත. මෙම සැලසුම් තුළ සියලු උප-ජාතික තලවල පරිපාලනයන්ට, එනම් පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස යන මේවාට, එකිනෙකා සමග සම්බන්ධීකරණය වීමට ප්‍රතිපාදන තිබෙනු ඇත. ආපදා කළමනාකරණ සැලසුම් අවුරුදු 5කට වරක් යාවත්කාලීන කිරීම හෝ අවශ්‍ය පරිදි, විශේෂයෙන්ම මහා ආපදාවකට පසුව, සමාලෝචනය හා ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු වේ.

පහත දේ කෙරෙහි නිසි සැලකිල්ල යොමු කරමින් විවිධ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල හා නියෝජිතායතනවල ආපදා කළමනාකරණ සැලසුම් සංවර්ධනය කිරීම සඳහා කාල රාමු නියම කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) වෙත පැවරී ඇත:

1. ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත උපද්‍රවවලට අදාළ ප්‍රදේශ ගොදුරු විය හැකි බව
2. අදාළ ප්‍රදේශයන්හි අවදානම් පාත්‍ර විය හැකි ජනගහනයේ ඝණත්වය
3. ඉතා උස ගොඩනැගිලි සහිත ප්‍රදේශ
4. ප්‍රමාණවත් ගිනි හිඳැස් හෝ නිසි ජලාපවහන පද්ධති නොමැති ගොඩනැගිලි හා නේවාසික ගොඩනැගිලි
5. අවදානම් ස්වරූපය / ස්ථාපනයේ විශේෂිත ස්වභාවය (පුපුරන ද්‍රව්‍ය, උපද්‍රවකාරී ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ එවැනි දේ ගබඩා කරන ස්ථාන)

උප-ජාතික මට්ටම්වල ආපදා කළමනාකරණ සැලසුම්කරණයේදී සහයෝගය දෙන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මානුෂීය, ස්වේච්ඡා හා සිවිල් සමාජ නියෝජිතායතන කිහිපයක් ඇත. ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය සහ දැනුම පැවරීම උපජාතික (දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ප්‍රජා) මට්ටම්හි සැලසුම්කරණයේදී ඉතා අගනේය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) මෙම නියෝජිතායතනයන්ට පහත දේ හරහා උපකාරී වෙයි;

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) විසින් සංවර්ධනය කරන ලද ආකෘති හා මාර්ගෝපදේශ සැලසුම්කරණ ක්‍රියාවලිය සඳහා ලබා දීම හා දිස්ත්‍රික්, ප්‍රාදේශීය හෝ ග්‍රාමීය ආපදා කළමනාකරණ (**DM**) කමිටුවල අනුමැතිය ලබා ගැනීමෙහිලා සහයෝගය දීම
- ක්‍රියාවලි වැඩිදියුණු කරනු පිණිස නිරීක්ෂණයේදී උගත් පාඩම් ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සලස්වනු පිණිස රජයේ පද්ධති තුළට දත්ත සමුදායන්, ජී.අයි.එස්. සිතියම් හා වෙනත් මෙවලම් අන්තර්ග්‍රහණය කිරීමට උපකාර කිරීම
- සාකච්ඡාවලදී විනිවිදභාවය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංකාවන් ආමන්ත්‍රණය හා සියලු අවදානමේ සිටින ප්‍රජාවන්හි සහභාගිත්වය සහතික කිරීම.
- ප්‍රදේශ-පාදක විශාල ව්‍යාපෘතිවල තිරසාරභාවය සහතික වනු පිණිස, ආපදා කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට හා එම සැලසුම් අදාළ ව්‍යාපෘතිවල කොටසක් වශයෙන් ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීමට ඒවායෙහි සහයෝගය ලබා ගැනීම.

3 ආපදා අවදානම් කළමනාකරණය කිරීම සඳහා පද්ධති ප්‍රවේශය

ස්වාභාවික ආපදාවන් සිදුවීම වැළැක්විය නොහැකි කාරණාවක් වන නමුදු, රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශ මගින් ආපදා අවදානම් ප්‍රමාණවත් අයුරින් අවම කිරීම සඳහා ප්‍රශස්ත සැලසුම් සකස් කිරීමට ආයෝජනය කිරීම ඔස්සේ කිසියම් උවදුරක් ප්‍රබල ආපදාවක් බවට පත් වීම වළක්වාලිය හැකි වේ. ආපදා අවදානම අඩු කිරීම සඳහා ආයෝජනය කිරීම මගින් පුද්ගලයන්, ප්‍රජාවන්,ව්‍යාපාරයන් සහ ඒවායේ වත්කම් ආශ්‍රිතව ආර්ථික, සමාජීය, සෞඛ්‍යමය සහ සංස්කෘතික ප්‍රත්‍යාස්ථිතිය / ඔරොත්තු දීම සහ නැවත කඩිනමින් යථා තත්ත්වයට පත් වීමේ හැකියාව වැඩි දියුණු කිරීම කෙරෙහි මෙන්ම ඉතා ඉහළ ප්‍රතිලාභ සහිත ප්‍රස්තුතය ක් වන පාරිසරික වශයෙන් නැවත යථා තත්වයට පත්වීම සඳහා ද සහාය සැලසේ. 2023- 2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (**NDMP**) මගින් ව්‍යුහාත්මක මෙන්ම ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග කෙරෙහි ආයෝජනය කිරීමටත්, එසේම ඉදිකිරීම් සහ ස්වාභාවික ශාක ඇතුළු හරිත යටිතල පහසුකම් සංයෝජනය කරමින් (**grey and green infrastructure**) ස්වාභාවික සහ මිනිසාගේ මූලිකත්වයක් සහිතව ඇතිවන (කෘත්‍රිම) ආපදාවන් ආශ්‍රිත අවදානම අඩු කිරීම උදෙසා ආයෝජනය කිරීමට යෝජනා කරනු ලැබේ.

3.1 ආපදා අවදානම් අවම කිරීම සඳහා ආයෝජනය කිරීම

2022 නොවැම්බර් මස දී **COP**27 සමුළුවට රජය මගින් ඉදිරිපත් කරන ලද කාලගුණ යෝග්‍යතා සැලැස්ම තුළ විස්තර කොට දක්වා ඇති පරිදි රටෙහි කාලගුණික අවදානම් පාත්‍රතාවය සැලකීමේදී ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් (**NDC**) මත පදනම්ව කාලගුණික කටයුතු කෙරෙහි අරමුදල් සම්පාදනය කිරීම ප්‍රමුඛතාවයෙහිලා සැලකීම ඥානාන්විත ප්‍රවේශයකි[42]. වනාන්තර, ප්‍රවාහනය, බලශක්තිය සහ ජලය, බලශක්තිය හා රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත කාර්යක්ෂමතා ප්‍රතිලාභ අත්පත් කර ගැනීම තුළ අවදානම අවම කිරීමේ සහ අනුගත වීමේ ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමේ ස්වරූපයෙන් කාලගුණික බලපෑම් අවම කිරීම සඳහා සිදු කළ හැකි ආයෝජන ගණනාවක් ජාතික වශයෙන් නිශ්චිත දායකත්වයන් තුළ ඉදිරිපත් කොට තිබේ[43].

මහ බැංකුවට අනුව අවම කාබන් විමෝචනයක් සහිත දේශගුණයට ප්‍රත්‍යාස්ථ සහ සම්පත් කාර්යක්ෂම යොදා ගැනෙන ආර්ථිකයකට මූල්‍ය ආයතන, ආයෝජකයින්, ආයතනික සහ හරිත බැඳුම්කර නිකුත් කරන්නන් යොමු කිරීම සඳහා "ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය" නිරණාත්මක මෙවලමක් වනු ඇත.

ශ්‍රී ලංකා මහබැංකුව විසින් හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය මගින්ද සංවර්ධන අංශ සමග සම්බන්ධිතව ආපදා අවදානම් අවම කිරීම සඳහා අරමුදල් රැස් කිරීමට අදාල ප්‍රවේශ මාර්ග කිහිපයක් සපයනු ලැබේ. ශ්‍රී ලංකා මහබැංකුවට අනුව " ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය යනු කාබන් විමෝචනයක් සහිත, කාලගුණික ප්‍රත්‍යාස්ථිතින්ගෙන් යුතු සහ සම්පත්-කාර්යක්ෂම ආර්ථිකයක් කෙරෙහි පරිවර්තනය වීම සඳහා අවශ්‍ය වන මගපෙන්වීම සපයා ගැනීමට මූල්‍ය ආයතන, ආයෝජකයන්, සංස්ථා සහ හරිත බැඳුම්කර නිකුත් කරන්නන් උදෙසා මාර්ගෝපදේශනය සැපයීමට ඉතා වැදගත් මෙවලමකි."

ආපදා අවදානම් අවම කිරීම කෙරෙහි සිදු කරනු ලබන ආයෝජනය කිරීම් කෘෂි පාරිසරික, භූගෝලීය සහ ඓතිහාසික අත්දැකීම් ගණනාවක් මගින් මග පෙන්වීමට යටත් වේ. අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග කලාපීය ව්‍යාපෘති හෝ දියත් කිරීම් වශයෙන් ඒකාබද්ධ කිරීමේ හැකියාවක් පවතී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන හරිත කාලගුණ අරමුදල (**GCF**) (වැව් සංස්කෘතිය ප්‍රතිෂ්ඨාපනය කිරීම) සහ **IUCN** (නකල්ස් කඳු පංතිය සංරක්ෂණය සහ කළමනාකරණය කිරීම) ඔස්සේ සිදුකරනු ලබන සාර්ථක සම්පත් මෙහෙයවීම් තුළ පහත සඳහන් අංගලක්ෂණයන්ගේ වැදගත්කම මේ වන විටත් හඳුනාගනු ලැබ තිබේ.

---

[42] අවදානම් කණ්ඩායම **20. 2022.** ශ්‍රී ලංකා දේශගුණික සෞභාග්‍ය සැලැස්ම - **V20:** අවදානම් විස්ස කණ්ඩායම (**v-20.org**)

[43] සංරක්ෂණ ජාත්‍යන්තරය (**2016**)

1. අවදානම් අවම කිරීම තුළ ජලාශ - දියඇලි වල ජල කළමනාකරණය ඇතුළුව ජල විද්‍යා ශිෂ්ටාචාරයේ වටිනාකම හඳුනාගැනීම
2. කාලගුණික විපර්යාස හේතුවෙන් කාලගුණික කලාප වල විචල්‍යතා ඇති වීම සහ ඉහළ ගණත්වයකින් යුතු වර්ෂාපතනය තුලින් ආපදා කෙරෙහි ඇති වන බලපෑම
3. භූමියේ සිට ගොඩබිම් සහ මුහුදු පරිසරය ආශ්‍රිත සියලු පරිසර සාධකයන්ගේ සම්බන්ධතාවය පවත්වා ගැනීම ඔස්සේ උස්බිම්වල සිට පහත් බිම් දක්වා ගංවතුර සහ ජලය කඩිනමින් ගමන් කිරීම
4. මධ්‍යම කඳුකරයේ වෘක්ෂලතා සහ වගාකටයුතු ආදිය කෙරෙහි හානි සිදුවීම පිළිබඳ සංවේදීභාවය/ අවබෝධය සහ ආපදා අවදානම සැලකීමේදී පරිසර පද්ධති සේවාවන්ගේ ගුණාත්මකභාවය
5. වෙරලාශ්‍රිත උපද්‍රවයන් අවම කිරීම තුල වෙරලාශ්‍රිත වෘක්ෂලතා සහ කොරල්පර වල භූමිකාව
6. ජල - භූ විද්‍යාත්මක ආපදාවන් අවම කිරීම සඳහා නගර සැලසුම්කරණය සහ ඉඩම් භාවිතාව පිළිබඳ සැලසුම්කරණය වැඩිදියුණු කිරීමේ විභවතාවය
7. අපජලය කළමනාකරණය කිරීම සහ ඊට අදාල තාක්ෂණයන් වැඩි දියුණු කිරීම ඔස්සේ කාර්මික ව්‍යාජ්ත විම් ආශ්‍රිතව ආපදා අවදානම් අවම කිරීම් කෙරෙහි ආයෝජනය කිරීම

අනුමැතිය රහිත පාරිසරික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගවීම, නීති විරෝධී වනාන්තර එලි කිරීම, තෙත් බිම් වලට හානි සිදුකිරීම, නීතිවිරෝධී ආකාරයෙන් වන සතුන් දඩයම් කිරීම සහ වෙළඳාම යනාදී සිදුවීම් ඉහළ යාම හමුවේ ප්‍රජාවේ නියුක්ත වීම සහ සම්බන්ධ වීම ඉහළ යාම සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම යනාදිය සඳහා පුරවැසියන් නියුක්ත කරවා ගත හැකි වේදිකාවක් නිර්මාණය කිරීම කෙරෙහි එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේදූෂණ විරෝධී දියත් කිරීමෙහි අවධානය යොමු වේ. වනසත්ව සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය, වනාන්තර දෙපාර්තමේන්තුව, වනසත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ඒ ආශ්‍රිත රජයේ ආයතන, පරිසර යුක්ති කේන්ද්‍රය (**CEJ**) සහ සිට්‍රා සමාජ නවෝත්පාදන මධ්‍යස්ථානය යන ආයතන සමග සහයෝගිතාවයෙන් යුතුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා ආයතනය විසින් පුරවැසියන් නියුක්ත කරවා ගැනීමේ ඩිජිටල් වේදිකාවක් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළ නිරත වී සිටින අතර එහි අරමුණ වන්නේ අනුමැතිය රහිත පාරිසරික ක්‍රියාකාරකම් පිලිබඳව අදාල රජයේ නිලධාරීන් වෙත නිල වශයෙන් දැනුම්දීම සඳහා කැමැත්තෙන් පසුවන පුරවැසියන් සම්බන්ධ කර ගැනීමයි.

නව ක්‍රමෝපායන්ගේ සහ ආයෝජන යාන්ත්‍රණයන්ගේ සහාය සැලසෙන හරිත සහ ඩිජිටල් පද්ධති මත පදනම්ව පාරිසරිකව ආපදා අවදානම් අවම කිරීම, ප්‍රතිසාධනය සහ ඒ ආශ්‍රිතව වඩා ප්‍රශස්ථ තත්ත්වයකට පත් වීම යනාදිය තුළ ආපදා අවදානම් අවම කිරීමේ ආයෝජනයන් සඳහා අරමුදල් සැපයීම උදෙසා 'ස්වාභාවික ප්‍රාග්ධන තක්සේරු සහ ගිණුම්කරණ' මූලධර්ම භාවිතා කිරීමට හා තිරසර භාවයේ ක්‍රියාපිලිවෙතක් වශයෙන් අවදානම අවම කිරීමට 'හරිත යටිතල පහසුකම්' තුළ ආයෝජනය කිරීම සම්බන්ධයෙන් පවත්නා ඉහළ පිලිගැනීම කෙරෙහි මෙම දියත් කිරීම් මගින් වාසි සලසනු ලැබේ.

වාණිජ මණ්ඩලය සහ ලෝක බැංකුවේ පෞද්ගලික අංශ හස්තය වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාවය සහ ආසියානු සංවර්ධන බැංකුව (අනිකුත් ආයතන අතර) ඇතුළු මූල්‍ය ආයතන මගින් සහාය සැලසෙන පෞද්ගලික අංශය විසින් ආපදා අවදානම අවම කිරීම ආශ්‍රිත සුරැකිතාවයන් සහ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලසුම්කරණය ආදී කටයුතු ප්‍රවර්ධනය කරනු ලැබේ. මෙහිදී ත්‍රිත්ව පාදම් රේඛා - (**Triple Bottom Line**) (පාරිසරික, සමාජීය සහ ආර්ථික) පැතිකඩ වලට අමතරව වර්ධනය, ලාභදායිත්වය සහ තිරසරභාවය පිළිබඳ කොටසක් වශයෙන් ආපදා අවදානම් අවම කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතාව සැලසුම් කිරීම ආශ්‍රිත සුරැකිතාවයන් ද ප්‍රවර්ධනය කරනු ලැබේ. මෙම සංදර්භය තුළ ජාතික සැලැස්ම 2030 මගින් ආපදා අවදානම අවම කිරීම සහ කාලගුණික ප්‍රත්‍යාස්ථතිය සඳහා අනෙක් අතට සහාය සැලසෙන හරිත සහ ප්‍රත්‍යාස්ථතික ආයෝජනයන් කෙරෙහි අදාල වන පරිදි ජලය, ප්‍රවාහනය, සන්නිවේදනය , සෞඛ්‍ය සහ බලශක්ති පද්ධති, ප්‍රතිපත්ති සහ එකඟතාවයන් සම්බන්ධයෙන් ආයෝජනය කිරීම ආශ්‍රිත රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිගන්වනු සහ ප්‍රවර්ධනය කරනු ලැබේ..

ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධව තුන්වන ලෝකයේ සමුළුව (3rd **World Conference for DRR**) සඳහා ලෝක බැංකුව විසින් පිලියෙල කරන ලද ප්‍රතිපත්ති පත්‍රිකාව තුළ ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධයෙන් ආයෝජනය කිරීමේ ප්‍රතිලාභ තුනක් විස්තර කරනු ලැබේ.

1. සෘජු බලපෑම් වලක්වාගැනීම - ව්‍යුහාත්මක (උදාහරණ වශයෙන් : හරිත සහ අළු - එනම් බැම් සහ වේලි වැනි යටිතල පහසුකම්) හෝ ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග (උදා : ඉඩම් භාවිතාව සැලසුම්කරණය , පූර්ව අනතුරු ඇඟවීම් සහ ගොඩනැගිලි කේත) යනාදී කුමන ආකාරයේ වුව ද ආපදා අවදානම් අවම කිරීමේ ආයෝජන තුළින් මිනිසුන් කෙරෙහි හානි සිදු වීම සහ සෘජු ආර්ථික අලාභහානි සිදු වීම සම්බන්ධයෙන් ආපදා ආශ්‍රිත කඩිනම් බලපෑම් අවම කිරීම කෙරෙහි දායකත්වය සපයනු ලැබේ.

2. ආර්ථික විභවයන් වැඩි දියුණු කිරීම - ආපදා අවදානම් පිළිබඳ සංකල්පය මගින් ජනතාව කෙරෙහි සහ ඉතුරුම් හා ආයෝජන හැසිරීම් ඇතුළු ආර්ථික තීරණ ගැනීම් කෙරෙහි බලපෑම් ඇති කරන බව ප්‍රසිද්ධ කරුණකි. නිසි ආරක්ෂිත ජාල නොමැති වීමෙන් අවම ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ආර්ථික කටයුතුවලට යොමු වීම දැකගත හැකිය.(උදාහරණ - ඉහළ අස්වැන්නක් සහිත බෝග ප්‍රභේදයන්ට අනුගත වීමට අඩු ආදායම්ලාභී ගොවීන් තුළ පැකිලීමක් පැවතීම)

3. සංවර්ධන සම්ප්‍රතිලාභ උත්පාදනය කිරීම - ගංවතුර අවම කිරීම, බලශක්ති උත්පාදනය, ජල ප්‍රවේශ ප්‍රතිලාභ යනාදිය සඳහා ඉඩකඩ සලසනු ලබන වේලි හෝ පාසල් සහ ප්‍රජා ගොඩනැගිලි වශයෙන් ද භාවිතයට ගත හැකි සුලි කුණාටු අවස්ථාවල භාවිතා කරනු ලබන ආරක්ෂිත නිවාස වැනි බහුකාර්ය ප්‍රයෝජන අත්පත් කර ගත හැකි ආකාරයට ආපදා අවදානම් අවම කිරීමේ ආයෝජන සැකසුම් කරගත හැකිය.

4. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030 මගින් ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සහ රට තුළ ආපදා කළමනාකරණය සඳහා පවත්නා ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ඉදිරි වර්ෂ 07 තුළ ප්‍රමාණවත් නියාමන රාමුවක් සහ අයවැය ප්‍රතිපාදන සහිතව මෙම ක්ෂේත්‍රයන් තුළ අවදානම් සංවේදී ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

3.2 සංවර්ධන ක්ෂේත්‍රය තුළට අපදා අවදානම් අවම කිරීමේආයෝජන මුඛ්‍ය ධාරාගත කිරීම

සියලුම අංශයන් තුළ, අනෙකුත් කාරණා අතර කාලගුණ බලපෑම් අවම කිරීම සහ කාලගුණ තත්ත්වයන්ට අනුවර්තනය වීම යන කාරණා සංයෝජනය කරමින් අවදානම් සංවේදී යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍ය ධාරාගත කිරීම තුලට ඇතුලත් වේ. ගෝලීය උණුසුම්කරණය තුලින් ඇති වන නොවැලැක්විය හැකි ප්‍රතිවිපාකවලට සහ කාලගුණික දේශගුණික රටාවන්ගේ සහ නිතර ඇති වන අහිතකර කාලගුණ තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ජනතාව සහ පද්ධති විසින් නිසි පරිදි අනුගත වීමේ තත්ත්වයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් කාලගුණික විපර්යාස සඳහා අනුගතවීම තුලට ඇතුලත් වන අතර ඒ හේතු කොට ගෙන ඒවා පැරිස් ගිවිසුම හා නව හරිත අභියෝගයන් යටතේ සම්පත් එක්රැස් කර මෙහෙයවීම සඳහා ප්‍රබල මාර්ගයක් වශයෙන් කටයුතු කරනු ඇත. ජාතික ආපදා කළමනාකරණ පනත (10.ඊ වගන්තිය) මගින් ස්වකීය ආයතන වල කටයුතු වලට ආපදා අවදානම් කළමනාකරණය ඇතුලත් කිරීම සඳහා සියලු අමාත්‍යාංශ, දෙපාර්තමෙන්තු, රජයේ සංස්ථා, පලාත් පාලන ආයතන සහ අනෙකුත් රජයේ සහ පෞද්ගලික ආයතනවලට පහසුකම් සැලසෙන වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසෙනු ලැබේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023- 2030 මගින් අනෙකුත් කාරණා අතර, පහත සඳහන් කාරණා ඔස්සේ ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනය තුලට ප්‍රධාන ප්‍රවාහගත කිරීම වෙනුවෙන් කටයුතු කරනු ලැබේ:

- දේශගුණික සුහුරු ප්‍රවේශයක් සහිතව ආපදා අවදානම් සංවේදී සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් නිර්මාණය කිරීම
- සොබා දහම මත පදනම් වූ විසඳුම් ඔස්සේ ආපදා අවදානම් අවම කිරීමට අනුගත වීම
- ඒකාබද්ධ ආයතනික ප්‍රවේශයක් වශයෙන් යෝග්‍ය දර්ශක සහිතව සියලු මට්ටම් තුළ අවදානම් අවම කිරීම අධීක්ෂණය කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම
- ව්‍යාපාර වල අඛණ්ඩතාව සඳහා සහ ජීවනෝපාය ආරක්ෂා කිරීම වෙනුවෙන් අවදානම් හුවමාරු (අවදානම් වෙනත් පාර්ශ්වයක් වෙත පැවරීම) හා සමාජ ආරක්ෂණ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.
- සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සහ අවදානම් සංවේදී උරුම කළමනාකරණය
- කාලගුණ සුහුරු හරිත ප්‍රවේශ සමග සම්බන්ධිතව වැඩි දියුණු කළ නාගරික ආපදා අවදානම අවම කිරීමේ ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීම

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023- 2030, ඔස්සේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් රේඛීය නියෝජිත ආයතන, එක්සත් ජාතින්ගේ නියෝජිත ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධාන මගින් සිදුකරන ආපදා අවදානම් අවම කිරීමේ ආයෝජන සඳහා පහසුකම් සලසනු ඇත.

3.3 නාගරික සංවර්ධනය තුළ ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍යධාරාගත කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම

සංවර්ධනය තුළ ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍ය ධාරාගත කිරීමේදී කාලගුණ සුහුරු ප්‍රවේශයන් සමගින් සැලසුම්ගත සංවර්ධනයන් සිදු කිරීම ඇතුළු නගරවල ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම කෙරෙහි දැඩි අවධානයක් සහ වැදගත්කමක් සලසනු ලැබේ. නාගරිකව තදබදය සහිත ප්‍රදේශවල අනාරක්ෂිත ගොඩනැගිලි සමූහයක් ඉදි වීම නගර තුළ අවදානම් තත්ත්වයන් ඇති කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයක් වේ. කිසියම් ප්‍රදේශයක් තුළ ඉදි කරනු ලබන නව ගොඩනැගිලි පොදු ස්වභාවික ගොදුරු වලට ප්‍රතිරෝධී වන බවට සහතික වීම සඳහා සහ පවත්නා සියලු ගොඩනැගිලි එකී ප්‍රමිතින්ට අනුකූල වන බව තහවුරු වන පරිදි පසුකාලීනව අවශ්‍ය වෙනස්කිරීම් සිදු කොට ඇති බවට සහතික කිරීම සඳහා ගොඩනැගිලි ක්ෂේත්‍ර සැකසීම සහ බලාත්මක කිරීම උදෙසා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මගින් කටයුතු කරනු ලැබේ. මෙහි පසුව සඳහන් කළ කාර්යය වඩා අභියෝගාත්මක සහ නාගරික බලධාරීන්ගේ ශක්‍යතාවයෙන් ඔබ්බට යන කාරණයක් වන අතර එම නිසා අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම් ආරක්ෂක ප්‍රදේශවල නැවත පදිංචි කිරීම ඇතුළුව කාලගුණ මූල්‍යකරණය සමග සම්බන්ධිතව නවෝත්පාදන මූල්‍යකරණ විසඳුම් සැලසීම එහිදී අවශ්‍ය විය හැකිය. ගොඩනැගිලි මිනුම් කටයුතු සිදුකිරීමේදී, අවදානම් සහිත ගොඩනැගිලි හඳුනාගැනීමේදී, අනාරක්ෂිත ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේදී, ගොඩනැගිලි වල පසුකාලීන අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකිරීම සඳහා දිරිදීමනා සැපයීමේදී සහ ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත පිලිවෙත් වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් දඩ පැනවීමේදී විනිවිද පෙනෙන සුළු, රජයේ මූලිකත්වයක් සහිත, අන්තර්කරණයෙන් යුතු, සමාජීය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මෙන්ම අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයන් අවශ්‍ය වේ.

3.4 ජීවනෝපාය පිළිබඳ අවධාරණය කිරීම

ආපදාවකදී වැඩිපුරම බලපෑමට ලක් වන්නේ දිළිඳු පුද්ගලයින් වන බව ඉතාම පැහැදිලි කරුණක් වන අතරම දරිද්‍රතාවය සහ අවදානම් පාත්‍රතාවය අතර සෘජු හා නියත සහසම්බන්ධයක් පවතින බවට උපකල්පනය කිරීම ද ඉතාම සරල වේ. තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා සහ විශේෂයෙන්ම නිරන්තරයෙන්ම විපර්යාසයන්ට ලක් වන කාලගුණික තත්ත්වයන් යටතේ ප්‍රත්‍යාස්ථිතියට පත් වීම යන තත්ත්වයන් ඇති කර ගැනීම උදෙසා දරිද්‍රතාවය අවම කිරීම සහ ආපදා අවම කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රමානුකූල පරිදි ඒකාබද්ධ කිරීම ඉතාම වැදගත් වේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2030 මගින් තිරසර ජීවනෝපායන් ප්‍රවර්ධනය කරනු ලබන අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තුළ සහ අනෙකුත් අංශ ආශ්‍රිතව ව්‍යාපාර කටයුතු අඛණ්ඩව ඉදිරියට කරගෙන යාම සහතික කිරීම සඳහා සැලසුම් කරනු ලැබේ.ප්‍රජා මට්ටම තුළ ක්‍රියාකාරීව කටයුතු කරනු ලබන ප්‍රදායක ආයතන, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක, ප්‍රජා මූලික සංවිධාන, සහ රාජ්‍ය නොවන සංවිධාන වල සහයෝගිතාවයෙන් යුතුව මෙම දියත් කිරීම් සිදු කෙරෙනු ඇත.

3.5 අවදානම් වෙනත් පාර්ශ්වයක් වෙත පැවරීම සඳහා නවෝත්පාදන මූල්‍යකරණය

ඓතිහාසික වශයෙන්, ශ්‍රී ලංකාව තුළ ආපදාවන් සඳහා මූලකරණයක් සිදු කිරීම සිදු කොට ඇත්තේ ප්‍රතිචාර දැක්වීමේ පදනමක් මත වන අතර, මෙය රජයේ අයවැය තුළින් අරමුදල් යොමු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රදායක ආයතන වලින් පුළුල් අරමුදල්කරණයන් සපයා ගැනීම යනාදියෙන් සමන්විත වේ. අත්‍යවශ්‍ය මානව සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන සම්පත් ආපදා හේතුවෙන් ඉවතට ඇදී යාම සිදු නොවන බවට වගබලා ගැනීම සඳහා එවන් ප්‍රවේශයන් වැඩි දියුණු කළ හැකිය. කාලගුණික විපර්යාස වල බලපෑම් හේතුවෙන් සහ ආපදාවන්ගෙන් බලපෑමට ලක් වන රටවල් සඳහා සහාය සැලසීමට පවත්නා ගෝලීය සම්පත් හිඟකම හේතුවෙන් ඉහළ යන අවදානම් පාත්‍රතාවයන් සහිත සංදර්භයක් තුළ අවදානම් අවම කිරීම කෙරෙහි මූල්‍යකරණය කිරීම වෙනුවට මෙවන් ප්‍රතික්‍රියාක (ප්‍රතිචාර දැක්වීමේ) ප්‍රවේශයන් අනුගමනය කිරීම තිරසර නොවේ.

ආපදා අවදානම් සඳහා මූල්‍යකරණය සැපයීමේ විකල්ප ඔස්සේ රජය සතුව පවත්නා මූල්‍යමය භාරය අවම කිරීම සඳහා 2016 වසරේ ඇති වූ ගංවතුර සහ නායයාම් වලින් අනතුරුව ලෝක බැංකු ආධාර සහිතව ව්‍යසන කල් දමන ඇඳි-පහළ විකල්පය සහිතව සංවර්ධන ප්‍රතිපත්ති ණයක් (**DPL**) ස්ථාපිත කරන ලදී. ස්වාභාවික ආපදාවල බලපෑම් අවම කිරීම සඳහා පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සහාය සලසන පරිසර පද්ධති සේවා ගෙවීම් (**PES**), තිරසර රක්ෂණ මූල්‍යකරණය වැනි අනෙකුත් නවෝත්පාදන මූල්‍යකරණ ක්‍රමවේදයන් අතර ආපදා අවදානම් සඳහා මූල්‍යකරණය සඳහා කාලගුණ රක්ෂණ යෝජනා ක්‍රමය සහ ආපදා අවදානම් සඳහා මූල්‍යකරණය කිරීමේ මූල්‍ය යාන්ත්‍රණ නමින් අවදානම් කළමනාකරණ මෙවලම් දෙකක් සලකා බැලීමට ලක් කොට ඇත. තවදුරටත්, අවදානම් පාත්‍රතාවයේ සිටින ගොවීන් ආරක්ෂා කරගැනීම, ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම සහ කෘෂිකාර්මික ණය අවස්ථා සලසා ගැනීම යනාදිය සඳහා වන මෙවලමක් වශයෙන් කෘෂිකාර්මික රක්ෂණ අවස්ථා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි රජය විසින් විශේෂ අවධානයක් යොමු කොට ඇත. ජල - කාලගුණ

විද්‍යාත්මක ආපදාවන් ආශ්‍රිත අවදානම් තත්ත්වයන් හැසිරවීම සඳහා යෝග්‍ය මෙවලමක් වශයෙන් දර්ශක පාදක **(Index based)** රක්ෂණය හඳුනාගෙන ඇත

මූල්‍යකරණය සහ රක්ෂණ වෙත ප්‍රවේශ වීමේදී වැදගත් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වන සැලකිලිමත් විය යුතු කාරණා පවතී. ඉඩම් සහ අනෙකුත් ඵලදායී වත්කම් වෙත පවත්නා හිමිකාරිත්වය සහ බැංකු ගිණුම් පවත්වා ගැනීම පිළිබඳ කාන්තාවන්ට සැලසෙන අවස්ථා ප්‍රමාණය අඩු අතර එය විධිමත් ක්‍රම ඔස්සේ ණය සහ රක්ෂණ පහසුකම් වෙත ප්‍රවේශ වීමේදී බාධකයක් වශයෙන් ක්‍රියා කරනු ලැබේ. නිවසේ ගෘහ මූලිකයා වශයෙන් පිරිමියෙකු වීමේ පදනම මත බොහෝ විට වත්කම් හිමිකාරිත්වය සහ සම්පත් වෙත ප්‍රවේශය පදනම් වේ. ස්ත්‍රී පුරුෂසමාජභාවීය හෝ සමාජ ආර්ථික වෙනස්කිරීමකින් තොරව ඉලක්කගත දරිද්‍රතා මර්ධනය සහ නිදහස් ආරක්ෂිත ජාල වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

3.6 සොබාදහම මත පදනම් වූ විසඳුම්

විපර්යාසයන්ට ලක් වන කාලගුණික තත්ත්වයන් තුළ ආපදා අවදානම් අවම කිරීමේ සංදර්භය ආශ්‍රිතව ස්වභාවදහම මත පදනම් වූ විසඳුම් ඔස්සේ කාලගුණික විපර්යාස සඳහා අනුගත වීම, කාලගුණික බලපෑම් අවම කිරීම සහ ආපදා අවදානම අඩු කිරීම යන තත්ත්වයන් උදා කර ගැනීම සඳහා නවමු සබැඳුමක් සපයනු ලැබේ.

බොහොමයක් වර්තමාන අභියෝගයන් ආමන්ත්‍රණය කිරීම සඳහා සොබාදහම භාවිතා කළ හැක්කේ කෙසේද යන්න අවධාරණය කරනු ලබන සොබාදහම මත පදනම් වූ විසඳුම් සඳහා වන පරිසරය සංරක්ෂණය සඳහා වන අන්තර්ජාතික එකමුතුවේ ගෝලීය ප්‍රමිතීන් තුළ දක්වා ඇති ආකාරයට ප්‍රත්‍යාස්ථතාව සඳහා ඉතා වැදගත් වන මාතෘකා පරාසයක් ආවරණය කරමින් සොබාදහම මත පදනම් වූ විසඳුම් රාමුව මගින් සමාජීය ප්‍රතිලාභ පිලිබඳව සාකච්ඡා කරනු ලැබේ. තිරසර සහ ප්‍රත්‍යාස්ථික සංවර්ධනය සඳහා වන නවීනතම මෙවලම් වශයෙන් එක්සත් ජාතීන්ගේ ක්‍රමවේදය සහ ලෝක බැංකුව විසින් මෙම ප්‍රමිතිය හෝ ප්‍රවේශය ඉතා පුළුල්ව භාවිතා කරනු ලැබීම හා ඒ වෙනුවෙන් කටයුතු කිරීම සිදු වේ.

සොබාදහම මත පදනම් වූ විසඳුම් (NbS)- "සමාජීය අභියෝගයන් සාධනීය ආකාරයෙන් සහ නිසි අනුගත වීමක් සහිතව ආමන්ත්‍රණය කරමින් , ඒ හා සමාගම්ව මානව සුභසාධනය සහ පෙව විවිධත්ව ප්‍රතිලාභ අත්පත් කර දෙමින් ස්වාභාවික හෝ නවිකරණයන්ට ලක් කරන ලද පරිසර පද්ධති ආරක්ෂා කිරීම, තිරසර අයුරින් කළමනාකරණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග වේ. "



34 රූපය. සොබාදහම මත පදනම්වූ විසඳුම් සඳහා පරිසරය සංරක්ෂණය සඳහා වන අන්තර්ජාතික එකමුතුවේ ගෝලීය ප්‍රමිතීන්

සොබාදහම මත පදනම්වූ විසඳුම් සංකල්පය තුළදී, කාලගුණික හානි අවම කිරීම සහ අනුගත වීම, ආපදා අවදානම් අවම කිරීම, සමාජ ආර්ථික සංවර්ධනය, මිනිස් සෞඛ්‍යය, ආහාර සුරක්ෂිතතාව, ජල සුරක්ෂිතතාව සහ පාරිසරික හානි වීම් හා පෙව විවිධත්ව හානිවීම් (රූපසටහන 34) වැනි බහුවිධ සමාජීය අභියෝගයන් ආමන්ත්‍රණය කරන අතර පරිසර පද්ධති හා පරිසර පද්ධති සේවාවන් ආරක්ෂා කිරීම ඔස්සේ ආපදා අවදානම අවම කිරීම පමණක් නොව ජීවිත සහ ව්‍යාපාරයන්ගේ තිරසරභාවය සහතික කිරීමද සිදුවන බවට විශ්වාස කරනු ලැබේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2030 මගින් සොබාදහම මත පදනම් වූ විසඳුම්, රාජ්‍ය පාලන පිලිවෙත් සහ බලපත්‍ර ඇතුළු අනිකුත් රෙගුලාසි අනුගමනය කිරීම යනාදිය ඔස්සේ පරිසර පද්ධති පාදක ආපදා අවදානම් අවම කිරීම **(Eco-DRR)**සහ පරිසර පද්ධති පාදක අනුගත වීම**(EbA)** ප්‍රවර්ධනය කරනු ලැබේ.

3.6.1 සොබා දහම මත පදනම් වූ විසඳුම් සඳහා සහාය සැලසීමට රාජ්‍ය පාලන තත්ත්වයන් වැඩිදියුණු කිරීම

සොබාදහම මත පදනම් වූ ප්‍රවේශයන් වඩා සාධනීය තත්ත්වයට පත් කිරීම සඳහා ආපදා ආශ්‍රිත රාජ්‍ය පාලන පැතිකඩ ප්‍රධාන භූමිකාවක් දරනු ලැබේ. මේ ආකාරයට සැලකීමේදී ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 තුල විවිධ සංවර්ධන කාර්යභාරයන් සඳහා ස්වභාවික සම්පත් නිස්සාරණය කිරීම සඳහා වන බලපත්‍ර සහ අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරන සහ ස්වභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කිරීම හා සංරක්ෂණය කිරීම භාරව කටයුතු කරන සියලු ප්‍රධාන නියෝජිත ආයතන සමග ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එකමුතුව කටයුතු කරනු ඇත. සමග එක්ව කටයුතු කරනු ඇත. මෙම ආයතන වලට ඇතුලත් වන්නේ මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, නාරා ආයතනය, මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා අනෙකුත් ආයතන වේ. එයට අමතරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පළාත් පාලන ආයතනද ස්වභාවික සම්පත් කළමනාකරණය සහ ස්වභාවික සම්පත් වල තිරසර භාවිතාව අධීක්ෂණය කිරීම පිළිබඳ විවිධ පැතිකඩ සමග සම්බන්ධ වී කටයුතු කරන අතර ඒ හේතු කොට ගෙන සහ විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් කළමනාකරණ වගකීම්ද එකතු වීම සමග අතිරේක තාක්ෂණික දැනුම සහ අධීක්ෂණ ශක්‍යතාවයන් එහිදී අවශ්‍ය විය හැකිය.

ආපදා පිළිබඳ කටයුතු පාලනය කිරීමේ කොටසක් වශයෙන්, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් පරිසර පද්ධති ක්‍රියාවලින් පිලිබඳ දැනුම ප්‍රජාවන් සහ පුරවැසියන් වෙත ලබා දෙමින් ඔවුන් සවිබල ගැන්වීම සහ පරිසර පද්ධතිවලට හානි සිදුවීම ඔස්සේ කාලගුණ අවදානම් ඇතුළු ආපදා තත්ත්වයන් වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇති වන ආකාරය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම සිදු වේ. පුරවැසි විද්‍යා ප්‍රවේශයන් භාවිතා කරමින් අධීක්ෂණ කටයුතුවලට සහභාගි වීමටත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය සහ අනිකුත් ආයතන විසින් පහසුකම් සපයන සමාජ මාධ්‍ය සහ විධිමත් ජාල ඔස්සේ වාර්තාකරණයන් සිදු කිරීමටත් ඔවුන් පුහුණු කෙරෙනු ඇත. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් පරිසර පද්ධති ප්‍රත්‍යාස්ථිති කෙරෙහි සහ කාලගුණය කෙරෙහි ඉහළ අවධාරණයක් සහිතව සහ ඒ ඔස්සේ අනෙක් අතට දීර්ඝකාලීන මූල්‍ය ශක්‍යතාවය සහ පිරිවැය ප්‍රතිලාභ වැඩි දියුණු කරමින් ක්‍රියාකාරකම් මාලාවක් මත පදනම් වූ රාජ්‍ය, ප්‍රදායක සහ පෞද්ගලික අංශ ආයෝජනයන් මෙහෙයවීම සිදු කරන අතර, ආපදා තත්ත්වයන් පාලනය කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීමට අරමුණු කරනු ලැබේ. ආපදා සහන සැලසීමේදී සහ පුනරුත්ථාපනය සඳහා ඉහළ පිරිවැය දැරීමේදී මෙන්ම අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම් වල ජීවන තත්ත්වය සහ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි සෘජු සහ වක්‍ර බලපෑම් ඇති වීම වැනි අවස්ථාවලදී රජය විසින් දැරිය යුතු වන මූල්‍ය භාරය අවම කිරීම මෙම ආයෝජනයන් මගින් අපේක්ෂා කෙරේ.

3.7 ආපදා අවදානම් කටයුතු පාලනය කිරීම සම්බන්ධයෙන් ආයතනික ශක්තිමත් කිරීම

ආපදා අවදානම පිළිබඳ තත්ත්වයන් පාලනය කිරීමේ අංශය තුලට විවිධ ආයතන, සංවිධාන, නීති, රෙගුලාසි, සම්මතයන් සහ ආපදා අවදානම් අවම කිරීම කෙරෙහි බලපෑමක් ඇති කරන සිවිල් සමාජයේ සහ පෞද්ගලික අංශය මගින් සිදු කරන දායකත්වයන් ඇතුලත් වේ. 2004 වර්ෂයේදී ඉන්දියානු සාගරය ආශ්‍රිතව ඇතිවූ සුනාමි අවස්ථාවේ සිට ආපදා අවදානම් පිලිබඳ කටයුතු පාලනය කිරීමේ තත්ත්වයන් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ඉතා වැදගත් පියවර කිහිපයක් ගෙන ඇත:

1. 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත බලාත්මක කිරීම සහ ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව ස්ථාපිත කිරීම
2. ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාවෙහි කටයුතු ක්‍රියාත්මක කිරීමේ ආයතන ව්‍යුහය වශයෙන් 2005 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම
3. 2007 වර්ෂයේදී ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව ස්ථාපිත කිරීම
4. 2007 වර්ෂයේ සිට ආපදා සිදුවීම් පිළිබඳව **DesInventar** දත්ත සමුදාය ස්ථාපිත කිරීම
5. 2013 වර්ෂයේදී ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ප්‍රකාශයට පත් කිරීම.
6. 2010 වර්ෂයේ සිට ආපදා අවදානම් අවම කිරීමේ දැනුම පාසල් විෂය මාලාව තුලට එක් කිරීම
7. 2016 වර්ෂයේදී හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීම
8. රජයේ තොරතුරු හුවමාරු කිරීමක් වශයෙන් 117 දුරකථන පහසුකම හඳුන්වා දීම

9. ශ්‍රී ලංකා අපදා පැතිකඩ ප්‍රකාශයට පත් කිරීම [44]
10. ජපාන ගුවන් අවකාශ ගවේෂණ නියෝජිත ආතයනය(**JAXA**), ඉන්දියානු සැටලයිට් ආයතනය, ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය(**ADPC**), එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික ප්‍රදායකයන්, රතු කුරුස සංවිධානය, අනෙකුත් ජාත්‍යන්තර නියෝජිත ආයතන සහ **DHL** වැනි පෞද්ගලික අංශ ආයතන ඇතුලත් කරගනිමින් දැනුම බෙදා හදා ගැනීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාවයන් නිර්මාණය කර ගැනීම.
11. 2010 සිට 2016 අතර කාලසීමාවේදී පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු ක්‍රම හඳුන්වා දෙන ලද අතර, 2017 වර්ෂයේදී කඩිනම් පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු හඳුන්වා දෙන ලදී. ඒ සඳහා හානි සහ පාඩු ඇගයීම් ක්‍රමවේදය ඇතුලත් කරන ලදී.
12. යළි මැනවින් ගොඩනැගීමේ මූලධර්ම අනුගමනය කරමින් 2016 /2017 පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු ක්‍රමය මත පදනම්ව ගංවතුර සහ නායයාම් සඳහා විස්තීරණ පශ්චාත් ආපදා ප්‍රතිසාධන සැලැස්මක් සකස් කරන ලදී.
13. නියහ අධීක්ෂණය සඳහා වන ක්‍රමවේදයක් වශයෙන් තත්ත්ව කාල තොරතුරු සහ තත්ත්ව අධීක්ෂණ අවකාශය හඳුන්වා දෙමින් (**PRISM**) දුරස්ථ සංවේදක තාක්ෂණික ක්‍රම භාවිතා කොට නියං උවදුරු සිතියම්ගත කිරීම
14. ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් රට තුළ අංශ 13ක් නියෝජනය කිරීම සඳහා පාර්ශවකරුවන් හට ඉඩ සලසමින් අන්තර්ජාල ඔස්සේ ක්‍රියාත්මක වන හානි සහ පාඩු වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම
15. **"RiskInfo"** නමින් පුළුල් ආපදා අවදානම් තොරතුරු අවකාශයක් ස්ථාපිත කිරීම
16. ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සමගාමීව අභ්‍යවකාශ දත්ත සහ තොරතුරු කළමනාකරණය කිරීම, වැඩි දියුණු කිරීම සහ නුවමාරු කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ ආයතන වලට සාමූහිකව කටයුතු කළ හැකි වේදිකාවක් වශයෙන් ජාතික අවකාශයිය දත්ත යටිතල පහසුකම් (**NSDI**) ස්ථාපිත කිරීම තුළ සක්‍රිය සහභාගිත්වය
17. බහු උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීම් සහ ආපදා අවදානම් අවම කිරීමේ කොළඹ ප්‍රකාශය උපයෝජනය (2020)
18. ආපදා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ වැදගත් ජාතික සිදුවීම් (උදා: රජයේ පාසල් විභාග, මැතිවරණ ආදිය) පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශ
19. ඒකාබද්ධ නියහ කළමනාකරණ වැඩසටහන
20. ආපදා අවදානම් අවම කිරීමේ ජාත්‍යන්තර දිනය (**IDDR**) සැමරීම සඳහා 2021 සහ 2022 වසරවලදී ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරීම
21. සුනාමිය පිළිබඳ ලෝක දැනුම්වත් කිරීමේ දිනය (**WTAD**) සැමරීම සඳහා 2021 සහ 2022 වසරවලදී ජාතික මට්ටමේ උත්සව සංවිධානය කිරීම
22. කොවිඩ් 19 වසංගත සමය තුළ ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම
23. "ආපදාවලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ අත්පොත" එළිදැක්වීම සහ සංවේදණකරණය.
24. ශ්‍රී ලංකාවට බලපාන පොදු ආපදා පිළිබඳ අධ්‍යාපනික සහ තොරතුරු සහිත ප්‍රකාශන (උදා: පොත් පිංච, පත්‍රිකා) පාසල් සිසුන් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර බෙදා හැරීම

3.8 ආරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහා මාර්ග සිතියම

2004 වර්ෂයෙන් පසුව පශ්චාත් සුනාමි ආපදා කළමනාකරණයට අදාල ආරම්භ කටයුතු ආරම්භ වූයේ 'ආරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා' යන ආපදා අවදානම් කළමනාකරණ මාර්ග සිතියම සමගිනි. හියෝගෝ ක්‍රියාකාරීත්ව රාමුව (**HFA**) 2005-2015 හා සමගාමීව 2006-2016 [45] අතර කාලසීමාව අනාවරණය කරනු ලබන වෙළුම් දෙකකින් එය සමන්විත විය. මෙම මාර්ග සිතියම තේමාත්මක ක්ෂේත්‍ර 7 ක් ඔස්සේ ව්‍යාපෘති 109ක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2010[46] වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් මාර්ග සිතියම ක්‍රියාවට නැංවීමේ අත්දැකීම් සමාලෝචනයට ලක් කරමින් (වගුව 4) අනාවරණ කරන ලද්දේ මාර්ග සිතියම ක්‍රියාවට නැංවීම හේතු කොට ගෙන මිනිසුන් තුවාල ලැබීමේ අවස්ථා සැලකිය යුතු ලෙස අඩු වීම කෙරෙහි එය තුඩු දී ඇති බවත්, එසේ ම ආපදා / උවදුරු වැලැක්වීම සහ අවම කිරීම සඳහා වන ආයෝජන නොමැතිකම යම්තාක් දුරකට හේතු කොට ගෙන සමස්ත ආපදා අවදානම් කළමනාකරණ ව්‍යාපෘති අතරින් සියයට 51ක් පමණ සම්පූර්ණ කොට පැවතුණු තත්ත්වයක් තිබුණු බවත්ය . ඒ සමගම යටිතල පහසුකම් කෙරෙහි

---

[44] ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය. **2016.** ශ්‍රී ලංකාවේ ආපදා පැතිකඩ (**dmc.gov.lk**)

[45] **https://www.preventionweb.net/english/professional/policies/v.php?id=17955**

[46] මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ප්‍රකාශයට පත් නොකළ වාර්තාව **2010"**

සිදුකරනු ලබන අලාභය, ආර්ථික පාඩු සහ බලපෑමට ලක් වන පුද්ගලයන් සංඛ්‍යාව දිගින් දිගටම අඛණ්ඩව ඉහළ යාමක් සිදු වූ බවත්, මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා සාධනීය යාන්ත්‍රණයක් නොතිබූ බවත් මෙහිදී අවධානයට ලක් විය.

වගුව 4. ආපදා අවදානම් අවම කිරීමේ සෙන්ඩායි රාමුවේ ප්‍රමුඛතාවන්ට එරෙහි මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය

ආපදා අවදානම් අවම කිරීමේ සෙන්ඩායි රාමුවේ (SFDRR) ප්‍රමුඛතා ක්ෂේත්‍ර යටතේ වන ක්‍රියාකාරකම්	ක්‍රියාත්මක කිරීමේ මට්ටම (%)		
	ඉහළ	මැද	අවම
SFDRR ප්‍රමුඛතා 1 (17)	**29**	**24**	**47**
SFDRR ප්‍රමුඛතා 2 (16)	**25**	**38**	**38**
SFDRR ප්‍රමුඛතා 3 (17)	**16**	**32**	**53**
SFDRR ප්‍රමුඛතා 4 (42)	**44**	**33**	**23**

3.9 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම (2013-2017) සහ ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන (2014-2018)

"වඩාත් ආරක්ෂිත ශ්‍රී ලංකාවක් උදෙසා" යන මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ආපදා කළමනාකරණ සැලසුම්කරණයේ ඊළඟ අදියරට ඇතුලත් වූයේ **2013-2017** ජාතික ආපදා කළමනාකරණ සැලැස්මයි. ඉන් අනතුරුව නැවතත් **HFA** භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන **(2014-2018)** නමින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් විය. මෙම **SLCDMP** තුළ වැඩි වශයෙන් භාවිතා කරන ලද්දේ බංගලාදේශ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන ඔස්සේ **(2012-2016)** උගත් පාඩම් සහ අත්දැකීම් ය.

ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන 2014-2018 සඳහා වන සමස්ත ඇස්තමේන්තුගත ආයෝජනය ශ්‍රී ලංකා රුපියල් බිලියන 29ක් පමණ වූ අතර එයින් සියයට 83 ක සම්පත් ප්‍රමාණයක් ආපදා අවම කිරීම කෙරෙහි වෙන් වූ අතර, ඇස්තමේන්තුවෙන් සියයට 6.9ක් පමණ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම සහ සහන කළමනාකරණය සඳහා විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන වෙත ලැබුණු අරමුදල් ප්‍රමාණය ඉතාම අවම ප්‍රමාණයක් වූ අතර ජාතික අයවැයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 9 ක් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙතින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 ක මුදලක් එලෙස ලැබී තිබුණි.


ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අතරතුර සෙන්ඩායි රාමුව **(Sendai framework)** හඳුන්වා දෙන ලද අතර, ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනෙහි ක්‍රියාකාරකම් 45 මගින් ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි (වගුව 5) ප්‍රමුඛතා ක්ෂේත්‍ර 4 ප්‍රමාණවත් පරිදි ආවරණය කරන ලදී. නම් වශයෙන් සැලකූ කල, අවදානම අවම කර ගැනීම සහ ප්‍රත්‍යාස්ථතිය උදෙසා අවදානම් සංවේදී ආයෝජන වශයෙන් ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතා අංක 1 සහ ප්‍රමුඛතා අංක 3 ක්ෂේත්‍ර යටතේ කාණ්ඩ කරන ලද ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනෙහි ක්‍රියාකාරකම් මගින් ඉහළ මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වයක් සටහන් විය.

වගුව 5. ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනෙහි සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතාවයන් සංසන්දනය කිරීම

ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි ප්‍රමුඛතාව යටතේ ශ්‍රී ලංකාවේ පුළුල් ආපදා කළමනාකරණ වැඩසටහනෙහි ක්‍රියාකාරකම්	වැඩසටහන් සංඛ්‍යාව	ක්‍රියාත්මක කිරීමේ මට්ටම් (%)		
		ඉහළ	මධ්‍යම	පහළ
අවදානම අවබෝධ කර ගැනීම	11	0	18	82
අවදානම් පිළිබඳ කටයුතු පාලනය ශක්තිමත් කිරීම	12	17	33	50
අවදානම් අවම කිරීම කෙරෙහි ආයෝජනය කිරීම	10	10	30	60
පෙර සූදානම, පූර්ව අනතුරු ඇඟවීම්, ප්‍රතිචාර දැක්වීම සහ මුදවා ගැනීම	12	17	42	41

3.10 ජාතික මට්ටමින් ආපදා කළමනාකරණය සිදු කිරීම

ආපදා කළමනාකරණ ආයතනික ආකෘතියේ සංකීර්ණභාවය සැලකීමේදී (රූපය 35) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුව අති විශාල කාර්යභාරයක් පවතින අතර එහිදී විශේෂයෙන්ම ආපදා කළමනාකරණ චක්‍රයේ සියලු පැතිකඩ තුළදී 'කිසිවෙකු මග හැරී නොමැත' යන්න සහතික කිරීම සඳහා වගකීම දැරිය යුතුය.



35 රූපය. ආපදා අවදානම් කළමනාකරණයේ ආයතනික රාමුව

3.10.1 ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

2005 වසරේ නොවැම්බර් මසදී ගරු අග්‍රාමාත්‍යවරයා යටතේ ආපදා කළමනාකරණය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් වෙනම අමාත්‍යාංශයක් ස්ථාපිත කරන ලද අතර, ඉන් අනතුරුව 2006 ජනවාරි මාසයේදී ආපදා

කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍යාංශය (**M/DM&HR).** වශයෙන් ආපදා කළමනාකරණය කෙරෙහි වෙන් වූ නව අමාත්‍යාංශයක් ස්ථාපිත කරන ලදී. එයින් අනතුරුව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට, වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු විවිධ අමාත්‍යාංශ විසින් ආපදා කළමනාකරණ විෂයය මෙහෙයවන ලදී. වර්තමානය වන විට ආපදා කළමනාකරණ විෂය ආරක්ෂක කැබිනට් අමාත්‍යාංශය යටතේ ජාතික ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් ස්ථාපිත කොට තිබෙන අතර පහත බලතල එයට හිමිවේ [47]:

- කාලගුණය සහ දේශගුණය සම්බන්ධ සේවා සැපයීම
- කාලගුණ විද්‍යා සමීක්ෂණ සහ පර්යේෂණ
- නාය යෑම් ආපදා කළමනාකරණය සහ ඒ ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- ස්වභාවික ආපදා පුරෝකථනය කිරීම සහ ඒවා සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කිරීම
- ස්වභාවිකව හා මිනිසා විසින් ඇති කරන ලද ආපදා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ස්වභාවිකව හා මිනිසා විසින් ඇති කරන ලද ආපදාවලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
- ආපදාවලට ඔරොත්තු දෙන ඉදිකිරීම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම

පහත සඳහන් ආයතන ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයට අයත් විෂය පථය යටතේ පවතී.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC)**
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (**DoM)**
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (**NBRO)**
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානව (**NDRSC)**

3.10.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන භාවිතා කරමින් ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාවේ(**NCDM)** කටයුතු ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කරනු ලැබීය. අනෙකුත් ප්‍රධාන නියෝජිත ආයතන සමග සහයෝගිතාවයෙන්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු, ආපදා බලපෑම අවම කිරීම, පෙර සූදානම, පුර්ව අනතුරු හැඟවීම් ප්‍රචාරණය කිරීම, හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම, සහන සේවා සම්බන්ධීකරණය කිරීම සහ ආපදාවෙන් පසු අවශ්‍ය වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම යනාදී කාර්යයන් භාරව කටයුතු කරන ප්‍රධානම ආයතනය වනුයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ බලතල යටතේ පවත්නා ප්‍රධාන විෂයපථය යටතට පහත කාරණා ඇතුලත් වේ:

1. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පිලියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහ අවශ්‍ය වන ආකාරයට එහි වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා සභාවට සහාය සැලසීම

2. ආපදා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සැපයීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

3. ආංශික, අමාත්‍යාංශීය සහ ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම පිලියෙල කිරීම සඳහා මගපෙන්වීම සැපයීම සහ එවන් සැලසුම් ජාතික සැලැස්මට අනුකූල වන බව සහතික කිරීම- ජාතික ආපදා සැලැස්මට අනුකූල වන බව සහතික කිරීම

4. ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සැලසුම් ඉදිරිපත් කිරීම සහ අදාල ආයතන විසින් සැලැස්ම ක්‍රියාත්මක කිරීම , සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අවශ්‍ය වන මූල්‍යමය සහාය භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම

---

[47] ස්වදේශ කටයුතු, ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය

https://www.peps.lk/ministry/state-ministry-of-home-affairs-national -security-and-disaster-management/

5. හදිසි ප්‍රතිචාර දැක්වීමට (උදා- නිරිතදිග සහ ඊසානදිග මෝසම් වැසි සමය සඳහා සූදානම් වීම) පළාත් පාලන නියෝජිතයන් (උදා: දිස්ත්‍රික් ලේකම්වරුන්) අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම.
6. ආපදාවක් සිදු වූ අවස්ථාවකදී, ආපදාවේ හෝ ව්‍යසනයේ ස්වභාවය සහ ප්‍රබලත්වය සැලකිල්ලට ගනිමින්, ජාතික හදිසි මෙහෙයුම් සැලැස්මේ සඳහන් වී ඇති ආකාරයට සුදුසු පරිදි සෙවීමේ සහ මුදා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, සහන සැලසීම, අධීක්ෂණය කිරීම මෙන්ම ප්‍රතිසාධන හා ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම

7. දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණ ඒකක සමග සම්බන්ධ වෙමින් ආපදා කළමනාකරණ පනතේ ලැයිස්තුගත කොට ඇති ආපදාවන් කළමනාකරණය කිරීම සඳහා පහසුකම් සැලසීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම

8. පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම, ආපදා කළමනාකරණය කිරීම පිලිබඳ දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම
9. ආපදා කළමනාකරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් රජයේ බලධාරීන් සහ නියෝජිත ආයතන, පෞද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් සියලු අදාල ආයතන සමග සම්බන්ධ වී කටයුතු කිරීම

3.10.3 තාක්ෂණික උපදේශක කමිටුව

2005 ආපදා කළමනාකරණ පනත මඟින් අර්ථ දක්වා ඇති පරිදි ආපදා කළමනාකරණ මෙහෙයුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික උපදේශක කමිටුවක් (**TAC**) පත් කිරීමට ප්‍රතිපාදන ලබා දී ඇත. ආපදා අවදානම් කළමනාකරණයේ අදාළ කාර්යයන් සහ වගකීම් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති වෘත්තිකයන් සහ විශේෂඥයන්ගෙන් සමන්විත ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව විසින් තාක්ෂණික උපදේශක කමිටුවේ සභාපති සහ සාමාජිකයින් පත් කිරීමට නියමිතය.

3.10.4 හදිසි ප්‍රතිචාර කමිටුව

හදිසි ප්‍රතිචාර කමිටුව (**ERC**) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ස්ථාපිත කර සම්බන්ධීකරණය කරනු ලබන අතර, සමස්ත හදිසි සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් විවිධ ආයතන හා ආයතනවල ජාතික මැදිහත්වීම් අවශ්‍ය වන විශාල ව්‍යාපාරයක අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වේ. හදිසි ප්‍රතිචාර කමිටුවට ජාතික හදිසි මෙහෙයුම් සැලැස්මේ දක්වා ඇති හදිසි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට සහ පවතින හදිසි තත්ත්වය හා ආපදා තත්ත්වයට අනුව අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ බලය හිමි වේ. පවත්නා මානව සම්පත් හා උපකරණ පිළිබඳ විමසා බැලීම, මූල්‍ය විධිවිධාන හා වෙනත් සම්පත් එක් එක් අංශ කෙරෙහි භාවිතය සහ ක්ෂණික නිවාරණ ක්‍රියාමාර්ග හා හදිසි අවස්ථාවන්ට මනාව මුහුණ දීම වළක්වාලන අඩුලුහුඩුකම් හඳුනාගැනීම යනාදී කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම කමිටුව මඟින් අපේක්ෂා කෙරේ.

එවැනි අවස්ථාවලදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ සියලුම ආයතන/ නියෝජිතායතනවලට නිශ්චිත හදිසි සැලසුම් (හෝ අදාළ ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් අනුව හදිසි ක්‍රියාමාර්ග) ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දෙන අතර ඒ සඳහා වන මහ පෙන්වීම් ද සිදු කරනු ලැබේ.


3.11 උප ජාතික මට්ටමේ ආපදා කළමනාකරණය

ජාතික මට්ටම සමග සම්බන්ධීකරණය වෙමින් (රූපසටහන 36) ග්‍රාමීය මට්ටමින් හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් සම්බන්ධ වන පරිදි පළාත්, දිස්ත්‍රික් සහ කොට්ඨාශ යනාදී ආකාරයට උප ජාතික මට්ටමේ ආයතනික පිලියෙල කිරීම් සඳහා 2005 ආපදා කළමනාකරණ පනත මඟින් විධිවිධාන සලසනු ලැබේ.

3.11.1 දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් පරිපාලන දිස්ත්‍රික්ක 25 තුළ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (**DDMCU**) ස්ථාපිත කරන ලදී. දිස්ත්‍රික් ආපදා

කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මෙම අංශයට අදාල විවිධ නියෝජිත ආයතන, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන ආයතන සහ දිස්ත්‍රික් මට්ටම තුළ කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන වල ප්‍රධානීන්ගේ නියෝජනයකින් සමන්විත විය. මෙම කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරනුයේ දිස්ත්‍රික් ලේකම්වරයාය. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් අවශ්‍ය සහාය සලසා දෙනු ලැබේ. දිස්ත්‍රික් මට්ටම තුළ සියලු සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත සහාය සැලසීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මගින් සිදු වේ. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන රජයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු සහ පලාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිත්වය දරනු ලැබේ. ප්‍රාදේශීය මට්ටම තුළ ආපදා අවදානම අවම කිරීමේ කටයුතු ප්‍රධාන ප්‍රවාහගත කිරීම සහ අවදානම් තත්ත්වයන් පිළිබඳ දැනුවත්භාවයකින් යුතු සංවර්ධන කටයුතු ඉදිරියට කර ගෙන යාම සඳහා අවශ්‍ය වන පසුබිම සලසා දෙනුයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන සම්බන්ධීකරණ කමිටුව (ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටු) මගිනි.



36 රූපය. **ආපදා කළමනාකරණ කමිටු උප ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම**

3.11.2 ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණය

රේඛීය අමාත්‍යාංශ, අධිකාරීන්, දෙපාර්තමේන්තු, මණ්ඩල, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන වල නියෝජිතයන්ගෙන් ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරණ කමිටුව සමන්විත වේ. දිස්ත්‍රික් ලේකම්වරයාගේ මගපෙන්වීම යටතේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සාමාජිකයන්ගේ සහාය සහිතව ප්‍රාදේශීය මට්ටමින් / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම තුළ අදාල ප්‍රදේශය ආවරණය වන පරිදි සියලුම සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වීමේ කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා වගකීම් දරනු ලබන ප්‍රධාන කමිටුව මෙයයි. ප්‍රාදේශීය ආපදා කළමනාකරණය මෙහෙයුම් කාර්යයන් උදෙසා පළාත් පාලන පද්ධතිය සමග සම්බන්ධීකරණය වී පවතී.

3.11.3 ආපදා කළමනාකරණය තුළ පළාත් පාලන ආයතන

මහජන සෞඛ්‍යය, මහජන උපයෝගිතා සේවාවන් සහ පොදු මාර්ග යනාදී ආශ්‍රිත සියලු කාරණාවන් නියාමනය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා වන බලතල පැවරී ඇත්තේ පලාත් පාලන ආයතන වෙතයි. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පලාත් පාලන ආයතන පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව [48] ප්‍රාදේශීය සැලසුම්කරණ කටයුතු ආශ්‍රිතව පරිසරය සහ ආපදා තත්ත්වයන් කෙරෙහි ඉතා ඉහළ අවධානයක් යොමු කරමින් කටයුතු කළ යුතු ආයතන වශයෙන් සහ ප්‍රාදේශීය පදනමක් සහිත බල අධිකාරියකින් යුතු සැලසුම් කිරීමේ බලධාරියා වශයෙන් පළාත් පාලන ආයතන හඳුනාගැනීමට ලක් කොට ඇත. මෙම ප්‍රතිපත්තිය මගින් ප්‍රකාශ කරනු ලබන ආකාරයට 'පළාත් පාලන ආයතනය, ආපදා කළමනාකරණය සඳහා වන සමස්ත දිස්ත්‍රික් රාමුවක් තුළ ආපදා සඳහා සූදානම් වීම, ආපදා අවම කිරීම, ආපදා හානි අඩු

[48] පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය, අංක **1632/26 - 2009** දෙසැම්බර් **18** සිකුරාදා

කිරීම සහ ආපදා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් පූර්ව ක්‍රියාකාරීව කටයුතු කළ යුතු වෙයි'. ආපදාවන්ට ගොදුරු වීමේ අවදානමක් සහිත ප්‍රදෙශ හඳුනාගැනීම, පවත්නා ආපදා අවදානම් අවබෝධ කරගැනීම සහ ඇතිවිය හැකි උවදුරු අවබෝධ කරගැනීමෙන් දේශීය වශයෙන් හඳුනාගත් ක්‍රමෝපායන් සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේද සහිත එක් එක් ප්‍රදේශයට සුවිශේෂී වූ විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කිරීම පලාත් පාලන ආයතන විසින් සිදු කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. පනතේ මෙහෙයුම් පැතිකඩ වලට සමගාමීව දේශීය වශයෙන් හඳුනාගැනීමට ලක් වූ ක්‍රමෝපායන් සහ ප්‍රතිචාර දැක්වීමේ පද්ධති සමගින් වඩා විස්තරාත්මක පුළුල් සහ එක් එක් ප්‍රදේශ කෙරෙහි සුවිශේෂී වූ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම උදෙසා හේතු වන පරිදි ආපදා අවදානම් සහිත ප්‍රදේශ, පවත්නා ආපදා අවදානම් තත්ත්වයන් කවරේද සහ අවදානම් තත්ත්වයන් සහ උවදුරු කවරේද යන්න හඳුනාගැනීම පලාත් පාලන ආයතන විසින් සිදු කරනු ලැබීම අපේක්ෂා කෙරේ[49]. නාගරික පලාත් පාලන ආයතන ක්‍රියාත්මක වන්නේ නාගරික සංවර්ධන අධිකාරි (**UDA**) පනත යටතේය. නාගරික සංවර්ධන සැලැසුම් සකස් කිරීමේදී සහ නියාමන ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීමේදී ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඒ සඳහා ඒකාබද්ධ කර ගැනීමට ඒවා සතුව විධිවිධාන පවතී. කලාපකරණ සැලසුම් පිලියෙල කිරීමේදී සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන අයදුම් කිරීම් අනුමත කිරීමේදී ඒ තුල ආපදා අවදානම් ඒකාබද්ධ කර ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාර්ගෝපදේශ නිකුත් කොට ඇත.

2019 වසරේදී, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ (**JICA**) සහාය ඇතිව, **"**දේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ගයක් සකස් කිරීමේ" ක්‍රියාවලිය **2015-2030** සෙන්ඩායි රාමුවේ "ඉලක්ක **5"** ට අනුකූල වීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ එක්ව, ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලියේ පළමු පියවර ලෙස ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සකස් කිරීම සඳහා බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාව සහ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අයගම ප්‍රාදේශීය සභාව යන ප්‍රාදේශීය සභා දෙකක් (**2**) තෝරා ගැනුණි. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල මත, පළාත් පාලන ධාරිතා සංවර්ධන (**CDLG**) ව්‍යාපෘතිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහය ඇතිව, සෙසු ආපදා අවදානම් සහිත දිස්ත්‍රික්ක සඳහා දේශීය ආපදා අවදානම අවම කිරීමේ උපායමාර්ගය සහ සංකල්පය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙනු ලැබීය. මෙම ක්‍රමෝපාය හඳුන්වාදීමත් සමඟ ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගෙන ඇති ආපදා අවදානම් අවම කිරීමේ මුලපිරීම් සඳහා සහයෝගීව කටයුතු කිරීම සඳහා ජාතික සහ උප ජාතික ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට පළාත් පාලන ආයතන රාමුව මෙහෙයවනු ලැබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව මේ සඳහා පුළුල් අධීක්ෂණ යාන්ත්‍රණයක් යෝජනා කර ඇති අතර ජාතික සහ පළාත්පාලන ආයතනවල සහය ඇතිව ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාව ප්‍රශස්ත කිරීම සඳහා අදාළ රෙගුලාසි ව්‍යුත්පන්න කර ඇත. මෙම ක්‍රමෝපාය මඟින් ආපදා අවදානම් කිරීමේ සෙන්ඩායි රාමුවේ මූලික මූලධර්ම දහතුනම අනුගමනය කිරීමට පළාත්පාලන ආයතනවලට හැකියාව ලැබෙන අතර ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධයෙන් වන ගැටළුසහගත තත්ත්වයන් ඵලදායී හා කාලානුරූපීව විසඳාලීම සඳහා අවශ්‍ය වන ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ ගෝලීය සම්බන්ධීකරණ ශක්තිමත් කිරීමට ද එමඟින් හැකි වනු ඇත.

3.11.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ආපදා කළමනාකරණය

ආපදා අවදානම් කලමනාකරණය කිරීමේ ක්‍රියාකාරකම් පොදුවේ මූලික වශයෙන් සම්බන්ධීකරණය කිරීම සඳහා සහ විශේෂයෙන්ම ප්‍රජා පාදක ආපදා අවදානම් කළමනාකරණ (**CBDRM**) කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා ග්‍රාම හෝ ගම් මට්ටමේ ආපදා කළමනාකරණ කමිටු ස්ථාපිත කරනු ලැබේ. ආපදා අවදානම් අවම කිරීම ආශ්‍රිත සියලු ක්‍රියාකාරකම් වලදී මෙම කමිටුව විසින් උත්ප්‍රේරක භූමිකාවක් දරනු ලැබීම අපේක්ෂා කෙරේ. පාරිසරික සංරක්ෂණය සඳහා අලුතින්පත්කරනු ලැබූ සංවර්ධන නිලධාරීන් ඇතුලුව (පරිසර අමාත්‍යාංශය යටතේ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ සිටින සංවර්ධන නිලධාරීන් සමූහය භාවිතා කරමින් මෙම මට්ටම තුළ කටයුතු වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා හැකියාව පවතී. ගම් මට්ටම තුළ ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා බැංකු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන විසින් සහයෝගය සලසනු ලබන අතර, ඒවා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ දිස්ත්‍රික් මට්ටමින් ආපදා කළමනාකරණ මෙහෙයුම් කටයුතු සමඟ සම්බන්ධ කළ හැකිය. ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ආපදා කළමනාකරණ ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ඉඩකඩ පවතින ක්ෂේත්‍ර පහතින් දක්වා ඇත.

---

[49] **íbid**

1. නිරීක්ෂණ ඔස්සේ පූර්ව අනතුරු හැඟවීම් පිලියෙල කිරීම (උදා : නායයාම්)
2. පිහිනුම් හැකියාව, සෙවීම සහ මුදවා ගැනීම, ප්‍රථමාධාර, කඳවුරු කළමනාකරණය යනාදිය ඇතුළුව සූදානම් කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම.
3. විවෘත මූලාශ්‍ර, භූගෝලීය තොරතුරු පද්ධති, දුරකථන යෙදවුම් යනාදිය භාවිතා කිරීම ඇතුළු උවදුරු සහ අවදානම් පාත්‍රතාවයන් සිතියම්ගත කිරීමේ කුසලතා.
4. ආපදා සහ අනුගතවීමේ ක්‍රියාමාර්ග ආශ්‍රිතව පරිසර පද්ධති ක්‍රියාවලීන් පිලිබඳ අධ්‍යාපනය සහ දැනුවත්භාවය
5. අධීක්ෂණ කටයුතු සඳහා සහභාගි වීම සහ පාරිසරික මිනුම්, ජල මට්ටම් යනාදිය සටහන් කිරීම වැනි තොරතුරු අනාවරණය කරගැනීමේ මෙවලම් භාවිතා කිරීම.

3.12 උපද්‍රවඅධීක්ෂණය සහ අනාවැකි පලකිරීම (පුරෝකථන)

ඉන්දියන් සාගරය ආශ්‍රිතව ඇතිවූ අතිශය විනාශකාරී සුනාමි අත්දැකීමෙන් පසුව ශ්‍රී ලංකාව විසින් ඉතා සැලකිය යුතු අයුරින් ස්වකීය ආපදා සූදානම් සහ ප්‍රතිචාර දැක්වීමේ ශක්‍යතාවයන් සවිමත් කොට සහ වැඩිදියුණු කොට ඇත. ස්වකීය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ඔස්සේ ප්‍රාදේශීය මට්ටමේ කියාකාරකම් ක්‍රියාත්මක කිරීම ඇතුළුව ජාතික ආපදා සඳහා සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන් වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවශ්‍ය නායකත්වය සහ මගපෙන්වීම සලසා ඇත. ශ්‍රී ලංකා රජය විසින් උවදුරු පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා වගකීම දරන ආයතන ශක්තිමත් කරමින්, බහුවිධ උවදුරු ආශ්‍රිත සහ බලපෑම් මත පදනම්වූ පුරෝකථන සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පියවර ගන්නා ලදී.

සාධනීය ආකාරරයෙන් ක්‍රියාවට නැංවිය හැකි පරිදි සැකසුම් කරන ලද සහ ශක්තිමත් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රම, සන්නිවේදන සහ අනතුරු හැඟවීමේ ක්‍රම යනාදිය සමග සංයෝජනය වූ ඒකාබද්ධ උවදුරු පුරෝකතනය කිරීමේ පද්ධතියක් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් ප්‍රවර්ධනය කරනු ලැබේ. සුවිශේෂී උවදුරු සම්බන්ධයෙන් උවදුරු අධීක්ෂණය කිරීම, පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් සකස් කිරීම ප්‍රධාන තාක්ෂණික නියෝජිත ආයතනයන්ගේ වගකීම වේ. අනෙකුත් පාර්ශ්වයන්ගේ සහාය සහිතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිසි කලට ආපදා අනතුරු හැඟවීම් අවසාන අදියරයන් / මට්ටම් **(last mile)** දක්වා ව්‍යාප්ත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබේ. හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය **(EOC)** විසින් පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීම සඳහා සහ ආපදාවන්ගේ බලපෑම් මෙන් ම ප්‍රතිචාරයන්ගේ සාධනීයභාවය ග්‍රහණය කර ගැනීම සඳහා යාන්ත්‍රණ ගණනාවක් භාවිතා කරනු ලැබේ. නියහ, ගංවතුර, නායයාම් යනාදිය ඇතුළු නිතිපතා ඇතිවන උවදුරු අවස්ථාවන්ට අමතරව රසායනික ද්‍රව්‍ය කාන්දුවීම් සහ ඒ ආශ්‍රිත උවදුරු අතුළුව, හදිසි අවස්ථාවේ ස්වරූපය මත පදනම්ව 119 ජාතික ජාලය සමග සමීපව සම්බන්ධ වෙමින් 117 ආපදා ක්ෂණික දුරකථන සේවාවද පවත්වාගෙන යනු ලැබේ


3.12.1 සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs)

ආපදා කළමනාකරණ සන්දර්භය තුළ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි **(SOPs)** යනු ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ විවිධ අවස්ථාවලදී පුහුණු වෘත්තිකයන් හෝ පාර්ශ්වකරුවන් කණ්ඩායමක් විසින් අනුගමනය කළ යුතු එකඟ වූ ක්‍රියාවලි සමූහයකි. සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි ආපදා විශේෂිත, නියෝජිතායතන/ආයතන විශේෂිත හෝ කාල සංවේදී විය හැක. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030 යටතේ, ආපදා කළමනාකරණයට සම්බන්ධ සියලුම නියෝජිතායතන/ ආයතන විසින් සූදානම් වීම සහ පූර්ව අනතුරු ඇඟවීම් ලැබීම් පිළිබඳව මෙන්ම හදිසි ප්‍රතිචාර, ප්‍රතිසාධනය, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් ආයතන විසින් ගත යුතු ක්‍රියාමාර්ග සඳහා පිරික්සුම් ලැයිස්තු / ස්ථාවර නියෝග ඇතුළත් නියෝජිතායතන/ආයතන විශේෂිත සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. 2005 ආපදා කළමනාකරණ පනතට අනුව අවශ්‍ය පරිදි අදාළ තාක්ෂණික ආයතන සහ රාජ්‍ය ආයතන විසින් සකස් කරන ලද විශේෂිත ආයතනික ආපදා කළමනාකරණ සැලසුම්වලට මෙම සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි ඇතුළත් කළ යුතුය. විශේෂිත ආපදා මැගමන්ට් කාර්යයන් සඳහා සහ විවිධ රජයේ දෙපාර්තමේන්තු / ආයතන සඳහා ස්ථාවර නියෝග **(SOs).** ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සහ සුදුසු පරිදි අමාත්‍ය මණ්ඩලයේ/පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව අදාළ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි යටතේ එකඟ වී අවසන් කළ යුතුය.

3.12.2 පූර්ව අනතුරු ඇඟවීම්

ආපදා කළමනාකරණ සැලසුම් සහ පවතින සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් පහත ආකාරයට පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසනු ලැබේ. (රූපසටහන - 37) ;

- අදාල උවදුරු පිළිබඳව දේශීය සහ ජාත්‍යන්තර පූර්ව අනතුරු ඇඟවීමේ නියෝජිත ආයතන සමග අඛණ්ඩව සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලබන එසේම විවිධ උවදුරු සම්බන්ධයෙන් පුරෝකථනය කිරීමේ වගකීම දරන ප්‍රාදේශීය තාක්ෂණික ආයතනයන් සමග සම්බන්ධීකරණය වීම
- අනාගතයේදී ඇතිවීමට යන තර්ජනයක් සම්බන්ධයෙන් එය ආශ්‍රිතව පවත්නා ආපදා ස්වභාවය සහ පූර්ව අනතුරු ඇඟවීමේ මට්ටම දක්වමින් අදාල බලතල සහිත තාක්ෂණික නියෝජිත ආයතන විසින් සකස් කරන ලද පණිවිඩ සහ ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම. පණිවුඩ විකාශනය කිරීමට ප්‍රථම හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් විවිධ තාක්ෂණික ආයතන විසින් නිකුත් කරනු ලබන තාක්ෂණික පණිවුඩ විශ්ලේෂණය කරනු ලැබේ.
- සෝදිසියෙන් පසුවීම සඳහා අදාල වන අනතුරු ඇඟවීමේ මට්ටම සහ ප්‍රජාවේ සාමාජිකයන් විසින් කටයුතු කල යුතු වන්නේ කෙසේද යන්න පිලිබඳ තොරතුරු සමගින් බලපෑමට ලක්වීමේ ඉඩකඩක් පවතින භූගෝලීය ප්‍රදේශ ආවරණය වන පරිදි දිස්ත්‍රික් පරිපාලනයේ සිට ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටම දක්වා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල සහයෝගය සහිතව අවදානම් පාත්‍රතාවේ සිටින ප්‍රජාවන් උදෙසා පූර්ව අනතුරු ඇඟවීම් විකාශනය කිරීම සහ ව්‍යාප්ත කිරීම උදෙසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය භාවිතා කිරීම. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සතුව පවත්නා ජංගම දුරකථන වෙත තොරතුරු විකාශනය කිරීමේ ක්‍රමය, කෙටි පණිවිඩ සේවාව, ඊඩබලිව් කුළුණු සහ අනිකුත් ඊඩබලිව් විධික්‍රම භාවිතා කිරීම මගින් වාචික, කෙටිපණිවුඩ, CD,
  HF /VHF, ෆැක්ස් පණිවිඩ සහ අනිකුත් ආකෘතින් ඔස්සේ වන පණිවිඩ අන්තර්ගතයන් විකාශනය කළ හැකිය.
- සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි පරිදි සිද්ධි විධාන පද්ධතියක් **Incident Command systems** අනුගමනය කිරීම ඇතුළුව නිසි කලට තත්ත්ව වාර්තා, ජාත්‍යන්තර සහ දේශීය සහාය ඉල්ලීම් ආදිය සම්බන්ධීකරණය සඳහා පහසුකම් සැලසීම.
- පූර්ව අනතුරු ඇඟවීම්, එදිනෙදා අවශ්‍යතාවන් සහ අනතුරුදායක තත්ත්වයන්ගෙන් මිදී ඉවත් වීම සඳහා සහාය සැලසීම ඇතුළුව දැනුවත්භාවය ඇති කිරීම සහ තොරතුරු යාවත්කාලීන කිරීම් සිදු කිරීම



37 රූපය. පූර්ව අනතුරු ඇඟවීමේ පණිවිඩ අවසාන අදියර / මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමේ ක්‍රමය

3.13 ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානමින් පසුවීම

හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානම් වීමේ පියවර ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සූදානම සැලසුම් අංශය මගින් සම්බන්ධීකරණය කර සිදු කරනු ලැබේ.

- නිරිතදිග සහ ඊසානදිග මෝසම් සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රධාන තාක්ෂණික ආයතනවල (උදා: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, සෞඛ්‍ය අමාත්‍යාංශය) සහාය ඇතිව වාර්ෂිකව ජාතික මට්ටමේ රැස්වීම් සම්බන්ධීකරණය කිරීම සහ සංවිධාන කිරීම. ප්‍රධාන තාක්ෂණික ආයතනවලින් තොරතුරු රැස් කිරීම, ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයන් හරහා සියලුම පාර්ශ්වකරුවන් වෙත පූර්ව අනතුරු ඇඟවීම්/ඇඟවීම්/ යාවත්කාලීන කිරීම් මෙන්ම හදිසි ප්‍රතිචාර සහ සහන අවශ්‍යතා සම්බන්ධීකරණය කිරීම ද මෙයට ඇතුළත් වේ.
- මෝසම්, ගංවතුර, සුළි සුළං, නායයෑම්, නියඟය, සුනාමි වැනි ස්වභාවික විපත් මෙන්ම වසංගත තත්ත්වයන්ට ද ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී මට්ටමින් ආපදා පෙර සූදානම් සැකසීම සහ හදිසි ප්‍රතිචාර සඳහා රැස්වීම් පැවැත්වීම සඳහා දිස්ත්‍රික් විසිපහේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක **(DDMCUs)** මෙහෙයවීම.
- දිස්ත්‍රික්/ප්‍රාදේශීය ආපදා අවදානම් කළමනාකරණ සැලසුම්, දිස්ත්‍රික් මෙහෙයුම් සැලසුම් සහ මෝසම් සඳහා සූදානම් වීමේ සැලසුම් සකස් කිරීම, සමාලෝචනය සහ පිළියෙල කොට අවසන් කිරීම
- ශ්‍රී ලංකාව පුරා සිටින අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අත්විඳින නිරන්තර ස්වභාවික ආපදා සහ සුනාමි තර්ජන සම්බන්ධයෙන් දැනුවත් කිරීම මෙන්ම පවත්නා සූදානමේ මට්ටම ශක්තිමත් කිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් සූදානම් වීමේ අභ්‍යාස හෝ ප්‍රායෝගික අභ්‍යාස, මූලිකත්වය ගෙන ක්‍රියා කිරීමේ අභ්‍යාස පැවැත්වීම. මෙම අභ්‍යාස පාසල්, රෝහල්, හෝටල්, ප්‍රධාන රාජ්‍ය ආයතන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායන් සහ සමස්තයක් වශයෙන් ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් ද සිදු කෙරේ.
- පළාත්පාලන ආයතන අතර ආපදා අවදානම් අවම කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගංවතුර, නාය යෑම්, සුළි කුණාටු සහ සුනාමි වැනි ප්‍රධාන ස්වභාවික ආපදා සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සකස් කිරීම
- **2005** ආපදා කළමනාකරණ පනත මගින් අනිවාර්ය කර ඇති පරිදි "ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම - සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සූදානම් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ" පිළිබඳව වන ග්‍රන්ථය නිර්මාණය කිරීම සහ සංවේදනය කිරීම.
- රසායනික අනතුරු, තෙල් කාන්දුවීම් සහ කාර්මික උපද්‍රව සඳහා හදිසි කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ජාතික මට්ටමේ ඉවත් කර ගැනීමේ අභ්‍යාස මෙන්ම ඒ හා සමාන අභ්‍යාස, බහුලව පවතින සහ/හෝ ඉහළ අවදානම් සහිත උපද්‍රව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- ආපදා කළමනාකරණයේ ප්‍රධාන ක්ෂේත්‍ර ඇතුළත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සම්බන්ධීකරණය සහ සකස් කිරීම
- අදාළ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රධාන ජාතික ලේඛන සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම
- ප්‍රතිපත්ති සම්පාදකයින්, ප්‍රතිචාර කාර්ය මණ්ඩලය සහ ප්‍රජාවේ ඉලක්ක කණ්ඩායම් සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් "ආපදාවලදී ස්ත්‍රී පුරුෂභාවය, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය **(SGBV)"** පිළිබඳව වන ප්‍රකාශනය සහ මාර්ගෝපදේශ සංවේදනය කිරීම
- **"**කොවිඩ්-**19** මධ්‍යයේ ආරක්ෂිත මධ්‍යස්ථාන කළමනාකරණය" සම්බන්ධයෙන් වන අත්පොත

3.14 පෞද්ගලික අංශයේ ආපදා සඳහා සූදානම් වීමේ කටයුතු සැලසුම්කරණය

පෞද්ගලික අංශයේ මූලිකත්වය සහිතව සිදු වන නිෂ්පාදන කටයුතු, සේවා සැපයීම් සහ රැකියා අවස්ථා, ආපදා අවස්ථාව අතරතුර හැකි උපරිම මට්ටමින් අඛණ්ඩව ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සහ ආපදාවක් මගින් බලපෑමට ලක් වන ස්වකීය සේවකයන්, මෙහෙයුම් කටයුතු සහ දේපල ආදිය නැවත ඉක්මනින් යථා තත්වයට පත් කිරීම සහතික කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සූදානම් කිරීම තුළ ආයතන අංශය ඉතා ප්‍රධාන භූමිකාවක් දරනු ලැබේ. සෑම ආයතනයක් විසින්ම 'හදිසි අවස්ථා සැලසුම්' සම්පාදනය කිරීමත් එමෙන්ම ස්වකීය දිස්ත්‍රික්, කොට්ඨාශ, පලාත් පාලන ආයතන හෝ

වෙනත් ප්‍රදේශ සීමා මත පදනම් වූ ආපදා කළමනාකරණ ආකෘති තුලට එම සැලසුම් ඒකාබද්ධ කිරීමත් දිරිගන්වනු ලැබේ. එසේම ප්‍රදේශය තුළ ආපදා කළමනාකරණ සැලසුම් පිලියෙල කිරීමේ කටයුතු සඳහාද ඔවුන් විසින් සක්‍රිය සහභාගිත්වයක් සැලසීමත්, තෝරාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් සැලසීමත් සිදු කළ හැකිය. ජාත්‍යන්තර ආපදා කළමනාකරණ නියෝජිතායතන ගණනාවක්[50], ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය බහු පාර්ශ්වික ප්‍රදායකයන් විසින් පෞද්ගලික අංශයේ ආපදා සූදානම සඳහා සහාය සලසන අතර, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාව (IFC), ආයතනික අංශය සඳහා හඳුන්වා දී ඇති පාරිසරික සහ සමාජයීය කාර්යසාධන දර්ශක[51] (ඇමුණුම 7) සහ ව්‍යාපාර හදිසි අවස්ථා සැලසුම්කරණය යනාදිය අනුගමනය කිරීම ඊට ඇතුලත් වේ.

ජල දූෂණය ආශ්‍රිත රෝගාබාධ වැනි සෙමෙන් ඇති වන ආපදා තත්ත්වයන් අවම කිරීම සඳහා සහාය වීම මගින් පෞද්ගලික අංශයේ මෙහෙයුම් වලට ආපදා පෙර සූදානම සඳහා දායකත්වය සැලසිය හැකිය. එක් අතකට සමාජීය වගකීමක් වශයෙන්ද සලකමින් මෙම මෙහෙයුම් කටයුතු මනා තත්ත්වයේ පවතින බව, විද්‍යාත්මක පදනමක් සහිත ඉලක්ක අනුගමනය කරනු ලබන සහ අදාල ප්‍රජාව හෝ ප්‍රදේශය මත පදනම් වන පරිසර පද්ධති කෙරෙහි බලපෑමක් ඇති නොකරන බව සහතික කිරීම වාසිදායක වේ. වැදගත් කරුණක් නම්, පරිසර පද්ධතියට එල්ල කරන බලපෑම අවම කිරීම ආපදා අවදානම අඩු කිරීමට හේතු වන බැවින් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදන සහ සේවා ස්ථානගත කිරීමට එමඟින් හැකියාව ලැබේ. ඒ, "යුරෝපීය සංගමයේ හරිත ගිවිසුම[52]" යටතේ ආපදාවලට ප්‍රත්‍යස්ථ සහ අඩු කාබන් කාර්මික සේවා සපයන ව්‍යාපාර සඳහා අපනයන වෙළඳපොල වැඩි ඉඩක් වෙන් වන බැවිනි.

3.15 හදිසි අවස්ථාවලදී සිදු කරන මෙහෙයුම්

සිද්ධි විධාන පද්ධතියේ (ICS) මූලධර්මයන්ට සමගාමීව අදාල ආයතන විසින් සකස් කරන ආපදා කළමනාකරණ සැලසුම් පරිදි අදාල රජයේ බලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමග ඒකාබද්ධව හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු ශක්තිමත් කිරීමේ වගකීම දරන ප්‍රමුඛ ආයතනය වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයයි. ජාතික මට්ටමේ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ ප්‍රොටෝකෝලය ඇමුණුම තුළ දක්වා ඇත. ප්‍රතිචාර දැක්වීමේ ස්වරූපය අනතුරෙහි බරපතල භාවය මත පදනම් වේ. අදාල ආපදාවේ බරපතලභාවය ප්‍රාදේශීය හැකියාවන් තුළින් කළමනාකරණය කර ගත හැකි මට්ටමින් ඔබ්බට යන්නේ නම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය ඔස්සේ ජාතික මට්ටමින් සහාය සලසනු ලැබේ. ගිනි ගැනීම්, හදිසි අනතුරු යනාදී දේශීය හදිසි අවස්ථා වලදී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික් හදිසි අවස්ථා මෙහෙයුම් කමිටුව විසින් අදාල පලාත් පාලන ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් ප්‍රතිචාර දැක්වීමේ කාලය අවම කිරීම සඳහා ක්‍රියාත්මක වනු ඇත. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම තුලින් ප්‍රමාණවත් මානව සම්පත් සමග අවශ්‍ය උපකරණ (පස් ඉවත් කිරීමේ යන්ත්‍ර, බෝට්ටු, ගිනි නිවීමේ රථ, ගිලන්රථ ආදිය) සපයමින් පළාත් පාලන ආයතනවල ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු කරනු ලැබේ. සහන සේවා සැලසීම, වින්දිතයන් සෙවීම සහ මුදවා ගැනීම, ප්‍රථමාධාර සැපයීම, ආරක්ෂක මධ්‍යස්ථාන කළමනාකරණය සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් ආශ්‍රිතව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සමග සම්බන්ධීකරණය වෙමින් රාජ්‍ය නොවන ආයතන කිහිපයක්ද පළාත් පාලන ආයතනයන්හි ශක්‍යතාවය සඳහා අවශ්‍ය සහාය සලසනු ලැබේ.

3.15.1 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (NEOP)

හදිසි අවස්ථා මෙහෙයුම් යාන්ත්‍රණය නිශ්චිතව ස්ථාපිත කොට දක්වනු ලබන හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම මත පදනම්ව හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක වන අතර ඒ ඔස්සේ පුරවැසියන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය තහවුරු කරමින් හදිසි අවස්ථා සහ ආපදා අවස්ථා වලදී රජය විසින් ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු කළමනාකරණය කරනු ලැබේ. ඒ ඔස්සේ බලාධිකාරය ක්‍රියාත්මක වන ආකාරය එයට අදාල වගකීම් සහ ආයතනික අන්තර් සබඳතාවයන් පැහැදිලි කොට දක්වනු ලබන අතර හදිසි අවස්ථා මෙහෙයුම් සඳහා සම්බන්ධ වී සිටින ක්‍රියාකාරීන් අතර සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය වනුයේ කෙසේද යන්න ඒ මගින් පෙන්වනු ලැබේ. මහා පරිමාණ ආපදා අවස්ථාවකදී

---

[50] ආසියා ශාන්තිකර ඇලන්ස් (A-PAD). ආසියා ශාන්තිකර සන්ධානය – ශ්‍රී ලංකාව – ආපදා කළමනාකරණය සඳහා (apad.lk)

[51] IFC. 2021
https://www.ifc.org/wps/wcm/connect/Topics_Ext_Content/IFC_External_Corporate_Site/Sustainability-At-IFC/Company-Resources/ESG+Performance+Indicators_SA/


[52] යුරෝපීය සංගමය. 2019. යුරෝපීය හරිත ගනුදෙනුවක් | යුරෝපීය කොමිසම (europa.eu)

ශ්‍රී ලාංකික බලධාරීන් විසින් එක්සත් ජාතීන්ගේ ආයතන, ජාත්‍යන්තර මානුෂීය ආයතන සහ මානුෂීය හමුදා ආයතන යනාදියට ආරාධනා කරනු ලැබිය හැකිය. ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මෙම කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන අතර, ආපදා කළමනාකරණය සඳහා වන හි සමස්ත මගපෙන්වීම යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශයද ඒ සඳහා හවුල් වේ.

3.15.2 හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ (EOC) කාර්යයන්

ඕනෑම හදිසි අවස්ථාවකදී වඩා සාධනීය සහ නිසි සම්බන්ධීකරණයකින් යුතු ප්‍රතිචාර දැක්වීමක් සහතික කිරීම සඳහා ඉතාම වැදගත් අංශය වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි අවස්ථා මෙහෙයුම් අංශයයි. මෙම හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය, අදාල සියලු උපාංග වලින් සමන්විත ප්‍රමාණවත් කාර්ය මන්ඩලයකින් යුතු අංශයක් වන අතර, සතියේ දින හතේම පැය 24 පුරාම ක්‍රියාත්මක වෙමින් සියලු අනතුරු ආශ්‍රිත තොරතුරු සම්බන්ධීකරණය කිරීම සහ ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය වන සම්පත් සම්බන්ධීකරණය වෙනුවෙන් කටයුතු කරනු ලැබේ. තීරණ ගැනීමේ හැකියාව ඇතිවන පරිදි කිසියම් අනතුරක් ආශ්‍රිත තොරතුරු ලබා ගැනීම, ඒවා විශ්ලේෂණය කිරීම සහ ඉදිරිපත් කිරීම/ප්‍රදර්ශනය කිරීම ඒ මගින් සිදු වේ.

සෑම දිනකම පැය 24 පුරාම අනිකුත් සියලුම තාක්ෂණික ආයතන සමග සම්බන්ධ වෙමින් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් තාක්ෂණික තොරතුරු සහ අනතුරු හැඟවීම් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇමතුම් මධ්‍යස්ථානය තොරතුරු ලබා දීම සඳහා විවෘතව පවතින අතර ඒ ඔස්සේ භාෂා ත්‍රිත්වයෙන්ම තොරතුරු ජනතාව වෙත ලබා දීම සිදු වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සමග සම්බන්ධීකරණය වෙමින් දිස්ත්‍රික්ක 25ම තුළ ආපදා අනතුරු හැඟවීම් අවසාන අදියර දක්වා ප්‍රචාරණය කිරීමට **EOC** තුල පූර්ණ අනතුරු හැඟවීමේ පද්ධතියක් ස්ථාපිත කොට ඇත. ස්වකීය සන්නිවේදන පද්ධති සහිතව ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ කණ්ඩායම් **EOC** තුල ස්ථාපිත කොට තිබෙන අතර එමගින් පූර්ව අනතුරු හැඟවීම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා පහසුකම් සපයනු ලැබේ. කිසියම් හදිසි අවස්ථාවකදී ස්වකීය තාක්ෂණික ප්‍රවීණයින් සමග අදාල පාර්ශ්වකරුවන් විසින් **EOC** කාර්යභාරයන් සඳහා සහභාගි වනු ලැබේ. ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලුම අනතුරු හැඟවීමේ මධ්‍යස්ථාන සමග සම්බන්ධ වූ විවිධ අනතුරු හැඟවීමේ විධික්‍රම හතරක් සහිතව දෙපසට දිවෙන(**upstream and downstream**) පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක වේ. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ ආකෘතිය 38 වන රූප සටහන මගින් ක්‍රමානුරූපව විශ්ලේෂණය කොට ඇත.



38 රූපය. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් ආකෘතිය

අවශ්‍ය වන විට සහ අවශ්‍ය වන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණය යටතේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත අදාල පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයන් විසින් අවශ්‍ය සහාය සහ පිරිස්බලය සපයනු ලැබේ. අනතුරුඇඟවීම් සහ අනිකුත් ඉතා වැදගත් ප්‍රධාන තොරතුරු දැනුම් දීම සඳහා විශ්වසනීය සන්නිවේදන පද්ධති සහිතව අදාල රජයේ ආයතන, පළාත් සහ දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත මෙම හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සම්බන්ධ වී පවතී. ඊට අමතරව මෙය අනිකුත් ප්‍රධාන පාර්ශ්වකාර ආයතන සහ මාධ්‍ය වෙත ද සම්බන්ධ වේ. මෙම මධ්‍යස්ථාන සතුව 117 හදිසි ඇමතුම් අංකය පවතින අතර ඕනෑම දේශීය දුරකථනයකින් ඕනෑම පුද්ගලයෙකු හට නොමිලයේ මෙම අංකයට ඇමතුම් ලබා දිය හැකි අතර, වෛද්‍යමය ආධාර ඇතුළුව ආපදා අංශයට ඕනෑම සහායක් සලසා ගැනීම සඳහා පැය 24 පුරාම මෙම අංකය ඇමතිය හැකිය.

3.15.3 දිස්ත්‍රික් මට්ටමේ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක ස්ථාපිත කොට ඇත්තේ අදාල දිස්ත්‍රික්ක තුළ සියළුම හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම්, පූර්ව අනතුරු ඇඟවීම්, ආපදා සඳහා සූදානම්වීමේ කටයුතු සහ අනෙකුත් දිස්ත්‍රික්ක ආශ්‍රිත ක්‍රියාකාරකම් නිසි ආකාරයෙන් පවත්වාගෙන යාමටයි. අදාල දිස්ත්‍රික්ක වල සියළු පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණය විය හැකි දිස්ත්‍රික් පරිපාලන පද්ධතිය සමග මෙම ඒකක සෘජුවම සම්බන්ධ වී ඇත. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ දිගුවක් වශයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය ස්ථාපිත කොට තිබෙන අතර, උප ජාතික මට්ටමේ හදිසි අවස්ථා තත්ත්වයකදී ක්‍රියාවට නැංවිය හැකි පරිදි සූදානමින් පසු වේ. වැදගත් පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධවීමේ තොරතුරු වල සිට ආපදාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වන උපකරණ, පුහුණු නිලධාරි කන්ඩායම් සහ අත්‍යවශ්‍ය සැපයුම් ඇතුළු සියලු සම්පත් වැනි අවශ්‍ය තොරතුරු සියල්ල මෙම දිස්ත්‍රික් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන විසින් පවත්වාගැනීම අවශ්‍ය වේ. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සාමාන්‍යයෙන් ක්‍රියාත්මකව පැවතීම, පූර්ව අනතුරු ඇඟවීමක් නිකුත්වීමේදී ක්‍රියාත්මක වීම, ආපදා අවස්ථාවක් ඇතිවූ විට ක්‍රියාත්මක වීම හෝ ස්වකීය ක්‍රියාකාරිත්වයේ ස්වභාවය අනුව ක්‍රියාත්මක වීම සිදු වේ.

3.16 හදිසි අවස්ථා ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණය යටතේ ප්‍රධාන ආපදාවක් හෝ හදිසි අවස්ථා තත්ත්වයක් හඳුනාගැනීමෙන් අනතුරුව ජාතික මට්ටමේ හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව කැඳවනු ලැබේ. අදාල ආපදා කළමනාකරණ සැලසුම් තුළ විස්තර කෙරෙනු ලබන ආපදා කළමනාකරණ කමිටු, අනු කමිටු, රජයේ දෙපාර්තමේන්තු වල දිස්ත්‍රික් කාර්යාල, ස්වේච්ඡා කණ්ඩායම් යනාදිය ඔස්සේ ජාතික මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ, ප්‍රාදේශීය මට්ටමේ, ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ සහ ප්‍රජා මට්ටමේ ආපදා / හදිසි අවස්ථාර ප්‍රතිචාර කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. සුනාමි අවදානමක් පවතින අවස්ථාවක හදිසි අවස්ථා මෙහෙයුම් සම්බන්ධීකරණ ව්‍යුහය සහ දිස්ත්‍රික් මට්ටම තුළ තොරතුරු ගලා යාම ඇමුණුම 9 මගින් පෙන්වා ඇත. රටෙහි ඕනෑම ප්‍රදේශයක මෙම ඕනෑම මට්ටමක් තුළ හදිසි අවස්ථා ප්‍රතිචාර ක්‍රියාකාරකම්වල දී ප්‍රධානත්වය ගනු ලබන්නේ ත්‍රිවිධ හමුදාව සහ පොලිසියයි.

3.16.1 ආපදාවල වින්දිතයන් හඳුනාගැනීම

බෝම්බ පිපිරීම් හෝ ඒ හා සමාන අවස්ථා ඇතුළු විශේෂ අවධානය යොමු වීම සිදු විය යුතු හදිසි අවස්ථාවලදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ විශේෂයෙන් පුහුණු කරන ලද හට පිරිස්වල සහාය සහිතව යෝග්‍ය ප්‍රතිචාර දැක්වීම් සම්බන්ධීකරණය කරනු ලැබේ. නීතිපති දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පොලිසිය මගින් සාමූහිකව අවශ්‍ය ආපදා වින්දිතයන් හඳුනාගැනීම සිදු කරනු ලැබේ.

3.16.2 මාධ්‍ය ආයතනවල භූමිකාව

හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන ආශ්‍රිත යාන්ත්‍රණය සමග සම්බන්ධීකරණය වීමෙන් හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම තුළ මාධ්‍ය ඉතා බරපතල හා වැදගත් භූමිකාවක් දරනු ලැබේ. දැනුම්වත්භාවයක් ඇති කිරීම, මනා අවබෝධයක් ඇති කිරීම, තහවුරු කරන ලද පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු මුදා හැරීම, නිරවද්‍ය යාවත්කාලීන කිරීම් සිදු කිරීම සහ ආපදා පිළිබඳ මෙන්ම පීඩාවට පත් ප්‍රදේශ පිළිබඳ තොරතුරු ලබා දීම, සහන සැලසීමේ කටයුතුවලට සහාය දැක්වීම යනාදී ක්‍රියාකාරකම්වලට වගකීම්සහගතව මැදිහත් වීම මඟින් ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ මූලික කාර්යය භාරයක් ඉටු කිරීම රජයේ සහ පෞද්ගලික මාධ්‍ය වෙතින් අපේක්ෂා කෙරේ.

ආපදාවක් සිදු වූ අවස්ථාවලදී, සම්බන්ධ වී සිටීමට සහ ආපදා හෝ හදිසි අවස්ථාවන්ට අදාළ වැදගත් මෙන්ම යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමට ජනතාව බොහෝ විට සමාජ මාධ්‍ය අවකාශ භාවිතා කරති. එමෙන්ම, ඵලදායී සන්නිවේදන අරමුණු සඳහා නිර්මාණය කර ඇති සම්බන්ධතා කණ්ඩායම් හරහා පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු බෙදා හැරීමට සහ අවශ්‍ය සහාය සැපයීම සඳහා බිම් මට්ටමේ ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් ද මෙම අවකාශයන් භාවිතා කරනු ලැබේ. හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සහ සහනාධාර සඳහා සහාය වීම සඳහා සමාජ මාධ්‍ය ජාලවලට ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කණ්ඩායම් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කළ හැකිය. නිවැරදි තොරතුරු මහජනතාව වෙත බෙදා හැරීමේ අරමුණින් ආපදා කළමනාකරණ සී මාධ්‍ය ආයතනවලට සුදුසු සහ අවශ්‍ය තහවුරු කළ තොරතුරු සපයයි. හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සහ සහනාධාර සඳහා සහාය වීම සඳහා සමාජ මාධ්‍ය ජාලවලට ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කණ්ඩායම් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කළ හැකිය. නිවැරදි තොරතුරු මහජනතාව වෙත බෙදා හැරීමේ අරමුණින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මාධ්‍ය ආයතනවලට සුදුසු සහ තහවුරු කළ තොරතුරු සපයයි.

3.16.3 ජංගම දුරකථන සේවා සම්පාදකයන්ගේ කාර්යභාරය

හදිසි අවස්ථාවකදී ජීවිත සහ දේපළ ආරක්ෂා කිරීම සඳහා මහජනතාවට පූර්ව අනතුරු ඇඟවීම් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම ඉතා වැදගත් වේ. ඉදිරියේදී ඇතිවිය හැකි ඕනෑම ආපදාවක් පිළිබඳව සාමාන්‍ය ජනතාවට කාලෝචිතව පූර්ව අනතුරු ඇඟවීමක් සිදු කිරීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (**TRC**) සහ ශ්‍රී ලංකාවේ සියලුම ජංගම දුරකථන සේවා සම්පාදකයන්ගේ සහයෝගිතාවෙන් යුතුව දායකත්වයක් නොදැක්විය යුතු කෙටි පණිවුඩ දැනුම්දීම් පද්ධතියක් හඳුන්වා දීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කටයුතු කරමින් සිටී. මේ සම්බන්ධයෙන් වන යාන්ත්‍රණයක් (එනම් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක්) දැනටමත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ ස්ථාපනය කර තිබෙන අතර එමඟින් පූර්ව අනතුරු ඇඟවීම් ජංගම දුරකථන සේවා සම්පාදකයන්ට සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථාවකට පෙර සහ එම අවස්ථාවේදී අනතුරු ඇඟවීම් සිදු කිරීම සහ මහජනතාවට නියමිත වේලාවට තොරතුරු ලබා දීම සියලුම ජංගම දුරකථන සේවා සම්පාදකයන්ගේ වගකීම වේ. වෙරළබඩ දිස්ත්‍රික්ක 14 ක පදිංචිකරුවන්ට සුනාමි තර්ජන පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පණිවිඩ හෝ අනතුරු ඇඟවීම් යොමු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු අතර ඉන් අනතුරුව, සිදුවිය හැකි සියලුම ස්වාභාවික විපත් සඳහා එකම ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අපේක්ෂා කරන අතර බහුවිධ උපදෙස් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස මෙම යාන්ත්‍රණය ක්‍රියාවට නංවනු ඇත.

3.17 සෙවීමේ සහ මුදාගැනීමේ මෙහෙයුම්

සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණ කිරීම සඳහා ඉතා පුළුල් සන්නිවේදන පද්ධතියක් භාවිතා කරමින් සෑම දිනකම පැය 24 පුරාම ක්‍රියාත්මක වන ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරී කණ්ඩායම්වලින් සමන්විත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයෙහි කාර්යයේ නියුතු නිලධාරියා විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාවෙන් සමන්විත වන සෙවීමේ සහ මුදවාගැනීමේ කණ්ඩායම් අවශ්‍ය වන පරිදි දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සිවිල් පරිපාලනයට ආපදා අවස්ථාවලදී සහාය දැක්වීම සඳහා සූදානමින් පසු වේ. ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු වලට අදාලව සූදානම් භාවය සහ කඩිනම්සහන ක්‍රියාකාරකම් සිදුකිරීම සහනික කිරීම සඳහා සූදානම් වීම සහ ආදර්ශ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම තුලදී මෙම කණ්ඩායම්ද දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සමග එක්ව කටයුතු කරනු ලැබේ. ජාතික මට්ටමේ සහ උප ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා සිවිල් හමුදා සහයෝගිතාවය (**CIMIC**) සහ සිවිල් අධිකාරීන් සඳහා හමුදා සහාය (**MACA**) මඟින් සහාය සලසනු ලබන අතර ත්‍රිවිධ හමුදා අණ දෙන නිලධාරීන් සහ පොලිස්පතිතුමා සමග ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලය විසින් එම කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබේ.

ජාතික මට්ටමේදී, අදාළ නියම කරන ලද ආයතන සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, ගිනි නිවන හමුදාව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පරමාණුක බලශක්ති අධිකාරිය යන ප්‍රතිචාර කණ්ඩායම් පුහුණු කිරීම්වලින් සන්නද්ධ කර තිබෙන අතර තෙල් කාන්දුවීම්, අනතුරුදායක ද්‍රව්‍ය අනතුරු සහ රසායනික හා කාර්මික අනතුරු, විකිරණ හදිසි අවස්ථා, මාරාන්තික, විෂ සහ අහිතකර රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැනි අනපේක්ෂිත හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීමට ඔවුන් කටයුතු කරනු ඇත. (ඇමුණුම 8).

3.18 සහන සහ ප්‍රතිසාධනය

වියලි ආහාර, ආහාර වේල් සහ පානීය ජලය සඳහා වන හදිසි අවස්ථා අරමුදල් සැපයීම, ආපදාවන්ගෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන් වෙත සහනාධාර ද්‍රව්‍ය බෙදා හැරීම සහ එම කටයුතු සම්බන්ධීකරණය කිරීම (දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටම් සමග සම්බන්ධීකරණය වෙමින් සහන ද්‍රව්‍ය රැස් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම) වැනි හදිසි සහන සැලසීමේ කාර්යභාරයන්හි වගකීම මූලික වශයෙන්ම පැවරී ඇත්තේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුබද්ධිත ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය වෙතයි. (**NDRSC**) මෙම මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු අදාල රජයේ සහ අනිකුත් නියෝජිත ආයතන සමග ආපදා කළමනාකරන මධ්‍යස්ථානය සම්බන්ධීකරණය වනු ලැබේ.

3.18.1 සහන මධ්‍යස්ථාන කළමනාකරණය

ජලය, සනීපාරක්ෂක සහ ස්වස්ථතා ප්‍රවර්ධන (**WASH**), පහසුකම්, ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය, වාසස්ථාන, නැවත පදිංචි කිරීම, පෝෂණය සහ සෞඛ්‍යය යන අංශ ආවරණය කරමින් හදිසි අවස්ථා සහන සහ තාවකාලික වාසස්ථාන තුළ 'ක්ෂේත්‍ර ප්‍රමිතීන්' වල මගපෙන්වීම යටතේ අවම මානුෂීය ප්‍රමිතීන් පවත්වාගෙන යනු ලැබේ.

ආපදා කළමනාකරන සැලසුම් සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි තුළ හඳුනාගනු ලබන ආකාරයට අවශ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පලාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ඒකක සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් සෞඛ්‍ය අංශයේ ආයතන විසින් අනෙකුත් ආයතනවල සහයෝගිතාවය යටතේ ආහාර හා සනීපාරක්ෂක පහසුකම්, මියගිය පුද්ගලයන්ගේ කටයුතු හැසිරවීම, තුවාලලත් සහ අවතැන් වූ පුද්ගලයන් පිලිබඳ කටයුතු කලමානකරණය කිරීම යනාදී කටයුතු පිළිබඳ කඩිනම් තක්සේරුකිරීම් වල මූලිකත්වය ගනු ලැබේ. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන, හිතවතුන්, සහ ප්‍රදායක ආයතන (දේශීය හෝ ජාත්‍යන්තර) ආදී ආයතන වල කටයුතු ඇතුළුව අවශ්‍ය සම්පත් සහ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසිම සඳහා විවිධ පරිපාලන මට්ටම් සමග සම්බන්ධීකරණය වී කටයුතු කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් සිදු වේ. නිසි අධීක්ෂණ සහ පාලන යාන්ත්‍රණයක් හදුන්වා දීම මගින් සහන බෙදා හැරීමේ කටයුතුවලදී සාධාරණ අයුරින් සහන බෙදා හැරීම, තත්කාර්යය සහ සංවිධානය නොවූ ආකාරයේ සහන බෙදාහැරීමේ සිදුවීම් අවම කිරීම, ආපදාවෙන් පසු පුද්ගලයන් හට සාධාරණ සහාය සැලීමක් සිදු කිරීම, සහන බෙදා හැරීම තුලින් සිදුවන දෝෂන කටයුතු වැලැක්වීම, ඇතැම් ප්‍රදේශ වෙත සහන ප්‍රමාණයට වඩා වැඩියෙන් සැපයීම වැලැක්වීම සහ අනෙකුත් දුෂ්කර ප්‍රදේශ වෙත සහන අඩුවෙන් ලැබීම වැලැක්වීම යන තත්ත්වයන් සහතික කෙරෙන ආකාරයෙන් අධීක්ෂණ සහ පාලන යාන්ත්‍රණයක් හඳන්වා දීම ඔස්සේ සහන බෙදා හැරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත.

තවද, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආපදාවලදී විශේෂයෙන් සහන මධ්‍යස්ථානවලදී සහ දිගු කාලීනව පවතින තාවකාලික රැඳවුම් ස්ථානවල සිදු විය හැකි ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (**SGBV**) පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්, ප්‍රතිචාර දැක්වීමේ කාර්ය මණ්ඩල සහ ප්‍රජාව අතර අවබෝධයක් ඇති කිරීම සඳහා ප්‍රකාශන පළ කිරීම සහ පුහුණුකරුවන් පුහුණු කරන වැඩසටහන්වලදී ඒ පිළිබඳ දැනුම්වත්භාවයක් ඇති කිරීමට ද කටයුතු කර තිබේ.

3.19 පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය

ඕනෑම ආපදාවකින් පසු, කඩිනම් පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය මෙන්ම ජීවනෝපාය සහ සමාජීය අංශ නහා සිටුවීම සඳහා නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. අත්‍යාවශ්‍ය සේවා සපයන ආයතනවල දිස්ත්‍රික්/කොට්ඨාශ මට්ටමේ ඒකක ඇතුළු ජාතික, පළාත්, පළාත් පාලන ආයතන අදාළ ආයතනික ආපදා කළමනාකරණ ක්‍රියාපටිපාටිවල දක්වා ඇති සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටියට අනුව මහජන උපයෝගිතා පුනර්ජීවනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ සහයෝගය ඇතිව, රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා, සමාජ සාධාරණත්වය, මධ්‍යස්ථභාවය, අපක්ෂපාතීත්වය, සාරධර්ම සහ විපතට පත් පුද්ගලයින්ගේ සංස්කෘතියට අනුගත වෙමින් ජීවනෝපායන් ස්ථාපනය කිරීමට හැකි වන පරිදි උපරිම සහාය ලබා දෙනු ලැබේ.

ආපදාවල පරිමානය මත පදනම් ව අදාල නියෝජිත ආයතන වල සහාය සලසා ගැනීමෙන් පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරනය සඳහා වන කඩිනම්, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන සැලසුම් සකස් කරමින් ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනිකුත් ආයතන සමග සම්බන්ධීකරණයෙන් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලී සඳහා සහාය සැලසීමට

අවශ්‍ය තක්සේරු කිරීම් සහ අධ්‍යයනයන් සිදු කරනු ඇත. ජාතික ආපදා කළමනාකරන ප්‍රතිපත්ති තුළ දක්වා ඇති පරිදි හානියට ලක්වූ නිවාස වල තත්ත්වයට වඩා ඉහළ ප්‍රමිතියෙන් යුතු ආකාරයට යටිතල පහසුකම් සහ නිවාස ගොඩනැගීම සඳහා කටයුතු කරන ප්‍රධාන ආයතන ඇමුණුම 9 මගින් හඳුනාගනු ලැබේ. වඩා විශාල බරපතල පීඩා වලදී පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට ප්‍රථම අදාල නියෝජිත ආයතන අතර සම්බන්ධීකරණය, ඉඩම් භාවිතාව සැලසුම් කිරීම සහ අවදානම් තක්සේරු කිරීම අවශ්‍ය වේ.

ආපදා අවදානම් සහිත ප්‍රදේශ සහ අවදානමට ලක්විය හැකි ජනගහනය නිසි ලෙස හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම මත පදනම්ව යම් ප්‍රදේශයක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙන සහන හා පුනරුත්ථාපන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට හැකි වනු ඇත. ඒ අනුව ගත් කල රක්ෂණය අතිශයින් වැදගත් වන්නේ ආන්තික ආපදා සිදුවීම්වලින් අනතුරුව සුදුසු පරිදි මූල්‍ය සහාය පිරිනැමීමට හැකි වන බැවිනි.

4 ආපදා අවදානම් කළමනාකරණය සඳහා ශක්‍යතා වර්ධනය

ශක්‍යතා සංවර්ධනය යනු ආපදා අවදානම අවම කිරීමේ කේන්ද්‍රීය උපාය මාර්ගයක් වන අතර අවදානම් සාර්ථකව කළමනාකරණය කිරීමට පුද්ගලයින්, සංවිධාන සහ සමාජයන්හි හැකියාව ගොඩනැගීම සහ පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

ශක්‍යතා වර්ධනය යනු ආපදා අවදානම් අවම කිරීම සඳහා මූලික වන ක්‍රමෝපායකි. තමන් විසින් මුහුණ දෙනු ලබන අවදානම් තත්ත්වයන් තමන් විසින්ම සාර්ථකව කළමනාකරණය කර දීම සඳහා පුද්ගලයන්, සංවිධාන සහ සමාජයන් සතු හැකියාව ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සඳහා ශක්‍යතා වර්ධනය අවශ්‍ය වේ. මේ සඳහා අවශ්‍ය වන්නේ පුහුණුව සහ විශේෂඥ තාක්ෂණික සහාය පමණක් නොව ස්වකීය ප්‍රදේශයන් තුල පවත්නා අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම සහ අවම කර ගැනීම සඳහා ප්‍රජාවන් සහ පුද්ගලයන් සතුව පවත්නා ශක්‍යතාවයන් සවිමත් කිරීමද මේ යටතේ අවශ්‍ය වේ. මේ සඳහා තාක්ෂණය හුවමාරු කරගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම, ජාල සකස් කර ගැනීම, කළමනාකරණ කුසලතා, ව්‍යෑත්තියමය සබඳතා සහ අනෙකුත් සම්පත් අවශ්‍ය වේ. ශක්‍යතා වර්ධන සහ ශක්‍යතා පවත්වා ගැනීම සඳහා සහාය සලසන ආයතන ඔස්සේ ස්වකීය අඛණ්ඩ සහ ස්ථීර අභිමතාර්ථ වශයෙන් ශක්‍යතා වර්ධනය තිරසරව පවත්වා ගෙන යා යුතු වේ. ශ්‍රී ලංකාව තුළ මෑත කාලීන වර්ෂ වලදී ආපදා අවදානම් කළමනාකරණය කිරීමේ කටයුතු හසුරුවා ගැනීමට අවශ්‍ය ශක්‍යතාවන් වැඩිදියුණු කිරීම තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත් වී තිබෙන අතර අනෙකුත් ජාත්‍යන්තර සංවර්ධන ප්‍රයත්නයන් ආශ්‍රිතව ජයග්‍රහණ ප්‍රමාද වී ඇත.

ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රමුඛතාවය 2 සඳහා වන සෙන්ඩායි රාමුව (ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා ආපදා අවදානම් අවම කිරීමේ පාලනය ශක්තිමත් කිරීම) සහ ප්‍රමුඛතාවය 3 (ප්‍රත්‍යාස්ථතාව සඳහා ආපදා අවදානම් අවම කිරීමට ආයෝජනය කිරීම) ශක්‍යතා සංවර්ධනයට අදාළ වන අතර එය සියලු ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම්වල පොදු තේමාවකි. ආපදා අවදානම් අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, පැනවීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය නිපුණතා ජාතික මට්ටමින් ප්‍රාදේශීය මට්ටමින් සෑම තරාතිරමකම වැඩිදියුණු කළ යුතු අතර මනා ප්‍රතිචාර දැක්වීම සඳහා පාලන පද්ධති ශක්තිමත් කළ යුතුය.

ආපදා කළමනාකරණය පිලිබඳ ශක්‍යතා වර්ධනය තනි ක්ෂේත්‍රයක් සඳහා පමණක් සීමා වී පැවතිය නොහැකි අතර එමගින් ආපදා අවදානම් කළමනාකරණයේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන සියලු අදාල අංශ, සංවිධාන සහ ආයතන ආවරණය කිරීම අවශ්‍ය වේ. මෙම අංශයන් අතර රජය තුළ මෙන්ම රජයෙන් පරිබාහිර සමාජ, ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපනික, යටිතල පහසුකම් පිලිබඳ, නිෂ්පාදනය පිළිබඳ, පාරිසරික, සංස්කෘතික සහ නියාමන අංශ ඇතුලත් වේ. පහතින් දක්වා ඇති ආපදා අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුවේ[53] ප්‍රවේශයන් මත පදනම්ව (වගුව 6) සකස් කරන ලද ජාතික ආපදා කළමනාකරන සැලැස්ම සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සහාය වන ඒකාබද්ධ ශක්‍යතා වර්ධන ක්‍රමෝපායක් වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023– 2030 තුලින් කටයුතු කරනු ලැබේ..

වගුව 6. ශක්‍යතා වර්ධනය සඳහා ආපදා අවම කිරීම සඳහා වූ සෙන්ඩායි ප්‍රවේශය

පාර්ශ්වකාර නියුක්ත වීම	වැඩසටහන සඳහා සම්පත් සැපයීම සහ දැනුවත්භාවය ඇති කිරීම සිදු වන ආකාරයේ සබඳතාවයන් සහ සංවාද ආරම්භ කිරීම සහ හවුල්කාරිත්වයන් සඳහා පදනම නිර්මාණය කිරීම
ශක්‍යතා අවශ්‍යතා ඇගයුම	ශක්‍යතා හිඩැස් (අඩුපාඩු)වල හේතුව සහ බලපෑම හඳුනාගැනීම, මැදිහත්වීම් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන පසුබිම නිර්මාණය කිරීම, ආරම්භක අධීක්ෂණ දර්ශක සැපයීම
මැදිහත්වීම අර්ථ නිරූපනය කිරීම	ආයතනික ශක්‍යතාවය, නායකත්වය, දැනුම සහ වගවීම පිලිබඳව ශක්‍යතා වර්ධන මැදිහත්වීම් නිර්මාණය කිරීම

[53] ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්ඩායි රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා සංවර්ධන උපායමාර්ගික ප්‍රවේශය

හවුල්කාරිත්වයන් ගොඩනැංවීම	විශ්වසනීයභාවය, ප්‍රවේශය, මානව සහ මූල්‍ය සම්පත්, ප්‍රවීණත්වය ආදිය සපයනු ලබන හවුල්කාරිත්වයන් ඔස්සේ ශක්‍යතා වර්ධනය
ක්‍රියාවට නැංවීම	නම්‍යශීලී අවශ්‍යතා-පාදක සහ ඉල්ලීම් ඔස්සේ ක්‍රියාත්මක වන මැදිහත් වීමේ වැඩසටහන්
අධීක්ෂණය සහ ඇගයීම	ශක්‍යතා අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන වෙනස්කම් ඇති කිරීම කෙරෙහි ඉලක්ක මගින් දායකත්වය සැලසෙන බව සහතික කිරීම අරමුණු කරගනිමින් අපේක්ෂිත ඉලක්ක වල ප්‍රගතිය මැන බැලීම

4.1 තොරතුරු හුවමාරුව ශක්තිමත් කිරීම

DesInventor සහ **RiskInfo** යෙදුම්වල සාර්ථකත්වය මත පදනම්ව, ආපදා කළමනාකරණය ආශ්‍රිත තොරතුරු කළමනාකරණය කිරීමේ කටයුතු වඩා ව්‍යාප්ත කිරීම සඳහා අවස්ථාව පවතී. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** ක්‍රියාකාරී සැලැස්ම සඳහා වටිනාකම් එකතු කරමින් වඩා සාරගර්භ තොරතුරු හුවමාරු කිරීමක් සඳහා ඉඩකඩ සලසමින් විශ්ව විද්‍යාල ඇතුළුව සංවර්ධන ක්ෂේත්‍රයන්, කාලගුණ සුහුරු ප්‍රවේශයන්, සමාජ ආරක්ෂණය, තොරතුරු තාක්ෂණය, පර්යේෂණ සහ සංවර්ධනය යනාදී අංශයන් තුළ නියුක්තව සිටින පුළුල් පරාසයකට අයිති ආයතන ආවරණය කරමින් දත්ත හුවමාරු කිරීම සහ ගුණාත්මක භාවය සහතික කිරීම පිලිබඳ ජාලය වඩා පුළුල් කිරීමේ ප්‍රයත්න ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** මගින් ප්‍රවර්ධනය කරනු ලැබේ.

ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක දේශගුණික ප්‍රත්‍යාස්ථතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතියේ **(CRESMPA)** පළමු අදියර යටතේ රට තුළ ගංවතුර සහ නායයෑම් ආපදා කෙරෙහි අවධානය යොමු කරන බලපෑම් පදනම් කරගත් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපනය කිරීමට යෝජනා කර ඇත. ව්‍යාපෘතියේ **I** අදියරේ ප්‍රධාන අරමුණ වන්නේ අවදානම් මත පදනම් වූ තීරණ ගැනීම වැඩිදියුණු කිරීම සඳහා රටකට නිශ්චිත දත්ත හුවමාරු පද්ධතියක් ස්ථාපනය කිරීමයි. තවද, ආපදා අවදානම් අවම කිරීමේ අරමුණින් සියලුම පාර්ශවකරුවන්ට උපදෙස්, නිරාවරණ සහ අවදානම් දත්ත භාවිතා කිරීමට හැකි වන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථයේ දත්ත විද්‍යාගාරයක් පිහිටුවීමට ද යෝජනා කර ඇත.

4.1.1 දත්ත සම්පාදකයන් සමඟ වන හවුල්කාරිත්වයන්

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය **(ICTA)**, ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් **(NSDI)** සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය **(UDA)** යන ආයතන සමඟ සම්බන්ධීකරණයක් ගොඩ නගා ගනිමින් අවදානමට අදාළ සංඛ්‍යාත්මක සහ අනෙකුත් දත්ත ආපදා අවදානම් අවම කිරීම සඳහා ඒකාබද්ධ කිරීමට ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023– 2030 මෙම ක්‍රියාමාර්ගය තුළින් අරමුණු කරයි. ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් අවකාශය සමාජ, ආර්ථික සහ පාරිසරික ප්‍රතිලාභ සඳහා පුළුල් පරාසයක අවකාශීය දත්ත බෙදාහදා ගැනීම, භාවිත කිරීම සහ ඒකාබද්ධ කිරීම රජයේ ප්‍රධාන මූලපිරීමක් ලෙස පිළිගෙන ඇති අතර එහිදී සියලුම පාර්ශ්වකරුවන්ට සහ මහජනතාවට අදාළ දත්ත වෙත ප්‍රවේශ විය හැකිය. මෙම අවකාශය දත්ත අනුපිටපත් කිරීම වළක්වා ගනිමින් දත්ත හුවමාරු කර ගැනීම, ආයතන අතර කාර්යක්ෂමතාව සහ සහයෝගීතාව පුළුල් කර ඇත. ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් අවකාශය සංවර්ධනය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු රාජ්‍ය ආයතන 26ක් අවකාශීය දත්ත ස්ථර 65කට වැඩි ප්‍රමාණයක් සමඟින් දායක වී ඇත.

4.1.2 ජාත්‍යන්තර ආයතන සමඟ හවුල්කාරිත්වයන්

ශ්‍රී ලංකාව පර්යේෂණ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සහ ආපදා අවදානම් අවම කිරීම මෙන්ම ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයන විෂය පථය පුළුල් කිරීම සඳහා නේවාසික සහ අනේවාසික එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ අඛණ්ඩව සහයෝගයෙන් සහ හවුල්කාරිත්වයෙන් යුතුව ක්‍රියා කරයි. එක්සත් ජාතීන්ගේ දත්ත සහ තොරතුරු හුවමාරු පද්ධතිවලට අමතරව,

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 හි හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා අගය එකතු කළ හැකි යාවත්කාලීන සහ උසස් දත්ත හා තොරතුරු පද්ධති පවත්වා ගෙන යනු ලබන විශ්ව විද්‍යාල, ජාත්‍යන්තර කෘෂිකාර්මික කේන්ද්‍ර සම්මේලනය (**CGIAR**), ජාත්‍යන්තර නියෝජිතායතන, බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ආයතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ද පවතී. 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ හඳුනාගෙන ඇති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා විශේෂයෙන් ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණික ප්‍රවේශයන් සැලසුම් කිරීමේදී එක්සත් ජාතීන්ගේ සහ අනෙකුත් පරිත්‍යාගශීලී ආයතනවල පවත්නා තොරතුරු පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමට යෝජනා කෙරේ..

4.2 ආපදා කළමනාකරණ පුහුණු

සාධනීය ආපදා අවදානම් කළමනාකරනයක් සිදු කිරීම සඳහා පාර්ශ්වකරුවන් සතු ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යභාරයක් වන්නේ පුහුණු කිරීම් සිදු කිරීමයි. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම තුළ ආකාර පහක පුහුණු කිරීම් ඉදිරිපත් කොට ඇත. (1) දැනුවත්භාවය/සංවේදීභාවය ඇති කිරීමේ වැඩසටහන් ; (2) ක්‍රෘත්‍යාත්මක ශක්‍යතාවයන් සංවර්ධනය කිරීම; (3) තාක්ෂණික ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම ; (4) දැනුවත්භාවය හා අධ්‍යාපනය සහ (5) ජාත්‍යන්තර සෙවුම් සහ මුදාගැනීමේ කණ්ඩායම (**INSARG**), හදිසි ප්‍රතිචාර වැඩිදියුණු කිරීමේ වැඩසටහන (**PEER**) සහ දේශීය සෙවීම් හා මුදාගැනීම මෙන්ම ජීවිතාරක්ෂක වැනි විශේෂිත වැඩසටහන් යනුවෙනි.

විශේෂිත පුහුණු වැඩසටහන් සඳහා පහසුකම් සැලසීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ගම්පොල ආපදා ප්‍රතිචාර පුහුණු මධ්‍යස්ථානය (ශ්‍රී ලංකා යුද හමුදාව), ඇඹිලිපිටියේ ශ්‍රී ලංකා හමුදා ඉංජිනේරු පාසල (ශ්‍රී ලංකා යුද හමුදාව), ගංගාවෑදිය ආපදා කළමනාකරණ පුහුණු පාසල (ශ්‍රී ලංකා නාවික හමුදාව), මුලතිව්හි ආපදා කළමනාකරණ පුහුණු පාසල (ශ්‍රී ලංකා ගුවන් හමුදාව), කටුකුරුන්දේ ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය (විශේෂ කාර්ය සාධක බලකාය), සහ වැල්ලවත්තේ ගිනි නිවන හමුදා පුහුණු මධ්‍යස්ථානය වැනි විවිධ පුහුණු මධ්‍යස්ථාන සමඟ හවුල් වී ක්‍රියා කරයි.

4.2.1 පුහුණුකරුවන් පුහුණු කිරීම

දැනුවත් භාවය ඇති කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ආශ්‍රිත පුහුණු ආවරණය කිරීම සඳහාත් ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සහ උපායමාර්ගික මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වාගෙන යාම සඳහාත් අදාල වන මූලික අවශ්‍යතාවයක් වශයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පුහුණුකරුවන් සමූහයක් ස්ථාපිත කර ගැනීම හඳුනාගනු ලැබේ. පශ්චාත් සුනාමි කාලසීමාව තුළ පත් කරන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ පළමු කණ්ඩායම තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් නව පුහුණුකරුවන් පුහුණු කිරීමේ කණ්ඩායමක් නිර්මාණය කර ගැනීම සහ එම පුහුණු ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන ව්‍යාපෘතියක් වෙනුවෙන් කටයුතු කරනු ලැබේ. පුහුණුකරුවන් පුහුණු කිරීමේ ප්‍රබල සංචිතයක් නිර්මාණය කරගැනීම උදෙසා හවුල්කරුවන් වශයෙන් වෘත්තියමය ආයතන සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන සහ දේශීය විශ්වවිද්‍යාල වල සහාය අපේක්ෂා කරනු ලැබේ.

4.2.2 පුහුණු පහසුකම්

රාජ්‍ය සේවාවේ පුහුණු අවස්ථා සැලසීම වෙනුවෙන් පවතින නවීනතම පුහුණු ආයතනය වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් ආරම්භ වෙමින් (**SLIDA**) විවිධ ආකාරයේ පුහුණු සහ ශක්‍යතා වර්ධන මැදිහත්වීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු මධ්‍යස්ථානය රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන සතුව පවතී. සංවර්ධන පරිපාලන ආයතනය සහ අනිකුත් විශ්ව විද්‍යාල විසින් ආපදා කළමනාකරණය ආශ්‍රිත උසස් මට්ටමේ පුහුණු සැලසීමත් ස්වකීය වැඩසටහන් වල කොටසක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ. තවද ප්‍රජා මට්ටමේ ශක්‍යතා වර්ධනය උදෙසා එකී ජාතික මට්ටමේ පුහුණු පැවැත්වීම සඳහා අවශ්‍ය වන පහසුකම් දේශීය සහයෝගිතා ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ද සපයා ඇත.

4.3 දැනුවත්භාවය සහ අධ්‍යාපනය

ආපදා කළමනාකරණ චක්‍රයේ සියලු පැතිකඩ තුලදී දැනුවත්භාවය සහ අධ්‍යාපනය යන කාරණා ප්‍රධාන භූමිකාවක් මවනු ලබන අතර ආපදා අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුවෙහි අංග, හදිසි අවස්ථා සඳහා සූදානමින් පසුවීම, සොබාදහම මත පදනම් වූ විසඳුම් වාර්තා කිරීම සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා කාලගුණය සහ පරිසර පද්ධති සම්බන්ධතා ආශ්‍රිත නව දැනුම භාවිතා කිරීම යනාදිය එමගින් ප්‍රවර්ධනය කරනු ලැබේ. විධිමත් යාවත්කාලීන කිරීම් සහ වැඩි දියුණු කිරීම් සහිතව උප ජාතික මට්ටමේ විවිධ රජයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කරනු ලැබේ. රජය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ ආයතන විසින් රට පුරා ක්‍රියාත්මක කරනු ලබන දැනුවත්භාවය ඇති කිරීමේ සහ අධ්‍යාපනය සැලසීමේ ප්‍රයත්නයන්ගේ ගුණාත්මක භාවය සහතික කිරීමේ ක්‍රියාවලියක් වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 තුළ කටයුතු කරනු ලැබේ.

4.3.1 පාසල් අධ්‍යාපනය

අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අඛණ්ඩව දැනුවත්භාවය ඇති කිරීමේ සහ අධ්‍යාපන අවස්ථා සැලසීමේ ක්‍රියාකාරකම් දිගටම ක්‍රියාත්මක කරනු ලබන අතර ප්‍රධාන ප්‍රමුඛතාවයක් හා අවශ්‍යතාවයක් වශයෙන් සලකමින්, ආපදා ආශ්‍රිත විෂයයන් පිළිබඳව නව දැනුම් ලබා දීම සඳහා විශේෂිත වැඩසටහන් ආරම්භ කරනු ලැබේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 අතරතුර ආපදා අවදානම් අවම කිරීම වෙනුවෙන් දැනුවත්භාවය සහ අධ්‍යාපනය ලබාදීමේදී පාසල් මට්ටමින් පවත්නා ශක්‍යතාවයන් වැඩි දියුණු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සහාය සලසමින් පෞද්ගලික අංශයේ ආයතන ද ඇතුළුව පාසල් මට්ටමින් අධ්‍යාපන සහ දැනුවත්භාවය ඇති කිරීමේ කටයුතුවල නියුක්ත වී සිටින ජාතික අධ්‍යාපන ආයතනය (**NIE**), ජාතික විද්‍යා පදනම (**NSF**) සහ අනෙකුත් ජාත්‍යන්තර සහ දේශීය ආයතන වැනි නියෝජිත ආයතන ගණනාවක් සමග සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක වීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සැලසුම් කරනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සියලුම පාසල්වල ආපදා කළමනාකරණ සමාජ පිහිටුවීමට මෙන්ම ශිෂ්‍යභට, ශිෂ්‍ය නියමු සහ බාලදක්ෂ විෂය මාලාවට ආපදා කළමනාකරණය විෂය ඇතුළත් කිරීමට මූලිකත්වය ගෙන ඇත. තවද, අනාගත සියලුම ගුරුවරුන් ආපදා අවදානම් කළමනාකරණ විෂය පිළිබඳව අධ්‍යාපනය ලබා දීම සහතික කිරීම සඳහා ගුරු අභ්‍යාස විද්‍යාලවල විෂය මාලාවට ආපදා අවදානම් අවම කිරීම ඇතුළත් කර ඇත.

4.3.2 විශ්වවිද්‍යාල අධ්‍යාපනය

රට තුල පවත්නා පිලිගත් විශ්වවිද්‍යාල 14කට වඩා වැඩි සංඛ්‍යාවක් අතරින් කොළඹ විශ්ව විද්‍යාලය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය ආදිය ඇතුළු විශ්ව විද්‍යාල කිහිපයක පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වේ. අනිකුත් විශ්වවිද්‍යාල වල කෘෂිකර්මය, සමාජ විද්‍යා සහ අනිකුත් විෂයයන් තුළ ආපදා කළමනාකරනය ආශ්‍රිත විෂයපථයන් ඇතුලත් කොට ඇත. විශ්වවිද්‍යාල මට්ටමේ වැඩසටහන් වල ගුණාත්මකභාවය සහතික කිරීම සහ ඒවා සඳහා සහාය සැලසීම, ඒවා මෙහෙයවීමේ අවශ්‍යතාවය මෙන්ම මෙම වැඩසටහන් වල ප්‍රමිතින් වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය සහ පෞද්ගලික අංශය සමග සහයෝගිතාවයන් ගොඩනැගීමේ අවශ්‍යතාවය සහ නව නාක්ෂණයන් සහ යහ පරිචයන් විෂය නිර්ණය තුලට ඇතුලත් කිරීමේ වැදගත්කම ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් හඳුනාගනු ලැබේ. මෙම වැඩසටහන් ආරම්භක උපාධි මට්ටමෙන් ඇරඹී සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා ව්‍යාප්ත විය හැකි අතර ඒ සඳහා වටිනාකම් එකතු කිරීමක් වශයෙන් ශිෂ්‍ය හුවමාරු සහ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්ද පැවතිය හැකිය.

4.3.3 තෘතියික අධ්‍යාපනය

වසර ගණනාවක් පුරා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ගුරු පුහුණු වැඩසටහන් සඳහා සහාය දක්වන අතර, අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා, තෘතීයික අධ්‍යාපන ආයතනවල වැඩසටහන් අන්තර්ගතය සහ පුහුණු ධාරිතාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම මඟින් ආපදා කළමනාකරණයට අදාල සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි, ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සහ අනෙකුත් තාක්ෂණික අංගයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන පුහුණු අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට ද හැකි වනු ඇත. ඒ අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන, කාර්මික විද්‍යාල සහ කුසලතා වර්ධනයට සම්බන්ධ අනෙකුත්

පුහුණු ආයතනවල අභ්‍යන්තර පුහුණුවීම් සඳහා දේශගුණික සුහුරු ප්‍රවේශයන් සහ ආපදා අවදානම් අවම කිරීමේ ගාමක බලවේග සමෝධානික කිරීමට ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මඟින් යෝජනා කෙරේ.

4.4 ප්‍රජාව පාදක කරගත් ආපදා අවදානම් කළමනාකරණය

ප්‍රජා පාදක ආපදා අවදානම් කළමනාකරණය (**CBDRM**) සහ ප්‍රජා පාදක අනුවර්තනය ආපදා අවදානම් කළමනාකරණය සහ දේශගුණ ප්‍රත්‍යාස්ථ ආයෝජන ව්‍යාපෘතිවල ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගත යුතුය. තවද, එවැනි ව්‍යාපෘති සාර්ථක වීමට නම්, ප්‍රජාවන් රජය සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සංවාදයක නිරත වීම අත්‍යවශ්‍ය වන අතර ආපදා අවදානම් සහ දේශගුණික විපර්යාසවලට ගොදුරු වීමේ මූලික හේතු හඳුනා ගැනීමටත් ප්‍රමුඛතාව අනුව හඳුනාගත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා අවශ්‍ය සම්පත් බෙදා හැරීමටත් එමඟින් හැකි වේ.

එබැවින්, පහත සඳහන් සංරචක හතර (4) ප්‍රජා පාදක ආපදා අවදානම් අවම කිරීමේ මූලපිරීම්වල ජාතික උපාය මාර්ග ලෙස පිළිගෙන ඇත.

- අවදානම් අවම කිරීමේ ක්‍රම අනුගමනය කිරීමෙන් අසාර්ථක වීමේ සම්භාවිතාව ද අවම කිරීම
- අඩු වූ මරණ, තුවාල සහ සෘජු හා වක්‍ර හානි සංඛ්‍යාව අනුව අසාර්ථක වීමේ ප්‍රතිවිපාක අවම කිරීම
- යථා තත්ත්වයට පත් වීමට අවශ්‍ය කාලය අවම කිරීම
- ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී නිර්මාණය විය හැකි අවදානම් ආකාර හඳුනා ගැනීම

ප්‍රජා පාදක ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් ලෙස ප්‍රජා කණ්ඩායම් තුළ ආපදා අවදානම් කළමනාකරණ කමිටු පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම අත්‍යවශ්‍ය වන අතර ග්‍රාම නිලධාරී මට්ටමේ සේවය කරන නිලධාරීන්ගේ නායකත්වය යටතේ එම කටයුතු සිදු කෙරෙනු ඇත. ආපදා කළමනාකරණ විෂය පිළිබඳ වගකීම්වලින් සවිබල ගැන්වුණු ඔවුන්ට අවශ්‍ය තරම් සම්පත් සහ ප්‍රමාණවත් දැනුම ලබා දෙනු ඇත.

4.5 පර්යේෂණ සහ සංවර්ධනය

විවිධ අවකාශීය පරිමාණයන් තුළ සැලසුම් කරනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග, උවදුරු සහ අවදානම් පාත්‍රතාවයන් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රම, විවිධ ආපදා අවස්ථාවලදී යටිතල පහසුකම් සහ ගොඩනැගිලි ආදිය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම, කාලගුණික විපර්යාස සහ කාලගුණික පද්ධති ආශ්‍රිත අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග (අනුගත වීමේ විකල්ප ආදිය ඇතුළුව) වලදී ආපදා අවදානම් අවම කිරීමේ විකල්ප වඩා පිරිවැය සඵලදායී, කාර්යක්ෂම, නවමු සහ නවෝත්පාදන තත්ත්වයට පත් කිරීම සඳහා විද්‍යාව, ඉංජිනේරුවේදය, සමාජීය විද්‍යාව, මූල්‍ය, නෛතික සහ තොරතුරු තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන් තුල සිදුකරනු ලබන පර්යේෂණ සමුදායක් අවශ්‍ය වේ. විද්‍යාඥයන්, ඉංජිනේරුවන් , මූල්‍යවේදීන්, ප්‍රතිපත්ති සැලසුම් කරන්නන් ඇතුළු විවිධ වර්ගයේ පාර්ශ්වකරුවන් සහ විවිධ අංශ සඳහා අදාල වන ඒකාබද්ධ ප්‍රවේශයන් වෙනුවෙන් ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්ඩායි රාමුව මඟින් කටයුතු කරනු ලැබේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මඟින්, විශ්වවිද්‍යාල ඇතුළු ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගිතාවයෙන් ප්‍රධාන පාර්ශ්වකාර ආයතන සහ පෞද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ජාතික පර්යේෂණ න්‍යාය පත්‍රයක් සකස් කිරීමට යෝජනා කරනු ලැබේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 විෂයපථය තුල පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉතා ක්‍රියාකාරී භූමිකාවක් දරනු ලබන අතර ආපදා කළමනාකරණ පනතේ 8 වන වගන්තිය යටතේ නිර්දේශ කොට ඇති පරිදි පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා තුඩු දෙන පර්යේෂණ සිදුකිරීම ඇතුළුව ජාත්‍යන්තර නියෝජිත ආයතන සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීම ඒ ඔස්සේ ප්‍රවර්ධනය කරනු ලැබේ. වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු හඳුනාගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික විද්‍යා පදනම, විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ අනිකුත් දේශීය සහ ගෝලීය සමාජ ආර්ථික සහ විද්‍යාත්මක ආයතන සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කරනු ලැබේ. හවුල් මූල්‍යකරණය සහිත පරිසර පද්ධති සංරක්ෂණය සහ ආපදා අවදානම් අවම කිරීම අතර ඉහළ යන සම්බන්ධතාවය සැලකීමේදී ආපදා අවදානම් අවම කිරීම ආශ්‍රිත පරිසර පද්ධති ආර්ථිකයන්ගේ නව පර්යේෂණ අවස්ථා පවතිනු ඇත. තවදුරටත් නාගරික, වෙරළබඩ සහ ගංගා ද්‍රෝණි මට්ටමේ ආපදා අවදානම් කළමනාකරණ දියත් කිරීම් කාලගුණික

මූල්‍යකරණය, ආයතනික තිරසරභාවය සහ සොබාදහම මත පදනම් වූ විසඳුම් සමග සමීපව සම්බන්ධ වී පවතින අතර විවිධ දෑ පිළිබඳ වන අන්තර්ජාලය (**IOT**), කෘතිම බුද්ධිය (**AI**) සහ පුරවැසි විද්‍යාව යනාදිය භාවිතය සමගින් ආපදා අවදානම් අවම කිරීම ආශ්‍රිත පර්යේෂණ සඳහා බහුවිධ අවස්ථාවන් විවෘත කරනු ලැබීම ඒ ඔස්සේ සිදුවේ.

5 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030 වැඩසටහන

සමාජ ආර්ථික අභියෝගයන් සහ ඉහළ යන කාලගුණික අවදානම් ඔස්සේ රටෙහි ආපදා කළමනාකරණ පසුතලය අර්ථනිරූපණය කරනු ලැබේ. ඉතා වේගයෙන් ඉහළ යමින් පවතින ආපදා අවදානම් මෙන්ම අනපේක්ෂිත මහා පරිමාණ සහ සෙමෙන් ඇති වෙමින් පවතින ආපදාවන්ද අවම කිරීම සඳහා ප්‍රතිපත්තිමය, නෛතික සහ මූල්‍යමය පැතිකඩ ඔස්සේ රටක් සතුව පවතින ශක්‍යතාවය වැඩිදියුණු කිරීම මෙහිදී අවශ්‍ය වේ. යාවත්කාලීන කරන ලද තාක්ෂණයන් සහ කාලගුණ සහුරු පිලිවෙත් ඇතුළුව වඩා සවිමත් ආයතනික ශක්‍යතා සහිතව බහු ආංශික සහ බහු පාර්ශ්වකාර ක්‍රියාකාරී සහභාගිත්වයක් ඔස්සේ වැඩිදියුණු කළ සාක්ෂි-පාදක සහ අවදානම ප්‍රධාන ප්‍රවාහගත වූ සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** මගින් විධිවිධාන සලසනු ලැබේ. ආපදා සහ කාලගුණ අවදානම් අවම කිරීම සඳහා සහාය සලසන පරිසර පද්ධති සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන අතරම අවදානම් පිළිබඳ දැනුවත්භාවයකින් යුතු සංවර්ධනයක් ඇති කිරීම කෙරෙහි යොමු වූ තිරසර ආයෝජන සඳහා පහසුකම් සැළසීමට ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම **2023-2030** මගින් අපේක්ෂා කරනු ලැබේ. කාලගුණය, ජලය, දූෂණය සෞඛ්‍යය, ආදිය දක්වා විහිදෙන ආපදා ආශ්‍රිත විවිධ විචල්‍යයන් අධීක්ෂණය කිරීම සඳහා වන අධීක්ෂණ මෙවලම් වල සාධනීයභාවය කළමනාකරණය කිරීම සහ මෙම අංශයට අදාල ඒකාබද්ධ තොරතුරු කළමනාකරණයක් මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය විය හැකිය.

ජාතික සහ උපජාතික මට්ටම් තුල ආපදා අවදානම් අවම කිරීමේදී සාකල්‍ය ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා සියලු අංශයන්ගේ සැලසුම්කරණ සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු තුළ යුක්තිසහගත, අන්තර්කරණයෙන් යුතු, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් ප්‍රතිචාර දක්වන සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රවේශයන් ප්‍රධාන ප්‍රවාහගත කිරීම ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් ප්‍රවර්ධනය කරනු ලැබේ.

ජාතික සහ උපජාතික මට්ටම් තුල ආපදා අවදානම් අවම කිරීමේදී සාකල්‍ය ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා සියලු අංශයන්ගේ සැලසුම්කරණ සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු තුළ යුක්තිසහගත, අන්තර්කරණයෙන් යුතු, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් ප්‍රතිචාර දක්වන සහ ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රවේශයන් ප්‍රධාන ප්‍රවාහගත කිරීම ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 මගින් ප්‍රවර්ධනය කරනු ලැබේ. කාලගුණික විපර්යාස ආශ්‍රිත උෂ්ණත්වය ඉහළ යාම, මුහුදු මට්ටම ඉහළ යාම සහ ලෝහ, කෘෂි රසායන අවශේෂ සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් යනාදිය හේතු කොටගෙන ඇති වන දූෂණය සහ කාලගුණික විපර්යාස ආශ්‍රිත උෂ්ණත්වය ඉහළ යාම හේතු කොට ගෙන ඇති වන නව සහ අලුතින් පැනනගින ආපදා තත්ත්වයන් පිලිබඳව විශේෂ අවධානය යොමු කරමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා ආංශික සංවර්ධන ක්‍රියාවලීන් තුළ පරිසර හිතකාමී ලෙස ආපදා අවදානම් අවම කිරීම සහ පරිසරය පාදක කරගත් අනුගත වීම ප්‍රධාන ප්‍රවාහගත කිරීම වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 තුලින් කටයුතු කරනු ලැබේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ක්‍රියාත්මක කිරීම තුල ආයතන විශාල සංඛ්‍යාවක් නියුක්ත වී කටයුතු කරනු ලැබේ. රාජ්‍ය, පෞද්ගලික අංශ සහ රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම සංකීර්ණ ක්‍රියාවලියක් වනු ඇත. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ක්‍රියාවට නැංවීම සඳහා සහ කළමනාකරණ සාධනීයභාවය ගවේෂණය කිරීම සඳහා අදාල වන පරිදි දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය වන පද්ධති සහ යාන්ත්‍රණ වැඩිදියුණු කිරීමට බාහිර සහයෝගය අවශ්‍ය විය හැකිය.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 තුල වැඩසටහනේ අවසාන ඉලක්කය අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන වැඩසටහන් ප්‍රතිඵල / ක්‍රමෝපායන් 4ක් අඩංගු වූ අතර එක් එක් ප්‍රතිඵලය විවිධ නිමැවුම් වලින් සමන්විත විය.

2023 - 2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම යටතේ විවිධ ආයතන විසින් විවිධ අවස්ථා වලදී සකස් කරන ලද සියලුම සැලසුම් සමමුහුර්ත කර ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය කාලානුරූපව නිරීක්ෂණය කළ හැකි පද්ධතියකට පරිවර්තනය කළ යුතු බවට අපේක්ෂා කෙරේ. එහිදී ආපදා අවදානම් කළමනාකරණය, අවදානම් අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානමින් සිටීම සහ වඩා හොඳින් නැවත ගොඩනැගීම සඳහා වන ක්‍රියාකාරකම් පිළිබඳව ද අවධානය යොමු කෙරේ.

2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ ලැයිස්තුගත කර ඇති වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වලට වත්මන් තත්ත්වය සහ අවබෝධය මත පදනම් වූ අවශ්‍යතා ඇතුළත් වේ. මෙම සැලැස්ම හුදු තනි ලියවිල්ලක් ලෙස නොව "සජීවී ක්‍රියාකාරී සැලැස්මක්" ලෙස සලකනු ලබන අතර, එය දේශගුණික විපර්යාස ආශ්‍රිත අභියෝග හේතුවෙන් පැන නගින අවශ්‍යතා සහ අවදානම් මත පදනම්ව අවශ්‍ය පරිදි වැඩිදියුණු කර වෙනස් කළ හැකිය. එවැනි ප්‍රවේශයක් සියලුම වගකිවයුතු පාර්ශ්වකරුවන්ගේ සාමූහික සහභාගීත්වය දිරිමත් කරනු ඇති අතර අදාළ ආයතනවලට වෙන් වූ ක්‍රියාකාරකම් විශේෂිත ආයතනික ක්‍රියාකාරී සැලසුම්වලට ඇතුළත් කිරීමට හැකි වනු ඇත.

5.1 මෙහෙයුම් ක්‍රමෝපායයන්

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 සැකසුම් කොට ඇත්තේ **ප්‍රධාන මෙහෙයුම් ක්‍රමෝපායයන් හෝ ප්‍රතිඵල ක්ෂේත්‍ර 4කින්** සමන්විත වන පරිදි හා ඒ එක් එක් ක්‍රමෝපාය යටතේ සුවිශේෂී නිමැවුම් ඇතුලත් වන පරිදිය.

1. අවදානම් පිළිබඳ දැනුවත්භාවයෙන් යුතු, තාක්ෂණික වශයෙන් වැඩි දියුණු වූ සහ සාක්ෂි පාදක දැනුම සහ අවබෝධය ඔස්සේ ජාතික ආපදා අවදානම් කළමනාකරණ පද්ධති, ශක්‍යතාවයන් සහ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම

අවදානම් පිළිබඳව අවබෝධය වැඩි දියුණු කරගැනීම සඳහා හැකිවන අයුරින් නවීන තොරතුරු එක්රැස් කිරීම, තොරතුරු සැකසීම සහ හැසිරවීම සිදු කරන අතර අවදානම් කෙරෙහි සංවේදී වූ සැලසුම්කරණයට ඉඩකඩ සැලසෙන අයුරින් ශක්‍යතා වර්ධනය සඳහා හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම මෙම පළමු ක්‍රමෝපාය ඔස්සේ සිදු වේ.

1.1. සියලු මට්ටම් තුළ විද්‍යාත්මක සහ සාක්ෂි-පාදක අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම් සහ පද්ධති ශක්තිමත් කිරීම
1.2. දේශගුණික ක්‍රියාකාරකම් සහ ආපදා අවදානම අවම කිරීම සඳහා ප්‍රමිතිකරණය සහ ප්‍රතිපත්ති උපදේශනය
1.3. දැනුම කළමනාකරණය සඳහා **HEVR** විශ්ලේෂණය සමඟ ඵලදායී සහ නිතිපතා යාවත්කාලීන කරන ලද අවකාශීය සහය දක්වන දත්ත සමුදායන් ලබා ගැනීම
1.4. අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සහ පාසල් අතර අධික උණුසුම සහ වායු දූෂණයට ප්‍රමුඛත්වය දෙමින් අවදානම් දැනුවත් කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම
1.5. ජාතික භෞතික සැලසුම් සහ ප්‍රතිපත්තිවලට ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ඇතුළත් කිරීම
1.6. ජාතික සහ උප ජාතික මට්ටමින් ප්‍රධාන තීරණ ගන්නන්, අත්‍යවශ්‍ය සේවා සපයන්නන් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්/ කණ්ඩායම් සඳහා ප්‍රමුඛත්වය දෙමින් ආපදා අවදානම් දැනුවත් කිරීම සඳහා වැඩිදියුණු කළ සන්නිවේදන සහ ව්‍යාප්ත කිරීමේ උපාය මාර්ග/ක්‍රියාපටිපාටි තිබීම.
1.7. දේශගුණික මූල්‍යකරණයේ සහ හරිත නවෝත්පාදනයේ ප්‍රතිලාභ ලබා දීම තුළින් ආපදා අවදානම් අවම කිරීමේ ආයෝජන ළඟා කර ගැනීමේ රාජ්‍ය, පෞද්ගලික සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම
1.8. ධාරිතාව ගොඩනැගීම, තාක්ෂණික වැඩිදියුණු කිරීම, ආපදා අවදානම් පාලනය සහ අවදානම් මූල්‍යකරණය සඳහා හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම
1.9. ආපදා ආශ්‍රිත සංඛ්‍යාලේඛන රාමුව මුඛ්‍යධාරාගත කිරීම සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගීත්වයෙන් ශක්‍යතාවන් වැඩිදියුණු කිරීම

2. ප්‍රමාණවත් නීතිමය බලතල, ආපදා අවදානම් අවම කිරීම, ඒකාබද්ධ කරගත් සංවර්ධන ක්‍රියාමාර්ග සහ ප්‍රජාවන්ගේ අර්ථාන්විත සහභාගිත්වය ඔස්සේ සියලු මට්ටම් තුළ ආපදා අවදානම් කටයුතු වල පාලනය වැඩිදියුණු කිරීම.

මෙම දෙවන ක්‍රමෝපාය ඔස්සේ අරමුණු කරනු ලබන්නේ අවදානම් අවම කිරීමේ ප්‍රයත්නයන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නෛතික සාධක, ප්‍රතිපත්තිමය සාධක සහ ඉඩකඩ සලසන වටපිටාව වැඩිදියුණු කර ගැනීම වන අතර, ඒ ඔස්සේ අවදානම් අවම කිරීමේ ආයෝජන සැලසුම් සහ නවීන අධීක්ෂණ මඟින් සහාය සැලෙසන අන්තර්කරණයෙන් යුතු ප්‍රවේශයන් සහ හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරනු ලැබේ..

2.1. සෑම තලයකම ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන නීතිමය සහ නියාමන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

2.2. ආපදා අවදානම් පාලනය සඳහා සෑම තලයකම බහු පාර්ශ්වකරුවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන, වයස් සංවේදී සහ ඇතුළත් ප්‍රවේශයක් ආයතනගත කිරීම

2.3. සෑම තලයකම හා සෑම අංශයකම ආපදා අවදානම අවම කිරීම සහ දේශගුණික ක්‍රියාකාරකම් මුඛ්‍යධාරාගත කිරීම

2.4. ආපදා අවදානම සහ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා වන ප්‍රයත්න සම්බන්ධ කිරීමට සහ මහ පෙන්වීම් ලබා දීම සඳහා සියලුම අංශ සහ ප්‍රජාවන් ජාතික සහ ප්‍රාදේශීය යාන්ත්‍රණයන්හි නියැලී සිටිති.

3. අවදානම් මූල්‍යකරණය, අවදානම් රක්ෂණය යනාදිය සඳහා වන නෛතික සහ නියාමන රාමු සහ මෙවලම් සඳහා පහසුකම් සැලසීමත් එමෙන්ම, බලපෑම් සඳහා ප්‍රතිචාර දක්වන සමාජ ආරක්ෂණ වැඩසටහන් ඔස්සේත් ප්‍රත්‍යාස්ථිතිය උදෙසා රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන ඉහළ නැංවීම

ආයතනයන්ගේ සහ අවදානම් පාත්‍රතාවයේ සිටින ප්‍රජාවන්ගේ ශක්‍යතාවයන් වැඩි දියුණු කරන අතරම අනෙකුත් කාරණා අතර ආපදා අවදානම් අවම කිරීම, කාලගුණ අනුගතවීම් සහ හරිත යටිතල පහසුකම් සඳහා අරමුදල් සපයනු ලබන මූල්‍යකරණ සහ අවදානම් හුවමාරු යාන්ත්‍රණ කෙරෙහි මෙම 3වන ක්‍රමෝපාය මගින් අවධානය යොමු කරනු ලැබේ.

3.1. අවදානම් වළක්වා ගැනීමේ ආයෝජන, සමාජ ආරක්ෂණ පද්ධති සහ යාවත්කාලීන අවදානම් තොරතුරු හරහා ඔරොත්තු දීමේ හැකියාව සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම

3.2. ඵලදායී සහ අන්තර්ග්‍රාහී සමාජ ආරක්ෂණ ජාල ප්‍රවර්ධනය කිරීම සහ සහාය දීම සඳහා ආයෝජනය කරන්න

3.3. දේශගුණික විපර්යාස සහ අනාගතයේදී උද්ගත විය හැකි ආපදා අවදානම් හේතුවෙන් ඇති වන බලපෑම්වලට මුහුණ දීම සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සහ පද්ධති සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම

3.4. අවදානම් දැනුවත් කිරීම සහ දේශගුණයට ඔරොත්තු දෙන ආයෝජන සිදු කිරීම සඳහා ප්‍රජාවන් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය/ව්‍යාපාර සම්බන්ධ කර සවිබල ගැන්වීම

4. කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීම් නිවේදනය කිරීම, ප්‍රජා ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම සහ ජාතික හා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම ඔස්සේ ආපදා සහ කාලගුණික විපර්යාසවලින් බලපෑමට ලක් වූ සියලු අංශයන් සහ ප්‍රජාවන් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ආපදාවලින් පසුව තිරසර අයුරින් නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වීම ඇති වන පරිදි සාධනීය සූදානම් වීමක් සහතික කිරීම

නිසි කලට පූර්ව අනතුරු හැඟවීම් සිදු කිරීම, නිසි පරිදි ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම යනාදිය සඳහා සහාය සැලසීමටත් එසේම දේශීය සහ ගෝලීය හවුල්කාරිත්වයන් ඇතුළුව වඩා හොඳින් නැවත ගොඩනැගීමේ ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීමටත් අදාල වන පද්ධති ස්ථාපිත කිරීමට මෙම 4 වන ක්‍රමෝපාය මගින් අරමුණු කරනු ලැබේ.

4.1. ප්‍රජා මූලික ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් හරහා ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම

4.2. විද්‍යාත්මක සහ සාක්ෂි පදනම් කරගත් ගෝලීය, කලාපීය, ජාතික සහ බහු උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වෙත ප්‍රවේශ වීම තුළින් ආපදා සූදානම වැඩි දියුණු කිරීම

4.3. සම්බන්ධීකරණ යාන්ත්‍රණ සහ යටිතල පහසුකම් ඇතුළුව වැඩි දියුණු කළ සූදානම සහ ප්‍රතිචාර උපාය මාර්ග

4.4. අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා සහය වන වැඩිදියුණු කළ සහ ඒකාබද්ධ පූර්ව අනතුරු ඇඟවීමේ බෙදා හැරීමේ යාන්ත්‍රණය

4.5. හදිසි සූදානම, ප්‍රතිචාරය, සෙවීම සහ මුදාගැනීම, ප්‍රකෘතිමත් වීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා ගෝලීය සහ කලාපීය සහයෝගීතාව සහ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම

4.6. ආපදා අවදානම් අවම කිරීමේ න්‍යාය පත්‍රවල "නැවත ගොඩනගා ගැනීම" උත්තේජනය කිරීම සඳහා සුසංයෝගී ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම

4.7. දේශගුණික විපර්යාස බලපෑම් සහ වාර්තා වන රෝග මැඩලීම සඳහා ආපදා සහ හදිසි අවස්ථා වලදී සෞඛ්‍ය සේවා සැපයීම ශක්තිමත් කිරීම

4.8. "ව්‍යාපාර සඳහා පාරිසරික සහ සමාජීය **(E&S)** කාර්ය සාධන දර්ශක" සංකල්පය ප්‍රවර්ධනය කිරීම

4.9. ආපදා කළමනාකරණ විෂය අමාත්‍යාංශයේ විශේෂිත ප්‍රධාන අංශ/ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම

සවිස්තරාත්මක උපායමාර්ග සහ අපේක්ෂිත ප්‍රතිඵල මූලික වශයෙන් 2023 - 2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ විස්තීර්ණ ක්‍රියාකාරී සැලැස්මේ පූර්විකාවක් වන අතර ඉන් ප්‍රමුඛතාව, අරමුණු හෝ කුළුණු, ප්‍රධාන මෙහෙයුම් උපායමාර්ගය,

දෙවැනි මට්ටමේ මෙහෙයුම් උපායමාර්ග, ක්‍රියාමාර්ග, දර්ශක, අදාළ කාල රාමු, මූලික වශයෙන් ප්‍රධාන වගකිවයුතු ආයතන සහ නියෝජිතායතන මෙන්ම අදාළ තිරසර සංවර්ධන ඉලක්ක ද නිශ්චිතව දක්වා තිබේ. බොහෝ අවස්ථාවලදී සමගාමීව ක්‍රියාත්මක වන කාල රාමු වර්ග හතර පහත පරිදි වේ:

1. අඛණ්ඩ (පුනරාවර්තන/ නිරන්තර)
2. කෙටි කාලීන (**T**1, 2024 නිමාව)
3. මැදි කාලීන (**T**2, 2026 නිමාව)
4. දිගු කාලීන (**T**3, 2030 නිමාව)

ගෝලීය රාමුව සනිටුහන් කරමින්, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023-2030 ප්‍රතික්‍රියාශීලී ආපදා ප්‍රතිචාර ප්‍රවේශයක සිට ප්‍රතිචාරය හා සහන ඉලක්ක කරගත් වෙනස් ප්‍රගතිශීලී ප්‍රවේශයක් මත රඳා පවතින සුසමාදර්ශීය වෙනසක් ඉස්මතු කරන අතර එය ආපදා අවදානම් අවම කිරීම, වැඩිදියුණු කළ සූදානම, අර්ථවත් ලෙස ආයෝජනය කිරීම හරහා ප්‍රත්‍යස්ථ හැකියාව ශක්තිමත් කිරීම, උපද්‍රව පිළිබඳ නිසි අවබෝධය තුළින් ආපදා අවදානම අවම කිරීම, සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් නව අවදානම් නිර්මාණය වීම අවම කිරීම, ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍යධාරාගත කිරීම සහ සමස්ත පාලනය වැඩිදියුණු කිරීම මත පදනම් වේ.

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2023 - 2030

ප්‍රමුඛතාව 1	**ආපදා අවදානම හඳුනා ගැනීම**
අරමුණ	**ආපදා පිළිබඳ දැනුම්වත් සැලසුම්කරණය සහ පද්ධතිය**
කුළුණ 1	
මෙහෙයුම් ක්‍රමෝපාය 1: සියලු ආකාරයේ උපද්‍රව, ආපදා තත්ත්වයන් සහ අවදානම් තත්ත්වයන් පිලිබඳ දැනුවත්භාවයකින් යුතු තාක්ෂනික වශයෙන් වැඩි දියුණු වූ සහ සාක්ෂි පාදක දැනුම් සහ අවබෝධය ඔස්සේ ජාතික ආපදා අවදානම් කළමනාකරණ පද්ධති, ශක්‍යතාවයන් සහ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.	

දෙවැනි මෙහෙයුම් උපායමාර්ග	**ක්‍රියාකාරකම්**	**දර්ශක**	**කාල රාමුව**				**ක්‍රියාත්මක කිරීමේ වගකීම (සංවිධානය/සංවිධාන)**		**තිරසර සංවර්ධන ඉලක්ක**
			අවුරුදු 1-2	**අවුරුදු 3-5**	**අවුරුදු 6-8**	**අවුරුදු 9-10**	**වගකීම**	**හවුල්කරුවන්**	
1.1 සියලු මට්ටම් තුළ විද්‍යාත්මක සහ සාක්ෂි-පාදක අවදානම් පිළිබඳ දැනුවත් සැලසුම් සහ පද්ධති ශක්තිමත් කිරීම	**1.1.1** පර්යේෂණ, නවීන තාක්ෂණය භාවිතා කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාවය හා හවුල්කාරිත්වය හරහා සාක්ෂි පදනම් කරගත් සහ තත්‍ය කාලීන විශේෂිත නිරීක්ෂණ සහ නිරීක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම	• තීරණ ගැනීම සඳහා දළ වශයෙන් 80%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ආපදා සහ දේශගුණික අවදානම් අවස්ථා පිළිබඳ ප්‍රක්ෂේපණයන් භාවිතා කිරීම.	✓				කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, **ID, NBRO, GSMB, NARA MAoSL, DoA, MFARD,** අධ්‍යාපනික ආයතන/ පර්යේෂණායතන (ජාතික / ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශය/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර කාලගුණ අධීක්ෂණ නියෝජිතායතන	SDG-11 SDG-13
	1.1.2 නව ආපදා තත්ත්වයන් සහ කාලගුණික සිදුවීම් නිරීක්ෂණය කිරීම වැඩිදියුණු කිරීම	• ප්‍රධාන ව්‍යාපෘති සහ නියැලීම්වලදී සහයෝගීත්ව තීරණ ගැනීමේ නිරතව සිටින රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ	✓						

	1.1.3 පවත්නා සහ අවශ්‍ය ධාරිතාවන් ඇගයීම සහ අධීක්ෂණය කිරීම සහ ප්‍රජාව/සමාජය තුළ සහ ආයතනික මට්ටමින් පරිසරය සක්‍රීය කිරීම, ආපදා අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.	පෞද්ගලික අංශයේ ආයතන සංඛ්‍යාව.	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	අදාල තාක්ෂණික නියෝජිතායතන, විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන	SDG - 1 SDG - 2 SDG -5 SDG -11
	1.1.4 පවතින මෙහෙයුම් ජල-කාලගුණ පද්ධති යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම		✓				**ID, DoM, NBRO, DoA, MAoSL,** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	අදාල විෂයයභාර අමාත්‍යාංශය/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය	SDG-11 SDG-13
	1.1.5 බලපෑම් මත පදනම් වූ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම				✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අදාල තාක්ෂණික නියෝජිතායතන		
1.2 දේශගුණික ක්‍රියාකාරකම් සහ ආපදා අවදානම අවම කිරීම සඳහා ප්‍රමිතිකරණය සහ ප්‍රතිපත්ති උපදේශනය	**1.2.1** ආපදා අවදානම් (පවත්නා සහ ඉස්මතු වන) සහ දේශගුණික විපර්යාස අභියෝග සම්බන්ධ කරමින් ප්‍රතිපත්ති උපදේශනය ඉලක්ක කර ගනිමින් සහ සක්‍රීය පරිසරයක් නිර්මාණය කරමින් චින්තන නායකත්ව වැඩසටහනක් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන්න	• සාක්ෂි උත්පාදනය මෙහෙයවීම සඳහා විෂයයට අදාල විශේෂඥයින් සහ වෘත්තිකයන් සමඟ පිහිටුවා ඇති ක්‍රියාකාරී අවකාශයක් තිබීම • වැඩි දියුණු කළ ප්‍රවේශ්‍යතාව සහ අවම වශයෙන් 75% හෝ ඊට වැඩි ඵලදායී භාවිතයක් සහිත පොදු වසම තුළ භූ යොමු, විශේෂිත සහ වෙන් කළ දත්ත			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	අදාල තාක්ෂණික නියෝජිතායතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, අධ්‍යාපනික ආයතන/පර්යේෂණායතන (ජාතික / ජාත්‍යන්තර), ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	SDG - 1 SDG - 2 SDG - 4 SDG-11 SDG-13

		සමුදායන් සඳහා ඇති සූදානම							
1.3 දැනුම කළමනාකරණය සඳහා **HEVR** විශ්ලේෂණය සමඟ ඵලදායී සහ නිතිපතා යාවත්කාලීන කරන ලද අවකාශීය සහය දක්වන දත්ත සමුදායන් ලබා ගැනීම	**1.3.1** මිනිසාට සහ පරිසරයට සිදුවන දූෂණයේ බලපෑම (වායු, ජලය, පස ආදිය) වැනි මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදා ඇතුළු ආපදා සිදුවීම් සම්බන්ධ විශ්ලේෂණ සහ යාවත්කාලීන දත්ත සමඟ නව මෙන්ම පවතින දැනුම් කළමනාකරණ දත්ත සමුදාය (යන්) නිර්මාණය කිරීම	• **HEVR** විශ්ලේෂණය සමඟ යාවත්කාලීන වූ අවකාශීය දත්ත සමුදායන් සහ අවම වශයෙන් **75%** කින් හෝ ප්‍රයෝජනවත් පරිශීලකයින්ට ප්‍රවේශය සඳහා කාලෝචිත තොරතුරු ලබා ගැනීම	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අදාල තාක්ෂණික නියෝජිතායතන (ජාතික / ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, **MoE,** ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	SDG - 1 SDG - 2 SDG – 4 SDG - 5 SDG-11 SDG-13
	1.3.2 විවිධ උපද්‍රව සහ බහු උපද්‍රව තත්ත්වයන් පිළිබඳ අවදානම් පිළිබඳ දැනුවත් තීරණ ගැනීම සඳහා ජාතික සිට ප්‍රාදේශීය මට්ටමින් ලබා ගත හැකි උපද්‍රව විශේෂිත සහ කලාප සිතියම් සකස් කිරීම	• තිරසාර සංවර්ධනය සඳහා කේන්ද්‍රස්ථාන ආයතන/ ආයතනවලින් අවම වශයෙන් 75%ක් භාවිතා කිරීම සඳහා ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටමින් බහු උපද්‍රව/උපද්‍රව විශේෂිත අවදානම් තක්සේරු කිරීම් සහ කලාප සිතියම් තිබීම.		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අදාල තාක්ෂණික නියෝජිතායතන (ජාතික / ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, **SD, DB, SLLDC, UDA, USDA, NERD, NHDA, PCs, LAs, INGOs, NGOs**	SDG - 1 SDG - 2 SDG - 4 SDG - 5 SDG - 9 SDG-11 SDG-13
	1.3.3 ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන අවම කිරීම් සහ තිරසාර සංවර්ධන ක්‍රියාමාර්ග දැනුම් දීම සඳහා බහු උපද්‍රව සහ උපද්‍රව විශේෂිත අවදානම් තක්සේරු කිරීම් (උපද්‍රව, නිරාවරණය, අවදානම් සහ ධාරිතාව), සිතියම්ගත කිරීම සහ කලාපකරණය ජාතික සිට ප්‍රාදේශීය මට්ටම් දක්වා පැවැත්වීම.				✓				
	1.3.4 මහජන ප්‍රයෝජනය සහ භාවිතය සඳහා භූ යොමු සහිත උපද්‍රව විශේෂිත සඳහා තක්සේරු කිරීම සඳහා දත්ත සමුදායන් සැකසීම	• ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ දැනුවත්භාවය සහ සාක්ෂරතාව වැඩි දියුණු		✓					

		කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පවතින ආපදා අවදානම් කළමනාකරණ තොරතුරු පද්ධති 75% හෝ ඊට වැඩි ප්‍රමාණයකින් භූ විද්‍යාත්මක තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම.							
	1.3.5 ආපදා අවදානම් පිළිබඳ දැනුවත්භාවය, සාක්ෂරතාව සහ කළමනාකරණ හැකියාව ගොඩනැගීම සඳහා දත්ත ප්‍රමිතිකරණය සඳහා පොදු දත්ත වේදිකාවක් සහ අන්තර් නියෝජිතායතන යාන්ත්‍රණයක් සමඟ ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් භූගෝලීය තොරතුරු පද්ධතිය පදනම් කරගත් ආපදා අවදානම් තොරතුරු කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම.			✓					
	1.3.6 කාලගුණික විපර්යාසවලට අනුවර්තනය වීම සහ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් හරහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුමේ හිඩැස් ආමන්ත්‍රණය කිරීම	• දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම සහ අවම කිරීම ඇතුළුව ක්‍රියාත්මක කරන ලද ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන්වල ප්‍රතිශතය වත්මන් මට්ටමේ සිට 75% ක් හෝ ඊට වැඩි අගයක් දක්වා වැඩි කිරීම			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,, **CCS,** ජාතික විද්‍යා පදනම, මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශය	අදාල තාක්ෂණික නියෝජිතායතන, අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, අධ්‍යාපනික ආයතන/පර්යේෂණායතන (ජාතික / ජාත්‍යන්තර), ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	SDG - 1 SDG - 2 SDG - 3 SDG - 4 SDG - 5 SDG - 9 SDG-11 SDG-13

1.4 අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සහ පාසල් අතර අධික උණුසුම සහ වායු දූෂණයට ප්‍රමුඛත්වය දෙමින් අවදානම් දැනුවත් කිරීමේ පද්ධති ස්ථාපිත කිරීම	**1.4.1** අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට විශේෂයෙන් ළමයින්ට බලපාන අධික තාපය හා වායු දූෂණයේ බලපෑම් අවම කිරීම සඳහා සාක්ෂි පදනම් කරගත් අවදානම් දැනුවත් පද්ධති සහ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම සහ ස්ථාපිත කිරීම	• අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර සහ පාසල්වල ස්ථාපිත කර ඇති අධික තාපය සහ වායු දූෂණය පිළිබඳ නව අවදානම් දැනුම්වත් පද්ධති සංඛ්‍යාව		✓			**NBRO, CCS, MoE,** මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG - 1** **SDG - 3** **SDG - 4** **SDG - 5** **SDG-11** **SDG-13**
1.5 ජාතික භෞතික සැලසුම් සහ ප්‍රතිපත්තිවලට ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ඇතුළත් කිරීම	**1.5.1** බහු උපද්‍රව සහ උපද්‍රව විශේෂිත අවදානම් සංවේදී ඉඩම් පරිහරණ සැලසුම්, කලාප සැලසුම් සංවර්ධනය, ජාතික භෞතික සැලසුම් ආදිය සකස් කර ක්‍රියාත්මක කිරීම.	• මුළු ඉඩම් පරිහරණ සැලසුම්/ සංවර්ධන කලාප සැලසුම් සහ ජාතික භෞතික සැලසුම් වලින් අවම වශයෙන් 50%ක් අවදානම් විශේෂිත සහ අවදානම් සංවේදී බවට පත් කළ යුතුය.				✓	**SD, SLLDC, UDA, USDA, DB, MoLands, NERD**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, පළාත් සභා, පළාත්පාලන ආයතන	**SDG - 1** **SDG -9** **SDG-11** **SDG-13** **SDG-14** **SDG - 15**
1.6 ජාතික සහ උප ජාතික මට්ටමින් ප්‍රධාන තීරණ ගන්නන්, අත්‍යවශ්‍ය සේවා සපයන්නන් සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්/ කණ්ඩායම් සඳහා ප්‍රමුඛත්වය දෙමින් ආපදා අවදානම් දැනුවත් කිරීම සඳහා වැඩිදියුණු කළ සන්නිවේදන සහ ව්‍යාප්ත කිරීමේ උපාය	**1.6.1** කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රමුඛත්වය දෙමින් ජාතික මට්ටමින් ප්‍රාදේශීය මට්ටමින් ආපදා අවදානම් දැනුවත් කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම (ජංගම යෙදුම්, වෙබ් අඩවි, **SMS,** ගුවන්විදුලිය, රූපවාහිනිය වැනි තාක්ෂණයන් යෙදීම ඇතුළුව) සන්නිවේදන සහ බෙදා හැරීමේ උපාය මාර්ග සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම. **1.6.2** ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් සහ ළමා කේන්ද්‍රීය ආපදා විශේෂඥ කණ්ඩායම් පිහිටුවීම	• කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇති සන්නිවේදන සහ බෙදා හැරීමේ උපාය මාර්ග සහ ක්‍රියා පටිපාටි ගණන		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **MWCASE, MoE, MoH, MoMM, DoGI**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, විදුලි සංදේශ සේවා සම්පාදකයින්, පුද්ගලික මාධ්‍ය ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -1** **SDG -3** **SDG- 4** **SDG -5** **SDG-11** **SDG-13**

මාර්ග/ක්‍රියාපටිපාටි තිබීම.	**1.6.3** ළමයින්, තරුණයින්, කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින් සහ ප්‍රධාන සේවා සපයන්නන් (සෞඛ්‍ය ශ්‍රම බලකාය, ගුරුවරුන් ආදිය) මෙන්ම තීරණ සම්පාදකයින් සඳහා ඉලක්කගත අධ්‍යාපනික වැඩසටහන් හරහා ජාතික සහ උප ජාතික මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම, දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ දැනුම, අවබෝධය, ධාරිතාව සහ කුසලතා ගොඩනැගීම.	• ළමයින්, තරුණයින්, කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින් සහ ප්‍රධාන සේවා සපයන්නන් සඳහා ආපදා අවදානම් අවම කිරීම, දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව, ධාරිතා ගොඩනැගීම සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		✓					
	1.6.4 හදුනාගත් සියලුම කණ්ඩායම්/පාර්ශ්වකරුවන් සඳහා ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පුළුල් කිරීම සඳහා අවශ්‍ය මානව සහ සැපයුම් සම්පත් සහිත දැනට පවතින පුහුණු මධ්‍යස්ථානවල ධාරිතාව ශක්තිමත් කිරීම.	• ආපදා අවදානම් අවම කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලද පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව, පොලිසිය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, රජයේ පුහුණු ආයතන	**SDG -1** **SDG -3** **SDG -4** **SDG -5** **SDG-11** **SDG-13**
1.7 දේශගුණික මූල්‍යකරණයේ සහ හරිත නවෝත්පාදනයේ ප්‍රතිලාභ ලබා දීම තුළින් ආපදා	**1.7.1** ප්‍රමිතිකරණය, පාරිසරික සහ සමාජ කාර්ය සාධන දර්ශක ආයතනික ඉලක්ක/උපාය මාර්ගවලට ඇතුළත් කිරීම හරහා ආපදා අවදානම් අවම කිරීමට පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම	• ආපදා අවදානම් අවම කිරීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය සහ නවෝත්පාදනයන් හඳුනාගැනීම සඳහා ජාතික සම්මාන පද්ධතියක් තිබීම		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, **CCS, CCC**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පුද්ගලික අංශයේ අදාල ආයතන	**SDG -1** **SDG - 2** **SDG -3** **SDG -5** **SDG-9**

අවදානම් අවම කිරීමේ ආයෝජන ළඟා කර ගැනීමේ රාජ්‍ය, පෞද්ගලික සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම	**1.7.2** හරිත මූල්‍යකරණය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මැදිහත්වීම පහසු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම	• කාලගුණික මූල්‍යකරණයේ සහ හරිත නවෝත්පාදනයේ ප්‍රතිලාභ ආපදා අවදානම අවම කිරීම සඳහා භාවිත කිරීමට ඇති යාන්ත්‍රණයක සුදානම				✓	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, **CCC**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පුද්ගලික අංශයේ අදාල ආයතන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-11** **SDG-13**
	1.7.3 ආපදා අවදානම් කළමනාකරණය සහ දේශගුණික විපර්යාස අවම කිරීම / අනුවර්තනය කිරීමේ සංකල්ප ප්‍රාථමික, ද්විතියික, තෘතීයික සහ වෘත්තීය මට්ටමේ අධ්‍යාපනික ආයතන, කාර්මික විද්‍යාල සහ විශ්ව විද්‍යාල වෙත මුඛ්‍යධාරාගත කෙරේ.	• ආපදා අවදානම් අවම කිරීම සහ ආපදා අවදානම් කළමනාකරණයේ විවිධ අංශ ආවරණය කරමින් පාසලේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වා හඳුන්වා දී ඇති පාඨමාලා/ විෂයයන් සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අධ්‍යාපන අමාත්‍යාංශය, **CCC**, අධ්‍යාපනික/ පර්යේෂණ ආයතන (ජාතික/ ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන	**SDG -1** **SDG -3** **SDG-4** **SDG -5** **SDG-11** **SDG-13**
1.8 ධාරිතාව ගොඩනැගීම, නාක්ෂණික වැඩිදියුණු කිරීම, ආපදා අවදානම් පාලනය සහ අවදානම් මූල්‍යකරණය සඳහා භවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම	**1.8.1** ආපදා අවදානම් සහ නව ආපදා අවදානම් පිළිබඳ තොරතුරු ඵලදායී ලෙස සමාජගත කිරීම සඳහා විවිධ මාධ්‍ය අවකාශ (උදා: මුද්‍රිත, සමාජ, ඉලෙක්ට්‍රොනික, ශ්‍රව්‍ය ආදිය) භාවිත කිරීම	• ආපදා/ ඉස්මතු වෙමින් පවතින ආපදා අවදානම් පිළිබඳ තොරතුරු බෙදා හැරීම සඳහා අවම වශයෙන් 50%ක්වත් ජනමාධ්‍ය සහ නව මාධ්‍ය අවකාශ භාවිත කෙරේ.	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, **MoMM**, **DoGI**, අදාල තාක්ෂණික නියෝජිතායතන, අධ්‍යාපනික/ පර්යේෂණ ආයතන (ජාතික/ ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන,, පුද්ගලික මාධ්‍ය ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	

	1.8.2 ජාතික සිට ප්‍රාදේශීය මට්ටම දක්වා ආපදා අවදානම් තොරතුරු ඵලදායී ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික, ප්‍රජාව පාදක කරගත් සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලන අධිකාරීන් මෙන්ම මාධ්‍ය සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න.	• අවදානම් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා රාජ්‍ය, පෞද්ගලික, ප්‍රජා පාදක සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලන පක්ෂ සහ මාධ්‍ය සමඟ සකස් කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, **NPPD**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, **SMoHA, PCs, LAs, CBOs,** ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -1** **SDG -3** **SDG-4** **SDG -5** **SDG-9** **SDG-11** **SDG-13**
	1.8.3 ආපදා අවදානම් කළමනාකරණය සහ තීරණ ගැනීම සඳහා ප්‍රජා පාදක කණ්ඩායම් (උදා: ප්‍රාදේශීය සංවර්ධන සංවිධාන, කාන්තා කණ්ඩායම්, යෞවන සමාජ, ළමා සමාජ) අතර හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික්/ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගීතාව සහතික කිරීම.	• ආපදා අවදානම් කළමනාකරණය සඳහා ප්‍රජා පාදක කණ්ඩායම් අතර හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීමට දිස්ත්‍රික්/ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන එළැඹ ඇති සහයෝගිතා සහ හවුල්කාරිත්ව සංඛ්‍යාව		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **DS, DivS, MWCASE,** පරිසර අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, **SMoHA, PCs, LAs, CBOs,** ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	
	1.8.4 ආපදා අවදානම් තොරතුරු හුවමාරු කර ගැනීමේදී ද්විපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම	• ආපදා අවදානම් තොරතුරු හුවමාරු කර ගැනීමේදී එළැඹී ද්විපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතා සංඛ්‍යාව				✓	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, විදේශ කටයුතු අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, **NPPD**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1** **SDG-3** **SDG-5** **SDG-9** **SDG-10** **SDG-11** **SDG-17**
	1.8.5 ඉස්මතු වෙමින් පවතින ආපදා අවදානම් (උදා: තෙල් කාන්දුවීම්) සහ හදිසි අවස්ථා (එනම් රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණ, න්‍යෂ්ටික සහ	• ආපදා අවදානම් (එනම් පවතින සහ ඉස්මතු වන) සහ ශ්‍රී ලංකාවට එල්ල වන දේශගුණික බලපෑම් පිළිබඳ තොරතුරු ගොනු කිරීම සඳහා විද්‍යාත්මක				✓	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය, **CCS,**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන,	**SDG-1** **SDG-3** **SDG-4** **SDG-5** **SDG-6**

	පිපිරීම් සහිත සිදුවීමක්) ශ්‍රී ලංකා භූමියට සමීපව සිදු වුවහොත් (එනම් අවට සාගරය සහ ගුවන් අවකාශය ආශ්‍රිතව) ඒ හේතුවෙන් ඇති විය හැකි අනතුරු පිළිබඳ දැනුවත්භාවය, සූදානම සහ හදිසි සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශීය හා විදේශීය/ කලාපීය සංවිධාන, විශ්වවිද්‍යාල, විද්‍යාත්මක ආයතන සමඟ ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම.	ආයතන, විශ්වවිද්‍යාල සහ සංවිධාන සමඟ එළඹ ඇති ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගීතා සංඛ්‍යාව					ජාතික විද්‍යා පදනම, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, **NARA,** සෞඛ්‍ය අමාත්‍යාංශය, අදාල තාක්ෂණික නියෝජිතායතන, අධ්‍යාපනික/ පර්යේෂණ ආයතන (ජාතික/ ජාත්‍යන්තර)	රාජ්‍ය නොවන සංවිධාන	**SDG-8** **SDG-9** **SDG-11** **SDG-13** **SDG-17**
1.9 ආපදා ආශ්‍රිත සංඛ්‍යාලේඛන රාමුව මුඛ්‍යධාරාගත කිරීම සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගීත්වයෙන් ශක්‍යතාවන් වැඩිදියුණු කිරීම	**1.9.1** ආපදා අවදානම් අවම කිරීම සඳහා කරුණු පදනම් කරගත් තීරණ සකස් කිරීමට අසල්වැසි රටවල් අතර තාක්ෂණික දැනුම හුවමාරු කර කිරීම තුළින් ආපදා සම්බන්ධ සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැනට පවතින පුහුණු මධ්‍යස්ථානවල ධාරිතාව ශක්තිමත් කිරීම.	• පුහුණුවලත් නිලධාරීන් සංඛ්‍යාව සහ තාක්ෂණික නියෝජිතායතනවලට සහ අදාළ පාර්ශවකරුවන්ට ප්‍රවේශ විය හැකි යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ හැකියාව අවම වශයෙන් 75% ක් හෝ ඊට වැඩි වීම.	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, **NPPD,** අදාල තාක්ෂණික නියෝජිතායතන, අධ්‍යාපනික/ පර්යේෂණ ආයතන (ජාතික/ ජාත්‍යන්තර)	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1** **SDG-2** **SDG-3** **SDG-4** **SDG-5** **SDG-6** **SDG-7** **SDG-9** **SDG-11** **SDG-13** **SDG-14** **SDG-15** **SDG-17**
	1.9.2 ආපදා සම්බන්ධ සංඛ්‍යාලේඛන ඒකක පිහිටුවීමට සහ අවශ්‍ය	• ස්ථාපිත ආපදා ආශ්‍රිත සංඛ්‍යාලේඛන ඒකක සහිත තාක්ෂණික		✓			ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන,	**SDG-1** **SDG-2** **SDG-3**

	තාක්ෂණික හා විශේෂඥතාව මෙන්ම අනෙකුත් අවශ්‍ය සම්පත් සැපයීම සඳහා පාර්ශවකරුවන්ගේ ආයතන සහ නිලධාරීන් හඳුනා ගැනීම.	ආයතන/අදාළ පාර්ශ්වකරුවන්ගේ සංවිධාන සංඛ්‍යාව					ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අදාල තාක්ෂණික නියෝජිතායතන (ජාතික/ ජාත්‍යන්තර)	ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-4** **SDG-5** **SDG-6** **SDG-7** **SDG-9** **SDG-11** **SDG-12** **SDG-13** **SDG-14** **SDG-15** **SDG-17**

ප්‍රමුඛතාව 2	ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම
අරමුණ	අවදානම් පාලනය සහ අන්තර්ග්‍රාහී සහභාගිත්වය වැඩිදියුණු කිරීම
ඵලය 2	
මෙහෙයුම් උපායමාර්ගය 2: ප්‍රමාණවත් නෛතික විධිවිධාන, ආපදා අවදානම් අවම කිරීමේ ඒකාබද්ධ සංවර්ධනය සහ පාර්ශ්වකරුවන්ගේ අර්ථවත් සහභාගිත්වය තුළින් ආපදා අවදානම් පාලනය සෑම තලයකම වැඩිදියුණු කිරීම.	

දෙවැනි මෙහෙයුම් උපායමාර්ග	ක්‍රියාකාරකම්	දර්ශක	කාල රාමුව				ක්‍රියාත්මක කිරීමේ වගකීම (සංවිධානය/සංවිධාන)		තිරසර සංවර්ධන ඉලක්ක
			අල්ප කාලීන	මධ්‍ය කාලීන	දීර්ඝ	අඛණ්ඩ	වගකීම		
2.1 සෑම තලයකම ආපදා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන නීතිමය සහ නියාමන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම	**2.1.1 2005** අංක **13** දරණ ආපදා කළමනාකරණ පනත යටතේ ඇති විධිවිධාන මත පදනම්ව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධිකාරී නියාමන ශක්තිමත් කිරීම සහ ජාතික ආපදා අවදානම් කළමනාකරණය සහ හදිසි ප්‍රතිචාර දැක්වීම සහ සූදානම ඵලදායීව හා කාර්යක්ෂමව ලබාදීමේ හැකියාව සහතික කිරීම.	• ආපදා අවදානම් අවම කිරීම/ දේශගුණික විපර්යාස අනුවර්තනය මුඛ්‍යධාරාගත කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සංස්ථාපනය කර ඇති රාජ්‍ය සංවිධාන/ ආයතන සහ පෞද්ගලික ආයතන සංඛ්‍යාව				✓	ආපදා කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අයත් අදාළ විෂය අමාත්‍යාංශය, **SMoHA, MoPHP&L**	අධිකරණ අමාත්‍යාංශය, **LDD,** අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන	**SDG-1 SDG-3 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13 SDG-16**
	2.1.2 ආපදා අවදානම් අවම කිරීම / දේශගුණික විපර්යාස අනුවර්තනය සංවර්ධන ක්‍රියාවලියේ මුඛ්‍යධාරාගත කිරීම සඳහා පවතින නීතිමය ප්‍රතිපාදනවලට අනුකූල වීම සහතික කිරීම					✓			

	2.1.3 ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ ආපදා අවදානම් කළමනාකරණ සම්බන්ධීකරණ කමිටු පැහැදිලි නියෝග, යොමු නියම (**TORs),** සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් ධාරිතාව සමඟ ස්ථාපිත කිරීම සහ විධිමත් කිරීම	• එක් එක් මට්ටම්වල ආපදා අවදානම් කළමනාකරණ කමිටු තුළ සකස් කරන ලද යොමු නියමයන් සහ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA**	විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන	**SDG-1 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13 SDG-17**
	2.1.4 ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත සහ අනෙකුත් අදාළ පනත් සහ නීතිමය රාමු යටතේ අදාළ විධිවිධාන මත පදනම්ව ශ්‍රී ලංකාවේ ඵලදායී ආපදා අවදානම් කළමනාකරණය සඳහා රෙගුලාසි සකස් කිරීම සහ බලාත්මක කිරීම	• ආයතනික (හෝ සංවිධානයේ) ක්‍රියාකාරී සැලසුම්වල ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන ඇතුළත් කර ඇති රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සංඛ්‍යාව		✓			ආපදා කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අයත් අදාළ විෂය අමාත්‍යාංශය, **LDD, SMoHA, LAs, CCC, MoPHP&L**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පුද්ගලික අංශය	**SDG-1 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13**
	2.1.5 2005 ආපදා කළමනාකරණ පනතේ විධිවිධාන සහ මාර්ගෝපදේශ මත පදනම්ව ආයතනික ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් (එනම් **IDMP)** සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු	• **2005** ආපදා කළමනාකරණ පනත මත පදනම්ව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් හඳුන්වා දුන් මාර්ගෝපදේශයන්ට අනුව ආයතනික ආපදා අවදානම් කළමනාකරණ		✓			ආපදා කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන	පළාත් සභා, පළාත්පාලන ආයතන	**SDG-1 SDG-6 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13**

	වල සංවිධානාත්මක ව්‍යුහය ශක්තිමත් කිරීම.		සැලසුම් (එනම් **IDMP**) ශක්තිමත් කර ක්‍රියාත්මක කර ඇති ආයතන සංඛ්‍යාව						
	2.1.6 ප්‍රධාන හෝ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් **(EIAs)** සහ සෞඛ්‍ය ආයෝජන බලපෑම් තක්සේරු කිරීම් **(HIAs)** තුළ ආපදා අවදානම් බලපෑම් තක්සේරු කිරීම් ඇතුළත් කරන්න.	• පාරිසරික බලපෑම් ඇගයීම් සහ සෞඛ්‍ය බලපෑම් තක්සේරු කිරීම් තුළ ආපදා අවදානම් බලපෑම් තක්සේරු කිරීම් ඇතුළත් කර ඇති ප්‍රධාන සහ/හෝ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව.		✓			පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, **CCS, UDA, DB, CMA, SSLDC,** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA, GBCSL, MoPHP&L, MoTHW**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන,, අදාල තාක්ෂණික නියෝජිතායතන, අධ්‍යාපනික/ පර්යේෂණ ආයතන (ජාතික/ ජාත්‍යන්තර), ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1 SDG-3 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13 SDG-15**
2.2 ආපදා අවදානම් පාලනය සඳහා සෑම තලයකම බහු පාර්ශ්වකරුවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන, වයස් සංවේදී සහ ඇතුළත් ප්‍රවේශයක් ආයතනගත කිරීම	**2.2.1** ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී, ළමා කේන්ද්‍රීය, වයසට ගැළපෙන සහ ඇතුළත් ප්‍රවේශයන්, ක්‍රියාකාරී සැලසුම් සහ ආපදා අවදානම් කළමනාකරණය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා අයවැය ඒකාබද්ධ කිරීම මගින් සියලුම අංශවල විස්තීර්ණ සහ සුසංයෝගී ආපදා කළමනාකරණ වැඩසටහන් සහතික කිරීම.	• සෑම තරාතිරමකම සෑම අංශයකම ආපදා අවදානම් කළමනාකරණ වැඩසටහන්වලට ඇතුළත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී, ළමා කේන්ද්‍රීය, වයසට ගැළපෙන සහ ඇතුළත් ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **MWCASE, NCPA, DoSS, NSE,** ප්‍රජා පොලිසිය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -1 SDG -4 SDG-5 SDG-11 SDG-12 SDG-13**
	2.2.2 ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය (ගම) මට්ටම දක්වා	• ප්‍රාදේශීය (ගම) මට්ටමින් ක්‍රියාත්මක කරන ලද			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන,	**SDG -1 SDG -3**

	ආපදා කළමනාකරණ යාන්ත්‍රණය (එනම් ආපදා වැළැක්වීම, ආරක්ෂාව, පුනරුත්ථාපනය පිළිබඳ අංශ) සඳහා කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.	වැඩසටහන්/ක්‍රියාකාරකම් ගණන					**MWCASE, NCPA, SMoHA, MoPHP&L**	පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -4 SDG-5 SDG-11 SDG-12 SDG-13**
	2.2.3 ආපදාවන්ට ගොදුරු වූවන්ගේ හෝ විපතට පත් වූවන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් අවශ්‍යතා පිළිබඳ අත්පොතක් සකස් කරන්න	• ජාතික මට්ටමින් අත්පොත ප්‍රකාශයට පත් කිරීම සහ එළිදැක්වීම සහ ප්‍රාදේශීය මට්ටමින් පවත්වනු ලබන හෝ සංවිධානය කරන ලද සංවේදී වැඩසටහන් සංඛ්‍යාව		✓					
	2.2.4 ප්‍රජා සහ ප්‍රාදේශීය මට්ටමින් ආපදා අවදානම් අවම කිරීමට සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ළමයින්, කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින් (හෝ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්) සහ වැඩිහිටියන්ගේ අර්ථවත් ක්‍රියාකාරී සහභාගිත්වයක් සහතික කෙරෙන නිශ්චිත වැඩසටහන් සැකසීම සහ ක්‍රියාවට නැංවීම.	• ළමයින්, කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින් (හෝ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්) වැඩිහිටියන් ප්‍රජා සහ ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධ කරගත් ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව				✓	**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, MWCASE, NCPA, DoSS, NSE, SMoHA, MoPHP&L, NSPWD,** ප්‍රජා පොලිසිය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -1 SDG -3 SDG -4 SDG-5 SDG-11 SDG-12 SDG-13**
	2.2.5 කාන්තාවන්, දරුවන් සහ ආන්තික ප්‍රජාවන්ගේ ජීවන	• දරුවන්, කාන්තාවන් සහ ආන්තික ප්‍රජාවන්			✓		**MoSDVT, NAITA,** අදාල	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන,	**SDG -1 SDG -3**

	තත්ත්වය ඉහළ නැංවීම සඳහා රැකියා, නිපුණතා සංවර්ධන සහ සෞඛ්‍ය සේවා වැනි ඔවුන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර හා සම්බන්ධ ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම් සඳහා ආයෝජනය කරන්න.	ඇතුළත් ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම් සංඛ්‍යාව					තාක්ෂණික විද්‍යාල, **MWCASE, DoSS, MoEd, NSE, NCPA,** ප්‍රජා පොලිසිය	පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG -4 SDG-5 SDG-11 SDG-12 SDG-13**
	2.2.6 ආපදාවලින් පීඩාවට පත් වූ පුද්ගලයන්ගේ පශ්චාත් ආපදා කම්පන තත්ත්වයන්ට පිළියමක් ලෙස පශ්චාත් ආපදා කාල සීමාව අතරතුර /ඉන් පසු ප්‍රධාන නගරවල මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය ආධාරක සේවා **(MHPPS)** සත්කාරක මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම.	• ආපදාවලින් පීඩාවට පත් පුද්ගලයන්ගේ පශ්චාත් ආපදා කම්පන තත්ත්වයන්ට පිළියමක් ලෙස ප්‍රධාන නගරවල පිහිටුවා ඇති මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය ආධාරක සේවා **(MHPPS)**සත්කාරක මධ්‍යස්ථාන සංඛ්‍යාව		✓			සෞඛ්‍ය අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA, MoPHP&L**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1 SDG-3 SDG-4 SDG-5 SDG-11 SDG-13**
2.3 සෑම තලයකම හා සෑම අංශයකම ආපදා අවදානම අවම කිරීම සහ දේශගුණික ක්‍රියාකාරකම් මුඛ්‍යධාරාගත කිරීම	**2.3.1** සෑම අංශයකම ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග (එනම් දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ පළාත් පාලන) ඒකාබද්ධ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ශක්තිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් තිබීම.	• සෑම තරාතිරමකම සහ සියලුම අංශ හරහා ආපදා අවදානම් අවම කිරීම ඒකාබද්ධ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ස්ථාපිත සම්බන්ධීකරණ යාන්ත්‍රණ සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණය සඳහා වන ජාතික මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අදාල තාක්ෂණික නියෝජිතායතන, **SMoHA, MoPHP&L**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1 SDG-3 SDG-4 SDG-5 SDG-6 SDG-7 SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13**

									SDG-14 **SDG-15**
	2.3.2 රට පුරා ඇති සියලුම පළාත්පාලන ආයතන සඳහා දේශීය ආපදා අවදානම් අවම කිරීමේ (**DRR**) සැලසුම් නිර්මාණය කිරීම ශක්තිමත් කිරීම	• එලදායී අධීක්ෂණ යාන්ත්‍රණ සමඟ ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් සකස් කර, අවශ්‍යතාවන්ට සරිලන පරිදි ක්‍රියාත්මක කර ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA, MoPHP&L**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, පළාත් සභා, පළාත්පාලන ආයතන, අදාල තාක්ෂණික ආයතන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1** **SDG-3** **SDG-5** **SDG-11** **SDG-13**
	2.3.3 බහු උපද්‍රව සහ බහු පාර්ශ්වකරුවන්ගේ හදිසි ප්‍රතිචාර සහ සම්බන්ධීකරණ ක්‍රියාවලියට අදාල හදිසි ඇමතුම් අංකයට (**117**) අදාල යාන්ත්‍රණය සහ යටිතල පහසුකම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස වැඩිදියුණු කිරීම	• ක්ෂණික ඇමතුම් (24**x**7 පදනම) සේවාවට අදාල මෙහෙයුම් සියලු උපද්‍රව/ හදිසි අවස්ථා (එනම් බහු උපද්‍රව - උදා. සෞඛ්‍ය, සමුද්‍ර විපත් ආදිය) ආවරණය වන පරිදි ව්‍යාප්ත කර ඇත.			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අයත් වන විෂයයභාර අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, අදාල තාක්ෂණික ආයතන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, ත්‍රිවිධ හමුදාව, පොලිසිය	
	2.3.4 මුඛ්‍ය ධාරාවේ ආපදා අවදානම් අවම කිරීම වැඩිදියුණු කිරීම මගින් පළාත් පාලනයට අදාලව ආපදා අවදානම් අවම කිරීම කාර්යක්ෂම හා අනිවාර්ය ප්‍රවාහගත කිරීම සහතික කිරීම	• වැඩිදියුණු කළ සැලසුම් සහ හුරු කරවීම් තුළින් ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේද අනුගමනය කරන පළාත් පාලන ආයතන සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA, MoPHP&L**, පළාත් සභා, පළාත්පාලන ආයතන	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතන, අදාල තාක්ෂණික ආයතනය ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන,	**SDG-1** **SDG-3** **SDG-4** **SDG-5** **SDG-8** **SDG-9** **SDG-11** **SDG-12** **SDG-13**
	2.3.5 අවදානම් පිළිබඳ දැනුම්වත් වීමට, පාරිසරික	• අවදානම් පිළිබඳ දැනුවත්, පාරිසරික			✓		ජාතික ආපදා කළමනාකරණ	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතනය,	**SDG-1** **SDG-3**

	වශයෙන් තිරසර භාවයට සහ දේශගුණ බලපෑම් අවම කිරීමට මෙන්ම අනුවර්තනය වීමට සහාය වීම පිණිස සියලුම සංවර්ධන ව්‍යාපෘති නියාමනය සහ ප්‍රමිතිකරණය	වශයෙන් තිරසර සංවර්ධන ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ මාර්ගෝපදේශ පිළිබඳ සාක්ෂි					මධ්‍යස්ථානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **CCS,** පරිසර අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, **LDD, SLLDC,** නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, **DB, USDA, MoTHW, CCC, CMA, NHDA**	අදාල තාක්ෂණික ආයතන, **SMoHA, MoPHP&L,** පළාත් සභා, පළාත්පාලන ආයතන, පුද්ගලික අංශය	**SDG-8 SDG-9 SDG-11 SDG-12 SDG-13 SDG-15 SDG-16**
	2.3.6 ලැව්ගිනි පිළිබඳ ඵලදායී, නවීන සහ විස්තීර්ණ කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම සහ ස්ථාපිත කිරීම	• පරිසර පද්ධතියට අවම හානියකින් වන පරිදි පාලනය කළ ලැව්ගිනි සංඛ්‍යාව			✓		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **FD,** පරිසර අමාත්‍යාංශය	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතනය, **SMoHA,** පළාත් සභා, පළාත්පාලන ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, **DWC, WNPS,** ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ගිනි නිවන හමුදාව, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන	**SDG-1 SDG-2 SDG-11 SDG-15 SDG-17**
	2.3.7 දිස්ත්‍රික්, ප්‍රාදේශීය, පළාත් පාලන, ග්‍රාම නිලධාරී කොට්ඨාශ සහ ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ කමිටුවල ආපදා	• උප ජාතික මට්ටමින් සකස් කරන ලද, යාවත්කාලීන කරන ලද සහ අධීක්ෂණය කරන	✓				ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, **SMoHA,**	අදාල විෂයයභාර අමාත්‍යාංශ/ ආයතනය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන,	**SDG-1 SDG-2 SDG-3 SDG-4**

	අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කිරීම, නිතිපතා යාවත්කාලීන කිරීම සහ අධීක්ෂණය කිරීම	ලද ආපදා කළමනාකරණ සැලසුම් සංඛ්‍යාව					**MoPHP&L,** පළාත් සභා, පළාත්පාලන ආයතන	රාජ්‍ය නොවන සංවිධාන	**SDG-6** **SDG-9** **SDG-11** **SDG-13** **SDG-14** **SDG-15** **SDG-17**
ජාතික ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වන අපි ශ්‍රී ලංකා රජයට අයත් ආපදා අවදානම් කළමනාකරණයට අදාළ අමාත්‍යාංශ සහ තාක්ෂණික නියෝජිතායතන සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා වගකියන වෙනත් ජාතික සහ ජාත්‍යන්තර ප්‍රධාන පාර්ශවකාර ආයතන සහ සහභාගිවන නියෝජිතයන් සමඟ ශ්‍රී ලංකාවේ කොළඹ දී හමුවී 2020 දෙසැම්බර් 14 සිට 16 දක්වා බහු ආපදා පූර්ව අනතුරු ඇඟවීම් සහ ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී

1. ආන්තික කාලගුණික තත්ත්වයන් සහ දේශගුණය හා සම්බන්ධ අභියෝගවල වර්ධනය වන තීව්‍රතාව සහ වාරගණන පිළිබඳව සහ පිළිගත නොහැකි ආකාරයට සිදුවන මනුෂ්‍ය ජීවිත සහ ජීවනෝපායන්ට හානි සිදුවීම, ජනතාව අවතැන්වීම සහ පාරිසරික සහ ආර්ථික හානි සිදුකරන ආපදා වල අඛණ්ඩ බලපෑම පිළිබඳ අපගේ දැඩි අවදානය යොමු කිරීම;
2. ආපදා අවදානම් කළමනාකරණයේදී පර්යේෂණ, විද්‍යාව සහ තාක්ෂණ යෙදවුම් අන්තර්ග්‍රහණය ශක්තිමත් කිරීම සහ ප්‍රධාන ධාරාගත කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනීම සහ බහුවිධ විෂයයන්ගෙන් සමන්විත වන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් සහිත ප්‍රජාවක් ගොඩනැගීම;
3. දරිද්‍රතාව, දේශගුණික වෙනස්කම්, ආරක්ෂිත පරිසර පද්ධති සහ ජෛව විවිධත්වය අහිමිවීම, වේගවත් නාගරීකරණය සහ ආපදා අවදානම් ප්‍රදේශවල සැළසුම් සහගත නොවන සංවර්ධන කටයුතු, සමාජ ආර්ථික අසමානතාවන් සහ ජනගහන වර්ධනය සහ සමාජීය අභියෝගයන්, අවදානම් සහ අවදානමට තිබෙන ඉඩ පිළිබඳ සාකල්‍යවාදී වැටහීමක් ඇතිකරගැනීම පිළිබඳ අවධානය යොමුකිරීමේ සහ ඔවුන් සමඟ අන්තර් සබඳතාවෙහි අවශ්‍යතාව අවධාරණය කිරීම;
4. විද්‍යාත්මක යෙදවුම් හා සංයුක්තව ස්වාභාවිකත්වය පදනම් කරගත් විසඳුම් යොදාගැනීමට අවධානය යොමුකරන අතර ම ජෛවිද්‍යාත්මකව මානවයන් සහ සත්ත්වයන් අතර රෝග පැතිරීම, හෝමෝන සහ මයික්‍රොප්ලාස්ටික් ආදිය ද ඇතුළත්ව ඉදිරියේදී ඇතිවිය හැකි අනාවැකි පළ කිරීමට නොහැකි ආපදා ද ඇතුළත්ව සියලු ම ආපදාවලට එරෙහිව ප්‍රත්‍යස්ථතාව ගොඩනැගීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම;
5. තිරසාර සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය, දේශගුණික වෙනස්කම් පිලිබඳ පැරිස් සම්මුතිය, ආපදා අවදානම් අවම කිරීම සඳහා වන සෙන්දායි රාමුව (2015 - 2030), සහ නව නාගරික න්‍යාය පත්‍රය වැනි ගෝලීය රාමු අතර සංසක්ත බව තහවුරු කිරීමේ වැදගත්කම සහ ජාතික, උපජාතික සහ ප්‍රාදේශීය මට්ටම්වල ඒවා සාක්ෂි පදනම් කරගත් බහු පාර්ශවකාර සබඳතා ප්‍රවේශයන් තුළින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හඳුනාගැනීම;
6. ආපදා අවදානම් අවම කිරීමේ ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව වැඩකටයුතු කිරීම සඳහා අපගේ කැපවීම යළි පණගැන්වීම;
7. බලය ලබා දෙන්නන් වශයෙන් සියලු පාර්ශ්වකරුවන්ගේ භූමිකාවන් පිළිගනිමින් ආණ්ඩුව සහ ප්‍රජාවන් සමඟ කටයුතු කරමින් ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණවලින් දැනුවත් බව සහ සාක්ෂි මත පදනම් වන "පූර්ණ සමාජ" ප්‍රවේශයක අවශ්‍යතාව හඳුනාගැනීම සඳහා කටයුතු කළෙමු.

01

ප්‍රත්‍යස්ථ සහ තිරසාර රටවල්, නගර සහ ප්‍රජාවන් සඳහා අවස්ථාවක් ලෙස ආපදා අවදානම් කළමනාකරණය සඳහා වන සෙන්දායි රාමුව අවස්ථාවක් කරගනිමින් බහුවිධ ආපදා පූර්ව අනතුරු ඇඟවීම් සහ ආපදා අවදානම් අවම කිරීම 2020 පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ මූලික ප්‍රතිඵල මත ගොඩනැගෙමින් අපගේ සියළුම අදාළ පාර්ශ්වකරුවන්ට සහ සංවර්ධන සහායකයන්ට,

1. ජාතික විද්‍යා පදනමක් ඇතිකර ශක්තිමත් කිරීමටත් ආපදා ප්‍රත්‍යස්ථ ජාතියක් ගොඩනැගීමටත් ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ සෙන්දායි රාමුවේ මූලික ක්ෂේත්‍ර හතර කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට විද්‍යාත්මක කෝණයකින් බැලීමත් යන කාරණා සම්බන්ධයෙන් කැපවීම;

2. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු, දේශගුණික වෙනස්කම් පිළිබඳ පැරිස් ගිවිසුම සහ භූමි භායනය සහ ජෛව විවිධත්වය පිළිබඳ වූ අදාල ගෝලීය සම්මුතීන් සමඟ ඇති ශක්තිමත් සබඳතා සමඟ ගෝලීය රාමු යෝග්‍ය ප්‍රතිපත්ති සහ පුරුදුවල සංසක්ත බව පරිවර්තනය කර යොදාගැනීම සඳහා කැපවීම;

3. ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රතිපත්ති සම්පාදනය, ආයෝජනය සහ ව්‍යවහාරයන් සඳහා වන විද්‍යාත්මක සහ තාක්ෂණික යෙදවුම්වල වැදගත්කම වටහාගනිමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා විද්‍යාව සහ තාක්ෂණය භාවිතා කිරීම වේගවත් කිරීම සඳහා යාන්ත්‍රණයක් වශයෙන් විද්‍යාව, තාක්ෂණය, ප්‍රතිපත්ති සහ ව්‍යවහාරයන් හරහා ඵලදායී බහු පාර්ශ්වික සබඳතා ස්ථාපිත කිරීම;

4. ආපදා පිළිබඳ සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම, ආපදා අවදානම් සහ සොබාඛ්‍යට අදාළ හදිසි අවදානම් අවම කිරීම වටහා ගැනීම සඳහා දැනුම සහ විද්‍යාව වැඩිදියුණු කිරීම, ඒ සම්බන්ධ තොරතුරු රැස්කිරීම සහ බෙදා හැරීම;

5. ප්‍රජා මට්ටමේ පෙර සූදානම සහ ප්‍රතිචාර ශක්තිමත් කිරීම මෙන් ම ආපදා අවදානම් අවම කිරීම සහ ඇතිවිය හැකි හදිසි සොබාඛ්‍ය තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ආපදා අවදානම් පාලනය දිර්ඝ කිරීම;

6. ආපදා අවදානම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස කලමනාකරණය කිරීම සඳහා පාලන කටයුතු ශක්තිමත් කිරීම සහ සම්පත් ඉලක්ක කිරීම හරහා දැඩි වගවීමක්, ආරක්ෂාවක් සහිතව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සහ වඩාත් පීඩාවට පත්වීමේ අවදානම සහිත කණ්ඩායම් බලගැන්වීම සම්බන්ධයෙන් කැපවීම;

7. සැඟවුණු රටාවන්, නිර්නාමික සහසම්බන්ධතාවන්, ප්‍රවණතා, වෙනත් පැතිකඩ වටහාගැනීම සඳහා විශාල දත්ත පද්ධති භාවිතා කිරීම ද ඇතුළත්ව ආපදා අවදානම් අවම කිරීමට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්ත භාවිතය ප්‍රවර්ධනය කිරීම.

8. පූර්ව අනතුරු ඇඟවීම් සඳහා මුල සිට අග දක්වා පැහැදිලි බහුවිධ ආපදා ප්‍රවේශයක් යෝග්‍ය නෛතික රාමුවක් හරහා ප්‍රවර්ධනය කිරීම සහ එය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, පශ්චාත් ක්‍රියාත්මක කිරීම් සමාලෝචනයන්හි සහ වැඩිදියුණු කිරීම් වලදී අවදානමට පාත්‍රවී සිටින ප්‍රජාවන් වෙත අවධානය යොමු කිරීම;

9. බලපෑම් පදනම් කරගත් අනාවැකි සහ අනතුරු ඇඟවීම් සේවාවලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ජාතික කාලගුණවිද්‍යා සහ ජලවිද්‍යා සේවාවන්හි, ආපදා අවම කිරීම සහ සිවිල් ආරක්ෂක නියෝජිතායතන සහ වෙනත් දේශීය, මහ නගර සභා හෝ ජාතික ආණ්ඩු තුළ සිටින වෙනත් ක්‍රියාකරුවන් අතර කාලගුණයට සහ දේශගුණයට අදාළ සේවා සැපයීමට අදාළ සබඳතාවන් ශක්තිමත් කිරීම;

10. නගරවල සිටින නායකයන් සහ සැළසුම්කරුවන් සහ පුළුල් නාගරික සංවර්ධන සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින පාර්ශ්වකරුවන් තුළ ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ වැටහීම ශක්තිමත් කිරීම;

11. සාක්ෂි පදනම් කරගත්, සුහුරු කාලගුණික, අවදානම් සංවේදී ජනතාවක් සහ පොදගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ස්වාභාවිකත්වය පදනම් කරගත් විසඳුම්වල ප්‍රතිලාභ සහ පිරිවැය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරන අතරම ආපදා ප්‍රත්‍යස්ථ ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නැවත සවි කිරීම;

12. අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් සහ රජයේ කටයුතු, කෘෂිකර්මය, වාරිමාර්ග වැනි සේවා අංශ සහ ප්‍රධාන සංවර්ධන අංශ වෙත ආපදා අවදානම් කළමනාකරණය ප්‍රධාන ධාරාගත කිරීම සහ සංස්කෘතික වෙනසක් ඇති කිරීමත් සංවර්ධන ආයෝජනයන් මත දැඩි බලපෑමක් ඇති කරන අංශ හරහා ධාරිතා වර්ධනය සහ සන්නිවේදනය (විද්‍යාව පිළිබඳ) එකිනෙක සම්බන්ධ තේමාවන් යටතේ ඒකාබද්ධ කිරීම;

13. පිරිමින්, කාන්තාවන්, ගැහැණු දරුවන්, පිරිමි දරුවන්, විශේෂ අවශ්‍යතාවන් සහිත පුද්ගලයන්, වැඩිහිටියන්, සංක්‍රමණිකයන් සහ සරණාගතයන් ඇතුළත්ව ජනගහණය තුළ සිටින වඩාත් පීඩාවත් පත්වීමේ හැකියාව තිබෙන පුද්ගලයන් බලගැන්වීම තුළින් ප්‍රජා පාදක සංවිධාන උපරිම ලෙස යොදාගනිමින් ආපදා අවදානම් කළමනාකරණය සඳහා සියල්ල ඇතුලත් ප්‍රවේශයක් යොදා ගනිමින් ආපදා අවදානම් අවම කිරීමේ ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ ව්‍යවහාරයන්වලට වඩාත් ඵලදායීව සම්බන්ධවීම;

14. ජාතික, උප ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පාර්ශවකරුවන්ගේ වටිනාකම සහ දායකත්වය වටහාගැනීම සහ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කෙරෙන ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ ව්‍යවහාරයන් ආපදා අවදානම් අවම කිරීමේ සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීම; සඳහා අපි ආරාධනා කරමු.

2020 දෙසැම්බර් 16 දින කොළඹ දී සම්මත කරන ලදී.

MHEW DRR Symposium 2020

9.3 ඇමුණුම 1: 2005 අංක 13 දරණ ආපදා කළමනාකරණ පනත

අර්ථනිරූපණය

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි "ව්‍යසනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නා වූ නැතහොත්, යම් දේපළක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණුවන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදු වන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වභාවික හෝ මිනිසා විසින් සිදු කරනු ලබන්නා වූ ද සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමකට ආසන්න වීම අදහස් වන අතර, ඊට-

(අ) නායයාමක්;

(ආ) සුළි සුළඟක්;

(ඇ) ගංවතුරක්;

(ඈ) නියඟයක්;

(ඉ) කාර්මික උපද්‍රවයක්;

(ඊ) සුනාමියක් (භූමිකම්පනාසන්න චලනයක්);

(උ) භූමි කම්පාවක්;

(ඌ) ගුවන් උපද්‍රවයක්;

(එ) සමුද්‍රීය උපද්‍රවයක්;

(ඒ) ගින්නක්;

(ඔ) වසංගතයක්;

(ඕ) පිපිරීමක්;

(ක) ගුවන් ප්‍රහාරයක්;

(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්;

(ච) රසායනික අනතුරක්;

(ජ) විකිරණශීලිත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්;

(ට) ගොඩබිම සහ මුහුදේ සිදු වන තෙල් පිටාර ගැලීම් ඇතුළුව තෙල් පිටාර ගැලීමක්;

(ඩ) න්‍යෂ්ටික ආපදාවක්;

(ණ) නාගරික සහ වනාන්තර ගිනිගැනීමක්;

(ත) වෙරළ බාදනය වීමක්; සහ

(ද) ටොනාඩෝ චණ්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක්.

9.4 ඇමුණුම 2: උපද්‍රව සිතියම්ගත කිරීම / උපද්‍රව තොරතුරු සඳහා වගකිව යුතු ආයතන

උපද්‍රව සහ තොරතුරු / සිතියම් වර්ගය	වගකිව යුතු ආයතන
නාගරික ගංවතුර	• ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) • අදාල මහනගර සභා, නගර සභා /ප්‍රාදේශීය සභා
නායයෑම් අනතුරු කලාප පිළිබඳ සිතියම්	• ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) • භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශය (GSMB)
ගංගා ගංවතුර මට්ටම, ගංවතුර අවදානම් සහිත ප්‍රදේශ, ලබා දී ඇති ගංගා ද්‍රෝණිවල ගංවතුර රටා. ගංවතුරට යටවීම්/ ඓතිහාසික ගංවතුර, ගංවතුර සමාකරණය/ පෝෂක ප්‍රදේශ ආකෘතිකරණය පිළිබඳ දත්ත සමුදායන්	• වාරිමාර්ග දෙපාර්තමේන්තුව(ID) • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL)
ජලාශ මට්ටම්, ජලාශවලින් අධික ලෙස පිටාර ගැලීම, ජලාශ කැඩීම, අධික ජලය හදිසියේ මුදා හැරීම, යම් ආයතනයක විෂයපථයට අනුව තෝරාගත් ජලාශ සහ වේලි ආශ්‍රිත පහත්බිම්වල ගංවතුර අවදානම් ප්‍රදේශ සිතියම්ගත කිරීම, වේලි කැඩී යාම පිළිබඳ ආකෘති නිර්මාණය මෙන්ම ජලාශ සහ වේලි ආශ්‍රිත පහත්බිම්වල ගංවතුර තත්ත්ව යනාදිය.	• වාරිමාර්ග දෙපාර්තමේන්තුව(ID) • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) • ලංකා විදුලිබල මණ්ඩලය (CEB) • ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (NW&SDB) • ගොවිජනසේවා දෙපාර්තමේන්තුව (ASD)/ පළාත් සභා - ඉංජිනෙරු අංශ
අයහපත් කාලගුණය සහ වර්ෂාපතනය, සුළි සුළං, අධික සුළං, කුණාටු, අකුණු, ගිගුරුම් සහිත වැසි, අධි අවදානම් ප්‍රදේශ/සිදුවීම් පිළිබඳ දත්ත ගබඩාව	• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (DoM)
වෙරළ බාදනය හා ගංවතුර / සුනාමි / කුණාටු බලපෑම්, මුහුදු මට්ටම ඉහළ යාම, මුහුදු රළ, මුහුදු මතුපිට, උෂ්ණත්ව දත්ත සහ විවිධ ප්‍රමාණවලින් අදාළ වන අනෙකුත් අදාළ තොරතුරු පිළිබඳ සිතියම් සහ අනෙකුත් තොරතුරු	• වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CC&CRMD) • ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA) • ශ්‍රී ලංකා නාවික හමුදාව • ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)
නියහ උපද්‍රව - විවිධ ස්වභාවයේ විවිධ ආයතන විසින් තොරතුරු / දත්ත සමුදායන් සහ සිතියම්ගත කිරීම • **කාලගුණික වශයෙන් නියහය** • **කෘෂිකාර්මික වශයෙන් නියහය** • **ජල විද්‍යාත්මක වශයෙන් නියහය**	• ජල සම්පත් මණ්ඩලය • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (DoM) • කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DoA) • වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID) • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (MASL) • ගොවිජන සේවා දෙපාර්තමේන්තුව/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (සුළු වාරිමාර්ග) • හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI)
වන අලි ප්‍රහාර සහ වෙනත් සත්ත්ව ප්‍රහාර **වනාන්තර / කුඩා පදුරු ආශ්‍රිත ගිනි**	• වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව (FD) • වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC) • වනජීවී හා පාරිසරික ආරක්ෂණ සංගමය (WNPS) • මධ්‍යම පරිසර අධිකාරිය (CEA) • පීඩාවට පත් ප්‍රදේශවල පළාත්පාලන ආයතන
වසංගත, බෝවන රෝග, කුරුළු උණ, ඒඩිස්, සාස්, විෂවීම් ආදිය සහ විය හැකි ජීව විද්‍යාත්මක උපද්‍රව, පානීය ජලයේ	• සෞඛ්‍ය අමාත්‍යාංශය (MoH) • වසංගත රෝග ඒකකය

ෆ්ලෝරයිඩ් තිබීම හේතුවෙන් උද්ගත වන සෞඛ්‍ය උවදුරු, වෙනත් සෞඛ්‍ය උවදුරු; විදේශයන්හි සිට මෙරටට පැමිණෙන පුද්ගලයින් / සතුන් හරහා බෝවන රෝග පැතිර යා හැකි අවස්ථාවක නිරෝධායන ක්‍රියාපටිපාටිය	• වෛද්‍ය පර්යේෂණ ආයතනය (**MRI**) • වෙනත් ආයතන/ නියෝජිතායතන අදාල වන පරිදි
පසුගිය ගිනි ගැනීම්වලට අදාල තොරතුරු	• කොළඹ මහ නගර සභාවේ සහ වෙනත් මහ නගර සභාවල මෙන්ම නගර සභාවල ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තු අදාල වන පරිදි
මාර්ග / රථවාහන / දුම්රිය අනතුරු සහ විශේෂයෙන් විශාල සහ අධික බරින් යුත් කන්ටේනර් / බවුසර් / ඛනිජ තෙල් නිෂ්පාදන, ගෑස්, විෂ රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් අන්තරායකාරී ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන හා සම්බන්ධ අනතුරු	• ප්‍රවාහන හා දුම්රිය අමාත්‍යාංශය • ජාතික ප්‍රවාහන කොමිසම (**NTC**) • දුම්රිය දෙපාර්තමේන්තුව • මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව • සෞඛ්‍ය අමාත්‍යාංශය (**MoH**)
ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම, පානීය ජලයේ ෆ්ලෝරයිඩ් තිබීම හේතුවෙන් හට ගන්නා සෞඛ්‍ය උවදුරු	• ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (**NW&SDB**) • ජල සම්පත් මණ්ඩලය
කලාපයේ භූ කම්පන ක්‍රියාකාරකම් ඇති කරන සුනාමිය; රට තුළ භූචලන / භූමිකම්පා; වැලි, මිනිරන්, හුණුගල් ආදී විවිධ ද්‍රව්‍ය නිස්සාරණය කිරීම සඳහා පතල් කැණීමේ ප්‍රදේශ (ගං ඉවුරු බාදනය හා ඉඩම් ගිලා බැසීම් ඇති කරයි); භූ කම්පන ක්‍රියාකාරකම් සම්බන්ධ දත්ත / සිතියම්	• භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශය (**GSMB**)
න්‍යෂ්ටික ක්‍රියාකාරකම් ආශ්‍රිත උපද්‍රව සහ අසල්වැසි රටවල පරමාණුක සහ න්‍යෂ්ටික බලාගාර/ස්ථාපන පිහිටීම; උද්ගත විය හැකි විකිරණ හා සබැඳි හදිසි අවස්ථා	• පරමාණුක බලශක්ති අධිකාරිය (**AEA**)
වැලි ගොඩදැමීම, මැණික් ගැරීම සහ අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැණීම සහ වැලි ගොඩදැමීමේ ප්‍රදේශ හේතුවෙන් සිදුවන අනතුරු	• භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශය • ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (**NGJA**) • මධ්‍යම පරිසර අධිකාරිය (**CEA**) • වැලි ගොඩ දැමීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව - පරිසර අමාත්‍යාංශය
රසායනික උපද්‍රව /අවදානම්, කර්මාන්ත ශාලා ආශ්‍රිත උපද්‍රව	• කර්මාන්ත අමාත්‍යාංශය (**MoInd**) • කම්කරු දෙපාර්තමේන්තුව (**LD**) • රසායනික අවි පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය (**NACWC**)
ඛනිජ තෙල් නිෂ්පාදන / ගබඩා කිරීම හේතුවෙන් ඇති වන ගිනි තර්ජන; භූමියට තෙල් කාන්දු වීම	• ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (**MoPRD**) • ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (**CPC**) • ශ්‍රී ලංකා නාවික හමුදාව
සාගරයට තෙල් කාන්දු වීම; වෙනත් අන්තරායකර අපවිත්‍ර වීම්	• සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (**MEPA**)

9.5 ඇමුණුම 3: අවශ්‍ය වන උපද්‍රව සිතියම් පරිමාණ

පරිමාණය	ආවරණය	දර්ශක යෙදුම්
ඉහළ ස්ථානගත කිරීම්: **1:200–1:2000** **(වඩාත් සවිස්තරාත්මක රූප මඟින් පරිපූරණය කළ හැක)**	ව්‍යාපෘතිය හෝ ඉදි කිරීම් ස්ථානය	• ව්‍යාපෘතිය හෝ ඉදි කිරීම් සිදු කරන ස්ථාන • යටිතල පහසුකම් පිළිබඳ සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම්
දේශීය: **1:2000–1:25000**	• මානව ජනාවාස ග්‍රාම නිලධාරී මට්ටම හෝ පළාත්පාලන ආයතනික මට්ටමක්/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ තක්සේරුවක්	• මූලික ඉංජිනේරු හෝ ව්‍යාපෘති සැලසුම් • විකල්ප / සූදානම් වීමේ සැලසුම් ප්‍රමාණාත්මක අවදානම් තක්සේරු කිරීම් සඳහා වන පදනම
මධ්‍යම: **1:25000–1:100000**	පළාත් පාලන මට්ටම/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම හෝ කුඩා ජල පෝෂක ප්‍රදේශ තක්සේරු කිරීම	• ප්‍රවාහනය, බලශක්තිය, ජලය ආශ්‍රිත සේවාවන් ඇතුළු නාගරික සැලසුම්කරණය
කලාපීය: **1:100,000–1:500,000**	විශාල ජල පෝෂක ප්‍රදේශ, කලාප, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ තක්සේරු කිරීම්	විශාල, භූගෝලීය වශයෙන් පැතිරී ඇති, යටිතල පහසුකම් ව්‍යාපෘති සැලසුම් කිරීම (උදා: ග්‍රාමීය මාර්ග, වාරිමාර්ග ආදිය)

මූලාශ්‍රය: වෑන් වෙස්ටර්න් - උපද්‍රව සිතියම්කරණ පරිමාණ මාර්ගෝපදේශ අනුගමනය කර ඇත.

9.6 ඇමුණුම 4: විවිධ ජාතික සහ පළාත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන / නියෝජිතායතනවල ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ මාර්ගෝපදේශය

පොදුවේ ගත් කල ආපදා කළමනාකරණ සැලසුම්වල සමස්ත ව්‍යුහය සහ අන්තර්ගතය පහත පරිදි වේ:

- හැඳින්වීම - ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන නීතිමය රාමුව; ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය; හදිසි ප්‍රතිචාර සඳහා හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් ආදිය.
- පැතිකඩ - ලබා දී ඇති අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ / ආයතනයේ සුදුසු පරිදි
- උපද්‍රව, අවදානම් සහ පවත්නා තර්ජන පිළිබඳ තක්සේරුව - ප්‍රදේශයට බලපාන ප්‍රධාන ආපදා, ගොඩනැගිලි, පරිශ්‍ර, වත්කම්, භාණ්ඩ හා වෙනත් දේපළ ආශ්‍රිත අවදානම්; අනෙකුත් සේවා සපයන්නන්/සැපයුම්කරුවන් සමඟ අත්‍යවශ්‍ය ස්ථාපන සිදු කිරීම හෝ ක්‍රියාකාරකම්/සේවාවන් සහ එම නිසා ඇතිවිය හැකි උපද්‍රවයන් සහ අවදානම් පිළිබඳ විශ්ලේෂණයක්; විෂය පථය තුළ ඇති ඕනෑම පොදු උපයෝගිතා සහ යටිතල පහසුකම් යනාදිය ස්වභාවික/මිනිසා විසින් සාදන ලද විපත්වලින් ආරක්ෂා වීම සඳහා අවදානම් විශ්ලේෂණයකට ඇතුළත් කළ යුතුය.
- හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේ සූදානම පහත පරිදි වේ:
    - ආයතනයේ/ නියෝජිතායතනයේ ආපදා කළමනාකරණ (DM) කමිටුවක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම
    - ආයතනය/ නියෝජිතායතනය තුළ ආපදා සූදානම / හදිසි මෙහෙයුම් සම්බන්ධීකරණය
    - හදිසි මෙහෙයුම් මැදිරිය සහ එහි කාර්යයන් - මෙය සංවිධානයේ ස්වභාවය අනුව වෙනස් වේ
        - ඉතා වැදගත් ස්ථාපනයන් හෝ කාර්යයන් නොමැති සම්මත සාමාන්‍ය ආයතන/ නියෝජිතායතනවලදී, හදිසි මෙහෙයුම් මැදිරිය සියලු පහසුකම් සහිත අධි තාක්ෂණික හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයක් නොවිය යුතු මුත් ආපදා කළමනාකරණ කමිටුවට රැස්වී සාකච්ඡා පැවැත්විය හැකි ආපදා සැලැස්ම, අදාළ සම්බන්ධතා තොරතුරු, ලිපි ලේඛන, ලිපිගොනු ආදිය තැබිය හැකි දුරකථන, ෆැක්ස්, අන්තර්ජාලය / විද්‍යුත් තැපෑල වැනි මූලික පහසුකම්වලින් සමන්විත ස්ථානයක් විය යුතුය. මෙය ආයතනයේ සාකච්ඡා පවත්වන ස්ථානය විය හැකි මුත් ආපදා කළමනාකරණයට අදාළ ලිපි ලේඛන මෙන්ම භාණ්ඩ/උපකරණ තැබිය හැකි වෙනම අල්මාරියක් තිබිය යුතු අතර එය හාරව ක්‍රියා කිරීම සඳහා නිලධාරියෙකු ද පත් කළ යුතුය.
        - ගුවන් තොටුපළ, වරාය, වරාය, බනිජ තෙල්/ගෑස් ගබඩා, විදුලිය, පානීය ජලය, විදුලි සංදේශ වැනි අත්‍යවශ්‍ය ස්ථාන හෝ පරිශ්‍රවලදී අවශ්‍ය පරිදි යාවත්කාලීන හදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන ස්ථාපනය කළ යුතුය.
- වත්කම් / උපකරණ / ලේඛන / තොරතුරු / දත්ත ආරක්ෂා කිරීම සඳහා වන විධිවිධාන
    - කාර්ය මණ්ඩලය, ගොඩනැගිලි සහ පරිශ්‍රය ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන
    - ආයතනය විසින් සපයනු ලබන රාජකාරී සහ සේවා පවත්වාගෙන යාම සඳහා වත්කම්, භාණ්ඩ, උපකරණ, ලිපි ලේඛන සහ වෙනත් දේපළ සුදුසු පරිදි ආරක්ෂා කිරීම / සුරක්ෂිතව තබා ගැනීම / අදාල ස්ථානවල තැබීම
    - නියෝජිතායතනයේ ක්‍රියාකාරකම්වලට අදාළ පරිගණකගත තොරතුරු / දත්ත උපස්ථ (backups) තබා ගැනීමේ විධිවිධාන (අදාළ පරිදි)
- අවශ්‍ය පරිදි ඕනෑම සම්පත් අවශ්‍යතාවක්
- උස් ගොඩනැගිලි සම්බන්ධයෙන් ගිනි ප්‍රතිචාර සැලැස්ම - ගිනි ආරක්ෂාව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල අවශ්‍යතා සපුරා තිබේද යන්න, ගිනි අනතුරු ඇඟවීම්, ඉවත් කිරීමේ පිටවීම් / සිතියම් / සංඥා, ගිනි නිවන යන්ත්‍ර, ජල විදින යන්ත්‍ර ආදිය සවි කර තිබේද යන්න සහ එහි සිටින සියලුම පදිංචිකරුවන් තහවුරු කර ගැනීම. හදිසි ගින්නක් ඇති වූ විට ගත යුතු ක්‍රියාමාර්ග (උදා: පිටවීමේ පඩිපෙළ භාවිතය) පිළිබඳව ගොඩනැගිල්ලේ සිටින පදිංචිකරුවන් දැනුවත් කර ඇත.
- උස් ගොඩනැගිලිවලදී වෙනත් හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලැස්ම - භූකම්පනයක්, ගුවන් අනතුරක් හේතුවෙන් ගොඩනැගිල්ල කඩා වැටීම, ගොඩනැගිල්ලට පහර දෙන අතිශය විශාල වස්තුවක් යනාදී වෙනත් හදිසි / ආපදාවක් ඇතිවීමේ හැකියාව බැහැර කළ නොහැක. එවැනි තත්වයක් තුළ ගත යුතු ක්‍රියාමාර්ග සහ පිළිපැදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම පිළිබඳව ගොඩනැගිල්ලේ සියලුම පදිංචිකරුවන් දැනුවත් කළ යුතුය. (ඔවුන් කණස්සල්ලට හෝ බියට පත් නොවන පරිදි)
- සම්බන්ධතා තොරතුරු, ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින සම්පත් පිළිබඳ විස්තර, ආරක්ෂිත මධ්‍යස්ථාන ලෙස හඳුනාගෙන ඇති ස්ථාන, හදිසි අවස්ථාවකදී මාරු කිරීම සඳහා යනාදී සියලු අදාළ තොරතුරු සැලැස්මෙහි ඇමුණුම් ලෙස දැක්විය හැකිය. මෙම සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වැඩිදුර මාර්ගෝපදේශ ලබා දෙනු ඇත.

- ආපදා කළමනාකරණ සැලසුම්කරණයේදී සලකා බැලිය යුතු අනෙකුත් අංශ අතර, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් **(BCP);** සහන සාධාරණ ලෙස බෙදා හැරීම සහ අයකර ගැනීම සඳහා විධිවිධාන; කෙටිම කාලසීමාව තුළ සාමාන්‍ය තත්ත්වයට පැමිණීමට හැකි වන පරිදි විශේෂ ප්‍රජා ප්‍රතිසාධන මොඩියුල; ආපදා ආචාර ධර්ම; ජලය, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ ආහාර, නවාතැන්, ජනාවාස සහ ආහාර නොවන ද්‍රව්‍ය සහ සෞඛ්‍ය සේවා සහ අවතැන්වීම් හේතුවෙන් ප්‍රජාවන්ට ආරක්ෂාව, ස්ථාන මාරුවීම් / අවතැන් වීමේදී ආරක්ෂාව, අභ්‍යන්තරයට මානුෂීය ආධාර ඇතුළු ආපදා සහන වලදී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් අවතැන් වූ පුද්ගලයින්, නැවත පදිංචි කිරීම සහ නැවත සමාජගත කිරීම; සංක්‍රමණික සේවකයින් සඳහා ආරක්ෂාව සහ බලපෑමට ලක් වූ පුද්ගලයින් සඳහා නැවත සමාජගත කිරීම යනාදිය වේ.

මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (2018)

විවිධ ජාතික අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ රාජ්‍ය ආයතන සහ ආයතනවල ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා අන්තර්ගත මාර්ගෝපදේශය

සංවිධානයේ/ආයතනයේ වර්ගය අනුව වෙනස්කම්වලට ඉඩ සලසන පහත සඳහන් අංගයන් සැලසුම්වලට ඇතුළත් වේ. ආයතනය පෞද්ගලික අංශයේ සහයෝගීතාව (උදා: පෞද්ගලික රෝහල් හෝ පෞද්ගලික පාසල්) සම්බන්ධ අංශයක් තුළ පවතින විට, අදාළ තැන්වල එවැනි සහයෝගීතාවයන් පිළිබිඹු කිරීමට සැලසුම් සකස් කළ යුතුය.:

1. ලබා දී ඇති අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය / නියෝජිතායතනය යෝග්‍ය පරිදි විස්තර කිරීම සහ එහි නීතිමය වරම
2. රටේ ආපදා අවදානම් කළමනාකරණ කටයුතු සඳහා සංවිධානයේ/ආයතනයේ සේවාවන්ගේ අදාළත්වය
    - ආයතනයේ භූගෝලීය පිහිටීම සහ එහි වත්කම් පිළිබඳ බහු උපද්‍රව අවදානම් තක්සේරුව;
        - උපද්‍රව විශ්ලේෂණය: ප්‍රදේශයට බලපාන ස්වභාවික සහ/හෝ මිනිසා විසින් සාදන ලද ආපදා පිළිබඳ සලකා බලන්න
        - අවදානම් විශ්ලේෂණය: ගොඩනැගිලි, පරිශ්‍ර, වත්කම්, භාණ්ඩ, වෙනත් දේපළවල අවදානම; කිසියම් ආයතනයක/ නියෝජිතායතනයක විෂය පථය තුළ ඇති ඕනෑම පොදු උපයෝගිතා සහ යටිතල පහසුකම් ස්වභාවික/මිනිසා විසින් සාදන ලද විපත් වල බලපෑමෙන් ආරක්ෂා කිරීම සඳහා අවදානම් විශ්ලේෂණයට ඇතුළත් කළ යුතුය. අත්‍යවශ්‍ය ස්ථාපනයන් හෝ ක්‍රියාකාරකම් සහිත නියෝජිතායතන වලදී, මේවා නිසා ඇති විය හැකි යම් උපද්‍රවයන් සහ ඒවායේ යම් දුර්වලතා පිළිබඳව විශ්ලේෂණයක් ඇතුළත් කළ යුතුය.
        - අවදානම් තක්සේරුව: මෙය උපද්‍රව විශ්ලේෂණය සහ අවදානම් විශ්ලේෂණය මත පදනම්ව සිදු කළ යුතුය
3. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ඒ සම්බන්ධයෙන් පවතින අවබෝධය ඇතුළු ආයතනයේ හවුල් දැක්මක්
4. ආයතනික ආපදා අවදානම් කළමනාකරණ උපායමාර්ගය, 2015-2030 ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ සෙන්ඩායි රාමුව සමඟ සහ ජාතික ආපදා අවදානම් කළමනාකරණ උපායමාර්ගය සමඟ සමපාත වූවකි. මෙම උපායමාර්ගයේ මතු කියැවෙන අංග ද ඇතුළත් වනු ඇත
    - අවදානම් තක්සේරුව මත පදනම්ව ආයතනික වත්කම් සඳහා අවදානම් අවම කිරීමේ පියවර හඳුනා ගැනීම.
    - ආයතනයේ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්වලින් උද්ගත විය හැකි බවට හඳුනාගත් අනාගත අවදානම් අවම කිරීමේ ප්‍රක්ෂේපණ
    - වත්කම් / උපකරණ / ලේඛන / තොරතුරු / දත්ත ආරක්ෂා කිරීම සඳහා වන විධිවිධාන
    - කාර්ය මණ්ඩලය, ගොඩනැගිලි සහ පරිශ්‍ර ආරක්ෂා කිරීම සඳහා වන විධිවිධාන
    - ආයතනය විසින් සපයනු ලබන රාජකාරී සහ සේවා පවත්වාගෙන යාම සඳහා වත්කම්, භාණ්ඩ, උපකරණ, ලිපි ලේඛන සහ වෙනත් දේපළ සුදුසු පරිදි ආරක්ෂා කිරීම/ සුරක්ෂිතව තබාගැනීම/ වෙනත් ස්ථානවලට රැගෙන යාම.
    - නියෝජිතායතනයේ ක්‍රියාකාරකම්වලට අදාළ පරිගණකගත තොරතුරු/දත්ත උපස්ථව තබා ගැනීමේ විධිවිධාන (අදාළ පරිදි)
    - ආයතනය සඳහා හදිසි සූදානම සැලසුම් කිරීම
    - ආයතනයේ/ නියෝජිතායතනයේ හදිසි කළමනාකරණ කමිටුව

- ආයතනය/ නියෝජිතායතනය තුළ ආපදා සූදානම / හදිසි මෙහෙයුම් සම්බන්ධීකරණය
- හදිසි මෙහෙයුම් මැදිරිය සහ එහි කාර්යයන් - මෙය ආයතනයේ ස්වභාවය සහ එය සපයන සේවාවන් හෝ සිදුකරන මෙහෙයුම් අනුව වෙනස් වේ.
- අවශ්‍ය අවස්ථාවලදී, ආයතනයේ අනාගත සංවර්ධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම සහ කලාපකරණය කිරීම සඳහා භාවිතා කළ යුතු ඉඩම පිළිබඳ සැලකිලිමත් වන්න.

5. විවිධ ක්‍රියාකාරීන් සමඟ කටයුතු කිරීමේ හැකියාව, උපායමාර්ග සැකසීමේ ක්‍රියාවලිය මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා නම් කරන ලද කේන්ද්‍රස්ථානයක් සහ මූලික කණ්ඩායමක්;
6. සැලැස්මේ විවිධ ක්‍රියාකාරකම් සඳහා සම්පත් අවශ්‍යතා එනම් මුඛ්‍ය කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා වෙන් වූ අයවැයක් ආකාරයෙන්, වෙනත් අරමුදල් විවිධ කාර්යාල සහ දෙපාර්තමේන්තුවලින් වෙන් කිරීම් සිදු කර ඇති මුත් එම ප්‍රතිපාදන උපායමාර්ගයට දායක වන ලෙස පැහැදිලිව වෙන් කර ඇත.
7. ක්‍රියාකාරී සැලැස්මක් හරහා උපායමාර්ගය විස්තාරණය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා කාල රාමුවක් ද ඇතුළුව (අදාළ පරිදි) :
    - ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම **(BCP) -** පශ්චාත් ආපදා කාලපරිච්ඡේදය තුළ අවම බාධාවකින් යුතුව සංවිධානය/ආයතනය මඟින් සපයනු ලබන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මෙය සකස් කළ යුතුය.
    - ගිනි සඳහා ප්‍රතිචාර සැලැස්ම (උස් ගොඩනැගිලි සම්බන්ධයෙන් විශේෂ අවධාරණයක් සහිතව)
    - ඉහත අංශවලට ද අදාල වන පරිදි ආපදාවකදී සහ ඉන්පසු හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි **(SOPs).** ආයතනයේ කාර්යයන් සහ සේවාවන් අනුව අවශ්‍යතාව වෙනස් විය හැක.
8. පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගත හැකි මාර්ග පිළිබඳ තොරතුරු, හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා ඇති සම්පත්, හදිසි අවස්ථාවකදී ස්ථාන මාරු කිරීමේදී ආරක්ෂිත නවාතැන් ලෙස හඳුනාගෙන ඇති ස්ථාන යනාදී තොරතුරු සැලැස්මෙහි ඇමුණුම් ලෙස ලබා දිය හැකිය..

(සටහන: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අදාළ සංවිධාන/ ආයතනවල ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සංවර්ධනය කිරීමේදී අවශ්‍ය පරිදි වැඩිදුර මගපෙන්වීම් ලබා දෙනු ඇත.)

අදාළ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ රාජ්‍ය සංවිධාන/ ආයතන සහ නියෝජිතායතන මඟින් ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා වන යෝජිත ක්‍රියාවලිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/සංවිධාන/ආයතන/නියෝජිත ආයතන මඟින් ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සංවර්ධනය කිරීම සඳහා දැනුම හා තොරතුරු හුවමාරු කර ගැනීම, පුහුණුව, සාකච්ඡා, මාර්ගෝපදේශ සටහන් යනාදිය මඟින් පහසුකම් සපයනු ලබන අතර, ක්‍රියාවලිය පිළිපැදීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කරනු ඇත. ඒ අනුව, ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සරල ලෙස ප්‍රතිනිර්මාණය කිරීම වැළැක්වීම සඳහා දේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් ඵලදායී ලෙස රට පුරා ප්‍රවර්ධනය කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රමවේදයක් ස්ථාපිත කරනු ඇත. නාගරික හා ග්‍රාමීය වශයෙන් අනන්‍ය වූ ලක්ෂණ, නිරන්තරයෙන් මුහුණ දෙන උපද්‍රව වර්ග, පාලනයට අදාල කරුණු හා මූල්‍ය තත්ත්වයන් යනාදී එක් එක් ආයතන අතර විවිධ වෙනස්කම් පවතින බැවින් අදාල සංවිධානය / ආයතනය මඟින් සපයනු ලබන සේවාවන්ට අනුව ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම වැදගත් වේ. ආපදා අවදානම් කළමනාකරණය සහ ප්‍රත්‍යාස්ථතා හැකියාව ගොඩනැගීම සිදුකිරීමට හැකිවන පරිදි අවශ්‍ය නෛතික හා ආයතනික ව්‍යුහයන් සංවිධාන/ ආයතන සතුව තිබිය යුතුය.

ක්‍රමවේදය: ආයතනික ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කිරීම (IDMP)

ජාතික මට්ටමේ පවතින ප්‍රතිපත්ති, රාමු, සැලසුම්, වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාවලි පිළිබඳ දැනුම්වත් කිරීම සහ පෙළගස්වන පහත සවිස්තරාත්මක ක්‍රියාවලියේ උච්චතම අවස්ථාව ලෙස දැකිය හැකි ආයතනික ආපදා අවදානම් කළමනාකරණ උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම සහ එකඟ වීම.

1. ආපදා අවදානම් කළමනාකරණය ක්‍රමවත් කිරීම
    - ආයතනික ව්‍යුහයන් (පළාත් පාලන ආයතන තුළ ජාතික සිට ප්‍රාදේශීය මට්ටම දක්වා/විශේෂිත ආපදා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව - ඇත්නම්)

- සලකා බැලිය යුතු අනෙකුත් අංග;
    - ලිඛිත නීති, රෙගුලාසි සහ කේත
    - අංශ සහ ක්‍රියාකාරීන් හරහා ආපදා අවදානම් අවම කිරීම මුඛ්‍යධාරාගත කිරීම
    - ශක්‍යතා ගොඩනැගීම
    - සිරස් හා තිරස් සම්බන්ධීකරණය

2. වර්තමාන සහ අනාගත අවදානම් පිළිබඳ දැනුම්වත් වීම සහ අවබෝධ කර ගැනීම

- ආපදා ඇගයුම
- ආපදා සන්නිවේදනය

3. සැලසුම් කිරීම සහ ක්‍රියා කිරීම සඳහා මූල්‍ය සම්පත් සංවිධාන කිරීම

- මූල්‍යකරණය සිදු කළ යුතු දෑ පිළිබඳ එකඟතා ඇති කරගන්න.
- පවත්නා සහ ඉදිරියේදී භාවිත කළ හැකි මූල්‍ය මූලාශ්‍ර හඳුනාගන්න.

4. අධීක්ෂණය සහ ඉගෙනීම

- ප්‍රගතිය අධීක්ෂණය කිරීම ප්‍රත්‍යාස්ථතා හැකියාව පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට උපකාරී වන අතර විවිධ ක්‍රියාකාරීන් අතර අමිල ඉගෙනුම් සහ සාකච්ඡා ක්‍රියාවලියක් ජනනය කරයි.
- පහත සඳහන් වැදගත් අංගයන් ද ස්ථාපිත කළ යුතුය.
    - ආයතනය විසින් ආපදා අවදානම් කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර ආයතන ප්‍රධානියා එහි මූලසුන ගෙන කටයුතු කරනු ඇත. ඒ හා සමාන කමිටු පළාත්/ දිස්ත්‍රික් මට්ටමේ කාර්යාලවල ද පිහිටුවිය යුතුය
    - ගිනි ආරක්ෂණ සැලැස්මක් සහ හදිසි අවස්ථාවකදී ඉවත්ව යාමේ සැලැස්මක් ඇතුළු හදිසි අනතුරු ඇඟවීමේ පද්ධතියක්. සංවිධානය/ආයතනය සහ ගොඩනැගිල්ල සඳහා ගිනි හා ආරක්ෂක නිලධාරියෙකු ද පත් කළ යුතුය. ගිනි ආරක්ෂණ පරීක්ෂා කිරීම් / පෙරහුරු නිතිපතා සිදු කළ යුතුය (උදා: ද්වි වාර්ෂිකව හෝ වාර්ෂිකව).
    - හදිසි අවස්ථා සඳහා සකස් කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි **(SOPs)** සහ කාර්ය මණ්ඩලය / සේවකයින් ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
    - ගිනි නිවන උපකරණ භාවිතය ඇතුළු විය හැකි උපද්‍රව සහ ප්‍රතිචාර දැක්වීමේ පියවර පිළිබඳව කාර්ය මණ්ඩලය/සේවකයින් දැනුවත් කිරීම.
    - රසායනික ද්‍රව්‍ය/ අන්තරායකර ද්‍රව්‍ය (ඇත්නම්) අවශ්‍ය ප්‍රමිතීන්ට අනුව ගබඩා කිරීම සහ භාවිතය.
- නිශ්චිත සේවාවන් සපයන සංවිධානයේ/ ආයතනයේ/ නියෝජිතායතනයේ ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ කාර්යාලවල නියෝජිතයන් ද අදාළ පරිපාලන මට්ටම්වල ආපදා අවදානම් කළමනාකරණ කමිටුවල සේවය කරනු ඇත. අදාළ සංවිධානයේ/ ආයතනයේ ආයතනික ආපදා කළමනාකරණ සැලසුම්වලට අමතරව හදිසි/ ආපදා අවස්ථාවකදී ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ පරිපාලනයට සහාය වීමේ ක්‍රියාකාරකම් සහ යාන්ත්‍රණ විස්තර කෙරෙන (දිස්ත්‍රික් / කොට්ඨාශ) සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි පරිපාලන මට්ටම්න් තිබිය යුතුය.
- මෙම සියලු අංගයන් අදාළ සංවිධානයේ ආපදා අවදානම් කළමනාකරණ සැලැස්මෙහි විස්තරාත්මකව දැක්විය යුතුය.

මූලාශ්‍රය: ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම - සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ - සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන සඳහා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (2021)

9.7 ඇමුණුම 5: ප්‍රාග්ධන වෙළඳපොළ (ආයතනික) සඳහා IFC ආයතනයේ පාරිසරික සහ සමාජීය (E&S) කාර්යසාධක දර්ශක

කාර්ය සාධනය මත බලපෑම් මට්ටම: • ඉහළ | • මැදි | • පහළ

කාර්යසාධන දර්ශකය	•	කාර්යසාධන මිනුම්
කාර්ය සාධන ප්‍රමිතිය මත පදනම්ව 1: පාරිසරික හා සමාජීය අවදානම් සහ බලපෑම් තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම		
1. හදිසි අවස්ථා සඳහා සූදානම	•	හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් හෝ ක්‍රියාපටිපාටියක් ඇත.
2. අංශයේ අවදානමට අනුරූප වන පාරිසරික සහ සමාජීය ධාරිතාව	•	පාරිසරික සහ සමාජීය අභ්‍යන්තර/බාහිර ධාරිතාව (පාරිසරික සහ සමාජීය ඒකකය/දෙපාර්තමේන්තුව, නව වත්කම් සහ මෙහෙයුම් සංවර්ධනය හා සම්බන්ධ පාරිසරික සහ සමාජීය අවදානම හඳුනා ගැනීමට සහ අධීක්ෂණය කිරීමට අභ්‍යන්තර සුදුසුකම් ලත් පාරිසරික සහ සමාජීය කාර්ය මණ්ඩලය, සුදුසුකම් ලත් බාහිර උපදේශකයින් වෙත පාරිසරික සහ සමාජීය බලපෑම් බාහිරින් ලබා දීම සඳහා විධිමත් ක්‍රියාවලියක්) ඇත.
3. පාරිසරික සහ සමාජීය අවදානම් හා බලපෑම් හඳුනාගැනීම	•	පාරිසරික සහ සමාජීය අවදානම් සහ සමාගම්වල මෙහෙයුම් පුළුල් කිරීමහමුවේ ඒවායේ බලපෑම් හඳුනාගැනීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇත.
4. පාරිසරික සහ සමාජීය කරුණු සම්බන්ධ අභිප්‍රාය ප්‍රකාශය	•	ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද පාරිසරික සහ සමාජ ප්‍රතිපත්තියක් ඇත.
5. බලපෑම් සහ අවස්ථා පිළිබඳ පීඩාවට පත් ප්‍රජාවගේ දැනුම	•	පීඩාවට පත් ප්‍රජාව වෙත තොරතුරු ලබා දෙනු ලැබේ.
6. බලපෑමට ලක් වූ ප්‍රජා ප්‍රතිපෝෂණ සහ පිළිසරණ	•	පීඩාවට පත් ප්‍රජාවගේ දුක්ගැනිවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යාන්ත්‍රණයක් ඇත.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 2: ශ්‍රමික සහ රැකියා වටපිටාවේ තත්ත්වය		
7. කොන්ත්‍රාත් සේවකයන් ආරක්ෂා කිරීම	•	කොන්ත්‍රාත් සේවකයන් හෝ තුන්වැනි පාර්ශ්වයන් සම්බන්ධ වන නෛතික ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
8. සේවකයන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව	•	සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව නිසියාකාරයෙන් තහවුරු කර නොමැති බවට හඟවන නෛතික ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
9. තුවාල හා මරණ	•	සෘජු සහ/හෝ කොන්ත්‍රාත් සේවකයින්ගේ වැඩ ආශ්‍රිත මරණ පිළිබඳ තොරතුරු නිබේ.
10. ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව	•	ශ්‍රම බලකායේ සංයුතිය ස්ත්‍රී පුරුෂභාවය අනුව ලබා ගත හැකිය.
11. වෙනස්කම් නොකිරීම සහ සමාන අවස්ථා	•	කුලී පදනම පදනම මත සේවා ලබා ගැනීම්, වැටුප්, උසස්වීම් මත වෙනස්කම් කිරීම වැළැක්වීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් ඇත.
12. ජාතික සහ රැකියා සබැඳි නෛතික තත්ත්වයන්ට අනුකූල වීම	•	සේවා කොන්දේසි (සංගම්, සාමූහික ගිවිසුම්, කම්කරු නීති, වෙනස් කොට සැලකීම, සමාන වේතනය, සමාන අවස්ථා නොමැතිකම, හිරිහැර කිරීම) සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී..
13. සේවක සංවිධාන	•	වෘත්තිකයන්ගේ සංවිධානවලට සම්බන්ධ වීමට සහ රැකියා තත්ත්වයන් මෙන්ම රැකියා කොන්දේසි පිළිබඳ දුක්ගැනවිලි ප්‍රකාශ කිරීම සඳහා ඇති යාන්ත්‍රණයන් හා එක්වීමට සේවකයන්ට ඇති අයිතිය අවහිර කිරීමක් හෝ සීමා කිරීමක් සමාගමේ පරිවයන් තුළින් සිදු නොකෙරේ.

කාර්යසාධන දර්ශකය	•	කාර්යසාධන මිනුම්
14. රැකියා ස්ථානයේ ලිංගික හිංසනයන් වළක්වා ගැනීම සඳහා වන විධිමත් ප්‍රතිපාදන	•	අවම වශයෙන්, නිර්නාමිකව සහ රහසිගතව පැමිණිලි ගොනු කිරීමේ යාන්ත්‍රණයක් සහිත ලිංගික හිංසන වළක්වාලීමේ ප්‍රතිපත්තියක් සහ ලිංගික හිංසන සිද්ධි සමාලෝචනය කිරීම සඳහා පුහුණු මානව සම්පත් කාර්ය මණ්ඩලයක් ඇතුළු, රැකියාවේදී ලිංගික හිංසන වැළැක්වීම සඳහා විධිමත් ප්‍රතිපාදන ඇත.
15. ශ්‍රමික ප්‍රතිපෝෂණ සහ පිළිසරණ	•	සේවක දුක්ගැනිවිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යාන්ත්‍රණයක් ඇත.
ආංශිකව නිශ්චිත අවදානම්: බලහත්කාරයෙන් යොදා ගන්නා හෝ ළමා ශ්‍රමිකයන්ගේ අවදානමක් ඇති රටවල හෝ අංශවල මෙහෙයුම් හෝ සැපයුම් ජාල (උදා- කෘෂි, රෙදිපිළි, ඉදිකිරීම්, කෘෂි ව්‍යාපාර)		
16. සමාගම තුළ බලහත්කාරයෙන් හෝ ළමයින් ශ්‍රමිකයන් වශයෙන් යොදා ගැනීම	•	සමාගමේ මෙහෙයුම්වලදී බලහත්කාරයෙන් හෝ ළමයින් ශ්‍රමිකයන් වශයෙන් යොදා ගැනීමට අදාල නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී. *
17. සමාගමේ මූලික සැපයුම් දාමයේ බලහත්කාරයෙන් හෝ ළමයින් ශ්‍රමිකයන් වශයෙන් යොදා ගැනීම	•	සමාගමේ මූලික සැපයුම් දාමයේ බලහත්කාරයෙන් හෝ ළමයින් ශ්‍රමිකයන් වශයෙන් යොදා ගැනීමට අදාල නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී. **
18. සේවකයන් සඳහා සුරක්ෂිත නවාතැන්	•	නවාතැන් (කඳවුරු, නේවාසිකාගාර, ආදිය) සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු සෞඛ්‍ය සහ ආරක්ෂාව (උදා: ගින්දර, ජලය, සනීපාරක්ෂාව, ජනාකීර්ණ වීම) වැනි කරුණු පිළිබඳ පොදු මතභේද පවතී..
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 3: සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීම සහ දූෂණය වළක්වාලීම		
19. වෙනත් පුද්ගලයන් භාවිත කරන ජලයට එල්ල කරන බලපෑම	•	වෙනත් පුද්ගලයන් භාවිත කරන ජලයට එල්ල වූ දැනට එල්ල කරන බලපෑම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
20. දූෂණය වැළැක්වීම සහ අවදානම්	•	අතීතයේ සිදු වූ හෝ මේ වන විට සමාගමෙන් / ව්‍යාපෘතියෙන් උද්ගතව ඇති දූෂණ අවදානම් (උදා- වායු හෝ ජල විමෝචනය, පස හෝ භූජලය අපවිත්‍ර වීම, අපද්‍රව්‍ය බැහැර කිරීම) සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
21. හරිතාගාර වායු විමෝචනය	•	හරිතාගාර වායු විමෝචනය පිළිබඳ තොරතුරු තිබේ: විෂය පථය 1 සහ 2 (t), විෂය පථය 3 ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලට අදාළ නම්, තීව්‍රතාව (නිෂ්පාදනය සඳහා බලශක්ති පරිභෝජනයේදී නිකුත් කරන හරිතාගාර වායු) / සාමාන්‍යකරණය කිරීමේ සාධකය [සාමාන්‍යයෙන් නිෂ්පාදන හෝ විකුණුම්]
22. සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීම	•	බලශක්ති කළමනාකරණ පද්ධතියක්, පිරිසිදු නිෂ්පාදන මුල පිරීම්, සම්පත් කාර්යක්ෂමතාව (එනම් බලශක්තිය, ජලය, වෙනත් සම්පත් සහ ද්‍රව්‍ය යෙදවුම්) ප්‍රමිතික ක්‍රියාත්මක වේ.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව **4:** ප්‍රජා සෞඛ්‍ය, සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව		
23. ආරක්ෂක හමුදාව ප්‍රජාවකට බලපෑම් කරයි	•	ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ ආරක්ෂක හමුදා පිළිබඳ ප්‍රකාශයක්, ප්‍රතිපත්තියක් හෝ කේතයක් සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ඇතුළුව නමුත් සීමා නොවී ප්‍රාදේශීය ප්‍රජාව සමඟ අන්තර් ක්‍රියා කිරීම ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී ප්‍රාදේශීය

		ප්‍රජාව සම්බන්ධ ප්‍රධාන ආරක්ෂක සිදුවීම් හා සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
24. ප්‍රජාවක සෞඛ්‍ය බලපෑම් සඳහා දායක වීම	•	ප්‍රජාවක් අතර වාර්තා වන රෝග (එච්.අයි.වී./ඒඩ්ස්, මැලේරියාව ආදිය) ඉහළ යාමට දායක වීම සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව පොදු මතභේද පවතී.
25. ප්‍රජාවක් කෙරෙහි ඇති සේවක බලපෑම්	•	ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ඇතුළු එනමුත් ඒවාට සීමා නොවන, ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සේවක හැසිරීම මෙන්ම අන්තර්ක්‍රියා පිළිබඳ ප්‍රකාශයක්, ප්‍රතිපත්තියක් හෝ කේතයක් ඇත

ආංශිකව නිශ්චිත අවදානම්: මහජනතාවට ප්‍රවේශ විය හැකි ගොඩනැගිලි සහ ව්‍යුහයන් ඉදිකරන හෝ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන සමාගම්/ව්‍යාපෘති, හෝ ප්‍රජාවන්ගේ ආරක්ෂාවට කර්ජනයක් විය හැකි (පාලම, වේලි, ආදිය).

කාර්යසාධන දර්ශකය	•	කාර්යසාධන මිනුම්
26. මහජනතාවට හානියක් වන අසාර්ථක යටිතල පහසුකම්	•	සමාගම යටිතල පහසුකම් (පාලම්, වේලි, වලිග වේලි හෝ අළු පොකුණු) ඉදිකරන්නේ නම් හෝ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ නම්, මහජනතාවට හානියක් වන නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
27. මහජනතාවට හානි කරන ගිනි හෝ ව්‍යුහාත්මක හානි	•	සමාගම ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි ගොඩනැගිලි හෝ ව්‍යුහයන් ඉදිකරන්නේ නම් හෝ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ නම්, මහජනතාවට හානියක් වන නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 5: ඉඩම් අත්පත් කර ගැනීම සහ ස්වේච්ඡාවෙන් තොර යළි පදිංචි කිරීම් (නව හෝ පවතින වත්කම් වැඩිදියුණු කිරීම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් හා සම්බන්ධ සමාගම්වලට අදාළ වේ)		
28.සමාජ බලපෑම් තක්සේරු කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිය	•	පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතියක් සහ/හෝ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිපත්තියක් සහ ක්‍රියාවලියක් ඇත.
29. ඉඩම් අත්පත් කර ගැනීමෙන් පීඩාවට පත් වූ පුද්ගලයින්/ප්‍රජාවන්	•	ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාවන්ට හෝ පුද්ගල නිවාස සඳහා නැවත ස්ථානගත කිරීම සහ නවාතැන් හෝ ජීවනෝපායන් අහිමි වීම සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු, පොදු මතභේද පවතී.
30. ආර්ථික විස්ථාපනය හා සබැඳි බලපෑම්	•	සමාගම/ව්‍යාපෘති හේතුවෙන් ජනතාවගේ ජීවනෝපාය කෙරෙහි ආර්ථික විස්ථාපනයෙන් සෘණාත්මක ලෙස බලපෑම් එල්ල කර ඇති බවට වන නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව මහජන මතභේද පවතී.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 6: ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ජීවී ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය (ස්වාභාවික සහ නවීකරණය කරන ලද වාසස්ථාන මෙන්ම වනජීවී සහ පරිසර පද්ධති සේවා කෙරෙහි බලපෑම් ඇති කරන සමාගම් සඳහා අදාළ වේ)		
31. පාරිසරික පද්ධති සේවා මත බලපෑම	•	සමාගම/ ව්‍යාපෘතිය හේතුවෙන් මිනිසුන්ට ප්‍රමාණවත් තරම් ජලය, ආහාර නොමැතිකම හෝ විශාල කුණාටුවල (ගංවතුර, ඉඩම් අහිමි වීම, පස/ජලය ලවණීකරණය ආදිය) බලපෑමෙන් පීඩා විඳීම සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු පොදු මතභේද පවතී.

32. නීත්‍යානුකූලව ආරක්ෂිත/ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රදේශවලට එල්ල කරන බලපෑම්	•	සමාගම/ව්‍යාපෘතිය නීත්‍යානුකූලව ආරක්ෂිත/ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රදේශවල පිහිටා ඇත.
33. පරිසරය සංරක්ෂණය කිරීම සඳහා වන අන්තර්ජාතික එකමුතුවට **(IUCN)** එල්ල වන බලපෑම්. අවදානම්සහගත, වඳවී යාමේ තර්ජනයට ලක්ව සිටින සහ බරපතල අන්දමින් වඳවී යාමේ තර්ජනයට ලක්ව සිටින විශේෂ සහ වාසස්ථාන	•	සමාගම/ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ පරිසරය සංරක්ෂණය කිරීම සඳහා වන අන්තර්ජාතික එකමුතුව **(IUCN)** මෙන්ම අවදානමට ලක්විය හැකි, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සහ බරපතල ලෙස වඳවී යාමේ තර්ජනයට ලක්ව සිටින විශේෂ සහ වාසස්ථානවලින් සමන්විත ප්‍රදේශයක ය.
34. ස්වභාවික වාසස්ථාන කෙරෙහි එල්ල කරන බලපෑම්	•	සමාගමේ මෙහෙයුම් ස්වභාවික වාසස්ථාන කෙරෙහි බලපෑම් එල්ල කරයි.
35. වාසස්ථාන ආරක්ෂා කිරීම සහ ජෛව විවිධත්ව කළමනාකරණය	•	ජෛව විවිධත්ව කළමනාකරණය පිළිබඳ ප්‍රකාශයක්, කේතයක් හෝ ප්‍රතිපත්තියක් ඇත; ජෛව විවිධත්ව සංරක්ෂණය සමාගම සිය පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතියට ඇතුලත් කර තිබේ.
36. නීත්‍යානුකූලව ආරක්ෂිත/ජාත්‍යන්තරව පිළිගත් ප්‍රදේශවල ව්‍යාපෘති ස්ථානගත කිරීම වැළැක්වීම සඳහා ක්‍රියාකාරී ප්‍රතිපත්තිය	•	ස්වාභාවික හෝ මිශ්‍ර ලෝක උරුම අඩවිවල **(WHS)** සහ ශූන්‍ය වද වී යාමේ **(AZE)** අඩවි සඳහා වූ සන්ධානයට අයත් ස්ථානවල ව්‍යාපෘති ස්ථානගත කිරීම වැළැක්වීම සඳහා ප්‍රකාශයක්, කේතයක් හෝ ප්‍රතිපත්තියක් ඇත; ජෛව විවිධත්වය සඳහා ආරක්ෂිත ප්‍රදේශ සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් සමඟ අනුකූලව සමාගම කටයුතු කරන බව ප්‍රකාශ කරමින්; සහ ප්‍රධාන ජෛව විවිධත්ව ප්‍රදේශ සහ ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණ කාණ්ඩ **I-III** හි ව්‍යාපෘති ස්ථානගත කිරීමෙන් වළකින්න.

කාර්යසාධන දර්ශකය	•	කාර්යසාධන මිනුම්
37. පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය **(IUCN)** අවදානමට ලක්විය හැකි, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සහ බරපතල ලෙස වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති වාසස්ථානවලට සිදුවන බලපෑම් කල්තියා වළක්වා ගැනීම	•	පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය **(IUCN)** අවදානමට ලක්විය හැකි, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සහ බරපතල ලෙස වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වාසස්ථානවලට බලපෑම් වළක්වා ගැනීම සඳහා ප්‍රකාශයක්, කේතයක් හෝ ප්‍රතිපත්තියක් ඇත.
38. ස්වභාවික වාසස්ථාන කෙරෙහි එල්ල වන බලපෑම් කල්තියා කළමනාකරණය කිරීම	•	ස්වභාවික වාසස්ථානවලට එල්ල කරන බලපෑම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රකාශයක්, කේතයක් හෝ ප්‍රතිපත්තියක් තිබේ.

ආංශිකව නිශ්චිත අවදානම්:: කෘෂි ව්‍යාපාරික සමාගම් සහ ඔවුන්ගේ ප්‍රාථමික ව්‍යාපාරයේ කොටසක් ලෙස කෘෂි භාණ්ඩ මිලදී ගන්නා සමාගම්.		
39. කෘෂි භාණ්ඩ සහතිකය	•	කෘෂි වෙළඳ භාණ්ඩ සහතික කර ඇත (උදා: **FSC, RSPO, MSC, RTRS, BCI, GRSB, Bonsucro** සහතිකය, ආදිය).
40. වැදගත් වාසස්ථාන ආරක්ෂා කිරීම සඳහා සැපයුම් දාමවල ක්‍රියාකාරී කළමනාකරණය	•	වැදගත් වාසස්ථාන සුවිශේෂී ලෙස වෙනසකට ලක් වීමේ අවදානමක් පවතින සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ප්‍රකාශයක්, ප්‍රතිපත්තියක් හෝ කේතයක් ඇත.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 7: ආදිවාසී ජනතාව (ආදිවාසීන්ට පමණක් බලපෑම් ඇති සමාගම්වලට අදාළ වේ)		
41. ආදිවාසී ජනතාව කෙරෙහි එල්ල වන බලපෑම්	•	ආදිවාසීන්ට හානි කිරීම සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව පොදු මතභේද පවතී.
42. ආදිවාසී ජනතාව සමඟ ක්‍රියාශීලීව සම්බන්ධ වීම	•	අදාළ වන පරිදි, නිදහස්, පූර්ව සහ දැනුවත්ව කැමැත්ත (**FPIC**) මත පදනම් වූ ආදිවාසී ජනතාව පිළිබඳ ප්‍රකාශයක්, කේතයක් හෝ ප්‍රතිපත්තියක් ඇත.
කාර්යසාධක ප්‍රමිතීන් මත පදනම්ව 8: සංස්කෘතික උරුමය (සංස්කෘතික උරුමයට බලපෑම් ඇති සමාගම් සඳහා පමණක් අදාළ වේ)		
43. සංස්කෘතික උරුමයට එල්ල වන ප්‍රබල බලපෑම්	•	සංස්කෘතික උරුමයන් කෙරෙහි සමාගමේ/ව්‍යාපෘතියේ බලපෑම හෝ භාවිතය සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව පොදු මතභේද පවතී..


*රැකියා ස්ථානයේ සහ සැපයුම් දාමයේ ළමා ශ්‍රමිකයන් ඇමතීම පිළිබඳ **IFC** මනා පිළිවෙත් සටහන බලන්න.

** රැකියා ස්ථානයේ සහ සැපයුම් දාමයේ ළමා ශ්‍රමිකයන් ඇමතීම පිළිබඳ **IFC** මනා පිළිවෙත් සටහන බලන්න.

9.8 ඇමුණුම 6: විවිධ ආකාරයේ තාක්ෂණික උපද්‍රව / අනතුරු සඳහා වගකිව යුතු අමාත්‍යාංශ / නියෝජිතායතන

සිදුවීම් වර්ගය	වගකිවයුතු අමාත්‍යාංශ / නියෝජිතායතනය
විකිරණ සහ න්‍යෂ්ටික අනතුරු හෝ ආපදා	පරමාණුක බලශක්ති නියාමන සභාව
රසායනික උපද්‍රව / තර්ජන කාර්මික උපද්‍රව	කර්මාන්ත අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව, රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය
පෙට්‍රෝලියම් නිෂ්පාදන / ගබඩා කිරීම, නල මාර්ග, ප්‍රවාහනයේදී ගොඩබිමට තෙල් කාන්දු වීම හේතුවෙන් උද්ගත වන ගිනි තර්ජන	ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
මාර්ග / රථවාහන අනතුරු, දුම්රිය හා ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, දුම්රිය/ සැලැසුම් අසාර්ථක වීම්	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා අධිකාරිය
තෙල් කාන්දු වීම්	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා නාවික හමුදාව
සත්ත්ව ප්‍රහාර	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී භාරය, මධ්‍යම පරිසර අධිකාරිය (CEA), අවදානම් ප්‍රදේශවල අදාළ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල
සෞඛ්‍ය උපද්‍රව - වසංගත, බෝවන රෝග, කුරුළු උණ, ඒඩිස්, සාස්, කොවිඩ්-19, විෂ වීම් ආදිය සහ විය හැකි ජීව විද්‍යාත්මක උපද්‍රව, වෙනත් සෞඛ්‍ය උවදුරු	සෞඛ්‍ය අමාත්‍යාංශය, වසංගත රෝග විද්‍යා අංශය, සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ වෙනත් අදාළ වේ

9.9 ඇමුණුම 9: සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ සහ හදිසි ඉවත් කිරීමේ ක්‍රියාවලිය : "අවසන් සැතපුම - අවසන් මිනිසා"



SDO - **සමෘද්ධි සංවර්ධන නිලධාරී**, EDO - **ආර්ථික සංවර්ධන නිලධාරී**, DO NDRSC - **ජාතික ආපදා සහන සේවයේ සංවර්ධන නිලධාරී**, WRDS - **කාන්තා ග්‍රාමීය සංවර්ධන සමිතිය**, RDS - **ග්‍රාමීය සංවර්ධන සමිතිය**, CSC - **සිවිල් ආරක්ෂක කම්ටුව**

9.10 පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

2023-2030 සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම, කෙටුම්පත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ, අයගෙන් ඔබ්බට, පුළුල් පරාසයක පාර්ශවකරුවන් අගය කිරීම සහ හඳුනා ගැනීම.

තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයින්

- **උපදේශකයන්**
  1. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ - අධ්‍යක්ෂ ජනරාල් (DMC)
  2. සුනිල් ජයවීර මහතා - අධ්‍යක්ෂ - සූදානම (DMC)
  3. අනෝජා සෙනෙවිරත්න මෙනවිය - අධ්‍යක්ෂ - අවම කිරීම, පර්යේෂණ සහ සංවර්ධන (DMC)
- දායකයන්
  - DMC සහ එහි දිස්ත්‍රික් ඒකක (එනම් DDMCU) හි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ කාර්ය මණ්ඩලය
  - පාර්ශවකරුවන්ගේ අමාත්‍යාංශ, තාක්ෂණික ආයතන, රාජ්‍ය සංවිධාන, ශාස්ත්‍රීය, රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සංවිධානවල නිලධාරීන්
  - පළාත් පාලන ආයතනවල සාමාජිකයින් සහ නියෝජිතයින් (පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාමීය මට්ටම ආදිය)
- **විශේෂඥ දායකත්වය**
  1. සම්මානිත මහාචාර්ය ක්‍රිෂාන් දෙහෙරගොඩ
  2. මහාචාර්ය ඩිලන්ති අමරතුංග
  3. ආචාර්ය ආනන්ද මල්ලවතන්ත්‍රී
  4. ආචාර්ය බුද්ධි වීරසිංහ
  5. වෛද්‍ය බුද්ධික හපුආරච්චි
  6. යූ ඩබ්ලිව් එල් චන්ද්‍රදාස මහතා
  7. බන්දුල වික්‍රමආරච්චි මහතා
  8. සුරංග කහඳව මහතා
  9. ඉන්දු අබේරත්න මහතා
  10. ජනත් හෙට්ටිආරච්චි මහතා
  11. වත්සලා ජයමාන්න මහත්මියයි
  12. වෛද්‍ය ලහිරු කොඩිතුවක්කු
  13. වාගීෂා පෙරේරා මහත්මිය
  14. වජිර හෙට්ටිගේ මහතා

- **සකස් කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම** - සුනිල් ජයවීර මහතා - අධ්‍යක්ෂ - සූදානම (DMC)
- විස්තීරණ උපදේශන මාර්ගෝපදේශ - ආචාර්ය ආනන්ද මල්ලවතන්ත්‍රී
- **ක්‍රියාවලි සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, සංස්කරණය කිරීම සහ මූලික හැඩතල ගැන්වීම සමග සමස්ත අන්තර්ගත ශෝධනය** - දුෂ්‍යන්ති විජේසූරිය මහත්මිය

පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ලැයිස්තුව

1	ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකාව) (පුද්ගලික) සීමාසහිත
2	ආපදා කළමනාකරණය සඳහා ආසියා පැසිෆික් සන්ධානය (APAD)
3	ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4	ආසියානු ආපදා සුදානම් මධ්‍යස්ථානය (ADPC)
5	ආපදා අවදානම් කළමනාකරණ වෘත්තිකයන්ගේ සංගමය (ADRiMP)
6	විගණකාධිපති දෙපාර්තමේන්තුව
7	මධ්‍යම පරිසර අධිකාරිය
8	ලංකා විදුලිබල මණ්ඩලය
9	ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව
10	ළමා අරමුදල (Child Fund) ශ්‍රී ලංකාව
11	දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය
12	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
13	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
14	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
15	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
16	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
17	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
18	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
19	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
20	ජාතික අයවැය දෙපාර්තමේන්තුව
21	ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
22	සමාජ සේවා දෙපාර්තමේන්තුව
23	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
24	ආබාධිත සංවිධාන ඒකාබද්ධ පෙරමුණ
25	ආපදා කළමනාකරණ අංශය - ආරක්ෂක අමාත්‍යාංශය
26	ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමය
27	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
28	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
29	ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
30	සංක්‍රමණය සඳහා ජාත්‍යන්තර සංවිධානය (IOM)
31	සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය - ශ්‍රී ලංකා කාර්යාලය
32	චාරිමාර්ග දෙපාර්තමේන්තුව
33	ජනතාක්ෂන් ජීටීඊ් (Janathakshan GTE LTD.)

34	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA)
35	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
36	සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය
37	ආරක්ෂක අමාත්‍යාංශය
38	අධ්‍යාපන අමාත්‍යංශය
39	බලශක්ති අමාත්‍යාංශය
40	මුදල් අමාත්‍යාංශය - භාණ්ඩාගාරය
41	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
42	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
43	සෞඛ්‍ය අමාත්‍යාංශය
44	සෞඛ්‍ය අමාත්‍යාංශය - ජාතික ඩෙංගු මර්දන ඒකකය
45	කර්මාන්ත අමාත්‍යාංශය
46	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
47	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
48	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
49	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
50	ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
51	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
52	ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
53	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
54	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - මුදල් අමාත්‍යාංශය
55	ජාතික විද්‍යා පදනම
56	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
57	සාගත සහන සඳහා ඔක්ස්ෆර්ඩ් කමිටුව (OXFAM) ජාත්‍යන්තරය
58	මාර්ග සංවර්ධන අධිකාරිය
59	සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය
60	සැවේ ද විල්ඩරෙන් (Save the Children) - ශ්‍රී ලංකා කාර්යාලය
61	SLYCAN භාරය (Trust)
62	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
63	ශ්‍රී ලංකා යුද හමුදාව
64	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
65	ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය
66	ශ්‍රී ලංකා දේශගුණික අරමුදල
67	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව

68	ශ්‍රී ලංකා නාවික හමුදාව
69	ශ්‍රී ලංකා පොලිසිය
70	ශ්‍රී ලංකා වරාය අධිකාරිය
71	ශ්‍රී ලංකා දුම්රිය සේවය
72	ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
73	ශ්‍රී ලංකා සුනීත්‍ය බලශක්ති අධිකාරිය
74	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
75	ශ්‍රී ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදානය සංගමය
76	පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
77	ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන සභාව
78	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
79	එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය (UN Human Rights Office)
80	එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UN office)- ශ්‍රී ලංකා කාර්යාලය
81	එක්සත් ජාතීන්ගේ කාන්තාවන් (UN Women)
82	එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
83	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
84	එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO)
85	එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR)
86	එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN HABITAT)
87	නාගරික සංවර්ධන අධිකාරිය
88	කැලණිය විශ්වවිද්‍යාලය
89	මොරටුව විශ්වවිද්‍යාලය
90	ලොෝක බැංකුව
91	ලෝක ආහාර වැඩසටහන (WFP)
92	ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) - ශ්‍රී ලංකා කාර්යාලය
93	වර්ල්ඩ් විෂන් ලංකා (World Vision Lanka)

ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම
2023 - 2030

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
120/2, විද්‍යා මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව

https://www.facebook.com/dmc.gov.lk
https://twitter.com/dmc_lk
http://www.dmc.gov.lk/
https://www.youtube.com/channel/UCEYdr4EBFyl8jDGOirQESqQ